323 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 323 - இல. 02
Volume 323 - No. 02

2025 නොවැම්බර් 17වන සඳුදා
2025 நவம்பர் 17, திங்கட்கிழமை
Monday, 17th November, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 214]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 216-227]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් විදෙස් ගමන් බලපත්‍රය අලුත් කිරීමේදී මුහුණ දෙන දුෂ්කරතා [තීරුව 228]

**වරප්‍රසාද යෝජනා:**
CIDA හි හිටපු අධ්‍යක්ෂවරයා විසින් "කෝප්" කමිටුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව කරන ලද විවේචනය [තීරුව 233]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 – [අටවන වෙන් කළ දිනය]:**
[ශීර්ෂය 112 (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක); ශීර්ෂ 110, 228-236, 326 (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා)] - කාරක සභාවේදී සලකා බලන ලදී [ තීරු 234-420]

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය:**
වාර්ෂික වාර්තාව (2022) [ තීරුව 421]

**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය:**
වාර්ෂික වාර්තාව (2022) [ තීරුව 421]

**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය:**
වාර්ෂික වාර්තාව (2023) [ තීරුව 422]

---

# பிரதான உள்ளடக்கம்

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 214]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 216-227]

**தனி அறிவித்தல் மூல வினா:**
வெளிநாட்டிலுள்ள இலங்கைப் பிரஜைகள் கடவுச்சீட்டைப் புதுப்பிப்பதில் எதிர்நோக்கும் பிரச்சினைகள் [ப: 228]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**
CIDAஇன் முன்னாள் பணிப்பாளரினால் "கோப்" குழுவின் செயற்பாடுகள் தொடர்பில் செய்யப்பட்ட விமர்சனம் [ப: 233]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட எட்டாம் நாள்]:**
[தலைப்பு 112 (வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை); தலைப்புக்கள் 110, 228-236, 326 (நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு)] - குழுவில் ஆராயப்பட்டது [ப: 234-420]

**இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகம்:**
ஆண்டறிக்கை (2022) [ப: 421]

**இலங்கை நீதிபதிகள் நிறுவகம்:**
ஆண்டறிக்கை (2022) [ப: 421]

**இலங்கை நீதிபதிகள் நிறுவகம்:**
ஆண்டறிக்கை (2023) [ப: 422]

---

# PRINCIPAL CONTENTS

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 214]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 216-227]

QUESTION BY PRIVATE NOTICE:
Difficulties Faced by Sri Lankan Migrants in Renewing Passports [Col. 228]

PRIVILEGE MOTIONS:
Criticism by Former Director of CIDA on Functions of COPE [Col. 233]

APPROPRIATION BILL, 2026 – [Eighth Allotted Day]:
Considered in Committee [Head 112 (Foreign Affairs, Foreign Employment and Tourism); Heads 110, 228-236, 326 (Justice and National Integration)] [Cols. 234-420]

SRI LANKA BUREAU OF FOREIGN EMPLOYMENT:
Annual Report (2022) [Col. 421]

SRI LANKA JUDGES' INSTITUTE:
Annual Report (2022) [Col. 421]

SRI LANKA JUDGES' INSTITUTE:
Annual Report (2023) [Col. 422]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 17වන සඳුදා***
*2025 நவம்பர் 17, திங்கட்கிழமை*
*Monday, 17th November, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Report on the submission of observations and steps taken in terms of the Standing Order No. 119 (4) of Parliament with regard to the matters mentioned on the Human Rights Commission of Sri Lanka in the Report of the Committee on Public Accounts, which was presented to Parliament; and

(ii) Report on the submission of observations and steps taken in terms of the Standing Order No. 119 (4) of Parliament with regard to the matters mentioned on the Administrative Appeals Tribunal in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that these Reports be referred to the Committee on Public Accounts.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Annual Report of the National Institute of Business Management for the year 2023.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජිහි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

වාර්තාව 1

(i) 2023 වර්ෂයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2023 වර්ෂයේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(iii) 2022 වර්ෂයේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2021 වර්ෂයේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

වාර්තාව 2

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 සහ 2023 වර්ෂ සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තා සහ ගිණුම්;

(iii) 2024 වර්ෂය සඳහා ධීවර ත්‍යාග අරමුදලේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2024 වර්ෂය සඳහා ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(v) 2017 වර්ෂය සඳහා ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තා මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2023 වර්ෂය සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2023 හා 2024 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(iii) 2023 හා 2024 වර්ෂ සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(iv) 2023 හා 2024 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(v) 2023 හා 2024 වර්ෂ සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(vi) 2023 හා 2024 වර්ෂ සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(vii) 2022 වර්ෂය සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන;

(viii) 2023 වර්ෂය සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ix) 2023 වර්ෂය සඳහා ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(x) 2022 හා 2023 වර්ෂ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා;

(xi) 2023 වර්ෂය සඳහා රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(xii) 2020/2021 වර්ෂය සඳහා සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා හි වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මාතලේ, ඕවිලිකන්ද, කිරිමැටියාව, අංක 19/බී යන ලිපිනයෙහි පදිංචි එච්.එම්.ජී. මහේෂිකා ජයමාලි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) තණමල්විල, බෝදාගම යන ලිපිනයෙහි පදිංචි ඩී.ජී. රූපසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) හෝකන්දර දකුණ, සමගි මාවත, කේම්බ්‍රිජ් කෝට්, අංක 425/45 යන ලිපිනයෙහි පදිංචි කේ.එස්. පුෂ්පකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) නිට්ටඹුව, හක්වඩුන්න, අංක 82 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඩබ්ලිව්.ජී. සුනිල් වෙදගෙදර මහතා සහ තවත් තිදෙනෙකුගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

ගරු කථානායකතුමනි, මීරිගම, ගිරිඋල්ල පාර (දකුණ), වැරැල්ලවත්ත යන ලිපිනයෙහි පදිංචි ඒ.ටී.එල්. සජීව ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -204/2024- (2), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -227/2024- (2), ගරු අජිත් පී. පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -464/2025- (1), ගරු රවී කරුණානායක මහතා

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය භාර දීලා මාස 7ක්, 8ක් වෙනවා. අප ස්ථාවර නියෝග 27(2) යටතේ යම් ප්‍රශ්නයක් ඇහුවොත්, ඒකට පිළිතුර දීමට කල් ගන්නා අවස්ථා තිබෙනවා. නමුත්, මේ ප්‍රශ්නයට පිළිතුර දීම මොකක් නිසාද මෙතෙක් දුරට කල් ගිහිල්ලා තිබෙන්නේ? ප්‍රශ්නය භාර දීලා මාස 7ක්, 8ක් ගතවෙලා තිබියදීත්, පිළිතුර දීමටත් සුමාන දෙකක් කල් ගන්නවා නම්- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි ඊළඟ ප්‍රශ්නයට යමු.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය පළමුවැනි වතාවට තමයි අද දින Order Paper එකට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා විශේෂ ප්‍රමාදයක් නැහැ. ගරු අමාත්‍යතුමා දැනුම් දී තිබෙනවා, සති දෙකකින් පිළිතුර ලබා දෙනවා කියලා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පළමුවැනි වතාවට- *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්, පළමුවැනි වතාව.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් මාස 8ක්, මේ ප්‍රශ්නය භාර දීලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක ගැන මම දන්නේ නැහැ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි අවුරුද්දකට ප්‍රශ්න 12ක් ඇහුවොත්, ඒවාට පිළිතුරු දීමට මෙහෙම කල් ඉල්ලන විට- *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා හිතන විධියට මේ පාර්ලිමේන්තුවේ වැඩියෙන්ම පිළිතුරු ලබා දෙන්නේ ගරු රවී කරුණානායක මැතිතුමාගේ ප්‍රශ්නවලට. මේ ප්‍රශ්නය අද පළමුවැනි වතාවට තමයි Order Paper එකට ඇවිල්ලා තිබෙන්නේ. Schedule වෙන දවසට නේ උත්තරය දෙන්න වෙන්නේ. අනෙක, මේක මේ පාර්ලිමේන්තුවේ කරගෙන යන සාමාන්‍ය ක්‍රමවේදයක්.

ගරු ඇමතිතුමා ඉදිරි දිනයක පිළිතුර ලබා දේවි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -662/2025- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අමාත්‍යවරුන් සඳහා වූ රජයේ නිල නිවාස: වර්තමාන තත්ත්වය
## அமைச்சர்களுக்கான அரசாங்க உத்தியோகபூர்வ இல்லங்கள்: தற்போதைய நிலைமை
## STATE-OWNED OFFICIAL RESIDENCIES FOR MINISTERS: PRESENT STATUS

1256/2025

**5. ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය රජය පැවති කාල සීමාව තුළ දී මාදිවෙල, පාර්ලිමේන්තු මන්ත්‍රී නිල නිවාස හැර කැබිනට් අමාත්‍යවරුන් හා රාජ්‍ය අමාත්‍යවරුන් විසින් භාවිත කරන ලද රජයේ නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම රජයේ නිල නිවාසවල වර්තමාන තත්ත්වය කවරේද;

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

(iii) එම රජයේ නිල නිවාස බදු පදනම මත හෝ කුලී පදනම මත වෙනත් ආයතන හෝ ව්‍යාපාර කටයුතු සඳහා ලබා දී තිබේද;

(iv) මෙම රජයේ නිල නිවාස ලබා දී ඇති වර්තමාන රජයේ අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த அரசாங்க காலப்பகுதியில், பாராளுமன்ற உறுப்பினர்களுக்கான மாதிவெல உத்தியோகபூர்வ இல்லங்களைத் தவிர, அமைச்சரவை அமைச்சர்கள் மற்றும் இராஜாங்க அமைச்சர்களால் பயன்படுத்தப்பட்ட அரசாங்க உத்தியோகபூர்வ இல்லங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அத்தகைய அரசாங்க உத்தியோகபூர்வ இல்லங்களின் தற்போதைய நிலைமை யாது என்பதையும்;

(iii) அத்தகைய அரசாங்க உத்தியோகபூர்வ இல்லங்கள் குத்தகை அல்லது வாடகை அடிப்படையில், வேறு நிறுவனங்களுக்கு அல்லது வணிக நடவடிக்கைகளுக்கு வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) அத்தகைய அரசாங்க உத்தியோகபூர்வ இல்லங்கள் வழங்கப்பட்டுள்ள தற்போதைய அரசாங்க அமைச்சர்கள் மற்றும் பிரதி அமைச்சர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of State-owned official residences occupied by Cabinet Ministers and State Ministers during the period of the previous Government, excluding the official residences of the Members of Parliament in Madiwela Housing Complex;

(ii) the present condition of the said State-owned official residences;

(iii) whether the said State-owned official residences have been provided to other institutions or businesses on lease or rent basis; and

(iv) the number of Ministers and Deputy Ministers of the present Government to whom such official residences have been duly allocated?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රජයේ නිවාස සංඛ්‍යාව 38යි.

(ii) එම නිවාස ආර්ථිකමය වශයෙන් ඵලදායීව උපයෝජනය කිරීම පිණිස යෝග්‍ය ක්‍රමවේදයක් යෝජනා කිරීම සඳහා අමප/24/2134/816/008 හා 2024.12.09 දිනැති කැබිනට් පත්‍රිකාව මඟින් ලැබී ඇති අනුමැතිය ප්‍රකාරව පත් කළ කමිටුව විසින් සිය නිර්දේශයන් සහිත වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඒ වාර්තාව අනුව කටයුතු කෙරෙමින් පවතී.

(iii) නැවත භාරගත් රජයේ බංගලා නිවාස 06ක් නාමික කුලියක් මත තාවකාලික පදනමින් පහත සඳහන් පරිදි වෙන් කර ඇත.

- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව - 01
- පොලිස් දෙපාර්තමේන්තුව - 01
- අධිකරණ අමාත්‍යාංශය (විශේෂ අධිකරණ පිහිටුවීම සඳහා) - 04

(iv) මේ වන කොට රජයේ නිල නිවාස ගරු කථානායකතුමාට සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් 07 දෙනෙකුට ඔවුන්ගේ වැටුපෙන් අදාළ නිවාස කුලිය අය කර ගනිමින් ලබා දී තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමා ප්‍රශ්නයේ (iv) වන කොටසට පිළිතුර ලබා දෙමින් කිව්වා, නියෝජ්‍ය ඇමතිවරුන්ටයි, කථානායකතුමාටයි අමාත්‍යවරුන්ගේ නිල නිවාස 08ක් වැටුපෙන් නිවාස කුලිය අය වන පරිදි ලබා දීලා තිබෙන බව. ඉතින් එහෙම කුලිය අය කරගෙන දෙනවා නම් ඕනෑම කෙනෙකුට කුලිය අය කරගෙන ඒවා දෙන්න පුළුවන්. මොකද, ගිය වතාවේත් එහෙම කුලිය අය වන විධියට තමයි දුන්නේ. ඒ වුණාට ආණ්ඩුව තීරණයක් ගත්තේ, අමාත්‍ය නිල නිවාස ගන්නේ නැහැ කියලා නේ. රටට කිව්වේ, කැබිනට් ඇමතිවරුන් පාවිච්චි කරපු ආණ්ඩුවේ එක නිල නිවාසයක්වත් කාටවත් දෙන්නේ නැහැ කියලායි. නමුත් කියැවුණා, නියෝජ්‍ය ඇමතිවරුන් 07 දෙනෙකුටයි, කථානායකතුමාටයි වැටුපෙන් නිවාස කුලිය කැපෙන පරිදි දීලා තිබෙනවා කියලා. එහෙම නම්, ඒවා කුලියට දෙන්න. මේ විපක්ෂයේත් කවුරු හරි ඉල්ලනවා නම්, ඒවා කුලියට දෙන්න. පඩියෙන් කැපෙන විධියට දෙනවා නම් විපක්ෂයේ අයටත් දෙන්න. මට නම් ඕනෑ නැහැ. මොකද, මට මාදිවෙල එකක් තිබෙනවා. මම මාදිවෙල තමයි රාජ්‍ය ඇමති කාලයේත් හිටියේ. මම ගිය සැරේ රාජ්‍ය ඇමතිවරයා වෙලාවත් නිල නිවාස ගත්තේ නැහැ. රාජ්‍ය පරිපාලන ඇමතිතුමනි, ඔබතුමා අහලා බලන්න. මම විතරයි රාජ්‍ය ඇමතිවරයෙකු හැටියට මාදිවෙල හිටියේ. නමුත්, වැටුපෙන් නිවාස කුලිය කැපෙන පරිදි ඒවා ගන්න බවක් කිව්වේ නැහැ නේ. ඔබතුමන්ලා කිව්වේ එහෙම නොවෙයි නේ.

මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් හදන්න. ආණ්ඩුවේ ඇමතිවරුන් ඒ නිල නිවාස ගන්නේ නැත්නම් ඒවා හදලා මොකකට හරි, කාට හරි දෙන්න. ඔබතුමන්ලා කිව්වේ ඒවා සංචාරක හෝටල්වලට හරි, වෙනත් මොනවාට හරි දීලා ඒවායෙන් ආදායමක් ගන්නවා කියලා නේ. ගරු ඇමතිතුමනි, ඒවා වහලා තිබුණාම අබලන් වෙනවා. ගරු ඇමතිතුමනි, ගෙයක් අවුරුද්දක් නොවෙයි, මාසයක් වහලා තියන්නකෝ, මොකක්ද ඇති වන තත්ත්වය කියලා බලන්න. දැන් එහෙම වහපු නිල නිවාස කිහිපයක් තිබෙනවා. ඒවා දැන් කඩා වැටෙන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ඒවා වහලා තිබෙන එකේ ප්‍රයෝජනයක් නැහැ. එහෙම නැත්නම් ඔබතුමන්ලාගේ ඇමතිවරුන් ගිහින් ඒවායේ ඉන්න. ඒක අපට ප්‍රශ්නයක් නැහැ.

සමහර ඇමතිවරුන් මාදිවෙල ඉන්නවා, අපි දන්නවා. අපි ඒක නැහැ කියන්නේ නැහැ. 6දෙනෙක්ද, 7දෙනෙක්ද ඒ නිවාස අරගෙන කියන එකත් මම පිළිගන්නවා, ගරු කථානායකතුමනි. 6දෙනෙක්ද, 7දෙනෙක්ද අරගෙන තිබෙනවා. ඉතින් කුලියට ගෙවල් දෙනවා නම්, දයාසිරි මන්ත්‍රීතුමාත් ගනියි. මොකද, එතුමාත් හිටපු ගෙදර භාර දීලා ආවේ. ඒ වාගේ ගොඩක් අය නිවාස භාර දීලා ආවේ. කුලියට දෙනවා නම්, කවුරුත් ගනියි. ඒකේ ප්‍රශ්නයක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මගේ පළමුවන අතුරු ප්‍රශ්නය ඇහුවා. ඒකට උත්තර දෙන්නකෝ.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය කියලා එතුමා කිව්වාට,- *[බාධා කිරීමක්]* මට නම් එතැන හඳුනාගන්න ප්‍රශ්නයක් තිබුණේ නැහැ. නමුත් එතුමා කියන කාරණය,- *[බාධා කිරීම්]* ඒක අපැහැදිලි ප්‍රශ්නයක් නිසා, අපැහැදිලි උත්තරයක්ම තමයි දෙන්න වෙන්නේත්. කිසිම අමාත්‍යවරයෙකුට එම නිවාස දීලා නැහැ. ඒක නිශ්චිතව කියන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කරන මේ නිවාස පිළිබඳව මම කලිනුත් සඳහන් කළා. 2024.12.09 දිනැති කැබිනට් පත්‍රිකාව මඟින් අනුමැතිය දීලා තිබෙන කමිටුව ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව කටයුතු කරගෙන යනවා. ඒ අනුව මම කලින් සඳහන් කළ විධියට මේ වනවිට නිවාස 6ක් නාමික කුලියක් මත තාවකාලික පදනමින් වෙන් කර දීලා තිබෙනවා. ඒ වාගේම තමයි තව ආයතන ඉල්ලා තිබෙනවා. එම ඉල්ලීම් පිළිබඳව මේ වෙනකොට සලකා බලමින් යනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් කවුරුන් හෝ ඒවා ඉල්ලුවොත් අපට ඒ ගැන සලකා බලන්න පුළුවන්. එසේ සලකා බලා අදාළ නම්, සුදුසු නම් පමණක් ඒවා ලබා දීම සඳහා කටයුතු කරනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒක බොහොම හොඳයි. *[බාධා කිරීමක්]* ගෙවලා ගන්න පුළුවන් ලු, ඇමති නිවාස.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න තමයි හදන්නේ, ගරු කථානායකතුමනි. හදිසි වෙන්න එපා. ඔන්න, විපක්ෂයේ අය අහගන්න, අර ඇමති නිල නිවාස ගෙවලා ගන්න පුළුවන්. මොකද, කලින් දෙන්නේ නැහැ කිව්වා. දැන් ඒවා ගෙවලා ගන්න පුළුවන් කියන කාරණය රාජ්‍ය පරිපාලන ඇමතිතුමා කියන එක හොඳයි. අන්න එහෙම ආවා නම් හරි. එහෙම තමයි. මොකද, කාටවත් දෙන්නේ නැහැ කියලා කලින් කිව්වා. ඒක ප්‍රශ්නයක් නැහැ.

ගරු ඇමතිතුමනි. ඔය නිල නිවාස වහලා දැන් මාස 12ක් විතර වෙනවා නේ. නිර්දේශ එනතුරු බලා බලා ඉන්න එපා, තව අවුරුද්දක් වැහුවොත් ඒවා ඉවරෙටම ඉවර වෙනවා. අවුරුදු දෙකක් විතර ගෙයක් වහලා තියන්න බැහැ. ඔබතුමාත් ඒක දන්නවා නේ. ඔබතුමා ආණමඩුවේ දුෂ්කර ප්‍රදේශයකින් ආපු ඇමතිවරයෙක්. මම ඔබතුමාට බොහොම හොඳට ගරු කරනවා. හැබැයි, ගෙයක් අවුරුදු දෙකක් වහලා තිබුණොත්, ඒක කඩා වැටිලා, නැති තත්ත්වයටම විනාශ වෙයි. ඒ නිසා ඒවා හදලා කාට හරි දෙන්න, ආදායම් ගන්න. එහෙම නැත්නම් ඒවා වෙනත් කාට හරි දෙන්න. ඒක තමයි මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ඒකත් පළමුවැනි අතුරු ප්‍රශ්නය වාගේම තමයි, ගරු කථානායකතුමනි. මම පළමුවැනි අතුරු ප්‍රශ්නයට දුන් පිළිතුර එතුමා නිවැරැදිව තේරුම් අරගෙන නැහැ. මම කිව්වේ, ඉල්ලීම් කළාට ඒ පිළිබඳව සලකා බැලීමෙන් පසුව ලබා දෙනවා කියන කාරණය. ඒ ඉල්ලීම් හැම එකක්ම ඉෂ්ට කරනවා කියන කාරණයක් මම සඳහන් කළේ නැහැ.

ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කරපු කාරණය එක පැත්තකින් නිවැරැදියි. ඒවා වහලා තිබෙන එක සාධාරණ නැහැ, ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා අපි ඒවා ඉල්ලුම් කරලා තිබෙන ආයතන වෙත ලබා දීම සඳහා කටයුතු කරමින් තිබෙනවා. ඒ ක්‍රියාවලිය මේ වෙනකොට සිද්ධ වෙමින් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම කථා කරන්නේ ඔබතුමාගේ වරප්‍රසාද සම්බන්ධයෙන්. මගේ අසල්වැසි ගෙයක් ලෙස, කථානායකවරයාට ගෙයක් තිබෙනවා. කරුණාකරලා ඒක පාවිච්චි කරන්න, ගරු කථානායකතුමනි. මොකද, ඒකේ කඩා වැටීම බලනකොට, අපට දුකයි ඒ තත්ත්වය ගැන.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මගේ වරප්‍රසාද ගැන ඔබතුමාට කථා කරන්න අවශ්‍යතාවක් නැහැ.

දෙවන වටය.

## ඊශ්‍රායලය සඳහා ගුවන් ගමන් ගාස්තු අඩු කිරීම: විස්තර
## இஸ்ரேலுக்கான விமானப் பயணக் கட்டணத்தைக் குறைத்தல்: விபரம்
## REDUCTION IN AIRFARES TO ISRAEL: DETAILS

204/2024

1. **ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Nalin Bandara Jayamaha)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඊශ්‍රායලය සඳහා ගුවන් ගමන් ගාස්තු අඩු කරන ලද දිනය කවරේද;
(ii) අඩු කරන ලද ගාස්තු ප්‍රමාණය කොපමණද;
(iii) මේ වනවිට ඊශ්‍රායලයේ සේවය කරනු ලබන ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;
(iv) ඉහත සඳහන් ගුවන් ගමන් ගාස්තු අඩු කිරීමේදී විශාල වංචාවක් සිදුවී ඇති බව දන්නේද;
(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இஸ்ரேலுக்கான விமானப் பயணக் கட்டணம் குறைக்கப்பட்ட திகதி யாது;
(ii) குறைக்கப்பட்ட கட்டண அளவு எவ்வளவு;
(iii) தற்போது இஸ்ரேலில் பணியாற்றி வருகின்ற இலங்கையர்களின் எண்ணிக்கை யாது;
(iv) மேற்படி விமானப் பயணக் கட்டணங்கள் குறைக்கப்பட்டபோது பாரியளவில் மோசடி இடம்பெற்றுள்ளது என்பதை அறிவாரா;
(v) இது சம்பந்தமாக மேற்கொள்ளப்படும் நடவடிக்கை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -
(i) the date on which airfares to Israel were reduced;
(ii) the amount of the fare reduction;
(iii) the number of Sri Lankans currently working in Israel;
(iv) whether he is aware that a major fraud has occurred in the above- mentioned reduction of airfares; and
(v) the action that will be taken in this regard?

(b) If not, why?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

*** සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2024 ඔක්තෝබර් 09 දිනට පෙර ගුවන් ටිකට් පත් ගාස්තු සඳහා මිල ගණන් කැඳවීම් සිදු කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගමේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් පමණකි.

කෙසේ වෙතත්, නව රජය පත්වීමත් සමඟ එම සැපයුම්කරුවන්ට අමතරව සිවිල් ගුවන්සේවා අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවන් සහ දුරකථන නාමාවලියෙහි සඳහන් සිවිල් ගුවන්සේවා අධිකාරියේ ලියාපදිංචි නියෝජිත ආයතනවලින්ද මිල ගණන් කැඳවීම් සිදු කරන ලදී. ඒ අනුව, ගුවන් ටිකට් පත් සඳහා අය කරන ලද පෙර පැවැති මිල ගණන්වලට වඩා අඩු මිලක් යටතේ ගුවන් ටිකට් පත් ලබා දිය හැකි විය.

(ii) එවකට පැවැති ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගමෙහි කළමනාකාරිත්වය විසින් නිශ්චිත ගාස්තුවක් ලෙස රුපියල් 295,000ක මුදලක් විගමණික ශ්‍රමිකයන්ගෙන් අය කරගෙන තිබුණි.

කෙසේ වුවද, 2024 නොවැම්බර් සිට 2025 මාර්තු දක්වා කාල පරාසය තුළ ගුවන් ටිකට් පතේ මිල රුපියල් 131,040 සිට රුපියල් 290,384 දක්වා අතර පරාසයේ පැවතිණි.

එබැවින්, උක්ත මුදල අය කරගෙන තිබූ නමුත්, රැකියා සඳහා විදේශගත වීමට බලාපොරොත්තුවෙන් සිටි තැනැත්තන් සඳහා සත්‍ය වශයෙන්ම අය කරගත් මුදලින් ඉතිරි වූ මුදල එම තැනැත්තන් වෙත ආපසු ගෙවන ලදී.

ඒ අනුව, මේ වනවිට රුපියල් 7,723,505ක මුදලක් ආපසු ලබා දී ඇති අතර, රුපියල් 10,480,252ක මුදලක් ආපසු ගෙවීමට කටයුතු කරමින් පවතී.

මින් පසුව මෙම ගුවන් ටිකට් පත් සඳහා ඒ ඒ දිනයන්වලට අදාළ ගුවන් ගමන් සඳහා පවතින ඉල්ලුම අනුව ගුවන් ටිකට් පත්වල මිල ගණන් තීරණය වීමක් සිදුවනු ඇත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් මිල ගණන් කැඳවීම් සිදු කරනු ලබන අතර, ඒ අනුව ඉදිරිපත් වන මිල ගණන් පදනම් කරගෙන විගමණික ශ්‍රමිකයන්ගෙන් ගුවන් ටිකට් පත් ගාස්තු අයකර ගැනීමට කටයුතු කරනු ඇත.

(iii) 2025.10.27 දිනට ඊශ්‍රායලයේ සේවය කරන ශ්‍රමිකයින් සංඛ්‍යාව.

| ක්ෂේත්‍රය | විදේශගතවීම් සංඛ්‍යාව |
|---|---|
| ඉදිකිරීම් ක්ෂේත්‍රය | 11,819 |
| හෝටල් ආශ්‍රිත රැකියා ක්ෂේත්‍රය | 1,164 |
| ඉකිදිරීම් සහ අලුත්වැඩියා කිරීමේ ක්ෂේත්‍රය | 795 |
| ආපනශාලා රැකියා | 869 |
| සාත්තු සේවය | 6,637 |
| යටිතල පහසුකම් ක්ෂේත්‍රය | 238 |
| කෘෂිකර්මාන්තය | 2,819 |
| නිෂ්පාදන | 09 |
| වෙළෙඳ හා සේවා | 01 |
| අනිතිකව | 3,300 |
| මුළු ගණන | 27,651 |

(iv) එවැනි වංචාවක් සිදු වී ඇත්දැයි හෙළිකර ගැනීම සඳහා මේ වනවිට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශනයක් සිදු කරමින් පවතී.

එසේම, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින්ද මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරනු ලබයි.

(v) ඒ සම්බන්ධයෙන් මේ වනවිට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ගොනු අංක ඒසී/1097/2024 (D) - බී 203 යටතේ සිදු කරන විමර්ශනයෙන් හා අභ්‍යන්තර විගණන විමර්ශනයෙන් අනාවරණය වන කරුණු මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

## රාජ්‍ය වත්කම් ප්‍රතිෂ්ඨාපන ආයතනය: පිහිටුවීම
## அரச சொத்துக்களை மீட்டெடுப்பதற்கான நிறுவனம்: தாபித்தல்
## PUBLIC ASSETS RECOVERY AGENCY: ESTABLISHMENT

227/2024

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Ajith P. Perera)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පිහිටුවීමට පොරොන්දු වූ "රාජ්‍ය වත්කම් ප්‍රතිෂ්ඨාපන ආයතනය" මේ වනවිට පිහිටුවා තිබේද;

(ii) එම ආයතනය මඟින් මේ වනවිට රජයට අත් පත් කරගෙන ඇති සොරාගත් වත්කම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ආයතනයේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) 2025 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විසර්ජන පනත් කෙටුම්පත මඟින් හෝ අතුරු සම්මත ගිණුම මඟින් එම ආයතනය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'வளமான நாடு-அழகான வாழ்க்கை' கொள்கைப் பிரகடனத்தின் ஊடாகத் தாபிப்பதாக வாக்குறுதியளிக்கப்பட்ட "அரச சொத்துக்களை மீட்டெடுப்பதற்கான நிறுவனம்" தற்போது தாபிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி நிறுவனத்தின் மூலமாக களவாடப்பட்ட சொத்துக்களில் எந்தளவு சொத்துக்களை தற்போது அரசாங்கம் கையகப்படுத்தியுள்ளது என்பதையும்;

(iii) மேற்படி நிறுவனத்தில் தற்போது பணிபுரியும் ஊழியர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) 2025ஆம் ஆண்டுக்காகச் சமர்ப்பிக்கப்பட்ட ஒதுக்கீட்டுச் சட்டமூலத்தினூடாக அல்லது கணக்கு வாக்குப் பணம் மூலமாக மேற்படி நிறுவனத்துக்கு ஒதுக்கீடு செய்யப்பட்டுள்ள நிதி எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) whether the Public Assets Recovery Agency, which the policy statement "A Thriving Nation - A Beautiful Life" promised to establish, has been established by now;

(ii) the amount of stolen assets that have been recovered to the Government by the Agency concerned;

(iii) the number of employees currently working at this Agency; and

(iv) the amount of money that has been allocated for the Agency from the Appropriation Bill or the Vote on Account presented for the year 2025?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතේ ප්‍රතිපාදන යටතේ, ශ්‍රී ලංකා පොලිසියේ අපරාධයකින් උත්පාදිත දේ විමර්ශන කොට්ඨාසය හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යන ආයතන සොරාගන්නා ලද වත්කම් ප්‍රතිෂ්ඨාපන ජාතික ආයතන ලෙස නෛතිකව හඳුන්වා දෙනු ලබයි.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

ඒ අනුව, සොරාගත් වත්කම් නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් මූලිකව කටයුතු කරනු ලබන මෙම ආයතන දෙක වෙතින් ගෙන්වා ගන්නා ලද තොරතුරුවලට අනුව, ප්‍රශ්න අංක (අ) (ii), (iii) සහ (iv) පහත පරිදි පිළිතුරු සකස් කොට ඇත.

(ii) ඒ අනුව, පොලිස් අපරාධයකින් උත්පාදිත දේ විමර්ශන කොට්ඨාසය 2025 අංක 5 පනත ප්‍රකාරව පිහිටුවා දැනට මාසයක පමණ කාලයක් ගතව ඇති හෙයින්, එකී කොට්ඨාසය විසින් මේ වනවිට රජයට අය කරගෙන ඇති සොරාගත් වත්කම් කිසිවක් නොමැති බව සඳහන් කර ඇත.

එලෙසම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින්ද 2025 අංක 05 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත ප්‍රකාරව මෙතෙක් කිසිදු අපරාධයකින් උත්පාදිත දේපළක් අත් පත් කරගෙන නොමැති බව සඳහන් කර ඇත.

(iii) පොලිස් අපරාධයකින් උත්පාදිත දේ විමර්ශන කොට්ඨාසයේ මේ වනවිට සේවය කරනු ලබන පොලිස් නිලධාරීන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| | |
|---|---|
| · ජ්‍යෙෂ්ඨ පොලිස් පරීක්ෂක (කොට්ඨාසයේ අධ්‍යක්ෂ) | 01 |
| · සහකාර පොලිස් අධිකාරි | 01 |
| · ප්‍රධාන පොලිස් පරීක්ෂක | 02 |
| · පොලිස් පරීක්ෂක | 01 |
| · උප පොලිස් පරීක්ෂක | 05 |
| · පොලිස් සැරයන් | 04 |
| · කාන්තා පොලිස් සැරයන් | 01 |
| · පොලිස් කොස්තාපල් | 38 |
| · කාන්තා පොලිස් කොස්තාපල් | 01 |

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය යටතේ පත් කරගත යුතු නිලධාරීන් සහ සේවා නියුක්තික පත් කර ගැනීමට අවශ්‍ය වන එම නිලධාරීන් සහ සේවා නියුක්තිකයන්ගේ පාරිශ්‍රමික, පාර්ලිමේන්තුව විසින් මෙතෙක් අනුමත කර නොමැති බැවින්, පවතින නීතිය ප්‍රකාරව මෙතෙක් කිසිදු සේවකයෙක් පත්කර නොමැති බව කොමිෂන් සභාව විසින් දන්වා ඇත.

ඒ අනුව, කොමිෂන් සභාවේ මේ වන විට රාජ්‍ය සේවකයන් ලෙස ස්ථාන මාරුවීම් මත අනුයුක්ත කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් හා සේවකයන් 169දෙනෙක්ද, ශ්‍රී ලංකා පොලිසිය විසින් තවත් පොලිස් කොට්ඨාසයක් ලෙස සලකා අනුයුක්ත කරන ලද නිලධාරීන් 256දෙනෙක්ද, 1994 අංක 19 දරන පනත යටතේ ස්ථාපිත හා දැනට බලාත්මක නොවන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පත් කරන ලද නීති නිලධාරීන් ඇතුළු තවත් නිලධාරීන් 63දෙනෙක්ද සේවයේ යෙදී සිටින බවට දන්වා ඇත.

(iv) 2025 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විසර්ජන පනත් කෙටුම්පත මඟින් හෝ අතුරු සම්මත ගිණුම මඟින් "රාජ්‍ය වත්කම් ප්‍රතිෂ්ඨාපන ආයතන" සඳහාම සුවිශේෂී වූ මුදල් වෙන්කර නොමැති බවත්, ශ්‍රී ලංකා පොලිසියට සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට මුදල් වෙන්කර ඇති බවටත් ලබා දී ඇති පිළිතුරුවලින් ගම්‍ය වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු කේ. කාදර් මස්තාන් මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් විදෙස් ගමන් බලපත්‍රය අලුත් කිරීමේදී මුහුණ දෙන දුෂ්කරතා
### வெளிநாட்டிலுள்ள இலங்கைப் பிரஜைகள் கடவுச்சீட்டைப் புதுப்பிப்பதில் எதிர்நோக்கும் பிரச்சினைகள்
### DIFFICULTIES FACED BY SRI LANKAN MIGRANTS IN RENEWING PASSPORTS

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலை வாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சரிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

இலட்சக்கணக்கான எமது நாட்டுப் பிரஜைகள் தொழில் நிமித்தம் மற்றும் புதிய அல்லது மேலதிகக் கற்கைநெறிகளை மேற்கொள்வதற்காகப் பல்வேறு நாடுகளில் தங்கியிருக் கின்றனர். மேலும், குடும்பத்தினரைச் சந்திக்கவும் குடும்ப நிகழ்வுகளில் கலந்துகொள்ளவும் அவர்கள் இங்கு வருகின்றனர். முக்கியமாக, தொழில் நிமித்தம் அங்கு நீண்ட காலம் வாழ்வோரின் வருமானத்தின்மூலம், எமது நாட்டுக்குப் பாரியளவு வெளிநாட்டுச் செலாவணி கிடைக்கின்றது. எனினும், தமது கடவுச்சீட்டின் செல்லுபடியாகும் காலம் நிறைவடைகின்ற சந்தர்ப்பங்களில், அவற்றைப் புதுப்பிப்பதில் நீண்ட காலதாமதம் மற்றும் பல்வேறு சிரமங்களுக்கு இவர்கள் முகங்கொடுக்கின்றனர். இவ்வாறான சூழ்நிலைகள் தவிர்க்கப் பட வேண்டும். அந்த வகையில், பின்வரும் கேள்விகளைக் கேட்கின்றேன்.

1. வெளிநாடுகளிலுள்ள எமது தூதரகங்களில் தேவை யான அனைத்து ஆவணங்களுடனும் கடவுச்சீட்டைப் சமர்ப்பித்தால், எத்தனை நாட்களுக்குள் அது மீளப் புதுப்பித்து வழங்கப்படும்?
2. 2024ஆம் ஆண்டிலும், அதற்கு முந்தைய ஆண்டு களிலும், 2025ஆம் ஆண்டிலும் - இன்றுவரை - கிடைக்கப்பெற்ற விண்ணப்பங்களின் எண்ணிக்கை ஆண்டு வாரியாக எத்தனை? புதுப்பிக்கப்பட்டு மீள வழங்கப்பட்டவற்றில், 2024ஆம் ஆண்டுக்குரியதும் அதற்கு முந்தைய ஆண்டுகளுக்குரியதும் 2025ஆம் ஆண்டுக்குரியதுமான கடவுச்சீட்டுகளின் எண்ணிக்கை ஆண்டு வாரியாக எத்தனை?
3. தேவையான அனைத்து ஆவணங்களுடனும் பூரண மாக விண்ணப்பங்கள் சமர்ப்பிக்கப்பட்டாலும், சில கடவுச்சீட்டுகள் விரைவாகவும் இன்னும் சில காலதாமதாகவும் வழங்கப்படுவது ஏன்?
4. மேலே மூன்றாவது கேள்வியில் சொல்லப்பட்ட காரணிகளுக்கு அமைய, இவ்வாறான செயற்பாடு களின் பின்னணியில் முறைகேடான நடவடிக்கைகள் ஏதும் இடம்பெறுகின்றனவா? ஆமெனின், அவற்றைக் கண்காணிக்க ஏதும் பொறிமுறை உண்டா?

5. தற்போது இருக்கின்ற நடைமுறையானது கால தாமதத்தை ஏற்படுத்துகின்றது என்பது பொதுவான ஒரு குற்றச்சாட்டாக இருப்பதனால், மேம்படுத்தப்பட்ட நடைமுறை ஒன்றை அறிமுகப்படுத்த முடியுமா?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)

(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විදේශ දූත මණ්ඩල ශාඛාව මඟින් විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ ගමන් බලපත්‍ර අලුත් කිරීම හා ඔවුන්ගේ අලුතින් උපත ලැබූ දරුවන්ගේ නව ගමන් බලපත්‍ර සකස් කිරීම සිදු කරනු ලබනවා.

   එහිදී ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අයදුම්පත්‍ර ලැබීමෙන් පසු සිදු කරන ක්‍රියාවලියට ගතවන කාලය පහත පරිදි දක්වන්න පුළුවන්.

   මැද පෙරදිග කලාපය සඳහා මාසයක කාලයක්, අනෙකුත් කලාපවලට -ආසියානු කලාපය, පැසිෆික් කලාපය, අප්‍රිකානු කලාපය- මාස දෙකකට ආසන්න කාලයක් ගත වනවා. උතුරු ලතින් ඇමෙරිකානු කලාපය, යුරෝපා කලාපය සඳහා මාස තුනක කාලයක් ගත වනවා.

   මැද පෙරදිග කලාපය තුළින් වැඩිම අයදුම්පත් ප්‍රමාණයක් යොමු කෙරෙන අතර, වැඩිම ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් පිරිසක් එහි ජීවත්වන බැවින් ඔවුන්ට ප්‍රමුඛත්වය ලබා දීලා තිබෙනවා. යුරෝපා කලාපයේ අයදුම්පත් පරීක්ෂා කිරීමේදී ඊට අදාළ ලේඛන වැඩි ප්‍රමාණයක් ඇති බැවින් සහ එම අයදුම්පත්‍රයන්ට අදාළ තොරතුරු දත්ත පද්ධතිය හරහා පරීක්ෂා කළ යුතු බැවින් වැඩි කාල සීමාවක් මෙම කලාපයේ විදේශ ගමන් බලපත්‍ර පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියට වැය වනවා.

   විදේශ දූත මණ්ඩලයේ අයදුම්පත්‍ර සමඟ ඉදිරිපත් කළ යුතු අනෙකුත් ලේඛනවල අවශ්‍යතාව සංශෝධනය කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් 2021.12.27 දිනැතිව අංක OM/2021/01 චක්‍රලේඛය නිකුත් කර ඇති අතර ඒ අනුව විදේශ ගමන් බලපත්‍ර ලබා දීම සිදු කරනවා. එම චක්‍රලේඛය ඇමුණුම 01 වශයෙන් දක්වා ඇත. ඇමුණුම 01 **සභාගත*** කරනවා.

2. 2024 වර්ෂය තුළ සහ 2025 වර්ෂයේ මෙම කාලය තුළ විදේශගත ශ්‍රී ලාංකිකයන් විසින් විදේශ ගමන් බලපත්‍ර අපේක්ෂාවෙන් යොමු කර ඇති විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත්‍ර සංඛ්‍යාව සහ කටයුතු අවසන් කර ඇති විදේශ ගමන් බලපත්‍ර සංඛ්‍යාව මෙසේයි.

   2024 වර්ෂයේ යොමු කරන ලද අයදුම්පත්‍ර සංඛ්‍යාව 61,229යි. ඒ අතරින් විදේශ ගමන් බලපත්‍ර ලබා දී අවසන් කර ඇති අයදුම්පත්‍ර සංඛ්‍යාව 59,285යි.

   තවත් ඉතිරිව තිබෙන්නේ එක්දහස් නවසිය ගණනක්. 2025 වර්ෂයේදී මේ ආකාරයෙන්ම යොමු කරන ලද අයදුම්පත්‍ර සංඛ්‍යාව 52,866යි. ඒ අතරින් මේ අවුරුද්දේ විදේශ ගමන් බලපත්‍ර ලබා දී ඇති සංඛ්‍යාව 44,805යි.

3. 2024 වර්ෂයේ ඇති වූ හිස් විදේශ ගමන් බලපත්‍ර තොගවල හිඟය හේතුවෙන් ඉහත අංක 1හි සඳහන් නිශ්චිත කාල පරාසය තුළ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි වුවත්, මේ වන විට එම නියමිත කාල පරාස තුළදී විදේශගත ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් විදේශ ගමන් බලපත්‍ර සකස් කිරීමේ කටයුතු නියමිත පරිදි සිදු කරමින් පවතිනවා.

   එහිදී ඉදිරිපත් කර ඇති ලේඛනවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමට අවශ්‍ය වන අතර, ඒ සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව යන ආයතනවල දත්ත පද්ධති පරීක්ෂා කිරීම සිදු කරනු ලබනවා. එම පරීක්ෂාවේදී ඉදිරිපත් කර ඇති ලේඛනවල නිරවද්‍යතාව පිළිබඳව ගැටලු මතු වුවහොත්, විදේශ දූත මණ්ඩල මඟින් අයදුම්කරුවන් දැනුවත් කර නිවැරදි ලේඛන ලබා ගැනීමෙන් අනතුරුව විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම හේතුවෙන් අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් සමහර අවස්ථාවලදී ගතවනවා.

4. අක්‍රමිකතා හඳුනා ගැනීමක් මේ වන විට සිදු වී නැත; වාර්තා වී නැත.

5. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය ඒකාබද්ධව 2025.06.30වන දින "විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල මඟින් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ විදේශ ගමන් බලපත්‍ර අයදුම් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම" මැයෙන් ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර ඇත.

   ඒ සඳහා 2025.07.14 දිනැති අංක අමප/25/1200/821/028 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදියර 1 යටතේ ඇමුණුම 02හි දක්වා ඇති රටවල් 20 ආශ්‍රිතව සංක්‍රමණ සඳහා වන ජාත්‍යන්තර සංවිධානය - IOM - එකඟ වී ඇති පරිදි ඔවුන්ගේ මූල්‍ය ආධාර මත විදේශ දූත මණ්ඩල/ කාර්යාල 20ක් ආවරණය කරමින් ජෛවමිතික ග්‍රහණ මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමේ කටයුතු මෙම වසර අවසානයේ හෝ 2026 වසරේ මුල් කාර්තුවේ දී ක්‍රියාත්මක වීමට නියමිතය. එම ව්‍යාපෘතිය යටතේ දැනට ගත වන කාලයට වඩා අඩු කාලයකින් විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමට හැකියාව ලැබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඇමුණුම 02 පහත පරිදි වේ.

Proposed 20 Missions for Phase-1- Biometric Enrollment Units Deployment
Online Passport Application process for the 20 Sri Lanka Missions Abroad

| No. | Country | Mission/Post | City |
|---|---|---|---|
| 1 | Australia | SLCG | Melbourne |
| 2 | Bahrain | SLEMB | Manama |
| 3 | Canada | SLCG | Toronto |
| 4 | France | SLEMB | Paris |
| 5 | Germany | SLEMB | Berlin |
| 6 | Israel | SLEMB | Tel Aviv |
| 7 | Italy | SLCG | Milan |
| 8 | Romania | SLEMB | Bucharest |
| 9 | Japan | SLEMB | Tokyo |
| 10 | Kuwait | SLEMB | Kuwait City |
| 11 | New Zealand | SLHC | Wellington |
| 12 | Oman | SLEMB | Muscat |
| 13 | Qatar | SLEMB | Doha |
| 14 | South Korea | SLEMB | Seoul |
| 15 | Saudi Arabia | SLCG | Jeddah |
| 16 | Saudi Arabia | SLEMB | Riyadh |
| 17 | United Arab Emirates | SLCG | Dubai |
| 18 | United Kingdom | SLHC | London |
| 19 | United States of America | SLEMB | Washington, D.C. |
| 20 | Cyprus | SLEMB | Nicosia |

ගරු කථානායකතුමනි, මේක තමයි පිළිතුර.

---

* **පුස්තකාලයේ තබා ඇත.**

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ அமைச்சர் அவர்களே, நன்றி! நீங்கள் கூறியது போன்று அல்ல, கடவுச்சீட்டைப் புதுப்பித்துக்கொள்வதில் பாரிய பிரச்சினை இருப்பதாகவே எமது புலம்பெயர் சமூகத்தினர் தெரிவிக்கின்றார்கள். இந்தப் பிரச்சினை இப்போது அல்ல, கடந்த அரசாங்க காலம் தொடக்கம் தொடர்ச்சியாக இருந்து வருகிறது. எமது புலம்பெயர் சமூகத்தினர் passportஐப் புதுப்பிப்பது உட்பட எந்த வேலையைச் செய்வதாக இருந்தாலும், தவறான முறையில் பாரிய கொடுப்பனவுகளைக் கொடுக்கவேண்டி இருக்கின்றது. அதாவது, அதிகாரிகளுக்கு கையூட்டல் கொடுத்தால்தான் வேலைகளைச் செய்யக்கூடியதாக இருப்பதாக இன்றும் குற்றஞ்சாட்டுகின்றனர். நீங்கள் passport சம்பந்தமான விடயத்தில் கவனம் செலுத்துகின்ற அதேநேரம், ஏனைய விடயங்களில் இடம்பெறுகின்ற ஊழலை ஒழிப்பதிலும் கவனம் செலுத்த வேண்டும். ஊழலை ஒழிப்பதற்காகத்தான் மக்கள் உங்களுக்கு வாக்களித்து இருக்கிறார்கள் என்ற அடிப்படையில், அவர்களுக்கு இவ்வாறான நிலைமைகள் ஏற்படாமல் பார்த்துக்கொள்ள வேண்டும். Passportஐப் புதுப்பிப்பது உட்பட ஏனைய வேலைகளையும் புலம்பெயர் சமூகத்துக்கு அவசரமாகச் செய்துகொடுப்பதற்கான ஏற்பாடு களைச் செய்யுமாறு கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණය සම්බන්ධයෙන් අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. යම් හෝ පැමිණිල්ලක් ලැබුණොත් අපි වහාම ඒ සඳහා ක්‍රියාත්මක වනවා. ඉදිරියටත් ඒ පිළිබඳව අවධානය යොමු කරලා, එම විදේශගත වුවන්ගේ විදේශ ගමන් බලපත්‍ර කඩිනමින් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු කරන්නම්. එම කාර්යය කඩිනම් කරන්න තමයි මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත්‍ර ලබා ගන්න කටයුතු කරන්නේ. ඔවුන්ගේ ලිපි ලේඛන පුළුවන් තරම් ඉක්මනින් පරීක්ෂා කරලා ඔවුන්ට කඩිනමින් ගමන් බලපත්‍ර නිකුත් කරන්න අවශ්‍ය කටයුතු කරන්නම්. ඔබතුමා යම් පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා නම් අපි ඒ සම්බන්ධයෙනුත් පරීක්ෂා කරලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න පියවර ගන්නම්.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, 31වන ස්ථාවර නියෝගය යටතේයි මා මෙම කාරණය ඉදිරිපත් කරන්නේ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වන ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වනවා:

> "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලු ම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය."

ගරු ඇමතිතුමාත් සභාවේ ඉන්න නිසා මම අහනවා, ඊයේ සම්බුද්ධ ජයන්ති,-

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මට පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව ලබා දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, ත්‍රිකුණාමල කොටුව පාර, ශ්‍රී සම්බුද්ධ ජයන්ති බෝධිරාජ විහාරස්ථානයට අදාළව ඊයේ දිනයේ සිදුවීමක් වාර්තා වෙලා තිබෙනවා. ඊයේ රාත්‍රියේ තැන්පත් කරන ලද බුදු පිළිමයක් සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් මතු වීම හේතුවෙන් පොලීසියට ඒ පිළිබඳව වාර්තාවක් ලැබුණා.

ඒ වාර්තාවේ සඳහන් වුණේ ඊයේ රාත්‍රියේ තැන්පත් කරන ලද ඒ බුදු පිළිමයට කරන ලද යම් කඩාකප්පල්කාරී ක්‍රියාවක්, හානි සිදු කිරීමක් සම්බන්ධයෙන් තොරතුරක් ලැබුණු බවයි. ඒ අනුව පොලීසිය ඊයේ රාත්‍රියේ එම බුදු පිළිමය ඉවත් කරලා එහි ආරක්ෂාව සහතික කර තිබෙනවා. ඊයේ හදිසියේ සිදු වූ ඒ බුදු පිළිමය තැන්පත් කිරීමත් සමඟ තමයි ඒ තත්ත්වය මතු වුණේ. අද දිනය වනවිට අපි පොලීසියට උපදෙස් දුන්නා, ඒ බුදු පිළිමය නැවතත් ඒ විහාරස්ථානයේ තැන්පත් කරන්න කියලා. මොකද, අද දිනයේ සිට විධිමත් ආරක්ෂක වැඩ පිළිවෙළක් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන්ද මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබිලා තිබුණා, එතැන ආපන ශාලාවක් පවත්වාගෙන යනවා, ඒක නීති විරෝධීයි කියලා. ඒ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගන්න පොලීසිය කටයුතු කරනවා. අධිකරණය දෙන තීන්දුවට අනුව තමයි කටයුතු කළ යුත්තේ.

ඊයේ රාත්‍රියේ බුදු පිළිමය ඉවත් කිරීමක් සිද්ධ වෙලා තිබෙනවා, බුදු පිළිමයේ ආරක්ෂාව සඳහා. මම හිතන විධියට, අද උදෑසන නැවත එම බුදු පිළිමය ඒ විහාරස්ථානයේ, දහම් පාසල් භූමියේ තැන්පත් කරන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. ඒ ඉඩම සම්බන්ධයෙන් තිබෙන ගැටලුව අධිකරණයෙන් තමයි නිරාකරණය කර ගන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් දැනට අවශ්‍ය ක්‍රියාමාර්ග පොලීසිය පැත්තෙන් ගන්නවා. අද දිනයේදී මේ සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කරලා අධිකරණය දෙන තීන්දු තීරණ අනුව කටයුතු කරනවා. දැනට බුදු පිළිමයේ ආරක්ෂාව තහවුරු කරලා තිබෙනවා. මොකද, ත්‍රිකුණාමලය නගරය තුළ නැවත අවාසනාවන්ත සිදුවීම් වෙන්න ඉඩක් දෙන්න හැකියාවක් නැහැ. බුදු පිළිමයේ ආරක්ෂාව තහවුරු කරලා, බුදු පිළිමය නැවත ඒ තිබුණු ස්ථානයටම වැඩම කරවන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. මේ පිළිබඳව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව පැත්තෙන් එන පැමිණිල්ල සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කරනවා. අධිකරණය දෙන තීන්දුවක් අනුව ඉදිරි කටයුතු කරන්න පියවර ගන්නවා, ගරු කථානායකතුමනි. සියලු උපදෙස් පොලීසියට ලබා දීලා තිබෙනවා, සාමය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීමට. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න තිබෙනවා. මේ රටේ මෙච්චර ප්‍රශ්නයක් වෙලා තිබියදී ඔබතුමා අපට කථා කරන්න ඉඩක් දෙන්න. මේ ඇමතිතුමා කියපු කාරණය සම්පූර්ණයෙන් වැරදියි. ඒකයි අපි කියන්නේ. *[බාධා කිරීමක්]* හාමුදුරුවන්ට ගහලා තිබෙන්නේ කුඩේ අරගෙන දෙකට කඩලා. එහෙම කොහොමද ගහන්නේ? සම්පූර්ණ වැරදියි. මේකද, බුද්ධාගමට සලකන විධිය?*[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, අපට ඉඩක් දෙන්න. ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ සිංහලයෙක්ද, බෞද්ධයෙක්ද? කථා කරන්න කාලයක් දෙන්න, අපට. *[බාධා කිරීම්]*

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### CIDA හි හිටපු අධ්‍යක්ෂවරයා විසින් "කෝප්" කමිටුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව කරන ලද විවේචනය
### CIDAஇன் முன்னாள் பணிப்பாளரினால் "கோப்" குழுவின் செயற்பாடுகள் தொடர்பில் செய்யப்பட்ட விமர்சனம்
### CRITICISM BY FORMER DIRECTOR OF CIDA ON FUNCTIONS OF COPE

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සහ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 නොවැම්බර් 13 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මුතු කුඩය කඩලා ගහලා තිබෙන්නේ, හාමුදුරුවන්ට. එහෙම ගහන්න පුළුවන්ද? ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ සිංහලයෙක්ද, බෞද්ධයෙක්ද? අපට කථා කරන්න දෙන්න. මේ රටේ බෞද්ධ සිද්ධස්ථානවලට ගහනවා.*[බාධා කිරීමක්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
බුද්ධාගමට ප්‍රමුඛතාව දෙනවා කියලා නේ කිව්වේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, ප්‍රමුඛතාව දෙනවා කියලා කිව්වේ. ලජ්ජයි, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]* ලජ්ජා නැතිකම මහ මුදලිකමටත් වඩා ලොකුයි. කරුණාකර, විනාඩියක් දෙන්න අපට කථා කරන්න. *[බාධා කිරීම්]* ඇමතිතුමා කියපු කාරණය සම්පූර්ණයෙන් වැරදියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත, 2026 - කාරක සභා අවස්ථාව. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක? *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, පොඩි නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. මගේ පසුගිය දින කථාවේදී මම සඳහන් කළා, ඔබතුමාගේ ලේකම් විසින් receptionist කෙනෙකුට බැණලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක අදාළ නැති point එකක්. *[බාධා කිරීම්]*

න්‍යායපත්‍රයේ විෂය අංක 1

## විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

*කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: නොවැම්බර් 15]*
*[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]*

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: நவம்பர் 15]*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee.- [Progress: 15th November]*
*[HON. SPEAKER in the Chair.]*

**112 වන ශීර්ෂය.- විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයා**
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.1,326,685,000

**தலைப்பு 112.- வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சர்**
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,326,685,000

HEAD 112.- MINISTER OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,326,685,000

**110 වන ශීර්ෂය.- අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 5,380,300,000

**தலைப்பு 110.- நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 5,380,300,000

HEAD 110.- MINISTER OF JUSTICE AND NATIONAL INTEGRATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 5,380,300,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 112; අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 110, 228 සිට 236 සහ 326.

සලකා බැලීම පූර්ව භාග 11.00 සිට අපර භාග 6.00 දක්වා. කපා හැරීමේ යෝජනාව, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි,-

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු සභාපතිතුමනි, මම කථා කරන්න ඉස්සෙල්ලා එතුමාට ඒ අවස්ථාව දෙන්නේ නැත්නම් ඒක මට ප්‍රශ්නයක් වෙනවා. *[බාධා කිරීම්]*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු දයාසිරි මන්ත්‍රීතුමා, වාඩි වෙන්න. ඔබතුමාගේ point එක ගැන පැහැදිලි කිරීමක් කළා නේ. *[බාධා කිරීම්]* ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමා සම්බන්ධයෙන්- *[බාධා කිරීම්]*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මගේ වෙලාව ගන්න එපා, මගේ වෙලාව දෙන්න එපා. *[බාධා කිරීම්]* ගරු සභාපතිතුමනි, මගේ වෙලාව නාස්ති වෙනවා. ඒ නිසා කරුණාකරලා,- *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මොකටද විනාඩියක්? ඒකේ Point of Order එකක් නැහැ. *[බාධා කිරීම්]* point of Order එකක් නැහැ. වහාම වාඩි වෙන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු සභාපතිතුමනි, මගේ වෙලාව.*[බාධා කිරීම්]* මේ සද්දය නිසා මට කථා කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා, කථාකරන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඒකට අවස්ථාව දීලා මට වෙලාව දෙන්න. *[බාධා කිරීම්]* දැන් ඉඳලා මගේ වෙලාව ගණන් ගන්න එපා. මොකද, රටේ ප්‍රධාන ප්‍රශ්නයක් ගැන මේ කථා කරන්නේ. එතුමාට අවස්ථාව දීලා ඉන්න. එහෙම නැත්නම් ප්‍රශ්නයක් වෙනවා. *[බාධා කිරීම්]* මට කියන දේ ඇහෙන්නේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, Standing Order අංකය කියන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, Standing Order 92(a) states, I quote:

> "A member may in any proceedings question whether proper procedures have been or are being followed by making a point of order except at a time when a division is in progress."

Sir, the point is, I made reference to your Secretary having a problem with a receptionist, who is not a lady but a male. I want to correct it.

ඒත් එක්කම මම කියන්න කැමැතියි, බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දෙන්න ඕනෑ කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන බව.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා point of Order එකක් ගෙනැල්ලා ආයෙත් පිට පනිනවා. *[බාධා කිරීම්]* ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒකේ Point of Order එකක් නැහැ. *[බාධා කිරීම්]*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු සභාපතිතුමනි, මගේ වෙලාව.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කිසිම කෙනෙකුට දෙන්නේ නැහැ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. නැත්නම් මම කොහොමද කථා කරන්නේ? මම කථා කරන දෙය ඇහෙන්නේ නැහැ නේ. එතුමාට විනාඩියක් දීලා ඉන්නකෝ. නැත්නම් මට කථා කරන්න බැරි වෙනවා. හැබැයි, මගේ වෙලාව ගන්න එපා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට කථා කරන්න පුළුවන්.

[පූ.භා. 10.05]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු සභාපතිතුමනි, "2026 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.11.17 සඳුදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 112 සහ 110, 228 සිට 236, 326 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මම මගේ කථාව ගරු දයාසිරි ජයසේකර මැතිතුමා ඉදිරිපත් කරන්න ගිය යෝජනාව කියමින්ම පටන් ගන්නවා. බුදු පිළිම කඩලා, පාස්කු ප්‍රහාරය සිදු කර තිබියදී ඒ සම්බන්ධයෙන් සාධාරණයක් ඉෂ්ට නොකරන ආණ්ඩුවකින් මෙතැන සාධාරණයක් බලාපොරොත්තු වෙන්න බැහැ කියන එක පළමුවෙන්ම මම මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, දැන් මේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැනත් කථා කරන වෙලාව. මේක ඉතා වැදගත් වැය ශීර්ෂයක්. ඒ හා සමානව රටේ ගෞරවයට, අභිමානයට වාගේම රටේ ඉදිරි පැවැත්මට සහ රටේ ඉදිරි සංවර්ධන කටයුතුවලට ඉතා වැදගත්වන අමාත්‍යාංශයක් මේක. මේ අමාත්‍යාංශය ගැන කථා කරද්දී මම පොඩ්ඩක් ඉතිහාසයට යනවා, ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලය දක්වා. ඒ අතීතය ගැන දන්නේ නැතිව 76 වසරක ශාපයක් ගැන ඔබතුමන්ලා කථා කරනවා. ඒ නිසා මේ ගැන කථා කරලා, මේ ගැන පහදා දීලා ඉස්සරහට යන එක හොඳයි කියලා මම හිතනවා. 1947-48 කාලයේ තමයි නිදහස ගන්න මූලික ආයතන පිහිටවූයේ. එදා ඉඳලාම ජාත්‍යන්තරයත් එක්ක සම්බන්ධ වෙලා තමයි නිදහස ලබා ගත්තේ. 1944දී බ්‍රිතාන්‍ය ආරක්ෂක ගිවිසුම අත්සන් කළා.

1944දී ජාති මණ්ඩල සාමාජිකත්වය හැදුවා. ඊළඟට, 1948, 1949 කාලයේ තමයි එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය ලබා ගන්න උත්සාහය ගත්තේ. හැබැයි, ඒ උත්සාහය එදා සාර්ථක කර ගන්න බැරුව ගියා. 1955 දෙසැම්බර් 14වැනි දා තමයි ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ගත්තේ. ඒ සාමාජිකත්වය ලබා ගත්තේ ඩී.එස්. සේනානායක මැතිතුමන්ලාගේ කණ්ඩායමේ තිබුණු දක්ෂතාව සහ විශේෂයෙන්ම ජාත්‍යන්තරයත් එක්ක තිබුණු සම්බන්ධතාව නිසා. ඊළඟට, 1949දී විදේශ සේවය පිහිටුවූවා. 1950 ජනවාරි 9වැනි දා සිට 14වැනි දා වනතුරු ජාති මණ්ඩලයේ විදේශ අමාත්‍යවරුන්ගේ පළමුවැනි සම්මේලනය කොළඹදී පැවැත්වූවා.

මෙහිදී ඩඩ්ලි සේනානායක මැතිතුමාත් විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. ඩඩ්ලි සේනානායක මැතිතුමා සහ ඩී.එස්. සේනානායක මැතිතුමා කියන දෙපළම ජාත්‍යන්තරය මොකක්ද කියලා හරියට හඳුනාගෙන කටයුතු කරපු නායකයෝ දෙපළක්. එතුමන්ලා ලබා දුන්නු ශක්තිය තමයි අපි ඉස්සරහට ගෙන යන්නේ.

ඊළඟට විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, 1951දී පැවැත්වූ සැන් ෆ්‍රැන්සිස්කෝ සාම සම්මේලනය ගැන. ඩී.එස්. සේනානායක මැතිතුමා අගමැතිතුමා වුණත් එදා එතුමාට යන්න විධියක් තිබුණේ නැති නිසා එවකට මුදල් ඇමතිතුමා හැටියට සිටි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාව ඒ සම්මේලනයට යැව්වා. මම මේක කියන්නේ හේතුවක් ඇතිවයි. එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කරපු කථාව මතක් කර ගන්න. බුදු පිළිමවල කථාවටත් මේක සම්බන්ධ වෙනවා. එතුමා කියනවා, වෛරය වෛරයෙන් නොවෙයි නිවෙන්නේ, වෛරය නිවෙන්නේ ප්‍රේමයෙන් කියලා. හැබැයි, ඔබතුමන්ලා ප්‍රේමය කියන එක හඳුනන්නේවත් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හරියට හරි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
එහෙම කියන්න හේතුවක් තිබෙනවා. ඔබතුමන්ලාගේ ජනාධිපතිවරයා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගිහිල්ලා අපේ රට ගැන කථා කරද්දී කිව්වේ මොනවාද? මේ රට කුඩු පිරිච්ච රටක්, පාතාලය රජ දහනක් වෙච්ච රටක් හැටියට තමයි එතුමා ශ්‍රී ලංකාව හඳුන්වා දුන්නේ. ඒක මතක තබා ගන්න. ජේ.ආර්. ජයවර්ධන මහත්මයාලා එදා ගිහිල්ලා මේ රට ගැන කථා කළේ මොනවාද? මේ රටේ ජීවත් වන ජනතාවගේ පෞරුෂත්වය ගැනයි එතුමන්ලා කථා කළේ, හැකියාව ගැනයි කථා කළේ, අපේ මිනිසුන්ගේ තිබෙන නිහතමානීකම, ඒ හා සමානව අපේ මිනිසුන්ගේ තිබෙන ජාතිකත්වයත් එක්කම අනෙක් අයට කරන ආදරය, ගෞරවය වාගේ දේවල් ගැන තමයි කථා කළේ. ඒක තමයි රටේ අභිමානය. ඒ ගැන තමයි එතුමා එදා කථා කළේ.

ගරු කථානායකතුමනි, මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මෙතැන ඉන්න මේ ඇමතිවරුන් කිසිම කෙනෙකුට ඔය ආසනවල ඉඳ ගන්න අයිතියක් නැහැ. 76 අවුරුද්දේ ශාපයක් ගැන කියන තමුන්නාන්සේලා හරි නම් ඔතැනින් නැඟිටලා යන්න ඕනෑ. මොකද, 76 අවුරුදු ශාපය කියලා කිව්වාට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ උත්සාහය නිසා තමයි මේ පාර්ලිමේන්තුව අපට ජපානයෙන් නොමිලේ, ආධාරයක් හැටියට ලැබුණේ. ඒකේ

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ඉඳගෙන තමයි තමුන්නාන්සේලා 76 අවුරුදු ශාපයක් ගැන කථා කරන්නේ. එම නිසා මතක තබා ගන්න, ඔතැන ඉඳගෙන 76 අවුරුදු ශාපයක් ගැන කථා කරන්න ඔබතුමන්ලාට අයිතියක් නැති බව.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එදා කළ ඒ කථාවෙන් මුළු ලෝකයම කම්පනයට පත් වුණා. මම මේ කියන්නේ, අද සහ එදා වෙනස ගැන. ඒක තමයි ජාත්‍යන්තරය දිනා ගන්නා ක්‍රමවේදය. එදා ජාත්‍යන්තරයේ -මුළු ලෝකයේ- සියලු දෙනාගේ ඇස් ඇරුණා විතරක් නොවෙයි, ජපානය ඊට පස්සේ අපට බොහෝ දේවල් ලබා දුන්නා.

1977-1978 කාලයේදී තමයි අපි ශක්තිමත් විදේශ ප්‍රතිපත්තියක් හැදුවේ. අපේ පැරණි ආණ්ඩුව තමයි -1977 ආණ්ඩුව තමයි- විදේශ කටයුතු අමාත්‍යාංශය හදලා පළමුවෙනි විදේශ කටයුතු ඇමතිවරයා හැටියට ඒ.සී.එස්. හමීඩ් මහතා පත් කළේ. ඒකත් ජේ.ආර්. ජයවර්ධන මහතාගේ පාලනයේ ප්‍රතිඵලයක්. 1978දී අපි නොබැඳි ව්‍යාපාරයට සම්බන්ධ වුණා. මම මේ කියන්නේ ජාත්‍යන්තරය හමුවට ගිහින් එදා නායකයන් සහ දැන් නායකයන් කරපු කථාවල් ගැනයි. විශේෂයෙන්ම නොබැඳි ජාතීන්ගේ සම්මේලනයේ සභාපතිවරයා හැටියට ජේ.ආර්. ජයවර්ධන මහත්මයා පත් වෙද්දී, එතුමා හොඳ කථාවක් කිව්වා. එතුමා එදා කිව්වා, ලෝකයේ නොබැඳි රටවල් දෙකයි තිබෙන්නේ, ඒ සෝවියට් දේශය සහ ඇමෙරිකාවයි කියලා. එතුමා ඒක නිකම් hint එකක් විධියට තමයි කිව්වේ. එතුමා එහෙම කිව්වේ, අනෙක් රටවලට නොබැඳි විධියට ජීවත් වෙන්න බැහැ කියන එකයි. අර දෙගොල්ලන්ට නොබැඳි විධියට ජීවත් වෙන්න පුළුවන් වුණත් අනෙක් රටවලට නොබැඳි විධියට ජීවත් වෙන්න බැහැ කියන පණිවුඩයයි එතුමා එදා ලබා දුන්නේ.

විශේෂයෙන්ම ඉන්දු-ලංකා ගිවිසුමේ ඉඳලා, රජීන ලංකාවට කැඳවාගෙන ඒමේ ඉඳලා සියලු කටයුතු එදා ඉතාම හොඳින් කළා. මතක තියා ගන්න, 76 අවුරුදු ශාපය තුළ ජාත්‍යන්තර සම්බන්ධතා තුළින් ජාත්‍යන්තරයේ හිත දිනා ගත් නිසා අපට ලැබුණු දේවල් බොහෝයි. එදා එංගලන්තයෙන් ලැබුණා, Victoria Dam එක; කැනඩාවෙන් ලැබුණා, Kotmale Dam එක; ජර්මනියෙන් ලැබුණා, Randenigala Dam එක; Japanවලින් ලැබුණා ඒ සියලු දේවල් හදන්න මැෂින් ටික. මතක තියා ගන්න. UN agenciesවලින් ලැබුණා, plans ටික. ඒ අය සැලසුම් ටික හදලා දුන්නා. ඊළඟට, World Bank එක සහ ADB එක එදා අපට loans ටික ලබා දුන්නා. ඒ වාගේම මතක තියා ගන්න, අපේ රටට ලැබුණා ජයවර්ධනපුර රෝහල. අද ඔබතුමන්ලා 76 අවුරුදු ශාපය ගැන කියලා කෑ ගහන දර්ශන පෙන්වන TV එක අපට ලැබුණේ කොහොමද? එදා ජාතික රූපවාහිනී නාළිකාවත් අපට ලැබුණේ ආධාරයක් හැටියටයි; ප්‍රදානයක් හැටියටයි. ඒවා දුන්නේ එදා අප පවත්වාගෙන ගිය ජාත්‍යන්තර සම්බන්ධතාව අනුවයි. ඒ වාගේම තමයි කටුනායක Free Trade Zone එක. 76 අවුරුදු ශාපය ගැන කියද්දී මතක තියා ගන්න, ඒ සියලු දේවල් අපට ලැබුණේ එදා අප ජාත්‍යන්තරය දිනා ගත්තු නිසා බව. අපේ විදේශ කටයුතු ඇමතිතුමනි, මේවා අනෙක් අයට කියලා දෙන්න ඔබතුමාට සිද්ධ වෙයි. මොකද, සමහර අය මේවා දන්නේ නැහැ. ඒ අය මේවා දන්නේ නැති නිසා බොහෝ වෙලාවට ද්වේශ සහගත විධියට, මඩ ගහමින්, අනෙක් අය පාච්චල් කරමින් කථා කරනවා. නමුත් මේ ගැන හරියට හඳුනා ගන්න ඕනෑ.

විශේෂයෙන් අද මොකක්ද වෙන්නේ? තමුන්නාන්සේලා 2025 -මේ අවුරුද්දේ- මානව හිමිකම් සැසියේදී මොකක්ද කළේ? ඒ සැසියේදී ඩයස්පෝරාවේ ඕනෑකමට, ඩයස්පෝරාවේ සල්ලිවලට, ඩයස්පෝරාවේ බලපෑමට අපේ රටට විරුද්ධව ගෙනාපු යෝජනාව හමුවේ තමුන්නාන්සේලා සද්ද නැතුව බංකුව යටට ගියා.

තමුන්නාන්සේලා ඒ ගැන කථා කළේ නැහැ. තමුන්නාන්සේලා ඒකට විරුද්ධව ඡන්දයක් ඉල්ලුවේ නැහැ. අඩු ගණනේ ඡන්දයක් ඉල්ලුවා නම් අනෙක් රටවල් අප ගැන කියන්නේ මොනවාද කියලා, ඒ අය අපේ රට පිළිබඳව දරන අදහස් මොනවාද කියලා දැනගන්න තිබුණා. හැබැයි ඒක කරන්න තමුන්නාන්සේලා සමත් වුණේ නැහැ. මොකද, තමුන්නාන්සේලාට වඩා ඉදිරියෙන්; තමුන්නාන්සේලාට වඩා උඩින් ඩයස්පෝරාව හිටියා. ඒ නිසා මතක තියාගන්න, එතැනදී අපි රටක් හැටියට විශාල වශයෙන් හැල්ලුවට ලක් වුණා කියන එක.

ඊළඟට කියන්න ඕනෑ, තමුන්නාන්සේලා ඉන්දියාව සමඟ අත්සන් කළ ගිවිසුම් ටික ගැන. මම අද උදේත් බැලුවා, වත්මන් ජනාධිපතිවරයා එදා මේ විපක්ෂයේ හිටපු කාලයේ ජාත්‍යන්තර ගිවිසුම් සම්බන්ධයෙන් කියපු කථා. එතුමා කිව්වා, "ඒ ගිවිසුම් හොරෙන් අත්සන් කරන්නේ කොහොමද, ඒ ගිවිසුම් ගැන ජනතාව දැනගන්න ඕනෑ, පාර්ලිමේන්තුව දැනගන්න ඕනෑ" කියලා. නමුත්, තමුන්නාන්සේලා ඉන්දියාව එක්ක ගහපු ගිවිසුම් ටික ගැන රටට කිව්වේ නැහැ; චීනය එක්ක ගහපු ගිවිසුම් ටික ගැන කිව්වේත් නැහැ. තමුන්නාන්සේලා ඇමෙරිකාව සමඟත් ගිවිසුමක් ගැහුවා. නේපාලය ගහන්න අකමැති වෙච්ච ගිවිසුම තමුන්නාන්සේලා ශ්‍රී ලංකාවේ ගැහුවා, ඇමෙරිකාවත් එක්ක. ඒකත් මතක තියා ගන්න. තමුන්නාන්සේලා මේ කරන්නේ මොනවාද? දැන් අපට අයිතිව තිබෙන්නේ මොනවාද? අපේ භූමිය තිබෙනවා, අපේ අහස තිබෙනවා, අපේ මුහුද තිබෙනවා. මේ සියල්ල දැන් අපට අයිතිද, නැද්ද? තමුන්නාන්සේලා මේවා කාට හරි පාවා දීලාද? එහෙම නැත්නම් විශේෂයෙන්ම මේ ගිවිසුම් හරහා අපව පාලනය කරන්න අවශ්‍ය කරන අයිතිය තමුන්නාන්සේලා ඒ අයට දීලාද කියා මේ වෙලාවේදී කථා කරලා පැහැදිලිව, හරියාකාරව රටට කියන්න ඕනෑ.

අපේ තානාපති සේවය අරගෙන බලන්න. තානාපති සේවයට පත් කිරීම් කරද්දී තමුන්නාන්සේලා කරන දේ අපි දන්නවා. තානාපතිතුමා සමහර වෙලාවට Foreign Service එකෙන් පත් වුණත්, first officer, second officer ආදි අය අප දන්නා විධියට පැලවත්තෙන් ගිහිල්ලා තිබෙන්නේ. පැලවත්තෙන් ගියාට කමක් නැහැ, පැලවත්තෙන් යන කෙනා දක්ෂයෙක් වෙන්න ඕනෑ; දක්ෂයෙකු හැටියට ගිහිල්ලා රට වෙනුවෙන් අවශ්‍ය වැඩ කොටස කරන්න ඕනෑ. විශේෂයෙන්ම තානාපති කාර්යාලයක් ගත්තාම, අදාළ රටවල් එක්ක තමුන්නාන්සේලාට තිබෙන සම්බන්ධතාව, ඒ තානාපති කාර්යාල හරහා අපට ඒ ඒ රටත් එක්ක කරගන්න තිබෙන දේවල් ටික මොනවාද කියලා හරියට හඳුනාගන්න ඕනෑ. තමුන්නාන්සේලා ඒ ටික හරියට හඳුනාගෙන නැහැ. නමුත්, අපි හැම රටකම තානාපති කාර්යාලවල ක්‍රියාවලිය සහ ඒ අය වැඩ කරන ආකාරය පිළිබඳව, ශ්‍රී ලාංකිකයන් සහ අනෙකුත් ජාතීන් එක්ක ඒ අය සම්බන්ධ වන ආකාරය පිළිබඳව ඉතා විමසිල්ලෙන් ඉන්නවා විතරක් නොවෙයි, ඒවායේ සියලු තොරතුරු අරගෙනයි ඉන්නේ.

තානාපති කාර්යාල හරහා ලංකාවට ගොඩක් දේවල් ලබා දෙන්න තමුන්නාන්සේලාට පුළුවන්. එකක් තමයි, ලංකාවේ ගෞරවය, අභිමානය ආරක්ෂා වන විධියට, ලංකාවේ සංස්කෘතිය ආරක්ෂා වන විධියට, ජාතියක් හැටියට "අපි ශ්‍රී ලාංකිකයෝ" කියන නම ගෙන යන්න අවශ්‍ය වැඩසටහන හදන එක. දෙවැනි කාරණය තමයි, වෙළෙඳ පොළ සමීක්ෂණය කිරීම. මොකද, අපි වෙළෙඳ පොළ හඳුනාගන්නේ නැතුව මේ රටේ මොන නිෂ්පාදනය කළත් වැඩක් නැහැ, අපනයන ක්ෂේත්‍රයට පිවිසුණාට වැඩක් නැහැ. මොකද, අපට අපනයන ක්ෂේත්‍රයේ කටයුතු කරන්න බැහැ, තමුන්නාන්සේලාත්, අපත් ඒ වෙළෙඳ පොළ හරියාකාරව හඳුනාගත්තේ නැත්නම්.

ඒ රටේ වෙළෙඳපොළ හඳුනාගන්න, තානාපති සේවයත් එක්ක සම්බන්ධ වෙන්න අනෙක් අමාත්‍යාංශ ටික තිබෙනවා. විශේෂයෙන්ම වෙළෙඳ අමාත්‍යාංශය ගත්තාම, මුදල් අමාත්‍යාංශය

ගත්තාම, අනෙකුත් අමාත්‍යාංශ ඒක රාශි කරගෙන වැඩසටහනක් හදන්න ඕනෑ. හැබැයි, ඒ වැඩ පිළිවෙළ තමුන්නාන්සේලා හදලා නැහැ. තමුන්නාන්සේලාට පුළුවන්, සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් වැඩසටහනක් සකස් කරන්න. විදේශ රැකියා සම්බන්ධව, සේවා සම්බන්ධව, අධ්‍යාපනය සහ විශේෂයෙන්ම සෞඛ්‍ය සම්බන්ධව වැඩසටහන් රාශියක් හදන්න පුළුවන්. රට දියුණු කරන්න නම්, එක තානාපති කාර්යාලයකින් ගන්න තිබෙන වැඩ කොටස් කියන්න බැරිතරම් ප්‍රමාණයක් තිබෙනවා. මොකද, අපේ රට දූපතක්. අපේ රට පිහිටා තිබෙන්නේ, ලෝකයේ ඉතාම ප්‍රබල ස්ථානයක. අපේ රටේ පිහිටීමේ ස්ථානය අනුව අනෙක් රටවලට අපි අත්‍යවශ්‍ය වෙනවා. හැබැයි, අපි ඒකෙන් හරියට ප්‍රයෝජන අරගෙන නැහැ. තමුන්නාන්සේලාගෙන් මම විශේෂ ඉල්ලීමක් කරනවා. ඉදිරි කාලය තුළ තමුන්නාන්සේලාට මේක කරගන්න බැරි නම්, - අපේ ඉන්නවා දක්ෂයෝ ටිකක් - තමුන්නාන්සේලා බංකුවක් අරගෙන ආවොත්, වාඩි කරගෙන ඒක ගැන කියා දෙන්න අපට පුළුවන්. ඒක කියලා දෙන්න අවශ්‍ය කරන වැඩසටහන අපි ඉදිරි කාලයේදී හදන්නම්. මොකද, මේ ආකාරයෙන්ම මේක සිද්ධ වුණේ නැතිනම් මොකද වෙන්නේ? එක පැත්තකින්, තමුන්නාන්සේලා ආණ්ඩුවක් - රජයක් - හැටියට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඒවාට සහභාගි වෙලා රට බාල්දු කරලා, හැල්ලුවට ලක් කරලා එනවා. අනෙක් පැත්තෙන්, තානාපති සේවයත් එක්ක සම්බන්ධීකරණය වෙච්ච, රටට ගන්න තිබෙන අනෙකුත් අවස්ථා ටික නැති කරනවා. විශේෂයෙන්ම විදේශ රැකියා ක්ෂේත්‍රය ගත්තාම, තානාපති කාර්යාල හරහා එය ඉහළටම ඔසවන්න පුළුවන්.

අද ලෝකයේ හැම රටක්ම වෛද්‍යවරු ඉල්ලනවා; nursesලා ඉල්ලනවා; විශේෂයෙන්ම IT ක්ෂේත්‍රයේ අය ඉල්ලනවා; ඉංජිනේරුවන් ඉල්ලනවා; හෝටල් ක්ෂේත්‍රයට ඉල්ලනවා; රියැදුරු මහත්වරු ඉල්ලනවා. හැබැයි, පෞද්ගලික අංශය ගිහිල්ලා හොයා ගෙන එන රැකියාවලට barriers දමන්න වැඩසටහන හදනවා ඇරෙන්න, තමුන්නාන්සේලා රජයක් හැටියට රටට අවස්ථාවක් ගෙනාවේ කවදාද? එහෙම අවස්ථාවක් තමුන්නාන්සේලා ගෙනැල්ලා නැහැ. තමුන්නාන්සේලා බොහෝ වෙලාවට හිතාගෙන ඉන්නේ, තමුන්නාන්සේලා කරන දේ හරි කියලා. තමුන්නාන්සේලා බොහොම උද්ධච්ච විධියට හැසිරෙනවා. තමුන්නාන්සේලා විදේශ සේවයේ සිටින සමහර නිලධාරින්වත් පාවිච්චි කරන්නේ වැරදි ක්‍රමයකට. තමුන්නාන්සේලා හිතනවා, ඒගොල්ලන්ටත් වඩා තමුන්නාන්සේලාට දැනුම තිබෙනවා කියලා. අපි දන්නවා, විදේශ කටයුතු අමාත්‍යාංශයේ හොඳ දැනුම් සම්භාරයක් ඒක රාශි කරගත්ත, පළපුරුද්ද තිබෙන විශ්‍රාමික අය ඉන්න බව. ඒ වාගේම දැනට වැඩ කරන අයත් ඉන්නවා. හැබැයි, ඒ අයගෙන් වැඩ ගන්නේ නැහැ. තමුන්නාන්සේලා කටයුතු කරන්නේ හරියට, තමුන්නාන්සේලා Foreign Service එකේ හිටපු අය සහ ඒ අය අට පාස් අය විධියට සලකලා. එහෙම කරලා මේ වැඩේ කරන්න බැහැ. මතක තියාගන්න, ඒක හරියට හඳුනාගන්න. එහෙම නොකර තමුන්නාන්සේලාට ඒ වැඩේ කරන්න බැහැ.

විශේෂයෙන්ම විදේශ රටවල සිටින අපේ ශ්‍රී ලාංකිකයන් ගැන කථා කළොත්, ඉතාලියේ refugees විධියට ඉන්න සමහර අයට ඒ රටේ උසාවියෙන් යම් අවස්ථාවක් දෙනවා. ඒ තමයි, පාස්පෝට් එක අරගෙන ආපුවාම ඒගොල්ලන්ට වීසා එක දෙනවා. දැන් පාස්පෝට් එක ගන්න තානාපති කාර්යාලයට ගියාම මොකක්ද කියන්නේ? පාස්පෝට් එක ගන්න ගියාම කියනවා, "වීසා එකක් නැහැ. ඒ නිසා පාස්පෝට් එක දෙන්න බැහැ" කියලා. මොන කෙහෙල්මල් රටක්ද මේක? අනෙක් රටවල් ඔක්කොම පාස්පෝට් එක නිකුත් කරනවා. මොකද, පාස්පෝට් එක දුන්නාම තමයි වීසා එක දෙන්නේ. එතකොට ඒ රටේ කෙනෙක් ඒ රටේ වීසා එක දෙනවා කියලා කියනකොට, අපේ ශ්‍රී ලාංකිකයන් ගැන අපි බලා ගන්නේ නැත්නම් මොකක්ද ඒ රට? මතක තියාගන්න, අපි රටක් හැටියට අපේ ශ්‍රී ලාංකිකයන් ආරක්ෂා කරගන්න ඕනෑ බව. ඒ අය තමයි දැනට අපට විශාල විදේශ විනිමයක් ලබා දෙන කණ්ඩායම. ඒ අය වෙනුවෙන් අඩු ගණනේ පාස්පෝට් එකක් ලබා දෙන්න අවශ්‍ය වැඩසටහන හදන්න බැරිද? එදා රට යද්දී තමුන්නාන්සේලා කිව්වා, මේ අය රට යන්නේ ආණ්ඩුව එපා වෙලා, අප්පිරියා වෙලා කියලා. සමහර තැන්වල එහෙම කිය කියා ඇඬුවා. හැබැයි, අද මේ අය රට යන්නේ මොකද? අද රට යනවා විතරක් නොවෙයි, අද වීසා නැතිව පිටරට ඉන්න කණ්ඩායම කොච්චරද බලන්න. ඒ අය යන්නේ ඇයි? ඒගොල්ලන් යන්නේ, ඒගොල්ලන්ට මේ ආර්ථික තත්ත්වයත් එක්ක මේ රටේ ජීවත් වෙන්න බැරි නිසායි. ඒ වාගේම ඒ අයට මේ රටේ ජීවත් වෙන ක්‍රමවේදයේ විශාල ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා ඒ අය ගිහින් ඒ රටවල වැඩ කරද්දී, අපි ඒ අයට පහසුකම් දෙනවා වෙනුවට, ඒ අයව ශක්තිමත් කරනවා වෙනුවට, ඒ අයව ආරක්ෂා කරනවා වෙනුවට, තානාපති කාර්යාලයට ආවාම අපි ඒ අයව එළවනවා නම්, ඒ තානාපති සේවය මොකක්ද? ඒ නිසා තානාපති සේවයේදී ඒ පිළිබඳව විශේෂත්වයක් දක්වන්න කියලා මම ඉල්ලනවා. අපි ලෝකයේ රටවලට කථා කරලා ඒ රටවල් හා සමානවම පුහුණු වැඩසටහනක් සකස් කරන්නේ නැත්තේ ඇයි? අපට පුහුණු ආයතන ගන්න පුළුවන්, ලෝකයේ හැම තැනකින්ම. ඒ පුහුණු වැඩසටහන්වලදී අපි බලාපොරොත්තු වෙන්න ඕනෑ, මේ රටේ ශ්‍රමිකයන්ව පුහුණු ශ්‍රමිකයන් හැටියට ඒ රටවලට යවන්න, ඒ රටවල භාෂාව උගන්වන්න, අලුත් තාක්ෂණය උගන්වන්න, ඒ රටවල නීති රීති උගන්වන්න. අපට මේ සියල්ලම කරන්න පුළුවන් ආයතන ටිකක් සකස් කරන්න පුළුවන්. ඒවා තමයි විදේශ රටවලින් අපි ආධාර හැටියට ඉල්ලන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අපි ආයෝජකයන් ගෙනෙන්න අවශ්‍ය වැඩසටහන් සකස් කරද්දී, විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ පළපුරුද්ද, හැකියාව සහ ආර්ථික ශක්තිය කියන සියල්ල පාවිච්චි කළ යුතු බව මතක තියාගන්න. ඒ නිසා අපි හැම රටකම තානාපති කාර්යාලය එක්ක සම්බන්ධීකරණය වෙච්ච තව සංවිධාන ගොඩක් හදන්න ඕනෑ.

තමුන්නාන්සේලා අද ගම්වල "ප්‍රජා ශක්ති" කියලා වැඩසටහනක් හදලා දේශපාලනය කරනවා. ඉටිගෙඩිය! ඒක නොවෙයි කරන්න ඕනෑ. හැබැයි, මේ කාරණය මතක තියාගන්න. හරි නම් තමුන්නාන්සේලා ඒ රටවලට ගිහිල්ලා ඒ රටවල ඉන්න දක්ෂ ශ්‍රී ලාංකිකයන් ඒක රාශි කරගෙන, තානාපති කාර්යාල සම්බන්ධීකරණය කරගෙන, යම් සංවිධාන ගොඩ නඟලා ඒ සංවිධාන මාර්ගයෙන් සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න ඕනෑ. එහිදී අධ්‍යාපනය සඳහා අවශ්‍ය කරන පහසුකම් ටික ලබාගන්න පුළුවන්, සෞඛ්‍ය සඳහා අවශ්‍ය පහසුකම් ටික ලබා ගන්න පුළුවන්, විවිධ සේවා ටික ලබාගන්න පුළුවන්. ඒ හා සමානව රැකියා අවස්ථා ටික ලබා ගනිද්දී තමුන්නාන්සේලාට විවිධ වූ ආයතන මෙහාට අරගෙන ඒ ආයතන මඟින් ශ්‍රමිකයන් පුහුණු කරලා ඒ රටවලට යවන්න පුළුවන්. ඒ රටවලින් බහිද්දී, - ඉතාලියෙන් බහිද්දී ඉතාලියේ කෙනෙක් විධියට; ජර්මනියෙන් බහිද්දී ජර්මනියේ කෙනෙක් විධියට; ඔස්ට්‍රේලියාවෙන් බහිද්දී ඔස්ට්‍රේලියාවේ කෙනෙක් විධියට; එංගලන්තයෙන්, ඇමෙරිකාවෙන් බහින කොටත් ඒ හා සමානවම - ඒ රටවලට හුරු කෙනෙකුව තමුන්නාන්සේලාට ඒ රටවලට යවන්න පුළුවන්. හැබැයි, තමුන්නාන්සේලා ඒ වැඩ කොටස කරන්නේ නැහැ.

ඊළඟට, මට කියන්න අමතක වුණු තව කාරණයක් තිබෙනවා. අපේ ශ්‍රීමතාණන්, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කරපු වැඩසටහන් පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

මම මේ ලේඛනය සභාගත කරන්නේ මේ නිසායි. අඩු ගණනේ 159දෙනා වන තමුන්නාන්සේලාවත් තේරුම් ගනීවි, මේක 76 අවුරුද්දක ශාපය නොවෙයි කියලා. තමුන්නාන්සේලා දැන් ඉන්නේ ශාපය උඩ ඉඳගෙන. ඒ නිසා, ඒ ශාපය නැහැ කියන එක තේරුම් ගනියි. ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් කරුණාවෙන් ඉල්ලනවා, මේ ලේඛනය කියවන්න, මේක බලන්න කියලා. ඒක තමයි නායකත්වය හරියට හඳුනා ගැනීම.

ඊළඟට, සංචාරක ව්‍යාපාරය ගැනත් මම කථා කරන්න ඕනෑ. අපේ රටේ සංචාරක ව්‍යාපාරය සිදු වෙන්නේ කොහොමද? මතක තබා ගන්න, අපේ රටේ සංචාරක ව්‍යාපාරය ගත්තොත්, පෞද්ගලික අංශය සොයා ගත්ත සුද්දෝ ටිකක් රටට ගෙනෙන එක විතරයි අද වෙනකොට සිද්ධ වෙන්නේ. අපි සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ කළ යුතු දේවල් මොනවාද? සමහර සංචාරකයෝ අපේ රටේ පරිසරය විඳින්න එනවා. අපේ රට ඉතා ලස්සන රටක්. ඒ වාගේම, අපේ රටේ පරිසරය ඉතා හොඳින් තිබෙනවා. ඒ වාගේම, ආගන්තුක සත්කාර පැත්තෙන් ගත්තාම, අපේ රටේ ජීවත් වන ජනතාව ඉතා හොඳ ජන කොට්ඨාසයක්. ඒ නිසා ඒක හඳුනා ගත්ත කණ්ඩායමක් අපේ රටට එනවා. මේ අය අපේ රටේ පරිසරය විඳින්න එනවා. ඊළඟට, මේ රටේ දේශගුණය විඳින්න එනවා. නිවාඩුව ගත කරන්න, නිදහසේ ආරක්ෂා සහිතව ඉන්න මේ රටට කණ්ඩායමක් එනවා. ඊළඟට, බෙහෙත් ගන්න එනවා. ලංකාවේ කෑම ටිකක් කාලා හොඳට විනෝද වෙන්න තව කණ්ඩායමක් එනවා. ඉගෙන ගන්න කණ්ඩායමක් එනවා. තවත් අය යම් කිසි සේවාවක් සපයන්න ලංකාවට එනවා. මේ විධියට මේ අය එනකොට තමුන්නාන්සේලා මොනවාද කරන්නේ? තමුන්නාන්සේලා driving licence එකක් දෙනවා. Driving licence එකක් දීලා මොකක්ද බලාපොරොත්තු වෙන්නේ? මේ driving licence එක ලබා දීමත් එක්ක මොනවාද වෙන්නේ කියලා අපි දකුණු පළාත අරගෙන බලමු.

දකුණේ හැම ගෙයක්ම සුද්දෝ කුලියට අරගෙන තිබෙනවා. සමහර ගොඩනැඟිලි හදන්න පටන් ගත්, අපේ රටේ සංචාරක ව්‍යාපාරයේ නිරත වන මහත්වරුන්ට මොකද වුණේ? ගොඩනැඟිල්ල භාගයක් හදන කොට, ඉතිරි ටික කරන්න ඒගොල්ලන්ට සල්ලි නැහැ. ඒගොල්ලන්ට අතහිත දෙන්න ආණ්ඩුවක් නැහැ, නියාමනය කරන්න ආයතනයක් නැහැ. ඒ හා සමානවම හරියට අතහිත දෙන්න බැංකුවක් නැහැ. ඒගොල්ලන් භාගයක් හදලා, ඉතිරි ටික අවසන් කරන්න සල්ලි නැති වෙනකොට කරන්නේ ඒක සුද්දෙකුට විකුණන එක, එහෙම නැත්නම් ඒක rent එකට දෙන එක. ඒ විධියට rent එකට දුන්නාම සුද්දා මොකද කරන්නේ? සුද්දා online හරහා තමයි, ඒ රටේ ඉඳලා ඒ හෝටලයට සුද්දෝ ටික ගේන්නේ. ඒ විධියට ගෙනෙද්දී ඒ සල්ලි ටික ගෙවන්නේ ඒ රටේදී. ඒක මතක තබා ගන්න. මෙහේදී නොවෙයි ගෙවන්නේ. ඒ සුද්දා මේ රටට ඇවිල්ලා එතැන ඉඳගෙන කරන්නේ මොකක්ද? ඔන්න, දැන් තමුන්නාන්සේලා driving licence එකකුත් දෙනවා, ඔහු වාහනයකුත් ගන්නවා, එහෙම නැත්නම් ත්‍රීවීල් එකක් අරගන්නවා. සමහර වෙලාවට ඒ එන සුද්දෝ ටික pool එකකට නාන්න අරගෙන යන්නේත් ඒ සුද්දාම තමයි. ඊළඟට, කොතැනක හරි තිබෙන ආයුර්වේද මධ්‍යස්ථානයකට ගෙනියනවා නම්, එතැනට ගෙනියන්නේත් අර සුද්දෝ ටිකම තමයි. එතකොට ඒ සුද්දන්ට තමයි ඒ සල්ලි ටිකත් හම්බ වෙන්නේ. ඒ සල්ලි ටිකත් ඔක්කෝම යන්නේ පිට රටට. අපේ ශ්‍රී ලාංකිකයන් උඩ බලාගෙන ඉන්නවා, මොකක්ද වුණේ කියලා. අපේ අයට හෙණ ගැහුවා වාගේ. අපේ මිනිස්සු සියලුදෙනාම පාරට බැහැලා තමුන්නාන්සේලා හොඳයි කියලා මේ ආණ්ඩුව හැදුවා නේ. දැන් ආණ්ඩුව හදලා උඩ බලාගෙන ඉන්නවා, මොකක්ද මේ කර ගත්තේ කියලා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, your time is over.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මට විනාඩියක් දෙන්න, ගරු සභාපතිතුමනි. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න. මොකද, මගේ විනාඩි දෙකක් ඉස්සෙල්ලා සොරා ගත්තා නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, එතුමාට විනාඩියක කාලයක් වැඩිපුර ලබා දෙන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
හොඳයි, එහෙම නම් මම විනාඩියක් ගන්නවා. කමක් නැහැ නේ. ගරු සභාපතිතුමනි, ඔබතුමා තරහා වෙන්න එපා. "ඔබතුමා ඔතැන වාඩි වෙන්න එපා, හිටගන්න" කියලා මම කියපු නිසා, ඔබතුමා මගේ වෙලාව කපාවි. එහෙම නොවෙයි. මොකද, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා නිසා තමයි අපට මේ පාර්ලිමේන්තුව හම්බ වුණේ. මම ඒකයි කිව්වේ, ඔබතුමාට ඉන්න අයිතියක් නැහැ කියලා. වෙන කාරණාවක් නිසා නොවෙයි, එහෙම කිව්වේ. තරහා වෙන්න එපා. *[බාධා කිරීමක්]* කොහොම හරි කමක් නැහැ. *[බාධා කිරීමක්]* නැහැ, රජින හෝ එදා තිබ්බ‍ අපේ ජාත්‍යන්තර සම්බන්ධතා අනුව තමයි, ඒ ඉතිහාසය අනුව තමයි මේවා ටික ඔක්කෝම ලැබුණේ. ඒවාට ශාප කරන්න එපා; මඩ ගහන්න එපා. ඒකෙන් ඉගෙන ගන්න. ඔබතුමන්ලාට ගොඩක් දේවල් ඒවායින් ඉගෙන ගන්න පුළුවන්. ඉගෙන ගෙන ඉස්සරහට යන්න. කමක් නැහැ.

අවසාන වශයෙන් මෙන්න මේ කථාවත් මම කියන්න ඕනෑ. මේ ටික ඔබතුමන්ලාට කියා දීලාම තමයි නතර වෙන්න ඕනෑ කියලා මම හිතුවා. Sri Lankans are a proud and dignified nation before the international community. We must never allow our country to be dragged into disgrace or embarrassment on the world stage.

Thank you very much.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Vijitha Herath. You have 15 minutes.

[පූ.භා. 10.26]

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
ගරු සභාපතිතුමනි, විදේශ කටයුතු, සංචාරක සහ විදේශ රැකියා කියන ක්ෂේත්‍ර තුනම ඒකාබද්ධ කර අපේ අමාත්‍යාංශය ගොඩ නැඟුවේ මේ රටට විදේශ විනිමය විශාල වශයෙන් ලබා

ගැනීමේ ඉලක්කය මතයි. අපේ විදේශ ප්‍රතිපත්තිය ඉතා පැහැදිලි, මධ්‍යස්ථ, මිත්‍රශීලී, ඒ වාගේම ප්‍රගතිශීලී විදේශ ප්‍රතිපත්තියක්. ඒ හරහා තමයි අපේ රට ලෝකය ඉදිරියේ ගෞරවයට, අභිමානයට පත් කළ හැක්කේ; පත් කළ යුත්තේ. අද ඒ අභිමානය අපි ලබාගෙන තිබෙනවා. විදේශ අමාත්‍යාංශය විධියට අපි නව සහයෝගිතා ක්ෂේත්‍ර වර්ධනය කර ගනිමින්, නව වෙළෙඳ පොළ විවෘත කර ගනිමින්, ද්විපාර්ශ්වික කලාපීය, බහුපාර්ශ්වික කටයුතු වැඩිදියුණු කර ගනිමින්, අපේ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය ශක්තිමත් කර ගනිමින්, ඒ වාගේම ලෝකය තුළ ඇති වන දේශගුණික විපර්යාස හා පාරිසරික ආරක්ෂාව පිළිබඳ කටයුතුවලට මැදිහත් වෙමින්, ලෝකය පුරා විසිර සිටින ශ්‍රී ලාංකික ඩයස්පෝරාවේ ඒ සියලු කටයුතු සඳහා මැදිහත් වෙමින් අපි අපේ කාර්යභාරය ඉටු කරමින් සිටිනවා.

මේ ගෙවුණු වසරක කාලය සම්බන්ධයෙන් අපි සතුටු වෙනවා. අපේ දැනට පවතින විදේශ දූත මණ්ඩල 63ක් තිබෙනවා. අපි මේ වසර ආරම්භයේදීම නවසීලන්තයේ මහ කොමසාරිස් කාර්යාලය ආරම්භ කරමින් නව විදේශ සම්බන්ධතා පවත්වාගෙන යන්න සමත් වෙලා තිබෙනවා. පසුගිය කාලයේ පැවැති ආණ්ඩු විසින් සයිප්‍රසයේ තිබුණු කොන්සල් ජනරාල් කාර්යාලය වසා දැම්මා. ශ්‍රී ලාංකිකයන් විශාල ප්‍රමාණයක් සයිප්‍රසයේ රැකියාවල නියුක්ත වෙනවා. අපි මේ වසර තුළ සයිප්‍රසයේ කොන්සල් ජනරාල් කාර්යාලය නැවත විවෘත කරලා ඒ කටයුතු දැන් ඉතා හොඳින් සිදු කරමින් යනවා. ඒ වාගේම ලබන වසරේ මුල් කාර්තුවේදී චීනයේ චෙන්ග්ඩු නගරයේත් නව කොන්සල් ජනරාල් කාර්යාලයක් ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. චීනයේ නගර කිහිපයක අපි දැනට කොන්සල් ජනරාල් කාර්යාල පවත්වාගෙන යනවා. චීනයෙන් ලංකාවට සංචාරකයන් විශාල ප්‍රමාණයක් ගෙන ඒම ඉලක්ක කරගෙන අපි චෙන්ග්ඩු නගරයේත් අලුතින් කාර්යාලයක් ආරම්භ කරනවා. මූලික වශයෙන් ඒ අයට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා අපි මෙම කොන්සල් ජනරාල් කාර්යාලයේ කටයුතු කරගෙන යන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම මම සතුටින් කියන්න කැමැතියි, මේ ගෙවුණු කාලය තුළ අපි රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් අපේ සම්බන්ධතා ශක්තිමත් කරගෙන තිබෙන බව. අපි ලෝකයේ සෑම රටක් එක්කම අපේ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පුළුල් කරගෙන තිබෙනවා; ඒ මිත්‍රශීලීත්වය අපි තහවුරු කරගෙන තිබෙනවා. ගෙවුණු වසර තුළ පමණක් රාජ්‍ය නායකයින් සහ විදේශ නායකයින් 20කට වැඩි ප්‍රමාණයක් අපේ රටට ආවා, අපේ රටත් එක්ක ඒ මිත්‍රශීලී රාජ්‍ය තාන්ත්‍රිකභාවයන් ශක්තිමත් කිරීම සඳහා. ඇත්තටම අපි ඒ පිළිබඳව සතුටු වෙනවා. එම නිල සංචාරවලට අමතරව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සලයේ මහ කොමසාරිස්වරයා අවුරුදු 9කට පස්සේ ලංකාවට පැමිණියා. අපි ඔහුට අවශ්‍ය පහසුකම් සියල්ල සැපයුවා. ඒ හරහා අපේ රටේ මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව විශ්වාසය තහවුරු කරන්න අපි සමත්වෙලා තිබෙනවා.

ඒ වාගේම අපේ රට ආර්ථික බංකොලොත්භාවයෙන් මුදාගන්න IMF එක, ලෝක බැංකුව සහ ADB එක විවිධ ආකාරයෙන් අපිත් එක්ක සහයෝගයෙන් කටයුතු කරනවා. එහි ප්‍රතිඵලයක් විධියට ලෝක බැංකුවේ සභාපතිවරයා මේ ගෙවුණු වසරක කාලය තුළ ලංකාවට ආවා. ලෝක බැංකුව හරහා ක්‍රියාත්මක වන විවිධ ආධාර වැඩසටහන්, ණය ආධාර වැඩසටහන් ශක්තිමත්ව ඉදිරියට ගෙන යන්න ඒ හරහා හැකියාව ලැබී තිබෙනවා.

ඒ වාගේම, රාජ්‍ය නායකයෙක් විධියට අපේ ගරු ජනාධිපතිතුමා නිල රාජ්‍ය සංචාර 8ක් කරනු ලැබුවා, ගරු අගමැතිතුමිය නිල සංචාර 6ක් කළා. ඒ හරහා අපි ඒ ඒ රටවල් සමඟ තිබුණු රාජ්‍ය තාන්ත්‍රික සබැඳියාව තවත් ශක්තිමත් කර ගත්තා. ඒ වාගේම එම රටවල ව්‍යාපාරික ප්‍රජාවත් එක්ක සහසම්බන්ධ වෙලා අපේ රටට නව ආයෝජන ගෙන එන්න, නව ව්‍යාපාරික අවස්ථා පුළුල් කර ගන්න එම සංවාද හරහා අපි සමත්වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, සමහර රටවල් එක්ක පවත්වාගෙන යා යුතු සහ අලුතින් පැවැත්විය යුතු දේශපාලන, ආර්ථික සංවාද වසර ගණනක් තිස්සේ සිදුවෙලා තිබුණේ නැහැ. මේ ගෙවුණු වසරක කාලය තුළ එවැනි රටවල් 9ක් සමඟ අපි ඒ දේශපාලන සංවාද වැඩසටහන් ආරම්භ කළා. අවුරුදු 7කට පස්සේ අපි භූතානය එක්ක දේශපාලන සංවාද ආරම්භ කරලා, අදාළ ගිවිසුම්වලට එළඹෙන්න කටයුතු කර තිබෙනවා. බංග්ලාදේශය සමඟ අවුරුදු 7ක් තිස්සේ කිසිදු දේශපාලන සම්බන්ධයක් තිබිලා නැහැ.

අපි මේ වසරක පාලන කාලය තුළ නැවත එම දේශපාලන සංවාද ආරම්භ කළා. නෙදර්ලන්තය සමඟ අවුරුදු 4ක කාලයක් එම දේශපාලන සංවාද පවත්වා තිබුණේ නැහැ. නමුත් මේ අවුරුද්ද තුළ අපි නෙදර්ලන්තය සමඟ අලුතින් සාකච්ඡා ආරම්භ කර, එම දේශපාලන සංවාද වැඩසටහන් හරහා ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කරන්න සමත් වෙලා තිබෙනවා.

අපේ විදේශ කටයුතු අමාත්‍යාංශය තුළ පසුගිය කාලය පුරා - ඉතිහාසයේ - පැවැති තත්ත්වය කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා. ඉතාලිය ගැන එතුමා වැඩිපුර කථා කළා. හැබැයි, කියන්න ලජ්ජයි. ඉතාලියත් එක්ක මේ තාක් කාලයක් කිසිදු රජයක් එම දේශපාලන සංවාද පටන් ගෙන තිබුණේම නැහැ. අපේ රජය බලයට පැමිණියාට පසුව තමයි පළමුවැනි වතාවට ඉතාලියේ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා ලංකාවට ඇවිල්ලා අපේ නියෝජ්‍ය ඇමතිතුමා එක්ක, අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරි කණ්ඩායමක් එක්ක දේශපාලන, ආර්ථික සාකච්ඡා පවත්වා, අවබෝධතා ගිවිසුමක් හරහා එම දේශපාලන සංවාදය ශක්තිමත් කර තිබෙන්නේ. ස්විට්සර්ලන්තයත් එක්ක අවුරුදු 7කට පසුව අපි නැවත සාකච්ඡා ආරම්භ කළා. ජපානය, පිලිපීනය වැනි රටවල් සමඟ අවුරුදු 7ක් තිස්සේ දේශපාලන සංවාද පවත්වා තිබුණේ නැහැ. අපි මේ කෙටි කාලය තුළ එම රටවල් සමඟ සංවාද ආරම්භ කර එම ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කරගෙන තිබෙනවා. ඒ වාගේම ඇත්තටම ගත්තොත්, තායිලන්තය, එක්සත් ආරාබි එමීර් රාජ්‍යය එක්ක අවුරුදු 11කට පසුව සාකච්ඡා පවත්වා විදේශ සම්බන්ධතා නැවත ශක්තිමත් කරන්න මේ කෙටි කාලය තුළ අපි සමත් වුණා. ඒ අනුව පසුගිය මාස කිහිපය ඇතුළත එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ශ්‍රී ලංකාව අතර ආයෝජන ප්‍රවර්ධනය ශක්තිමත් කිරීමට අදාළ ගිවිසුම - Agreement between the Democratic Socialist Republic of Sri Lanka and the United Arab Emirates on the Promotion and Reciprocal Protection of Investments - පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීමට අපට හැකි වුණා.

එක්සත් අරාබි එමීර් රාජ්‍යය අද අපේ රටේ ආයෝජනය කරන්න විශාල කැමැත්තක් දක්වනවා. එම විශ්වාසය තහවුරු වුණා. එම විශ්වාසය තහවුරුවීමත් එක්ක ගරු ජනාධිපතිතුමාට ආරාධනාවක් ලැබුණා. එම ආරාධනාව අනුව අපි එම රාජ්‍ය නායකයන් මුණ ගැසුණා; සාකච්ඡා පැවැත්වුවා. මේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විදේශ ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිතුමා අපේ ලංකාවට අවස්ථා කිපයකදීම පැමිණියා. ගෙවුණු වසරක කාලය තුළ අපේ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා හරහා අපි අලුතින් ගිවිසුම් 70ක් ඇති කරගෙන තිබෙනවා. ආර්ථික, දේශපාලන, පාරිසරික, සමුද්‍රීය ආදී විවිධ ක්ෂේත්‍රවලට අදාළව අවබෝධතා ගිවිසුම් 70ක් අපි මේ කෙටි

[ගරු විජිත හේරත් මහතා]

කාලය තුළ අත්සන් කර තිබෙනවා. ඒක විශාල ජයග්‍රහණයක්. කෙටි කාලයක් තුළ දකුණු ආසියානු රටවල් සමඟ ගිවිසුම් 20ක්, නැඟෙනහිර ආසියානු රටවල් සමඟ ගිවිසුම් 19ක්, ඒ වාගේම අග්නිදිග හා මධ්‍යම ආසියානු රටවල් සමඟ ගිවිසුම් 8ක්, යුරෝපා හා උතුරු ඇමෙරිකානු රටවල් සමඟ ගිවිසුම් 15ක්, මැද පෙරදිග රටවල් සමඟ ගිවිසුම් 4ක්, ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු රටවල් සමඟ ගිවිසුම් 4ක් ඇති කරගෙන තිබෙනවා. ඔක්කෝම එකතු කළාම, මේ පුංචි කාලය තුළ අපි මේ රාජ්‍යයන් සමඟ නව ගිවිසුම් 70ක් අත්සන් කරලා තිබෙනවා; එකඟතාවන් ඇති කරගෙන තිබෙනවා; අපේ රාජ්‍ය තාන්ත්‍රික බැඳීම තවත් ශක්තිමත් කරගෙන තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා තවත් තහවුරු කර ගන්න, ඉදිරියට ගෙන යන්න අවශ්‍ය කටයුතු අපි කරලා තිබෙනවා. විශේෂයෙන් ලතින් ඇමෙරිකානු සහ කැරිබියානු කලාපය සමඟ ඇති රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා යම්කිසි දුර්වල මට්ටමක තිබුණා. විශේෂ මැදිහත් වීමක් කරලා Antigua and Barbuda, Belize කියන රාජ්‍යයන් සමඟ අලුතින් රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා අපි ආරම්භ කළා. ඒ පිළිබඳව අපි එකඟතාවලට, ගිවිසුම්වලට එළඹුණා. මේ රටවල් සමඟ අලුත් diplomatic relations අපි ආරම්භ කළා. ඒකත් මේ කෙටි කාලය තුළ සිදු වෙච්ච දෙයක්.

ගරු සභාපතිතුමනි, ආර්ථික ක්ෂේත්‍රයේ විශාල වශයෙන් ආයෝජන ගෙන්වා ගන්න, ව්‍යාපාර අවස්ථා පුළුල් කර ගන්න ඒ ව්‍යාපාර ප්‍රජාවත් එක්ක B2B ගිවිසුම් කිහිපයකට අපි එළඹුණා. රජය ව්‍යාපාරවල යෙදෙන්න එන්නේ නැහැ. ඇත්තටම ඒ කාර්යය කරන්නේ රජය නොවෙයි. පෞද්ගලික අංශය තමයි ඒ කාර්යය කරන්නේ. විදේශ රැකියා අවස්ථා ලබා ගන්නේත් පෞද්ගලික අංශය. අපි කරන්නේ ඒකට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම. ඒ නිසා මේ කාරණය වරද්ද ගන්න එපා. විදේශ රැකියා ගෙන ඒමට අවශ්‍ය රජයන්-රජයන් අතර ගිවිසුම් අත්සන් කිරීම, රජයන්-රජයන් අතර බැඳීම් ශක්තිමත් කිරීම, අපේ රටේ පුහුණු ශ්‍රමිකයන්ට ඒ රටවල රැකියා අවස්ථා පුළුල් කර ගැනීම වැනි දේවල් අපි කරනවා. හැබැයි, රැකියා අවස්ථා ලබා දීමට මැදිහත් වන්නේ පෞද්ගලික රැකියා ආයතනයි. ඒක තමයි අපේ ප්‍රතිපත්තිය. ඒක ඉතා හොඳින් කෙරෙනවා.

ව්‍යාපාර සම්බන්ධයෙනුත් එහෙමයි. පෞද්ගලික අංශය ව්‍යාපාර කරනවා, ආයෝජන ගෙනෙනවා, අපේ අපනයන ගෙන යනවා. හැබැයි, ඒකට අවශ්‍ය පහසුකම් සැලසීම, ඒ සම්බන්ධතා තහවුරු කිරීම තමයි විදේශ කටයුතු අමාත්‍යාංශය පැත්තෙන් කෙරෙන්නේ. අපි ඒ සම්බන්ධයෙන් මේ අවුරුද්දක කෙටි කාලය තුළ විශාල මැදිහත්වීම් ගණනාවක් කරලා තිබෙනවා. අපි සමත් වෙලා තිබෙනවා, විදේශ සමාගම් 150ක් සමඟ අලුත් ආයෝජන අවස්ථාවලට යන්න. ඒ අනුව අවුරුද්දක කෙටි කාලය තුළ විදේශ සමාගම් 150කට වැඩි ප්‍රමාණයකට අපි අලුත් ආයෝජන අවස්ථාවලට ඉඩ පහසුකම් සැපයුවා. ඒ විතරක් නොවෙයි. එවැනි ව්‍යාපාරික ආයෝජන සමාගම් 2,000ක් එක්ක අපි අපේ අදහස් හුවමාරු කරගෙන තිබෙනවා. අපේ රට පිළිබඳව අපි ඔවුන් දැනුවත් කර තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා, ඒ දැනුවත් කිරීමේ අඩිතාලම හරහා තව බොහෝ ආයෝජකයින්, විදේශ ව්‍යාපාරිකයන් ලංකාවේ ව්‍යාපාරවලට සම්බන්ධ වෙයි කියලා. මේ තුළින් අපේ රටේ ව්‍යාපාරිකයන්ට වෙනත් රටවල ව්‍යාපාර කටයුතු කිරීමට ලැබෙන අවස්ථාව පුළුල් වනවා. ඒ වාගේම අනෙක් රටවල තිබෙන එවැනි ව්‍යාපාර සංගම් එක්ක ගිවිසුම්වලට එළඹෙන්න Ceylon Chamber of Commerce සඳහා පුළුවන්කමත් මේ තුළින් ලැබෙනවා. මෑතකදී Federation of Saudi Chambers සහ Federation of Chambers of Commerce and Industry of Sri Lanka මමත් ඉන්න වෙලාවක අලුත් ගිවිසුමක් අත්සන් කළා. එවැනි ගිවිසුම් ගණනාවක් පසුගිය කාලයේ අපි අත්සන් කළා, අපේ පෞද්ගලික අංශයේ ආයතනත්, ඒ රටවල තිබෙන පෞද්ගලික අංශයේ ආයතනත් එක්ක. ඒවායෙන් තමයි වෙළඳ අවස්ථා, ව්‍යාපාරික අවස්ථා පුළුල් වන්නේ; ආයෝජන අවස්ථා පුළුල් වන්නේ. ඉතින් ඒ මැදිහත් වීම ගැන ඇත්තටම අපි සතුටු වනවා; රටක් විධියට අපි ආඩම්බර වනවා. ඒ වාගේම රටේ බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන්, ආහාර සැපයුම සම්බන්ධයෙන්, ඒ වාගේම බෙහෙත් ද්‍රව්‍ය රටට ලබා ගැනීම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය විධියට ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික සම්බන්ධතාවලදී අපි මැදිහත් වෙලා තිබෙනවා වාගේම මේ කෙටි කාලය තුළ අපි ඒ සම්බන්ධව බොහෝ ජයග්‍රහණත් ලබාගෙන තිබෙනවා.

ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් කිව්වොත්, ඔබතුමන්ලා දන්නවා, අපි ISB loans restructure කළ බව. හැබැයි, අපේ ද්විපාර්ශ්වික ණය restructure කිරීම ඉතිරි වෙලා තිබුණා. ඉතින් අපි මේ කෙටි කාලය තුළ එක්සත් රාජධානියත් එක්ක, ප්‍රංශයත් එක්ක, හන්ගේරියාවත් එක්ක, ජපානයත් එක්ක, ඉන්දියාවත් එක්ක, සවුදි අරාබියත් එක්ක, ඕස්ට්‍රේලියාවත් එක්ක අපේ ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගතකරණය අවසන් කරන්න මුදල් අමාත්‍යාංශයත්, මහ බැංකුවත්, ඒ වාගේම විදේශ කටයුතු අමාත්‍යාංශයත් අන්තර් සම්බන්ධතාවකින් යුතුව කටයුතු කළා. ඒ තුළින් විශාල ජයග්‍රහණ ලබා ගන්නත් අපට පුළුවන් වෙලා තිබෙනවා.

අපි කවුරුත් දන්නවා, ඇමෙරිකා එක්සත් ජනපදයේ ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා විසින් ලංකාවට සියයට 44ක විශේෂ තීරු බද්දක් පනවපු බව. මුදල් අමාත්‍යාංශයේත්, ඒ වාගේම විදේශ කටයුතු අමාත්‍යාංශයේත් විශේෂ මැදිහත් වීම යටතේ අපි සමත් වුණා, එය සියයට 20ට අඩු කර ගන්න. ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා පසුගිය 13වැනි දා නව නියෝගයක් නිකුත් කරලා තිබෙනවා, අපේ සමහර ආහාර ද්‍රව්‍යත් zero-tariff තත්ත්වයට ගෙන එන්න. ඉතින් අපි ඒ සම්බන්ධීකරණය හරහා තමයි මේ සියලු ජයග්‍රහණ අත්කර ගත්තේ. බොහෝ රටවලට ඒක කර ගන්න බැරි වුණා. අසල්වැසි ඉන්දියාවට පවා ඒ තත්ත්වයට එන්න බැරි වුණා. නමුත් රටක් විධියට අපි සමත් වුණා, සියයට 44ක් ලෙස පනවා තිබුණු tariff එක සියයට 20ට අඩු කර ගන්න. ඒ සාකච්ඡාව තවමත් ඉස්සරහට යනවා. තවම අප අතර agreement එකක් අත්සන් කරලා නැහැ. අපි එකඟතා සාකච්ඡා කරමින් යනවා. සාකච්ඡා වට 17ක් අපි පවත්වා තිබෙනවා. ඒ සාකච්ඡා වට 17 පුරාවට සාකච්ඡා කරලා තමයි මේ සහනය ලංකාවට ගෙන එන්න අපි සමත් වුණේ.

ඒ වාගේම අවුරුදු 13කට පස්සේ ලබන 2026 අවුරුද්දේදී අපේ අපනයන සංවර්ධන මණ්ඩලයත්, විදේශ කටයුතු අමාත්‍යාංශයත්, තවත් රජයේ ආයතනත්, අපේ විදේශ තානාපති කාර්යාල සහ මහ කොමසාරිස් කාර්යාලත් ඒකාබද්ධව Sri Lanka Expo එක පවත්වන්න අපි කටයුතු සූදානම් කරනවා. ඒ, අපේ ආර්ථිකය ශක්තිමත් කරන්න. ඒ කටයුතු අපි දැනටමත් සැලසුම් කරලා තිබෙනවා. ඒ හරහා අපි බොහෝ ජයග්‍රහණ ලබා ගන්නත් මැදිහත් වනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලය තුළ අපි බහුපාර්ශ්වීය ආර්ථික කටයුතු සම්බන්ධයෙන්, IORA එකේ සභාපතිත්වය දරලා ඒ හරහා ඒ අමාත්‍යවරුන්ගේ සමුළු පැවැත්වූවා. Ceylon Chamber of Commerce එකත් එක්ක, IORA එකේ සාමාජික රටවල් එක්ක අපි විවිධ සමුළු පැවැත්වූවා. ඒ හරහාත් වෙළෙඳ සහයෝගීතාව තවත් ශක්තිමත් කර ගත්තා. අපි Colombo Planහි 74වෙනි සංවත්සරය කොළඹදී පැවැත්වූවා. අපි රටක් විධියට, විදේශ කටයුතු අමාත්‍යාංශය විධියට ඒ සබැඳියාවත් ශක්තිමත් කර

ගත්තා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ සැසිවාරයේදී පලස්තීන ජනතාවගේ ස්වාධීන අයිතිය වෙනුවෙන් අපේ ශක්තිමත් ස්ථාවරය, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථාවරය අපේ ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව සඳහන් කළා. ජිනීවා මානව හිමිකම් කවුන්සලයේදී රටේ ආරක්ෂාව වෙනුවෙන්, රටේ ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් ඉතා මධ්‍යස්ථව අපි කටයුතු කර තිබෙනවා. ජිනීවා මානව හිමිකම් කවුන්සලය "යකෙක්" කියලා අපි කියන්නේ නැහැ, "දෙවියෙක්" කියලා කියන්නේත් නැහැ. අපේ රට පිළිබඳව, මානව හිමිකම් ආරක්ෂා කිරීම පිළිබඳව, දේශීය යන්ත්‍රණයක් තුළ කටයුතු කරන අපේ ස්ථාවරය ඉතා පැහැදිලිව, නිරවුල්ව අපි ඉදිරිපත් කර තිබෙනවා. එවැනි ජයග්‍රහණ ගණනාවක් මේ කෙටි කාලය තුළ අපි ලබාගෙන තිබෙනවා. රටක් විධියට අපි සතුටු වනවා, මේ කෙටි කාලය තුළ විදේශ කටයුතු අමාත්‍යාංශය විධියට ලබා ගත් ජයග්‍රහණ පිළිබඳව.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. Sajith Premadasa. You have 17 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 10.42]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු සභාපතිතුමනි, අපි හැමෝම දන්නවා, රටේ උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව බුදු දහමට ප්‍රමුඛස්ථානයක් පිරිනැමෙන බව. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II වන පරිච්ඡේදයේ සඳහන් වෙලා තිබෙනවා. ඒ වාගේම බුද්ධ ශාසනය සුරක්ෂිත කිරීම, පෝෂණය කිරීම රජයේ වගකීමක් වනවා. ඒ වාගේම අනෙකුත් ආගම්වලටත් -සෙසු ආගම්වලටත්- නිසි ස්ථාවරය, නිසි තැන, නිසි පිළිගැනීම ලබා දීම පිළිබඳවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතාම පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා.

1951දී ආරම්භ කරපු විහාරස්ථානයක් තමයි, ත්‍රිකුණාමලය ශ්‍රී සම්බුද්ධ ජයන්ති බෝධිරාජ විහාරය. විශේෂයෙන්ම එය 2010 වසරේදී බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබෙනවා. ඒ වාගේම එයට පූජා භූමි ඔප්පුවක් පිරිනමලාත් තිබෙනවා. ඒ විහාරස්ථානය තුළ බෞද්ධ ආගමට අදාළ සියලු කාර්යයන් ඉෂ්ට කිරීම සඳහා වූ නිදහස ඒ ගෞරවනීය ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ප්‍රමුඛ දායක සභාවේ සාමාජිකයන්ට තිබෙනවා. ඒක තමයි රටේ නීතිය. ඒක තමයි අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය, බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දෙමින්, සෙසු ආගම්වලටත් නිසි තැන ලබා දෙමින් කටයුතු කිරීම. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද ඒ පූජා භූමියට පොලීසිය ඇතුළු වෙලා බුදු පිළිමය තියන්න ඕනෑ තැන තීන්දු කරනවා, ඒ වාගේම දහම් පාසල් ගොඩනැඟිලි ඉදිකළ යුතු ආකාරය පිළිබඳව, ඒවාට තහංචි පැනවීම පිළිබඳව නියෝග නිකුත් කරනවා. විශේෂයෙන්ම මම අහන්න කැමැතියි, මේ විධියට කටයුතු කිරීම තුළින් ජාතික සමගියට එරෙහිව, රට තුළ තිබිය යුතු එකමුතුභාවයට එරෙහිව අපේ ජන සමාජය තුළ ජාතිවාදී බලපෑම් කරන්නට බලාගෙන ඉන්න කණ්ඩායම්වලට උල්පන්දම් දීමක් නේද මේ සිද්ධ වන්නේ කියලා.

පූජා භූමි ඔප්පුවකුත් තිබෙන විහාරස්ථානයක් තුළ ආගමික කටයුතු, දහම් වැඩකටයුතු, ධර්මයට අදාළ වැඩකටයුතු ක්‍රියාත්මක කිරීමේ නිදහස තිබෙනවා. මොනයම් හෝ ගැටලුවක් තිබෙනවා නම් අදාළ ත්‍රෛනිකායික මහා සංඝ රත්නය හමු වෙලා, මහා නායක හිමිපාණන් වහන්සේලා හමු වෙලා, සාකච්ඡාමය මාර්ගයෙන් එම වැඩකටයුතු කෙරෙන්නට ඕනෑ. එහෙම නැතුව මහ රෑ පොලීසිය යවලා පූජා භූමි ඔප්පුවක් තිබෙන විහාරස්ථානයක් තුළ සිදු වන සංවර්ධනමය වැඩකටයුතුවලට කොහොමද පොලීසිය අත ගහන්නේ? කාගේද ඒ නියෝග? කවුද මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්නේ? රජයට අපි කියනවා, රටේ උත්තරීතර නීතිය නොදන්නේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II සහ III පරිච්ඡේද කියවා බලන ලෙස. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II සහ III පරිච්ඡේදවල ඡායා පිටපත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බුදු දහමට ලබා දීලා තිබෙන ප්‍රමුඛස්ථානය පිළිබඳව වාගේම සෙසු ආගම්වලටත් ලබා දීලා තිබෙන ඒ නිසි තැන පිළිබඳව සහ ආගමික සමගිය තුළ මේ රට සාමකාමීව ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව නීතිය දන්නේ නැත්නම් කරුණාකරලා මේක හොඳට කියවලා බලන්න කියලා අපි රජයෙන් ඉල්ලීමක් කරනවා. වහාම මේ තත්ත්වය සමනය කරන්නට ජනාධිපතිවරයා ප්‍රමුඛ අදාළ බලධාරීන් ගෞරවනීය මහා නායක හිමිපාණන් වහන්සේලා ආමන්ත්‍රණය කරලා, හමු වෙලා, උන්වහන්සේලාගේ අවවාද, අනුශාසනා මත මේ ඇවිළෙන්නට යන ජාතිවාදී, ආගම්වාදී ගින්න නතර කරලා, කරුණාකරලා යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කරන්නට කටයුතු කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

මෙම කාරණාව පිළිබඳව දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා මේ ගරු සභාවේ කරුණු ඉදිරිපත් කරන්නට අවස්ථාව ඉල්ලනකොට කථානායකවරයා ඒක වැළැක්වීම වැරදි ක්‍රියාවක්. ඒ ගැන මම කනගාටු වනවා. උද්ගත වී තිබෙන ජාතික ප්‍රශ්නයකට රටේ අවධානයත්, පාර්ලිමේන්තුවේ අවධානයත් යොමු කරන්නට අවස්ථාව ආණ්ඩුව සහ විපක්ෂය කියන භේදයෙන් තොරව හැම මන්ත්‍රීවරයෙකුටම තිබෙනවා. අපි ඉල්ලීමක් කරනවා, ප්‍රජාතන්ත්‍රවාදය අහුරන්නට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ කරන ක්‍රියාවලිය කරුණාකරලා වහාම නතර කරන්න කියලා.

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා, කාලීන ගැටලු කිහිපයක් ඉදිරිපත් කරන්න. දැන් මහ කන්නයේ වැඩකටයුතු ආරම්භ කරලා තිබියදී රජයට බැරි වෙලා තිබෙනවා, පොහොර සහනාධාර අරමුදල් ලබා දෙන්න. ඒක බොරුවක් නොවෙයි, ඇත්තක්. ඒ ගැන නොදන්නවා නම් කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, තලාවට, රාජාංගනයට, නාමල්ඔය ව්‍යාපාරයට ගිහිල්ලා බලන්න කියලා. තවම ඒ ප්‍රදේශවලට පොහොර සහනාධාර අරමුදල් ලැබිලා නැහැ. පසුගිය කාලය පුරාවටම ඒ සහනාධාර අරමුදල්වලින් වැඩි

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ප්‍රතිශතයක් ලබා දීලා තිබෙන්නේ වගා කටයුතු අවසන් වෙනකොට. මේකද කාර්යක්ෂම රාජ්‍ය පාලනය? වගාව ඉවර වුණාට පස්සේ පොහොරවලට ලබා දෙන මුදල් ලබා දීමද ක්‍රමයේ වෙනස? මෙහෙමද ගොවියා රජ කරවන්නේ, මෙහෙමද ගොවියා රැක ගන්නේ, මෙහෙමද ගොවියාට සලකන්නේ කියලා මම අහන්න කැමැතියි. ඒ නිසා කරුණාකරලා මේ පොහොර සහනාධාර අරමුදල් ලබා දීමට වහා කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේදී රජයෙන් ඉල්ලා සිටිනවා.

විශේෂයෙන් මේ විෂයයට අදාළ තවත් කාරණාවක් පිළිබඳව මම කථා කරන්න කැමැතියි. ඒ, හදිසි මරණ පරීක්ෂකවරු පිළිබඳව. අපේ රටේ මරණ පරීක්ෂකවරු 500ක් පමණ ඉන්නවා. මේ අය 24 පැයම, සතියේ දින 7ම, 365 දවසේම විශාල කාර්යභාරයක් ඉෂ්ට කරනවා, මේ හදිසි මරණ පරීක්ෂකවරු. ඒ අයට ගමන් දීමනාව වශයෙන් ලැබෙන්නේ හැතැප්මකට රුපියල් 6යි, ගරු ඇමතිතුමනි. ඇත්තවශයෙන්ම ඒ රාජකාරිය ඉෂ්ට කරන්න, මරණයක් වෙනුවෙන් මේ අයට ලබා දෙන්නේ රුපියල් 1,000යි. වියදම යනවා, රුපියල් 1,700ක් විතර. අවුරුදු 7ක කාලයක් මේ දීමනාව යාවත්කාලීන කරලා නැහැ. 2019දී කැබිනට් පත්‍රිකාවක් අනුමත වුණා, රුපියල් 1,000 දීමනාව රුපියල් 2,500 කරන්න. නමුත්, ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ දීමනාව රුපියල් 3,000 බවට පත් කරන්න කියන එකයි ඒ අයගේ ඉල්ලීම.

ලිපි ද්‍රව්‍යවලට කිසිම සහනයක් ලැබෙන්නේ නැහැ. ඉස්සර තිබුණේ කොළ 5ක් පුරවන්න. නමුත්, දැන් කොළ 39ක් පුරවන්න තිබෙනවා. අවදානමක් අරගෙන තමයි හදිසි මරණ පරීක්ෂකවරු කටයුතු කරන්නේ. කොවිඩ් වසංගත සමයේ මේ අයගේ ජීවිත 3ක් අහිමි වෙලා තිබෙනවා. අනෙක් අයටත් වැඩි කිරීම් කරනවා කියනවා නේ. ඇයි, මේ අයටත් ඔවුන් ඉල්ලන ආකාරයට වැඩි කිරීමක් කරලා දෙන්න බැරි? ඒ අය ඉල්ලන්නේ රුපියල් 1,000 දීමනාව රුපියල් 3,000 බවට පත් කරලා දෙන්න කියලා. ඒ අයගේ රාජකාරිය තුළ තවත් රජයේ රැකියාවක් හෝ පෞද්ගලික අංශයේ රැකියාවක් කිරීම යථාර්ථවාදී නැහැ. එහෙම කරන්න අමාරුයි. වෙනත් ජීවනෝපායක් කරන්න බැහැ. ගරු ඇමතිතුමනි, ඒ අයට දීලා තිබෙන පත්වීම් ලිපිය ගැනත් ඔබතුමා පොඩ්ඩක් හොයා බලන්න. මේ අය අතර ඩිප්ලෝමාධාරින් ඉන්නවා, උසස් අධ්‍යාපනය කළ අය ඉන්නවා. ඒවාට ගරුත්වයක් ලැබෙන ආකාරයට පත්වීම් ලිපිය ලබා දෙන්නට ඕනෑ. ඒ වාගේම, විවිධ වසංගත පිළිබඳව වෛද්‍ය වාර්තා සකස් කිරීමේදී, සංඛ්‍යාලේඛන, දත්ත සකස් කිරීමේදි මේ අය ලොකු කාර්යභාරයක් ඉෂ්ට කරනවා. එම නිසා ඒ අය පිළිබඳ හොඳ අවබෝධයකින් යුතුව ඔබතුමන්ලා කටයුතු කරන්න. මරණයක් සිදු වුණාම බොහෝ දෙනෙකුගේ අවශ්‍යතාව වන්නේ ඉක්මනින් ඒ මරණය නිදහස් කරගන්න එක. ඒ සඳහා මේ අය සුවිශාල කැප කිරීමක් කරනවා. ඒ නිසා මම හිතනවා, ඒ අයව පගාකාරයින් හැටියට හංවඩු ගැසීම සුදුසු නැහැ කියලා. පගාකාරයින් ජන සමාජයේ හැම තලයකම, හැම තත්ත්වයකම සිටිනවා. ඒ නිසා එහෙම කියන්නේ නැතුව කරුණාකර ඒ අය ගැන බලන්න.

ගරු සභාපතිතුමනි, ඔබතුමාම දන්නවා, සාමාන්‍යයෙන් ගත්තොත් මරණ 80,000ක් පමණ සිදු වන බව. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 80ක් වැය කරනවා. ඉතින්, ඔවුන්ට දැනට ලබා දෙන රුපියල් 1,000 දීමනාව රුපියල් 3,000 දක්වා වැඩි කරන්නට තවත් අමතර රුපියල් මිලියන 160ක් පමණයි අවශ්‍ය වෙලා තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ අය ගැන අහිතක් හිතන්නේ නැතුව, මේ අයව පගාකාරයින් ගණනට දමන්නේ නැතුව, කරුණාකර මේ අයගේ ඉල්ලීම්වලට සවන් දෙන්න කියලා. සමථ මණ්ඩල කොමිෂන් සභාවක් හා සමානව හදිසි මරණ පරීක්ෂණ පිළිබඳවත් කොමිෂන් සභාවක් ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්නය කියලා මම මේ අවස්ථාවේදී බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, මම මතක් කරන්න කැමැතියි, මේ කාරණයත්. තවදුරටත් අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයට විශාල ශක්තියක් ලබා දුන් ගුරු සංවර්ධන නිලධාරින් 16,600ක් ඊයේ සවස් භාගයේ සිට ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට ඉන්නවා. මම අද උදේ ගිහින් ඒ අයව හමු වෙලායි මෙතැනට ආවේ. ඒකයි එන්න පොඩ්ඩක් ප්‍රමාද වුණේ. ඇයි, මේ අයට ලබා දුන් පොරොන්දු ටික ක්‍රියාත්මක කරන්නේ නැත්තේ? මැතිවරණයට පෙර මොකක්ද කිව්වේ? අනිවාර්යයෙන්ම ඔවුන් ගුරු සේවයට ගන්නවා, ඔවුන් විශිෂ්ට සේවාවක් ඉෂ්ට සිද්ධ කළාය කිව්වා. ඇත්තටම ඔවුන් විශිෂ්ට සේවාවක් ඉෂ්ට කළා. කොවිඩ් වසංගත සමයේ නිදහස් අධ්‍යාපන ක්ෂේත්‍රය කඩා වැටෙන්නට නොදී ඔවුන් දැවැන්ත වැඩ කොටසක් කළා. මොකක්ද, ඔවුන්ගේ ඉල්ලීම? අධිකරණයේ තිබෙන සමථකරණ තීන්දුව ක්‍රියාත්මක කරන්න කියන එක. මොකක්ද තීන්දුව? Postgraduate diploma එක සමත් වෙන්න වසර 3ක් ලබා දෙන්න, ඒ අතරතුර 2-II ශ්‍රේණියට අභ්‍යාසලාභී ගුරුවරුන් හැටියට බඳවා ගන්න කියන එක. ඇයි, මේ 16,600ට මේ යුතුකම ඉෂ්ට කරන්නට බැරි, ඔබ මැතිවරණයට පෙර - ජනාධිපතිවරණයට පෙර, මහ මැතිවරණයට පෙර, පළාත් පාලන මැතිවරණයට පෙර - කරනවාය කියලා පොරොන්දු වුණා නම්? රජයේ වගකිව යුතු ඇමතිවරු තමයි විපක්ෂයේ ඉඳගෙන මේවාට ප්‍රතිඥා ලබා දුන්නේ; ඒ පොරොන්දු ලබා දුන්නේ. ඒ කියපු දේවල්වල වීඩියෝ පට තිබෙනවා, හඬ පට තිබෙනවා. ඒක මුළු රජයම දන්නවා. ඇයි, මේ දෙය ක්‍රියාත්මක කරන්නෙ නැත්තේ? හරිනි අමරසූරිය ගරු අග්‍රාමාත්‍යවරියම කියා තිබෙනවා, උපාධි පත්වීම් 52,000ක් ලබා දෙන්න හැකියාව තිබෙනවා කියලා. ඒක, කැබිනට් සටහනක තිබෙනවා. එහෙනම් රැකියා විරහිත උපාධිධාරින් 35,000කගේත්, මේ ගුරු සංවර්ධන නිලධාරින් 16,600කගේත් ප්‍රශ්නය විසඳීම එතරම් අපහසු කාර්යයක් නොවෙයි. ඒ නිසා මම පැහැදිලිවම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. කරුණාකරලා සංවර්ධන නිලධාරින් 16,600ක් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ කටයුත්ත වහාම ක්‍රියාත්මක කරන්න, ලබා දුන් පොරොන්දු ටික ඉටු කරන්න කියලා. උපාධිධාරින් 35,000කගේ රැකියා ප්‍රශ්නය විසඳනවා කියපු පොරොන්දුව ඉෂ්ට සිද්ධ කරන්න; එය ක්‍රියාත්මක කරන්න.

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ පාර්ලිමේන්තුවේ ඉන්න හැම නිලධාරියෙකුම අගනා සේවාවක් ඉෂ්ට කරනවා. අපි ඒ නිලධාරින්ට චෝදනා මුඛයෙන් කථා කරන්න හොඳ නැහැ. මොනවා හරි ඌනතාවක්, විෂමතාවක්, අඩුපාඩුවක් තිබෙනවා නම් අපි ඒවා හදා ගනිමු. මොනවා හරි ගැටලුවක් තිබෙනවා නම්, අපි ඒවා සාකච්ඡා කරලා විසඳා ගනිමු. පාර්ලිමේන්තුවේ ඉහළ තනතුරුවල ඉන්න අය වාගේම පාර්ලිමේන්තුවේ ඉන්න පොඩ්ඩෝ ටිකත් -සාමාන්‍ය පුද්ගලයිනුත්- විශිෂ්ට සේවාවක් කරමින්, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය මේ 225දෙනාටම ක්‍රියාත්මක කරන්නට සහයෝගය ලබා දෙනවා. මේ සියලු දෙනාටම අපි ශක්තිය ලබා දෙන්න ඕනෑ. අපහාස කරලා, අවමාන කරලා, පැත්තකට තල්ලු කරලා කටයුතු කරන්නට හොඳ නැහැ. අපි දන්නවා, මේ රජයට බොහෝ අවස්ථාවලදී මුල අමතක වෙනවා කියලා. උද්ධච්ච වෙන්න හොඳ නැහැ. කුඩුප්පුරං වෙන්න හොඳ නැහැ. මහන්තත්තකමක් ඇති කර ගන්න එපා. මතක තබා ගන්න, ඔබට මේ බලය ලබා දෙන්නට මේ ජන සමාජයේ සියලුම තලවල සිටින අය උදවු කරපු බව. එදා, ඔබතුමන්ලා ගුරුවරුන්ව සැලකුවේ දෙවිවරු හැටියට. දෙවිවරු හැටියට සැලකුවේ ඡන්දය ගැන හිතලා නේද? අදත් එහෙමද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අදත් එහෙමයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

අදත් එහෙම නිසා වෙන්න ඇති, ගුරුවරු SMS ගහන්න දන්නේ නැහැ කියලා කියන්නේ. එහෙම කියන්නේ, ඒ අයව අදත් දෙවිවරු හැටියට සලකන නිසා වෙන්න ඇති. SMS ගහන්න බැරි වුණාට දෙයියනේ, කතිරය ගැහුවා නේ. ගුරුවරුන් කොයි තරම් සේවාවක් ඉෂ්ට කළාද? මහින්ද ජයසිංහ මැතිතුමා කියනවා, මෝඩ වුන් දෙන්න එපා කියලා. දැන්, ඔක්කෝම මෝඩ වුන් වෙලා ඉන්නේ, ගුරුවරුන්ට දෙනවා කියපු තුනෙන් දෙක නැතිව. කෝ, දෙනවා කියපු තුනෙන් දෙක? *[බාධා කිරීමක්]* මේ, ඔබතුමාට පෞද්ගලිකව පහර ගහනවා නොවෙයි. ඔබතුමා මයික්‍රොෆෝනයක් දකින දකින මොහොතේ ගුරුවරුන්ව මහ පාරට බස්සලා, ගුරුවරුන්ට දිය යුතු තුනෙන් දෙක වෙනුවෙන් කොච්චර හඬක් නැඟුවාද? කෝ, ඒ තුනෙන් දෙක? අද, ඒ තුනෙන් දෙක ලබා දීලා නැහැ නේ. ඒ නිසා මම කාරුණාවෙන් ඉල්ලීමක් කරනවා. පෞද්ගලික විවේචනයක් නොවෙයි මේ කරන්නේ. *[බාධා කිරීමක්]* පව දොඩවන්න එපා. බොරු කියන්න එපා. මේක පව ආණ්ඩුවක්. මේක ටොන් පව ආණ්ඩුවක්. ජනතාව අන්දවන ආණ්ඩුවක්; ජනතාව රවටන ආණ්ඩුවක්. තරහ ගන්න එපා, ඇත්ත කියනකොට.

මම අවසාන වශයෙන් විජිත හේරත් මැතිතුමාට විශේෂ යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමැතියි. විදේශ රැකියා ක්ෂේත්‍රය පිළිබඳව ඔබතුමාගේ පූර්ණ අවධානය යොමු කරන්න. මොකද, විදේශ රැකියා ලබා දීම සඳහා නිර්මාණය වෙලා තිබෙන සමහර ආයතන ව්‍යාජ ආයතන. ඒ ව්‍යාජ ආයතනවලට යොමු වෙන ප්‍රමාණය වැඩියි. ඒක ගැන පුදුම වෙන්න අවශ්‍ය නැහැ. රටේ දූප්පත්කම සියයට 40යි, 50යි කියලා විශ්ලේෂකයින් සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරලා තිබෙනකොට, තමන්ගේ ජීවනෝපාය ශක්තිමත් කර ගන්න බොහෝ දෙනා විදේශ රැකියාවලට යොමු වෙනවා. ජනතාව විදේශ රැකියාවලට යොමුවෙන නිසා ඒ විදේශ රැකියා ලබා දෙන ආයතනවල නිර්ව්‍යාජභාවය ස්ථාපනය කරන්නට යම්කිසි විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරන එක ඔබතුමාගේ වගකීමක්.

මම දන්නවා, කොච්චර දැනුම් දීම් කළත්, විවිධ පුද්ගලයෝ ආර්ථික අපහසුතා මැද කෙටි මාර්ගවලට යන බව. ඒක නතර කරන්නට ඕනෑ. කෙටි මාර්ගවලට ගියාම මොකක්ද වෙන්නේ? අවසානයේ යුද පිටියටත් යන්න වෙනවා. ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ විශ්‍රාමික නිලධාරින් ආර්ථික ප්‍රශ්න මැද ඒ ක්‍රියා කරනවා. හැබැයි, නීත්‍යනුකූලව ක්‍රියාත්මක වෙන ක්‍රමවේදත් තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරලා එවැනි ව්‍යාජ ආයතන මැඩ පවත්වන්නට ගන්න පුළුවන් ඉහළම, නීත්‍යනුකූල තීන්දු තීරණ ටික අර ගන්න කියලා මම ඔබතුමාගෙන් මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා.

මම කථා කරනකොට අපේ සුනිල් වටගල නීතිඥතුමා පොඩ්ඩක් කෑ ගැහුවා. කමක් නැහැ. මම ඔබතුමාට එක කාරණාවක් කියන්න කැමැතියි. පොඩි ගැටලුවක් තිබෙනවා. විශ්‍රාමික විදුහල්පතිවරු, ගුරුවරු 85,000ක් ඉන්නවා. ඇත්ත වශයෙන්ම සුබෝධනී කමිටු වාර්තාව හරහා ලබා දුන් සහනය නොලැබීම තුළ අද ඒ අය ලොකු අසහනයකට පත් වෙලා තිබෙනවා. ඔබතුමා දන්නවාද, මොකක්ද ගැටලුව කියලා? ගැටලුව තමයි, සාමාජිකයන්ගෙන් යම් යම් ආධාර, උපකාර අරගෙන ඔබතුමන්ලා දෙපළම ඒ අය වෙනුවෙන් නඩුවක් දාලා තිබෙන එක. ඒ නඩුව දාලා තිබෙන්නේ විශ්‍රාමික ගුරුවරුන් සහ විශ්‍රාමික විදුහල්පතිවරුන් වෙනුවෙන්. හැබැයි, නඩුව දාපු ඔබතුමන්ලා දැන් ඉන්නේ ආණ්ඩු පාර්ශ්වයේ. මේ ගැන ආපහු සාකච්ඡාව නොවැම්බර් මාසයේ තිබෙනවා. එතකොට, "නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ" වාගේ වෙන්නේ නැතිව කටයුතු කරන්න. මම ඔබතුමන්ලාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා,- *[බාධා කිරීමක්]* මේ කථා කරන්නේ 85,000ක් වෙනුවෙන්. ඒ 85,000 නියෝජනය කරන්නේ දැන් වැඩේ නොකරන අය.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

අධිකරණයට ඉඩ දෙන්න ඒ- *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

වටගල මැතිතුමනි, කලබල වෙන්න එපා. *[බාධා කිරීම්]* වටගල මැතිතුමනි, කලබල වෙන්න එපා. මම ඔබතුමාට යෝජනාවක් කරනවා. *[බාධා කිරීම්]* ඔබතුමාත්, මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමාත්, -මම යෝජනාවක් කරන්නේ- ඒ විශ්‍රාමිකයින් 85,000 නියෝජනය කරන කණ්ඩායම ගෙනැල්ලා සාකච්ඡා කරලා ඒ අය විශ්වාස කරන, ඒ අය පිළිගන්න විසඳුමක් ලබා දෙන්න. ඒකයි කියන්නේ. ඒකයි යෝජනා කරන්නේ. මේ එදිරිවාදිකම් අපට අවශ්‍ය නැහැ. අපට ඕනෑ, ප්‍රශ්නවලට උත්තර. අපට ඕනෑ, ගැටලුවලට විසඳුම්. අන්න ඒක තමයි ප්‍රගතිශීලී විපක්ෂය කියන්නේ.

ගරු සභාපතිතුමනි, වැවිලි ක්ෂේත්‍රය ගැන, වතු ජනතාව ගැන කියමින් මෙතැන කෑ ගැහුවා. කාරක සභා අවස්ථාවේදී එම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරන වෙලාවේදී දෙන්න පුළුවන් උත්තරය මම දෙන්නම්, සුදුසු උත්තරය දෙන්නම්. වතු ප්‍රජාව ගැන තමුන්නාන්සේලාගෙන් අපට උපදෙස් අවශ්‍ය නැහැ. වතු ප්‍රජාවට මේ රටේ පුරවැසිභාවය නොමැතිව සිටිනකොට ඔවුන්ට පුරවැසිභාවය ලබා දුන්නේ රණසිංහ ප්‍රේමදාසයි කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි. ඒ නිසා ඒකට දෙන්න ඕනෑ උත්තරය මම දෙන්නම්; මම විතරක් නොවෙයි අපේ කණ්ඩායම. මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු සභාපතිතුමනි *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Okay, Hon. Deputy Minister, I will give you one minute.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

එතුමා මගේ නමත් සඳහන් කරමින් යම් ප්‍රකාශයක් කළා. එම නිසා මම පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මම කරුණාවෙන් ඉල්ලීමක් කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන මේ මස 25වැනි දා විවාද කරනවා. මම ඔබතුමාට අභියෝග කරනවා, තුනෙන් දෙක මොකක්ද කියලා මේ පාර්ලිමේන්තුවේ විග්‍රහ කරන්න කියලා. මම ඒක කියලා තිබෙනවා. ඇති තරම් විග්‍රහ

[ගරු මහින්ද ජයසිංහ මහතා]

කරලා තිබෙනවා. දන්නේ නැත්නම් මගේ වීඩියෝ එකක් හරි බලලා එදාට විග්‍රහ කරන්න. ඒ, පළමුවැනි කාරණය. දෙවැනි කාරණය මේකයි. ජනාධිපතිතුමා විශ්‍රාමිකයින් ගැන ඉතාම පැහැදිලිව කිව්වා. ඔබතුමන්ලා; රනිල්, මෛත්‍රී, සජිත් ආණ්ඩුව හදපු ප්‍රශ්නය -2015-2019 ප්‍රශ්නය- අපි අදියර තුනකින් විසඳනවා.

අපට තිබෙන ඊළඟ ප්‍රශ්නය මොකක්ද? මේ රටේ 2024.12.31 දින දක්වා විශ්‍රාම ගිය පිරිස ලක්ෂ 7ක් ඉන්නවා. 85,000 විතරක් නොවෙයි. ඒ ලක්ෂ 7ක ප්‍රශ්නය අපි අනිවාර්ය ලෙසම ඉදිරියේදී විසඳනවා. ඒක අපි කියලා තිබෙනවා. ඒ ප්‍රශ්නය ගැන අපි දන්නවා. ඇති තරම් සාකච්ඡා කරලා තිබෙනවා. ඒ වාගේම 1997 සිට 2024 දෙසැම්බර් 31 දක්වා විශ්‍රාම ගිය ගුරු, විදුහල්පතිවරු 85,000ක් ඉන්නවා. ගරු සභාපතිතුමනි, අපි අනිවාර්ය ලෙසම ඒ ප්‍රශ්නය විසඳනවා. හැබැයි, අපට යම් කාලයක් ඕනෑ. අපි බලයට ඇවිල්ලා අවුරුද්දයි. මේ ඉදිරිපත් කරන්නේ දෙවැනි අය වැය. ඉදිරියේදි ඒ ප්‍රශ්නය විසඳනවා කියලා අපි ඔවුන්ට පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Harshana Nanayakkara. You have 20 minutes.

[පූ.භා. 11.03]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් කරුණු කීපයක් මතු කළා. මාගේ කථාව ආරම්භ කිරීමට පෙර මම මේ කාරණාව කියන්න අවශ්‍යයි. ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ ගුරු පත්වීම් සම්බන්ධයෙන් වූ තොරතුරු සම්පූර්ණ නැහැ. ඒක අසම්පූර්ණයි. මක් නිසාද, ඒ පත්වීම් සම්බන්ධයෙන් සංවර්ධන නිලධාරින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු හතරක් පවරා තිබුණා. ඒ නඩු හතර නිෂ්ප්‍රභ වුණා. ඒ කියන්නේ, Supreme Court එකෙන් ඒවා නිෂ්ප්‍රභ කර දැම්මා. අන්න ඒ හින්දා තමයි අපේ ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී ඒ සංවර්ධන නිලධාරින්ට කිව්වේ, පාරේ තොටේ රස්තියාදු නොවී අනෙකුත් නිලධාරින් වාගේම විභාගය ලියා ගුරු පත්වීම් ගන්න එන්න කියලා. මොකද, අනෙක් අය ඒක කළා.

දෙවනුව, ඔබ මරණ පරීක්ෂකවරුන් ගැන සඳහන් කරපු දේ ගැනත් කියන්න ඕනෑ. ඔවුන්ට ලැබෙන මුදල ප්‍රමාණවත් නැති බව මම පිළිගන්නවා. එය යම් ප්‍රමාණයකට increase කිරීම සඳහා අවශ්‍ය සාකච්ඡා මේ වන විට පවත්වනවා. ඔවුන්ට ගෙවන ගණන වැඩි කරලා විතරක් මදි. ඒ මුදල් වැඩි කිරීමත් සමඟම ඔවුන්ගේ වගවීමත්, ඔවුන්ගේ වෘත්තීමයභාවයත් යම් ආකාරයකට අධීක්ෂණය කොට පරිපාලනය කිරීම අවශ්‍ය වෙනවා. නමුත්, ඒ මුදල් වැඩි කිරීම සම්බන්ධව අපි මේ මොහොතේ සාකච්ඡා කරමින් ඉන්නවා.

ගරු සභාපතිතුමනි, මම දැන් මාතෘකාවට අදාළ කථාවට එන්නම්. අද විවාදයට ගන්නේ රට තුළ නීතියේ විධානය සහ පාලනය ස්ථාපනය කිරීමට උර දෙන ප්‍රධාන අමාත්‍යාංශයක වැය ශීර්ෂයක්. මෙය, අපේ රජයේ දෙවැනි අය වැයයි. අපට ලැබුණේ සියලු සම්පත්වලින් සපිරි, ඉතාම සුමටව ක්‍රියාත්මක වන අමාත්‍යාංශයක් නොවෙයි. ඔබට මතක ඇති, ගියවර මගේ කථාවේදී මම අධිකරණ ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්න ටික කිව්වා. අධිකරණ ක්ෂේත්‍රයේ පවතින උග්‍ර මානව සම්පත් හිඟය, ඩිජිටල් අධිකරණ පද්ධතියක් නොමැති වීම, නඩු අවසන් කිරීමේ ප්‍රමාදය, ජාත්‍යන්තර දර්ශකවල පහළට යෑම, බන්ධනාගාර තදබදය, ජාතික ඒකාබද්ධතා හා සංහිඳියාව ස්ථාපිත කිරීමේ ගැටලු ආදිය ගැන මම ගියවර කිව්වා. පසුගිය වසරක කාලය තුළ මේ ප්‍රශ්න සියල්ල සම්පූර්ණයෙන් විසඳන්න බැරි වුණත්, මේ ප්‍රශ්න විසඳන්න ඉතාම හොඳ ප්‍රවේශයක් ගන්න පුළුවන් වුණා. ඇතැම් ප්‍රශ්න විසඳුවා. කාලයක් පුරා ඇති වෙලා තිබුණු මේ ප්‍රශ්නවලින් සමහර ප්‍රශ්න තවත් විසඳන්න තිබෙනවා. අපේ උත්සාහය දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙනුත් පිළිගෙන තිබෙනවා.

ඔබ අන්තර්ජාලයට ගිහින් බැලුවොත් පෙනේවි, World Justice Project ඒකේ තිබෙන Rule of Law Index එක. අප එහි 2025 අවුරුද්දේ 75 වන ස්ථානයේ ඉඳන් 74 වන ස්ථානයට ඇවිත් තිබෙනවා. දූෂණය නොමැති වීමේ දර්ශකයේ - Absence of Corruption Index එකේ - 63 වන ස්ථානයේ ඉඳන් 61 වන ස්ථානයට පැමිණ තිබෙනවා. ඒ වාගේම රජයේ වගවීම සහ විනිවිදභාවය සලකා බලන Open Government Index එකේ 63 වන ස්ථානයේ සිට 59 වන ස්ථානයට ස්ථාන 4කින් ඉදිරියට ඇවිත් තිබෙනවා. මානව හිමිකම් දර්ශකයේ - Fundamental Rights Index එකේ - 86 වන ස්ථානයේ ඉඳලා 85 වන ස්ථානයට පැමිණ තිබෙනවා. ඒ අනුව අපි පෙන්නුම් කර තිබෙනවා, රජය මානව හිමිකම් ආරක්ෂා කිරීමේ මෙන්ම අනෙකුත් ජාත්‍යන්තර දර්ශකවලත් ප්‍රගමනයක් පෙන්නුම් කර තිබෙන බව. එය ජාත්‍යන්තරය ද පිළිගෙන තිබෙනවා. ඒ වාගේම, Civil Justice Index එකේ 123 වන ස්ථානයේ සිට 100 වන ස්ථානයට පැමිණීමට ද හැකි වී තිබෙනවා. ඒ වාගේම ඉතාම සතුටට පත් විය හැකි කරුණක් ලෙස දක්වන්නේ, අධිකරණයේ ස්වාධීනතාව සහ විගණනයේ ස්වාධීනත්වය සලකා බලන Constraints on Government Powers Index ඒකේ 76 වන ස්ථානයේ සිට 67 වන ස්ථානයට ස්ථාන 9කින් වසරක් තුළ ඉදිරියට පැමිණෙන්නට හැකි වී තිබීමයි. මේක තමයි ගරු ජනාධිපතිතුමා කිව්වේ අපේ රටේ පුරවැසියන් ලෝකය ඉදිරියේ නැවතත් පිළිගැනීමට පත් වන තත්ත්වයක් නිර්මාණය කරනවා කියලා. ඒක තමයි මේ සිදු වෙමින් පවතින්නේ.

ගියවර අය වැයෙන් අධිකරණ ක්ෂේත්‍රයට රජය විශාල මුදලක් වෙන් කළා. 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' මේ රටේ ජනතාවට උරුම කර දීමට යන ගමනේදී සෑම විටම නීතියේ විධානය හා පාලනය ස්ථාපිත කිරීමට ප්‍රමුඛතාව ලබා දිය යුතුමයි. ඒ නිසා අධිකරණ ක්ෂේත්‍රයට මෙවර අය වැයෙනුත් වියදම් සඳහා රුපියල් බිලියන 58.5ක ප්‍රතිපාදන වෙන් කිරීමට යෝජනා කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම මේ අමාත්‍යාංශය භාර ගත් විගස අධ්‍යයනයක් කරලා ඉදිරියට යාමේදී තිබෙන ගැටලු මොනවාද කියලා හඳුනා ගැනීම සිදු කළා. ප්‍රධාන ගැටලුව වුණේ, උග්‍ර මානව සම්පත් හිඟයයි. ඉතාම සතුටුයි කියන්න, මේ අභියෝගාත්මක අවස්ථාවේ වුවද මේ වන කොටත් පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් 2,871කට ගරු අග්‍රාමාත්‍යතුමියගේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් ක්‍රියාත්මක වන නිලධාරි කමිටුව අනුමැතිය ලබා දීලා තිබෙනවා. ඒවායෙන් 1,315ක්ම අධිකරණ සඳහායි. බන්ධනාගාර සඳහා බඳවා ගැනීම් 1,086ක් ද ඒ අතර තිබෙනවා. මේ වන විට එම බඳවා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතිනවා.

ගරු සභාපතිතුමනි, අධිකරණ අමාත්‍යාංශය තමයි මේ රටේ අපරාධ නීතිය, සිවිල් නීතිය ඇතුළු නීති ප්‍රතිසංස්කරණ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ප්‍රමුඛතම ආයතනය වන්නේ. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් කියා තිබෙනවා අපි නීති සකස් කරන්නේ විශේෂඥ කමිටු මඟින් කියලා. ඒ වාගේම අවශ්‍ය අවස්ථාවලදී මහජන අදහස් ද විමසා බලනවා. මනා අධ්‍යයනයකින් තොරව, නීති ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ අදහස් නොගෙන තනි මතයන්ට නීති සංශෝධනය කිරීමෙන් ඒවායේ අඩු පාඩු ඇති වන අතරම, ක්‍රියාත්මක කිරීමේදී ද ඇතැම් විට වියවුල් තත්ත්වයන් නිර්මාණය වෙනවා. ඒ නිසා නීති කොමිෂන් සභාව ක්‍රියාත්මක කිරීමට අමතරව, විශේෂඥ කමිටු ද මෙම නව නීති ගෙන ඒමට සහ පවතින නීති සංශෝධනය කිරීමට පත්කොට තිබෙනවා. මේ අවස්ථාවේත් එවැනි විශේෂඥ කමිටු 14ක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම ඒ බව කියන්න ඕනෑ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, සංවිධානාත්මක අපරාධ මැඩ පැවැත්වීම උදෙසා නීතියක් සම්මත කිරීම, රජයේ අභිචෝදක කාර්යාලය පිහිටුවීම ඇතුළු විශේෂ නීති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මෙම කමිටු ක්‍රියාත්මක වනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ නව පනත් කෙටුම්පත ඒ කමිටුව විසින් මා වෙත භාර දෙනු ලැබුවා. මේ මොහොතේදී එය දෙමළ භාෂාවට සහ සිංහල භාෂාවට පරිවර්තනය කිරීමේ කටයුතු සිදු වෙමින් පවතිනවා. ත්‍රස්තවාදය වැළැක්වීම සම්බන්ධයෙන් වූ එම අලුත් පනත් කෙටුම්පත පරිවර්තන දෙක ආ ගමන් මහජන අදහස් විමසීම සඳහා මහ ජනතාව වෙත පත් කරන්න ඉතාම ඉක්මනින් කටයුතු කරනවා. අප දීපු එක පොරොන්දුවක් තමයි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම. අන්න ඒ දේ කරන්න අවශ්‍ය වැඩ ටික අපි දැන් කරලා ඉවරයි.

ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන විශාල නීති ප්‍රතිසංස්කරණ සංඛ්‍යාවක මේ අවස්ථාවේ නියැළිලා ඉන්නවා. ඒ වාගේම මේ අවුරුද්දේ අපි ඉතාම සාර්ථක නීති ප්‍රතිසංස්කරණ කිහිපයක්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කර ගත්තා. ඒවා අතරින් අපරාධ සිදු කිරීම තුළින් උපයන වත්කම් යළි ලබා ගැනීමේ හා රාජසන්තක කිරීමේ නීති ප්‍රතිසංස්කරණ අපි සිදු කළා. අප රජය නීති සම්මත කිරීමෙන් නොනවතින අතර, ඒවා ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරනවා. අපේ ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා විසින් එම පනත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය, අපරාධයකින් උත්පාදිත දේ විමර්ශනය කිරීම සඳහා වන පොලිස් කොට්ඨාසය පසුගිය ඔක්තෝබර් 20වෙනිදා ආරම්භ කරනු ලැබුවා.

ඒ වාගේම අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණයට ඉඩ සලසමින් සැකකරුවන්, වූදිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විවෘත අධිකරණයේදී ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයෙන් ලබා ගැනීමේ නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම සුවිශේෂී සන්ධිස්ථානයක් වෙනවා. අපරාධ නඩු විධාන සංග්‍රහයට කළ මෙම සංශෝධනය නිසා අවදානමට ලක් විය හැකි සැකකරුවන් සහ වින්දිතකරුවන් අධිකරණයට ගෙන ඒමේ අවශ්‍යතාව අවම වෙනවා. ඒ වාගේම දුර බැහැර ස්ථානවලට යැමට ගත වන කාලය ඉතිරි කරගෙන විශේෂඥ සාක්ෂිකරුවන්ට එම කාලය ඵලදායී ලෙස රාජකාරි කටයුතුවලට යොදා ගැනීමට හැකි වෙනවා. ඒ වාගේම සිතාසි බෙදා හැරීම හා විශේෂඥ වාර්තා විද්‍යුත් තැපෑල මඟින් සිදු කිරීමේ හැකියාව දැන් පවතිනවා. විවෘත අධිකරණයේදී සාක්ෂි ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය හරහා ලබා ගැනීමට අවශ්‍ය සංශෝධන සිවිල් නඩු විධාන සංග්‍රහයට ගෙන ඒම සඳහා කටයුතු කරමින් පවතිනවා.

අධිකරණ පද්ධතිය නවීකරණයට ඉඩ සැලසූ මෙම නීති ප්‍රතිසංස්කරණ මඟින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය පහසුකම් සපයන තාක්ෂණික උපකරණ කට්ටල 100ක් මේ වසර තුළ අධිකරණ වෙත ලබා දීමට ප්‍රසම්පාදන කටයුතු මේ දවස්වල සිදු කරමින් පවතිනවා, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම විවිධවිධාන යාවත්කාලීන කර ඵලදායිව හා සුමටව වාණිජ මෙහෙයුම් සිදු කිරීමට අවශ්‍ය සංශෝධන විනිමය බිල්පත් ආඥා පනතට සිදු කර තිබෙනවා. ඒ වාගේම, රාජ්‍ය වත්කම් කළමනාකරණය හා අධීක්ෂණයේදී තම වගකීම් ඉටු කිරීමට අපොහොසත් වන රාජ්‍ය නිලධාරින්ට අධිභාර පැනවීම වෙනුවෙන් වසර කිහිපයක් විගණන පනතට සිදු කර ගැනීමට නොහැකිව තිබූ සංශෝධන සම්මත කර ජාතික විගණන කාර්යාලය ශක්තිමත් කිරීමට අපට පුළුවන් වෙලා තිබෙනවා.

මැතිවරණයට කලින් අපි මහ ජනතාවට පොරොන්දු වුණා, මහජන මුදලින් මේ රටේ විශ්‍රාමික ජනාධිපතිවරුන්ගේ සහ ඔවුන්ගේ පවුල් නඩත්තු කිරීම නවත්වනවා කියලා. ඒ අනුව අපි ජනතාවට දුන්නු පොරොන්දුව ඉටු කරමින් හිටපු ජනාධිපතිවරුන්, අනාගත ජනාධිපතිවරුන් සහ ඔවුන්ගේ පවුල් සඳහා ලබා දෙන ආර්ථිකමය නොවන හිමිකම් ඉවත් කිරීමට නීති ප්‍රතිසංස්කරණ සිදු කළා. අපි ජනතාවට පොරොන්දු වුණු අනෙකුත් නීති ප්‍රතිසංස්කරණ සියල්ලත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, අපට තිබෙන ප්‍රධානම අභියෝගය වන්නේ නීතියේ ප්‍රමාදයයි. "නීතියේ ප්‍රමාදය කියන්නේ යුක්තිය ඉටු නොවීමක්" - justice delayed is justice denied - කියලා කියමනක් තිබෙනවා. නමුත් අපි මේ රටේ ස්වාධීන අධිකරණ පද්ධතියට අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම් කරන්නේ නැහැ. අපට වසරක් තුළ ජාත්‍යන්තර දර්ශකවල ඉහළ යැමට එයත් එක හේතුවක් වුණු බව කියන්න කැමැතියි.

ගරු අගවිනිසුරුතුමා ඇතුළු අධිකරණ සේවා කොමිෂන් සභාව අධිකරණ පරිපාලන විෂය සිදු කරනවා. එසේම අධිකරණ පද්ධතියට අවශ්‍ය ප්‍රවාහන, සන්නිවේදන හා යටිතල පහසුකම් ලබා දීම අප අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබනවා. මම මේ අවස්ථාවේ සිහිපත් කරන්න කැමැතියි, වර්තමාන අගවිනිසුරුතුමා ප්‍රධානත්වය දරන නව අධිකරණ සේවා කොමිෂන් සභාව, යුක්තිය පසිඳලීමේ යන්ත්‍රණය වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී කිරීමට ඉතාම සක්‍රියව කටයුතු කරන බව. හදිසියේ අධිකරණ පරීක්ෂා කිරීම් ද සිදු කරනවා, වෙනත් පරීක්ෂා කිරීම්වලට අමතරව.

ඔබතුමන්ලා මාධ්‍යවල සහ මේ පාර්ලිමේන්තුවේදී දැක්කා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා වාගේ විනිශ්චයකාරවරුන් විසිදෙනෙකුට වැඩි සංඛ්‍යාවකගේ වැඩ තහනමකට ලක් කර තිබෙන බව. ඒ අනුව ඔබතුමන්ලාට පෙනෙනවා, හැම තැනකම වාගේ යම් යම් වැඩ කටයුතු සිදුවෙමින් පවතින බව. හැබැයි මම පැහැදිලිව කියන්න කැමැතියි, මේ සියලු ක්‍රියාමාර්ග අධිකරණ සේවා කොමිෂන් සභාව ස්වාධීනව ගන්න ඒවා මිස ඒකට වෙන මැදිහත්වීමක් නැහැ කියන එක. ඒ වාගේම ගරු අග්‍ර විනිශ්චයකාරතුමා විසින් ඒ සියලු වැඩ තහනම් කිරීම් සහ ඉවත් කිරීම් අර ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියපු ආකාරයට නොවෙයි, නීතියට අනුව, සාධාරණත්වය සහ යුක්තිය අනුව විමර්ශනය කොට දෙන ලද තීන්දු බව.

මට අධිකරණ සේවා කොමිෂන් සභාව දැනුම් දීලා තිබෙනවා, විනිශ්චයකාරවරුන් ඇතුළු අධිකරණ කාර්ය මණ්ඩලවලට එරෙහිව ලැබුණු පැමිණිලි 650කට වැඩි සංඛ්‍යාවක් විමර්ශනය කරලා තීන්දු තීරණ අරන් තිබෙන බව. ඒ වාගේම විනිශ්චයකාරවරුන්ගේ කටයුතු කාර්යක්ෂමව කරන්නත්, ඔවුන් සම්බන්ධයෙන් සුවිශේෂී කාර්යසාධන ඇගැයීම් ක්‍රමයක් අඛණ්ඩව පවත්වාගෙන යැමටත් අධිකරණ සේවා කොමිෂන් සභාව කටයුතු කරනවා.

ඒ වාගේම Clean Sri Lanka වැඩසටහනට සමගාමීව අධිකරණවල ගොඩගැහිලා තිබෙන නඩු භාණ්ඩ මේ අවුරුද්දේ

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

දෙසැම්බර් 31 දින වන විට නිෂ්කාසනය කරන්න අවශ්‍ය විශේෂ වැඩ පිළිවෙළක් අධිකරණ සේවා කොමිෂන් සභාව මේ වෙලාවේ ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා දීර්ඝ විස්තර සහිත චක්‍රලේඛයක් නිකුත් කරලා, වෙනමම විනිශ්චයකාරවරුන් පත් කරලා එම ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමටත් අධිකරණ සේවා කොමිෂන් සභාව සාධනීය පියවර රැසක් ගෙන තිබෙනවා.

සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හිත් - සති අන්තයේ පවා - රෙජිස්ට්‍රාර්වරයා ඇතුළු කාර්ය මණ්ඩලවල සැහෙන පිරිසක් අධිකරණවල උදේ සිට හවස් වෙනකම් මේ වැඩ කටයුත්ත කරනවා. මේ මොහොතේ මම ඒ අයට ස්තුති කරන්න කැමැතියි. නීතිඥවරුන් වශයෙන් අපි සැවොම දන්නවා, අධිකරණවල කොච්චර නඩු භාණ්ඩ ගොඩගැහිලා තිබෙනවාද, ඒවා ඉවරයක් කරන්න ඕනෑ කියන කාරණාව. ඒ නිසා උසාවිවල වැඩ කරන ඒ සහෝදර සහෝදරියන්ට මගේ හෘදයංගම ස්තුතිය පිරිනමනවා. ඔව්, මා දන්නවා, ඒ වැඩේ අමාරුයි කියලා. නමුත් අපි ඉවසීමෙන්, වගවීමෙන් මේක කරගෙන යමු. ඒ වෙන මහන්සියට අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු ඒ කටයුතු කරන සියලුම උසාවි කාර්ය මණ්ඩලවලට මම ස්තුතිවන්ත වනවා.

ගරු සභාපතිතුමනි, අප රජයේ ප්‍රතිපත්තියක් තමයි, ඩිජිටල් රාජ්‍යකරණය. එහිදී අධිකරණ පද්ධතිය කාර්යක්ෂම කිරීමට ස්වයංක්‍රිය අධිකරණ පද්ධතියක අවශ්‍යතාව අධ්‍යයන රැසකින්ම හඳුනාගෙන තිබෙනවා. ගරු අග්‍ර විනිශ්චයකාරතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ කටයුතුවලින් විශාල ප්‍රමාණයක් මේ වන විටත් ඩිජිටල්කරණයට ලක් කරලා තිබෙනවා. Court of Appeal එකේ කටයුතුත් ඩිජිටල්කරණයට ලක් කරලා තිබෙනවා. ඒ අනුව එතුමා මෙම ඩිජිටල්කරණ වැඩසටහන අභියාචනාධිකරණ ඇතුළු අනෙක් අධිකරණ සඳහාත් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සලස්වමින් සිටිනවා. අමාත්‍යාංශය විධියට ඒ සඳහා අවශ්‍ය පූර්ණ සහයෝගය ලබා දීමට අපි කටයුතු කරමින් සිටිනවා.

අපේ රටේ ජනගහනයට සාපේක්ෂව ඉන්න විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව තවමත් ප්‍රමාණවත් නැහැ. ඒ අනුව විනිශ්චයකාරවරුන් සහ අධිකරණ සංඛ්‍යාව වැඩි කිරීමේ සැලැස්ම අප දිගටම ක්‍රියාත්මක කරනවා. මේ සඳහා නිර්දේශ ඉදිරිපත් කරමින් රටේ ආර්ථික අර්බුදයට පෙර සකස් කළ වාර්තාව මා අගය කරන අතර, එය වර්තමාන අවශ්‍යතාව අනුව වෙනස් විය යුතු බව අප විසින් හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව මේ සඳහා නව සැලැස්මක් සකස් කිරීම වෙනුවෙන් කමිටුවක් පත් කිරීමට මා අපේක්ෂා කරනවා.

මේ වසරේදී විනිශ්චයකාරවරුන් 50දෙනෙකු අලුතෙන් බඳවා ගනිමින් අධිකරණ පද්ධතිය ශක්තිමත් කරනු ලැබුවා. ඒ වාගේම අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පුත්තලම, පොළොන්නරුව, අනුරාධපුරය සඳහා අතිරේක මහෙස්ත්‍රාත් අධිකරණ ආරම්භ කළ අතර රත්නපුර, කෑගල්ල යන ස්ථානවල අතිරේක දිසා අධිකරණ ආරම්භ කළා. ඒ වාගේම මනම්පිටිය සහ කල්පිටිය සංචාරක අධිකරණ "මහෙස්ත්‍රාත් අධිකරණ" දක්වා උසස් කිරීමට ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගේ එකඟතාව ලැබී තිබෙනවා. අපි ඉක්මනින් එය ගැසට් කිරීමට කටයුතු කරනවා. ඒ වාගේම බිබිල, හෙට්ටිපොල, දෙයියන්දර, තඹුත්තේගම, අඟුණුකොළපැලැස්ස, ආනමඩුව සහ ගල්ගමුව මහෙස්ත්‍රාත් අධිකරණ, "දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ" ලෙසට අධිකරණ බලය ලබා දෙමින් ගැසට් කිරීම සඳහා වන ඉල්ලීම මේ වන විටත් රජයේ මුද්‍රණාලයාධිපති වෙත අපි යොමු කර තිබෙනවා. අධිකරණ අමාත්‍යාංශයෙන් පහසුකම් සැපයීම මත මේ වසරේදීත් කොළඹ තවත් සිවිල් අභියාචනාධිකරණයක් ආරම්භ කළා. ඒ වාගේම කොළඹ මෙතෙක් පැවති මහාධිකරණ ශාලා 8ට තවත් එකක් එකතු කොට මේවායෙහි විවිධ විෂයයන්ට අදාළ නඩු විමසීම ආරම්භ කොට තිබෙනවා. නමුත් ගොඩගැසී තිබෙන නඩු කඩිනමින් අවසන් කිරීම සඳහා තවත් අධිකරණ ශාලා අවශ්‍ය වනවා.

ඔබ දන්නවා, අපේ රජයේ ඇමතිවරුන් නිල නිවාස භාවිත කරන්නේ නැහැ කියලා. ඒ අනුව ඇමති මණ්ඩලය තීරණය කළා, ඇමති නිල නිවාසවලින් යම් ප්‍රමාණයක් - 4ක් - මහාධිකරණ සඳහා වෙන් කිරීමට.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
6ක් අරන් තිබෙනවා; 6ක්.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඒ අනුව ගරු අග්‍ර විනිශ්චයකාරතුමාත් සමඟ සාකච්ඡා කරලා අපි ඉදිරියේදී එම නිවාසවල මහාධිකරණ ශාලා තාවකාලික වශයෙන් පිහිටුවීම සිදු කරනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභාපතිතුමනි, point of Order එකක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Chamara Sampath Dasanayake?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අධිකරණ ඇමතිතුමා සභාව නොමඟ යැව්වා. අද උදේ රාජ්‍ය පරිපාලන ඇමතිතුමා කිව්වා, කථානායකතුමා සහ නියෝජ්‍ය ඇමතිවරුන් හත්දෙනෙක් රජයේ නිල නිවාස අටක් අරගෙන තිබෙනවා කියලා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මම හිතන විධියට, ඔබතුමා තේරුම් ගත්තේ නැහැ, මම කියපු කාරණය. එතැන නිවාස ගොඩක් තිබෙනවා. නිවාස හතරක් අපි අරගෙන තිබෙනවා, අධිකරණවලට. මා කිව්වේ ඒක.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Gayantha Karunathilleka?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු ඇමතිතුමනි, මට මිනිත්තුවක් දෙන්න. මේ කාරණය ඔබතුමාටත් ප්‍රයෝජනයක් වේවි. අද සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න තිබෙන්නේ, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට. අද කථිකයෝ රාශියක් ඉන්න නිසා - ආණ්ඩුවේත්, විපක්ෂයේත් කථිකයින්ට වැඩිපුර වෙලාවක් ලබා දෙන්න පුළුවන් නිසා - එතුමා කියනවා, එතුමාගේ කල් තැබීමේ යෝජනාව ඉවත්කර ගන්නවා කියලා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Minister, you may continue. You have a few more minutes.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, එම නිවාස හතර ඉතාම ඉක්මනින් - තව සති දෙකකට අඩු කාලයක් තුළදී - අපි අධිකරණ සේවා කොමිෂන් සභාවට, අග්‍ර විනිශ්චයකාරතුමාට භාර කරනවා. එතකොට විශේෂ නඩු, එහෙම නැත්නම් වංචා, දූෂණ සම්බන්ධයෙන් වූ නඩු හෝ ගරු අග්‍ර විනිශ්චයකාරතුමාට සුදුසු යැයි හිතෙන නඩු අහන්න ඒ අධිකරණ ශාලා භාවිත කරන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යයක් තමයි, අධිකරණ පද්ධතියට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම. මං අමාත්‍යාංශය භාර ගන්නකොට ඉදිකිරීම් ආරම්භ කරලා අවසන් නොකරපු ව්‍යාපෘති රැසක් තිබුණා. අධිකරණ සේවා කොමිෂන් සභාව 2017 වසරේ ඉඳලා තිබෙන්නේ කන්ටේනර්වල. අපට පුළුවන් වුණා, අධිකරණ සේවා කොමිෂන් සභා ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරලා භාර දෙන්න. චීන ආධාර යටතේ අභියාචනාධිකරණ ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර එය මෙම වසරේ ජනවාරි මස ජනතා අයිතියට පත් කළා. එසේම චීන ආධාර යටතේ සිදුවන ශ්‍රේෂ්ඨාධිකරණ ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කොට මෙම වසරේ දෙසැම්බර් මස අපට භාර දීමට නියමිතව තිබෙනවා.

ඒ වාගේම පුත්තලම අධිකරණ ගොඩනැගිල්ල අපි පසුගිය මාසයේ විවෘත කළා. වාකරෙයි, නිකවැරටිය, වාලච්චේනයි ගොඩනැගිලිත් මේ වසර තුළදීම අපි ජනතා අයිතියට පත් කරන්න බලාපොරොත්තු වනවා.

BCC ඉඩමේ අමාත්‍යාංශ ගොඩනැගිල්ල ඉදිකිරීම අපි ආරම්භ කළා. දැනට කොළඹ අලුත්කඩේ අධිකරණ පවතින සමස්ත භූමි භාගයම අධිකරණ සංකීර්ණයක් ලෙසට හඳුනා ගනිමින් එහි වෙනම අපරාධ, සිවිල්, අභියාචන සහ ශ්‍රේෂ්ඨාධිකරණ පරිශ්‍ර ඇති කිරීමටත් පියවර ගනිමින් පවතිනවා. ඒ අනුව සිවිල් නඩුවලට අදාළ පූර්ව නඩු විභාග අධිකරණ, සුළු හිමිකම් අධිකරණ, දිසා අධිකරණ, වාණිජ මහාධිකරණ, සිවිල් අභියාචන මහාධිකරණ මෙන්ම ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය ආදිය සඳහා නවීන පහසුකම් සහිත සුහුරු අධිකරණ ශාලාවලින් යුක්ත නව අධිකරණ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2026 වසර ආරම්භයේ සිදු කිරීමට සැලසුම් කොට තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Harshana Nanayakkara, you have two more minutes.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

Sir, I will take two more minutes from the time allotted for my winding up speech in the evening.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Okay.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මෙම අය වැය යටතේ ලබා දෙන ප්‍රතිපාදන මඟින් කඩුවෙල නව අධිකරණ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනවා. අපේ රජයේ ඇමතිවරුන් නිල නිවාස වාගේම සුඛෝපභෝගී වාහන භාවිත කරන්නේත් නැහැ. ජනතා මුදල් ඉතිරි වන ආකාරයට අපි අරපිරිමැස්මෙන් යුතුව කටයුතු කරනවා. අධිකරණ අමාත්‍යාංශය සතුව තිබුණු සුඛෝපභෝගී වාහන වෙන්දේසි කරලා රුපියල් මිලියන 190කට වැඩි මුදලක් රාජ්‍ය ආදායමට අප බැර කළා. තවත් කිහිපයක් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, නිත්‍ය වශයෙන්ම අප රජය විෂ මත් ද්‍රව්‍ය උවදුර රටින් මුලිනුපුටා දමනවා. ඒ සඳහා "රටම එකට" ජාතික මෙහෙයුම සාර්ථකව ක්‍රියාත්මක වනවා. අපි නීතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ බන්ධනාගාර පිරී ඉතිරී ගොස් තිබෙනවා. බන්ධනාගාරවල ඉන්න පුළුවන් ප්‍රමාණයට වඩා තුන් ගුණයක් ඉක්මවා රැඳවියන් ඉන්නවා. බන්ධනාගාර තදබදය අවම කිරීමට පල්ලන්සේන සහ බූස්ස බන්ධනාගාරවල ධාරිතාව වැඩි කළා. ඒ වාගේම අය වැය ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ වටරැක, කළුතර බන්ධනාගාරවල නව ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු කරනවා. ඒ වාගේම ජනාධිපතිතුමා අය වැය කථාවේදී බන්ධනාගාර පුළුල් කිරීම ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම උදෙසා තවත් රුපියල් මිලියන 2,000ක් වෙන් කළා. එම ප්‍රතිපාදන මඟින් 2018 වසරේ ඉදිකිරීම් ආරම්භ කර නතර වී තිබෙන මාතර-කොටවිලවත්ත බන්ධනාගාර සංකීර්ණය ඉදිකිරීම ආරම්භ කර මාතර නගර සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දෙනවා. එසේම ආර්ථික අර්බුදය හේතුවෙන් නතර වී තිබෙන වාරියපොල බන්ධනාගාරය පුළුල් කිරීම යළි ආරම්භ කරනවා. බන්ධනාගාර තදබදයට කෙටි කාලීන විසඳුමක් ලෙස ඉඩ තිබෙන ස්ථානවල තාවකාලික ඉදිකිරීම් සිදු කිරීමට මේ වන විටත් පියවර ගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ජාතික ඒකාබද්ධතාව තහවුරු කිරීම සහ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වෙනවා. ඒ සඳහා අපගේ ජාතික ඒකාබද්ධතා අංශයත්, ආයතන කිහිපයකුත් ක්‍රියාත්මක වෙනවා.

ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් බහු වාර්ගික, බහු ආගමික ජන කණ්ඩායම් අතර සාමය, සහජීවනය සහ සංහිඳියාව වැඩිදියුණු කිරීමට ආන්තීකරණයට ලක් වූ ප්‍රජාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමට, පාරිසරික හා සුරක්ෂිතතාව තුළින් ජනවාර්ගික සහජීවනය ඇති කිරීමට ප්‍රතිලාභීන් 15,552ක් සඳහා වැඩසටහන් 318ක් පවත්වා තිබෙනවා. එසේම ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන කාර්යාලය ලාංකීය ජනතාව අතර සහජීවනය සහ එකමුතුකම ප්‍රවර්ධනය උදෙසා අධ්‍යාපන වැඩසටහන්, කලා සහ සංස්කෘතික වැඩසටහන්, සමාජ හා ආර්ථික වැඩසටහන් ඇතුළු වැඩසටහන් ගණනාවක් සිදුකර තිබෙනවා.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිදු කරන ලද විමර්ශන 2028 වන විට සම්පූර්ණයෙන්ම අවසන් කිරීම සඳහා ඉදිරිපත් කළ සැලැස්මට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබෙනවා.

එසේම සමූහ මිනීවළවල් 17ක කැණීම් හා වෝහාරික විමර්ශන සිදු කරමින් පවතින අතර, කොළඹ වරායේ, මන්නාරම තිරුකේතීස්වරන්, යාපනය චෙම්මනි, මඩකලපුව කුරුක්කල්මඩම්, ත්‍රිකුණාමලය සාම්පූර් ප්‍රධාන ස්ථානයන් වෙනවා. මෙම සමූහ මිනීවලවල් කැණීම් හා වෝහාරික විමර්ශන සිදු කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රජය මේ දක්වා රුපියල් බිලියන 22කට වැඩි මුදලක් වියදම් කර තිබෙනවා.

එසේම සැප්තැම්බර් මාසයේ ජිනීවාහිදී පැවැති බලහත්කාරී අතුරුදහන් කිරීම් පිළිබඳ කමිටුවට ඉතා සාර්ථක වාර්තාවක් ඉදිරිපත් කළ අතර, ඔවුන්ගේ විමසුම් ලැයිස්තුවට රටක් ලෙස සාර්ථකව පිළිතුරු ලබා දීමට අපට හැකි වුණා.

ගරු සභාපතිතුමනි, ගැටුම්වලින් විපතට පත්වූවන්ට අර්ථදායි සහ තිරසාර හානිපූරණයන් සිදු කිරීම සඳහා හානිපූරණ කාර්යාලය ක්‍රියාත්මක වෙනවා. උතුරු, නැඟෙනහිර යුද ගැටුම් හේතුවෙන් සිදුවූ මරණ, තුවාල සහ දේපළ හානි වෙනුවෙන් වන්දි ගෙවීම වසර 30කට ආසන්න කාලයක් සිදුකරමින් පැවැති අතර, අප රජය යටතේ එම වන්දි ගෙවීම පසුගිය සැප්තැම්බර් වනවිට සම්පූර්ණයෙන්ම අවසන් කළා.

ඒ වාගේම 2,000 වර්ෂයෙන් පසු අතුරුදහන් වූවන්ගේ පවුල් 4,348කට මේ දක්වා ගෙවීම් සිදුකර ඇති අතර, අතුරුදහන් වූවන්ගේ කාර්යාලයේ නිර්දේශ අනුව දිගටම එම ගෙවීම් සිදුකරනවා.

ඒ වාගේම 2000 වසරට පෙර අතුරුදහන් වූවන්ට වන්දි සූත්‍රයක් නිර්මාණය කර වන්දි පැකේජයක් ලබා දීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කිරීමට කටයුතු කරමින් සිටිනවා.

ගරු සභාපතිතුමනි, අප රජය වංචනික ලෙස වන්දි ලබා ගැනීමට කිසිවකුට ඉඩ නොතබන අතර, අරගලයෙන් හානි වූ වන්දි ලැබිය යුතු නියම පුද්ගලයන්ට වන්දි ලබා දීම සඳහා නිර්ණායක සකස් කර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කරනවා.

හානිපූරණ කාර්යාලය මඟින් මූල්‍ය සහන පමණක් නොවෙයි, මනෝ සාමාජීය සහාය සහ ජීවනෝපාය සහායත් ලබා දෙනවා. ඒ සඳහා ජීවනෝපාය වැඩසටහන් විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කර ඇති අතර, ඒවායේ සාර්ථකත්වය පිළිබඳ නිරන්තර සුපරීක්ෂණ කටයුතු සිදු කරනවා. ඒ වාගේම සතුටින් කියන්න කැමැතියි, පාස්කු ඉරිදා ප්‍රහාරයේ වින්දිත අරමුදලින් වින්දිතයන් 663ක් සඳහා රුපියල් මිලියන 310ක් වන්දි ලබාදී සම්පූර්ණයෙන්ම වන්දි ගෙවීම් අවසන් කර තිබෙන බව.

ගරු සභාපතිතුමනි, ගෙවීගිය වසර තුළ අප සිදුකළ තවත් බොහෝ කාර්යයන් තිබෙනවා. අප අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව මඟින් එම තොරතුරු ඉදිරිපත් කර තිබෙනවා. අප ජනතාවට පොරොන්දු වූ ස්වාධීන, කාර්යක්ෂම හා විනිවිද්‍යභාවයෙන් යුතු යන්ත්‍රණයක් තුළින් මහජන විශ්වාසය නැවත ගොඩනඟනවා. අමාත්‍යාංශයේ කාර්යයන් සාර්ථකව ඉටු කිරීමට කැප වී සිටින අමාත්‍යාංශ ලේකම් ඇතුළු කාර්යය මණ්ඩලයට මගේ ස්තුතිය පළ කරනවා. එසේම සැම අතින්ම සහයෝගය ලබා දෙන ගරු අගවිනිසුරුතුමා ප්‍රමුඛ අධිකරණ සේවා කොමිෂන් සභාව සහ ගරු විනිසුරුතුමන්ලා ඇතුළු අධිකරණ කාර්ය මණ්ඩලය ද මේ වෙලාවේ මා ආදරයෙන් සහ ගෞරවයෙන් සිහිපත් කරනවා. එසේම ගරු නීතිපතිතුමා ඇතුළු අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන දෙපාර්තමේන්තු, ආයතන ප්‍රධානීන් ඇතුළු එම කාර්ය මණ්ඩලයට ද මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The Committee will resolve itself into Parliament.

***ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.***
*அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I wish to inform that since the Hon. Member who has been listed to move the Adjournment Motion today has withdrawn the Motion, as per the decision of the Committee on Parliamentary Business held on 11th September, 2025, the time scheduled from 6.00 p.m. to 6.30 p.m. for debating the Adjournment Motion could be utilized, with the permission of this House, for the Committee Stage Debate of the Appropriation Bill.

Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී. -***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் மேலும் ஆராயப்பட்டது. -*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered further in Committee. -*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Mrs.) Chamindranee Kiriella. You have ten minutes.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Minister?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු සභාපතිතුමනි, අද උදේ ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නයට, මා දුන් පිළිතුර පිළිබඳව යම් අපැහැදිලි බවක් එතුමාට තිබෙන බව එතුමාගේ කථාවෙන් පැහැදිලි වුණා. ඒ කාරණය මෙහෙමයි. රජයේ බංගලා, නිල නිවාස කිසිම ඇමතිවරයෙක් අරගෙන නැහැ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ඒක ගැන දැන් කියන්න බැහැ. ඒක දැන් කියන්න බැහැ නේ, ගරු ඇමතිතුමා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

මම කියනතුරු ඉන්න. *[බාධා කිරීමක්]*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු මන්ත්‍රීතුමනි, මේ පැහැදිලි කිරීමක් කරන්නේ. Could you make it very short, Hon. Minister?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ඒ, නියෝජ්‍ය ඇමතිවරුන් අරගෙන තිබෙන්නේ, ලොරිස් නිවාස සංකීර්ණයේ මන්ත්‍රීවරුන්ට හිමි නිල නිවාස. රජයේ බංගලා දීලා තිබෙන්නේ, කලින් සඳහන් කරපු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, පොලිස් දෙපාර්තමේන්තුව, අධිකරණ අමාත්‍යාංශය යන ඒවාට. ඒ හයක්. නියෝජ්‍ය ඇමතිවරු අරගෙන තිබෙන්නේ, රජයේ බංගලා, නිල නිවාස නොවෙයි, ලොරිස් නිවාස සංකීර්ණයේ නිල නිවාස. *[බාධා කිරීමක්]*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. (Mrs.) Chamindranee Kiriella. Your time starts now.

[පූ.භා. 11.30]

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, 2026 අය වැය ලේඛනය පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදයේ දී අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ අවස්ථාවේ දී සංචාරක කර්මාන්තය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. ප්‍රථමයෙන්ම, දහවන පාර්ලිමේන්තුවේ නවක මන්ත්‍රීවරියක් වශයෙන් තේරී පත් වෙලා, අවුරුද්දක් සම්පූර්ණ වන මේ මොහොතේ මට විශාල ශක්තියක් වන කන්ද උඩ රට, මහනුවර දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාව මම ඉතාම ආඩම්බරයෙන් සහ ගෞරවයෙන් මතක් කරන්නට කැමැතියි.

ගරු සභාපතිතුමනි, අපේ රටට විදේශ විනිමය ලබා ගැනීම සඳහා මේ සංචාරක කර්මාන්තය අපට ඉතා වැදගත් වෙනවා. ඉතිහාසය ගත්තොත්, අපේ රට විජය කුමරු විසින් තම්බපණ්ණි වශයෙනුත්, අරාබි ජාතිකයන් විසින් Serendib වශයෙනුත්, ඒ වාගේම ඉන්දියන් සාගරයේ මුතු ඇටය - Pearl of the Indian Ocean - වශයෙනුත් හඳුන්වා තිබුණු බව අපි දන්නවා,. නමුත්, අද අපේ සංචාරක කර්මාන්තයට නිසි තැන ලැබිලා තිබෙනවාද කියන ප්‍රශ්නය අප සියලුදෙනාට තිබෙනවා. අපි දන්නවා, මේ රජයට ජනවාරි මාසයේ අපේ රටේ සංචාරක කර්මාන්තයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 5ක ආදායමක් ලැබීමේ අරමුණක් තිබුණු බව. ඒ වාගේම සංචාරකයන් මිලියන 3ක් අපේ රටට ගෙන්වීමට target එකක් තිබුණත්, අද වෙනකොට 2025 වර්ෂයේ මාස එකොළහමාරක් ගත වෙලත්, විදේශ සංචාරකයන් මිලියන 1.9ක් තමයි අපේ රටට පැමිණ තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, අපේ target එක අපිට සපුරා ගැනීමට නොහැකිවීමට කරුණු කිහිපයක් තිබෙනවා. මම ඒ පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරන්නට කැමැතියි.

අපි දන්නවා, ඕනෑම රටක සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා ගමනාන්ත සන්නාමකරණය - destination branding - කියලා එකක් පාවිච්චි කරන බව. අපි දන්නවා, ඉන්දියාවේ, "Incredible India" කියලා හොඳ campaign එකක් තිබුණා. ඒ වාගේම, අයිස්ලන්තයේ, "Inspired by Iceland", නවසීලන්තයේ, "100% Pure New Zealand" යනාදී වශයෙන් ඉතා සාර්ථක destination branding campaigns කරගෙන ගියා. ඒ මඟින් ඒ රටවල සංචාරක කර්මාන්තය දෙගුණ, තෙගුණ කිරීමට හැකි වුණා. අපේ රටෙත් සංචාරක කර්මාන්තය ගැන කථා කරනකොට "So Sri Lanka", ඒ වාගේම "A Land Like No Other", කොවිඩ් උවදුරෙන් පස්සේ "You Will Come Back for More" යනාදී වශයෙන් ඉතා සාර්ථක campaigns ගෙන ගියා අපි දැක්කා. මේ ජනවාරි මාසයේ සංචාරකයන් වැඩි කර ගැනීම සඳහා, අලුත් මුහුණුවරකින් campaign එකක් ආරම්භ කිරීමට නියමිත වුණත්, අද වෙනකොට ඒක දියත් කිරීමට නොහැකි වෙලා තිබෙනවා. ඇත්තටම ඒක විශාල පාඩුවක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ හෝටල් හිමියන් මේ සම්බන්ධයෙන් අප්‍රසාදය පළ කරලා තිබෙනවා. අපි දන්නවා, ශීත ඍතුව - winter season එක - නොවැම්බර් මාසයේ ආරම්භ වෙලා, අපේ රටට වැඩිම විදේශ සංචාරකයින් සංඛ්‍යාවක් එන්නේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවල බව.

අද වනකොට අපේ රටට 32,000ක පමණ සංචාරකයින් පිරිසක් පැමිණ සිටියත්, අපේ මූලික target එක වන මිලියන 3 සපුරාලීමට තවම නොහැකි වෙලා තිබෙනවා. 2018දී දළ වශයෙන් අපේ රටට සංචාරකයින් මිලියන 5ක් පමණ පැමිණ තිබෙන බව අපි දන්නවා. ඒ තුළින් අපේ රටේ දළ දේශීය ආදායමෙන් සියයට 5කට ආසන්න ප්‍රමාණයක් 2018දී ඉපැයීමට හැකි වුණා. නමුත්, අද වනකොට සංචාරකයින් මිලියන 1.9ක් පමණ පැමිණ තිබෙනවා. ඒ හරහා අපේ රටේ දළ දේශීය ආදායමෙන් සියයට 2ත්, 3ත් අතර අඩු අගයක් තමයි ඉපැයීමට හැකිවෙලා තිබෙන්නේ කියලා මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. මම විශේෂයෙන්ම ඉල්ලා සිටින්නේ, අපේ මේ marketing campaign එක අඩුම තරමේ එන අවුරුද්දට වාසිසහගත වන විධියට ඉතා ඉක්මනින්ම දියත් කරන්න කියලායි.

අපේ සංචාරක ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටින නිසා මම මේ කාරණයත් කියන්න කැමැතියි. ඔබතුමා ජූලි මාසයේදී ප්‍රකාශයක් නිකුත් කළා, දැනට පවතින රටවල් 7ට අමතරව තව රටවල් 33කට visa free කරනවා කියලා. ඒ කියන්නේ, ඒ අදාළ වීසා ගාස්තුව රටවල් 33කට ගෙවීමට අවශ්‍ය වන්නේ නැහැ කියලා. ඒ ප්‍රකාශය නිසා අපේ සංචාරක කර්මාන්තයේ විශාල ආන්දෝලනයක් ඇති වුණා. නමුත්, අද වනකොට ඒකට අදාළ ගැසට් පත්‍රිකාව නිකුත් කිරීමට ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ සාධක නිසා අපේ සංචාරක කර්මාන්තයට අපේ මූලික අරමුණ ඉටු කර ගැනීමට නොහැකි තත්ත්වයක් තමයි ඇති වී තිබෙන්නේ.

[ගරු නීතිඥ චමින්ද්‍රානි කිරිඇල්ල මහත්මිය]

ඒ වාගේම මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. අපේ රටට එන සංචාරකයන් වෙනුවෙන් tour guidesලා ඉන්න බව අපි දන්නවා. විශේෂයෙන්ම මේ tour guidesලා සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම මේ tour guidesලා Sri Lanka Tourism Development Authority එකේ ලියාපදිංචි වීම අවශ්‍යයි. නමුත් දැන් තිබෙන අලුත් තත්ත්වය තමයි, මේ ඉන්න tour guidesලා වෙනුවට, පිට රටින් පැමිණි tour guidesලා අපේ රටේ ලියාපදිංචි වෙන්නේ නැතිව අපේ රටට ලැබිය යුතු ඒ විදේශ විනිමය ලබා ගනිමින් යම්කිසි දුෂ්කර තත්ත්වයක් ඇති කර තිබීම. මීට දින කිහිපයකට පෙර සමාජ මාධ්‍ය හරහා අපි යම්කිසි සිදුවීමක් දැක්කා. ඒ තමයි, විදේශිකයන්, විශේෂයෙන්ම චීන ජාතික tour guidesලා - ඒ කියන්නේ Sri Lanka Tourism Development Authority එකේ ලියාපදිංචි නොවූ tour guidesලා - Airport එකෙන් අපේ රටට එන සංචාරකයින්ව ඩැහැගෙන අපේ රටේ ලියාපදිංචි වෙලා තිබෙන tour guidesලාගේ කාර්යභාරය ඉටු කිරීම. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අපි දැක්කා, මීට දින කිහිපයකට පෙර අපේ රටට පැමිණි විදේශ කාන්තාවන්ට නොයෙක් හිරිහැර සිදුවෙලා තිබෙන ආකාරය. අපි දැක්කා, නවසීලන්තයේ සිට පැමිණි කාන්තාවකට තිරුක්කෝවිල් ප්‍රදේශයේදී යම්කිසි කරදරයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබුණු ආකාරය. ඒ වාගේම ඊයේ වාර්තා වෙලා තිබෙනවා, නෙදර්ලන්තයෙන් පැමිණි කාන්තාවන් දෙදෙනෙකුට කුරුණෑගල, මාවතගම ප්‍රදේශයේදී මෙවැනිම සිදුවීමකට මුහුණදීමට සිදුවෙලා තිබෙනවා කියලා. මම ගරු අමාත්‍යතුමාගෙන් නැවතත් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා. මොකද, මේක අනිවාර්යයෙන්ම අපේ සංචාරක කර්මාන්තයේ දියුණුවට විශාල වශයෙන් බලපාන කරුණක්.

මා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කය යුනෙස්කෝ සංවිධානය මඟින් ලෝක උරුම නගරයක් ලෙස නම් කර තිබෙන බව අපි දන්නවා. විශේෂයෙන්ම මහනුවර නගරය ආදර්ශ නගරයක් ලෙස සංවර්ධනය කිරීමට පසුගිය 2025 අය වැයෙන් රුපියල් මිලියන 50ක් වෙන් කරලා තිබුණා, Walkability Improvement Project කියලා. දළදා වීදියේ, රජ වීදියේ, කොළඹ වීදියේ සහ දේව වීදියේ කොටසක ඇවිදීම පහසු කිරීමට තමයි මේ ව්‍යාපෘතිය හරහා මුදල් වෙන් කර තිබුණේ. නමුත්, මේ රුපියල් මිලියන 50 වැය නොකිරීම නිසා නැවතත් මෙම මුදල භාණ්ඩාගාරයට ගිහිල්ලා තිබෙනවා. මේ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න කියලා මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මහනුවරට සංචාරකයින් පැමිණියාට ඔවුන් බොහෝදුරට එක රැයක්වත් මහනුවර ඉන්නේ නැහැ. මහනුවර දිස්ත්‍රික්කයේ හෝටල් 1,000කට වැඩි සංඛ්‍යාවක් ලියාපදිංචි වෙලා තිබෙනවා. නමුත්, අපේ marketingවල සහ brandingවල තිබෙන දුර්වලතා නිසා අද වන විට මහනුවරට එන බොහෝ සංචාරකයින් වැඩිම වුණොත් එක රැයයි මහනුවර රැඳී සිටින්නේ. මම කලින් කිව්ව ආකාරයට විශේෂයෙන්ම මහනුවර නගරය ලෝක උරුම නගරයක් වශයෙන් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ගරු අමාත්‍යතුමාගෙන් අප ඉල්ලීමක් කරනවා, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ වැඩි අවධානයක් යොමු කරන්න කියලා. පේරාදෙණිය උද්භිද උද්‍යානය, ඒ වාගේම දළදා මාළිගාව, ඊට අමතරව ලංකාතිලක විහාරය, ගඩලාදෙණිය වැනි පැරණි ඉතිහාසයක් තිබෙන සිද්ධස්ථාන මහනුවර පිහිටා තිබෙනවා. නමුත් ඒවා පිළිබඳව marketing සිද්ධ වනවා ගොඩක් අඩුයි. විශේෂයෙන් ගත්තොත්, Tourism Development Levy එක විධියට සියයට 0.5 සිට 1 දක්වා ගාස්තුවක් හෝටල්වලින් රජයට ගෙවනවා. නමුත්, marketing activities හරියට සිදු වන්නේ නැත්නම් එම මුදල ගැනීමෙන් සාධාරණයක් ඉටු වෙන්නේ නැහැ කියන එක මම මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. එම නිසා විශේෂයෙන්ම, විදේශ රටවලින් එන සංචාරකයින්ට මහනුවර රැඳී සිටීමට කැමැත්තක් ඇති වීම සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉතාම ගෞරවයෙන් මා ඉල්ලා සිටිනවා.

අධිකරණ ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ඔබතුමන්ලාගේ ගියවර අය වැය කථාවේදීත් සඳහන් කළා, විශේෂයෙන්ම අපේ උසාවි පද්ධතිය ඩිජිටල්කරණයට ලක් කරනවා කියලා. ඒ සම්බන්ධයෙන් අපිත් දීර්ඝව කථා කළා. මහනුවර අධිකරණ සංකීර්ණය ගත්තොත්, තවමත් එහි සාධනීය වෙනසක් සිදුවෙලා නැහැ. ගරු සභාපතිතුමනි, අඩුම ගණනේ නඩු කටයුතු සඳහා පැමිණෙන මහජනතාවට photocopy එකක් ගන්නවත් බැරි තත්ත්වයක් තමයි මහනුවර අධිකරණ සංකීර්ණය තුළ තිබෙන්නේ. ඉතින්, ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ඔප්පු register කිරීමේ ප්‍රශ්නයකුත් මහනුවර දිස්ත්‍රික්කය තුළ තිබෙනවා. සමහර අංශවල දිනකට ඔප්පු 7කට වඩා register කරන්නේ නැහැ කියලා මහනුවර නීතිඥ සංගමයෙන් මා දැනුවත් කර තිබෙනවා. විශේෂයෙන්ම one-day service හරහා ඔප්පු ලියාපදිංචි කිරීමේදී ආණ්ඩුවට ඒ සඳහා වැඩි මුදලක් ලැබෙනවා. නමුත් මේ one-day service එකට දිනකට ඔප්පු 7කට වඩා ලැබෙන්නේ නැහැ කියා තමයි අපව දැනුවත් කර තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉතාම කාරුණිකව ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. (Mrs.) Rohini Kumari Wijerathna. You have eight minutes.

[පූ.භා. 11.42]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සහ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය පිළිබඳව අද දිනයේදී වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා.

විදේශ රැකියා සම්බන්ධයෙන් කථා කරනකොට, විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, ඔබතුමන්ලා හොඳ යෝජනාවක් ගෙනැවිත් තිබෙන බව. විදේශගත ශ්‍රමිකයන්ට, ඒ කියන්නේ රටවිරුවන්ට දායකත්ව විශ්‍රාම වැටුපක්, සමාජ ආරක්ෂණ ක්‍රමයක් ගෙන ඒමට ඔබතුමන්ලා යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ, මමත් මේ සම්බන්ධව පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන බව. එය න්‍යාය පුස්තකයේ 43වැනි යෝජනාව හැටියට මේ වනකොට ඇතුළත් වෙලා තිබෙනවා. මගේ යෝජනාවම අරගෙන ඉදිරිපත් කිරීම පිළිබඳව ඔබතුමන්ලාට මා ස්තුතිවන්ත වනවා.

ගරු සභාපතිතුමනි, සංචාරක අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරනකොට මා කියන්න කැමැතියි, මාතලේ දිස්ත්‍රික්කය කියන්නේ සංචාරක පුරවරයක් බව. 2024 නොවැම්බර් මාසයේ පැවති අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී මම මතක් කළා, නකල්ස් රක්ෂිත සංචාරක කලාපය වැඩිදියුණු කරන්නට ලෝක බැංකු ආධාර යටතේ යම් කිසි මුදලක් ලැබී තිබෙන බව. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සිට සියලුදෙනා පුහුණු කර තිබුණා. හැබැයි, ඒ මුදල් තවම තිබෙන බවට තමයි ආරංචිය තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර, යහ පාලන රජය සමයේ ඉදිරිපත් කරපු ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු අධිකරණ ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, මම කියන්න කැමැතියි, පසුගිය සතියේ පාළු ගෙයි වළං බිඳිනවා වාගේ තත්ත්වයක් තමයි ඇති වෙලා තිබුණේ තියලා. පෞද්ගලික හේතුවක් නිසා මට එදා අය වැය දෙවන වර කියවීමේ විවාදයට අදාළව ඡන්දය විමසන අවස්ථාවේදී එන්න බැරි වුණා. එහෙම නැතුව, බයකට ඡන්දය දෙන්න නැවිත් සිටියා නොවෙයි කියන එක මම මේ වෙලාවේ මතක් කරනවා. මොකද, එවැනි අර්ථ කථන ඒ තුළ තිබුණා. *[බාධා කිරීමක්]* අධිකරණ ඇමතිතුමා නොවෙයි. මම ඒක දැක්කා, සමාජ මාධ්‍යවල.

මම විශේෂයෙන්ම කිව යුතු තවත් කාරණයක් තිබෙනවා. මා මිත්‍ර උගත් නීතිඥ ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා ඊයේ කළ ප්‍රකාශයක් මම දැක්කා. එය නිවැරදියි. මේක රෝහිණී විජේරත්නගේ මතය මිස, සමගි ජන බලවේගයේ මතය නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ අපි නීති සම්පාදකයන්. නීති සම්පාදනය කරනකොට අපට යම් ගැටලුවක් මතු වනවා නම්, අපට ඒකට සංවාදයක් තිබෙන්න ඕනෑ. සංවාදයක් තිබිලා ඒක නිවැරදි මඟකට ගන්න පුළුවන් වුණොත් තමයි, ප්‍රශස්ත යෝජනාවක් බිමට යන්නේ. අන්න ඒ කටයුත්ත තමයි මම එදා කළේ. මම ඒක පැහැදිලි කරන්නම්, ඔයගොල්ලන් නිශ්ශබ්දව අහගෙන ඉන්න. මේක රෝහිණී කවිරත්නගේ මතය කියන එක සහ මා දැකපු දෝෂය මම ඔබට පෙන්නුවා කියන එක තමයි මම මේ වෙලාවේ කියන්නේ.

විශේෂයෙන්ම මම මේ ගැනත් කියන්න ඕනෑ. මගේ නිවස වටේම ඉන්නේ වතු ප්‍රජාව. මගේ ගෙදර ඉස්සරහ පැත්තට එනකොට, විශේෂයෙන් කබරගල ඉඳලා පිටකන්ද පැත්තට එනකොට ඇල්කඩුව වැවිලි සමාගමට අයත් ඉඩම් තිබෙන්නේ. අනෙක් පැත්තේ තිබෙන්නේ රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් ඉඩම්. මේ ඉඩම්වල සේවය කරන වතු ශ්‍රමිකයෝ සහ අපි සහෝදරයෝ වාගේ ජීවත් වන පරිසරයක් තුළ මට මොළේ අමාරුවක් නැහැ, වතු ශ්‍රමිකයාට දෙන දීමනාව වැඩි කරනවාට විරුද්ධ වන්න. මම මගේ අත් දෙකම ඔසවනවා, ඒක නීත්‍යානුකූලව දෙන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා නම්. අපි ඒක හදන්න ඕනෑ. අන්න ඒකට තමයි මේ සභාව භාවිත කරන්න ඕනෑ. එහෙම නැතුව මේ සභාව භාවිත කළ යුත්තේ මඩ ගහගන්න නොවෙයි කියන එක මම ඔබතුමන්ලාට මතක් කරන්න ඕනෑ.

සමගි ජන බලවේගයේ මතය මොකක්ද කියන එක පිළිබඳව බොහෝ මන්ත්‍රීවරුන් කථා කළා. විපක්ෂ නායකතුමාත් ඒ ගැන පැහැදිලි කිරීමක් කළා. සමගි ජන බලවේගයේ මතය ඒකයි. මම කියනවා, මම වතු ශ්‍රමිකයාව අන්දවනවාට විරුද්ධයි කියන එක. හැම දාම වතු ශ්‍රමිකයා අන්දවා, නොයෙකුත් බොරු පොරොන්දු දීලා ඒ අය නොමඟ යැවූ යුගය අපි දැන් අවසන් කරන්න ඕනෑ.

ඊයේ "The Sunday Times" පත්තරේ මෙන්න මෙහෙම පළ වෙලා තිබෙනවා, I quote:

> "AG upholds supremacy of PFMA over ACA
>
> The Attorney-General has ruled that all state financial transactions must follow the Public Financial Management Act ..."

2025.11.16වන දින "The Sunday Times" පත්තරේ පළ වූ වාර්තාව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒකෙන් කියන්නේ මොකක්ද? සියලු ආයතන 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව ක්‍රියා කළ යුතු බව. මේක කථානායකතුමාට දැනුම් දීලා තිබෙනවා. මේක කථානායකතුමාට දැනුම් දෙන්නේ මේ නිසායි. කථානායකතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් නීතිපතිවරයාගෙන් අහනවා, එහි නීත්‍යානුකූලභාවය. ඒකට දීපු උත්තරය මෙන්න මේකයි. අධිකරණ ඇමතිතුමාත් මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා. ගරු සභාපතිතුමනි, කථානායකතුමා අහපු ප්‍රශ්නයම මම අහනවා. ඒ, කාගෙන්ද? විගණකාධිපතිතුමාගෙන්, ජාතික ප්‍රසම්පාදන කොමිසමෙන් වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් මම අහනවා, මේක හරිද කියලා. මේක වැරැදි නම් නිවැරැදි කරන්න. මොකද, අපි වතු ශ්‍රමිකයන්ට නිවැරැදි ක්‍රමයක් හදලා දෙන්න ඕනෑ. දෙන්න පුළුවන් විධියේ නීත්‍යානුකූල ක්‍රමයක් අපි හදලා දෙන්න ඕනෑ. මොකද, නීතිපතිතුමා කියනවා, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ගැන තිබෙන ඉහළම පනත තමයි, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත කියලා. විගණකාධිපතිතුමා, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් මම ඒ ගැන විමසන ලද ලිපිය මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේක මගේ මතය බව මම නැවත කියනවා. මගේ මතය වෙනුවෙන් මම පෙනී ඉන්නවා. පාර්ලිමේන්තු කාර්යභාරය කියන්නේ මොකක්ද කියන එක මම පැහැදිලි කළා. ඒ සම්බන්ධව අහන්න හොඳම අයගෙන් තමයි මම ඇහුවේ. ඒක නිසා මේ යෝජනාව නිවැරැදි කරන්න කියලා තමයි මගේ ලිපියෙන් මම අහන්නේ. ඒ ලිපියේ මම කියනවා, වතු කම්කරුවාගේ දෛනික වැටුප වන රුපියල් 1,700ක මුදල රුපියල් 2,000 කරන්න කියලා. ඒකට ඔබතුමන්ලා විරුද්ධද? පෞද්ගලික සමාගම් 22ක තෝරා ගත් දින 25 ඉක්මවා වැඩ කරන ශ්‍රමිකයන්ට පමණක් නොවෙයි මේ දීමනාව ගෙවන්න ඕනෑ. එහෙම ඉන්නවා නම් ඉන්නේ මුරකාරයායි, කෝකියායි, ෆැක්ටරියේ වැඩ කරන කිහිප දෙනායි විතරයි. දින 25ක් වැඩ කරන ශ්‍රමිකයන්ට විතරක් නොවෙයි, අනෙක් අයටත් මේ දීමනාව දෙන්න ඕනෑ.

කුඩා හා මධ්‍ය පරිමාණ වතු තමයි මේ රටේ තේ ආර්ථිකයට සියයට 75ක දායකත්වයක් ලබා දෙන්නේ. ඒ අයව මේකෙන් අයින් කරන්න එපා, ඒ අයටත් මේ මුදල ගෙවන්න කියා තමයි මම කියලා තිබෙන්නේ. ඒක වැරැදිද? අනුර කුමාර දිසානායක විපක්ෂයේ මන්ත්‍රීතුමා හැටියට ඉන්නකොට එතුමා කියනවා මම අහලා තිබෙනවා, "රුපියල් 1,700 නොදෙන වතු ආණ්ඩුවට පවරා ගන්න ඕනෑ" කියලා. මේ ගෙවීම 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට එකඟද, නැද්ද කියන එකයි මම ඇහුවේ. නීතිපතිතුමා කියනවා, "ඒ පනත තමයි උත්තරීතර" කියලා. හැබැයි, විගණකාධිපතිතුමා තවම මට ඒකට උත්තරයක් දීලා නැහැ.

ගරු සභාපතිතුමනි, අපේ රටේ වතු ශ්‍රමිකයන් 480,000ක් ඉන්නවා. ලාභ ලබන වතු සමාගම් 21 ඇතුළේ ඉන්නේ 101,000යි. ඒකෙන් දවස් 25 වැඩ කරන අය 50,000ට අඩුයි. 20,000ක් විතර ඉන්නේ. අපි 20,000ක් කියලා හිතුවොත්, 460,000කට මේ මුදල හම්බ වෙන්නේ නැහැ. මන්දපෝෂණය තිබෙනවා. වහල සිදුරු

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

වෙලා, වැස්සට තහඩුව යටින් වතුර වැටෙනවා. ගෙදර පොළොවේ උල්දිය දානවා. ඒවා ඇහෙන් දැකපු, අත්විඳපු කෙනෙක් මම. එහෙම අය මේ 20,000 ඇතුළේ නැහැ. එහෙම නම් අපි මේ සියලුදෙනාට සාධාරණය ඉෂ්ට කරන්න ඕනෑ. සමානයන් වෙනස්කොට සැලකීම කියන එක මේක ඇතුළේ සිදු වෙනවා. ඒක නිසා තමයි මම කිව්වේ, හැමෝටම දෙන්න පුළුවන් ක්‍රමයක් මේක තුළ හදන්න කියලා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. (Mrs.) Rohini Kumari Wijerathna, your time is up.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

මේකට වියදම් කරන්නේ ඒකාබද්ධ අරමුදලේ මුදල්. ඒවා නීත්‍යානුකූල වෙන්න ඕනෑ. එහෙම නොවුණොත්, මම විගණකාධිපතිතුමාගෙන් අහනවා, මේකට අත්සන් කරන වැවිලි කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා, අය වැය අධ්‍යක්ෂ ජනරාල්තුමා, වතු සමාගමේ ප්‍රධානීන් හිරේ යනවාද, නැද්ද කියලා. දැන් එහෙම දේවල් සිදු වෙලා තිබෙනවා. එහෙම වෙනවාද, නැද්ද? ඔව්ද, නැද්ද? එහෙම වෙන්නේ නැත්නම්, විගණකාධිපතිතුමා කියනවා නම් මේවා අපි ගෙවමු කියලා,- අපි දකිනවා, විගණකාධිපතිතුමා හැම දාම COPE එකට ඇවිල්ලා මේ මූල්‍ය කළමනාකරණ පනත ඉස්සරහට අරගෙන තමයි ප්‍රශ්න කරන්නේ - එතුමාට ආපසු COPE එක තුළ කරන්න වැඩක් නැතුව යනවා. මම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් අහනවා, අල්ලස කියන වරද මේකෙන් වෙන්නේ නැද්ද කියලා. හරි, ඒක වෙන්නේ නැහැ කියනවා නම් අපි ගෙවමු, රුපියල් 1,700 නොවෙයි, රුපියල් 2,000ක්. දින 25 වැඩ කරන කම්කරුවන්ට පමණක් නොවෙයි, වතු ශ්‍රමිකයන් සියලුදෙනාට ඒ දීමනාව ගෙවන්නට සමගි ජන බලවේගය ඇතුළුව රෝහිණී විජේරත්නත් එකඟයි. අන්න ඒක සමාජගත කරන්න ඕනෑ. නමුත්, ඒ වතු ශ්‍රමිකයන්ගේ තිබෙන සැබෑ ගැටලුව දඩමීමා කරගෙන, ඒ අයව එළියට දමලා, පින්තූර පුච්චලා තමන්ගේ දේශපාලන වාසිය ගන්නවා නම්, අන්න ඒවා තමයි තුච්ඡ වැඩ.

අවසාන වශයෙන් මම කියනවා, එදා හා අද පෙනී ඉන්නවා වාගේම හෙටත් මම ඒ වතු ශ්‍රමිකයන් වෙනුවෙන් පෙනී ඉන්න බව. ඔබතුමන්ලා පෙළපාළි නොවෙයි, පින්තූර පිච්චුවත්, මාව පාරේ මරලා දැම්මත් ඒ අයට හොඳ ක්‍රමයක් ලැබෙන කල් මගේ සටන මම ගෙන යනවා. මගේ මතය වෙනුවෙන් මම පෙනී ඉන්නවා. මොකද, වහලය හිල් වෙලා තිබෙන්නේ, පොළොවෙන් උල්දිය දමන්නේ අර කියන ප්‍රධාන සමාගම් 21ක වැඩ කරන අයගේ නිවෙස්වල නොවෙයි. මන්දපෝෂණයෙන් පෙළෙන්නේ ඔවුන් නොවෙයි.

මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙනවා. නමුත් මම කියනවා, කියවන්න, ලියන්න විතරක් නොවෙයි, කියපු දෙයක් තේරුම් ගන්නත් පුළුවන් සමාජයක් බිහි කරන්න ඕනෑ බව. එහෙම නැති නිසා තමයි විදේශ කටයුතු ඇමතිතුමාට අර පට්ට සිංහලෙන් ලියපු ලියුම කියවලා අවබෝධ කර ගන්න බැරි වුණේ කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. U.P. Abeywickrama. You have nine minutes.

[පූ.භා. 11.52]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)

මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු සභාපතිතුමනි.

අපි අහලා තිබෙනවා කථාවක්, "මුට්ටිය බිඳගෙන නා ගන්නවා" කියලා. මම හිතන විදියට, මේ විරුද්ධ පක්ෂය මුල් අවස්ථාවේදීම වතු කම්කරුවන් සඳහා,- දීර්ඝ කාලයක් තිස්සේ මේ රටේ ආර්ථිකය පෝෂණය කරන්න, මේ රටේ ජාතික උන්නතිය සඳහා විශාල මෙහෙයක් ලබා දීපු වතු කම්කරු ජනතාවගේ දුක්ගැනවිල්ල සම්බන්ධයෙන් අපේ ආණ්ඩුව බලයට පත් වෙච්ච මොහොතේ ඉඳලාම අවධානය යොමු කළා. අදාළ අංශ සමඟ වාගේම වතු හාම්පුතුන් සමඟ කථා කරලා, කරන්න පුළුවන් සියලු ආකාරයේ සාකච්ඡාවලින් පසුව ඉතාම විධිමත්ව ඉදිරිපත් කරපු යෝජනාවක් අනුව හාම්පුතුන්ගෙන් රුපියල් 200ක මුදලකුත්, ආණ්ඩුවේ භාණ්ඩාගාරයෙන් රුපියල් 200ක මුදලකුත් වශයෙන් රුපියල් 400ක් එකතු කරලා, රුපියල් 1,750ක වැටුපක් ලබා දීමේ තීරණයට එළඹුණා. කොහොම වුණත්, ඒක මෙතුමන්ලාට දරා ගන්න බැරිව එක එක ඒවා කියලා මේ රටේ වතු කම්කරු ජනතාවගේ කෝපයට, ගර්හාවට පාත්‍ර වුණාට පසුව දැන් විවිධ කථා කියනවා. ජනාධිපතිවරයා ඉතා පැහැදිලිව කිව්වා, දවසක් වැඩ කළත්, දවස් දෙකක් වැඩ කළත්, දවස් 20ක් වැඩ කළත් රුපියල් 200 ගණනේ දීමනාව ලැබෙනවා කියලා. දවස් 25ක් වැඩ කළොත් ලැබෙන ගණන තමයි හදලා පෙන්වූවේ. අපි දන්නේ නැහැ, ඒක තේරුම් ගන්න බැරි තරම් මේගොල්ලන්ගේ මොළයේ මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවාද කියලා.

ගරු සභාපතිතුමනි, අපි අද දිනයේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැනත් කථා කරනවා. එම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරනකොට මම කියන්න ඕනෑ, අපි මෙවර අය වැයෙන් 2026 වසර සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට රුපියල් මිලියන 58,500ක් වෙන් කරලා තිබෙන බව. එයින් රුපියල් මිලියන 43,000ක් පුනරාවර්තන වියදම් හැටියටත්, රුපියල් මිලියන 15,500ක මුදලක් ප්‍රාග්ධන වියදම් හැටියටත් වෙන් කරන්න යෝජනා කරලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. ජාතික ජන බලවේගය අපේ ආණ්ඩුව බලයට පත් වුණේ පරණ ආණ්ඩු කරගෙන ගිය කෙරුවාව කරගෙන යන්න නොවෙයි. අපි මේ රටේ ජනතාවට ඉතාම පැහැදිලි පොරොන්දුවක් දුන්නා, යල් පැන ගිය, ගතානුගතික දේශපාලන පක්ෂ විසින් අගාධයට ඇද දමපු මේ රට අපි වෙනස් මාවතකට ගෙන යනවාය කියලා.

දැන් මෙතුමන්ලා නඟන තර්කයක් වාගේම වාද විවාද කරන කාරණාවක් තමයි, අපේ ප්‍රාග්ධන වියදම්වල යම් අඩුවක් තිබෙනවාය කියන කාරණය. අපි අනිවාර්යයෙන්ම ඒක පිළිගන්නවා. අපි ඒක දැනගෙන කළේ. මීට පෙර කිසිම විධිමත් ක්‍රමවේදයකින් තොරව, ආවට ගියාට, තමන්ගේ හිතවතුන්ට, කොන්ත්‍රාත්කරුවන්ට දීලා මහජන මුදල් නාස්ති කරපු විදියට නොවෙයි, අපි ඉතාම විධිමත් ක්‍රමවේදයක් සහිතව තමයි ප්‍රාග්ධන වියදම් වශයෙන් මහජන මුදල් වියදම් කරන්නේ.

ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් කියනවා නම්, මේ දවස්වල වාහන ගෙන්වීමේදී දින 12කින් ටෙන්ඩරය close කිරීම පිළිබඳව විවිධ කථා කියනවා. අපි ඒගොල්ලන් වාගේ හොරකම් කරන්න එහෙම ක්‍රියාත්මක වෙනවා නොවෙයි. හදිසි කටයුතුවලදී යම් ආකාරයකට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇතුළේම කරන්න පුළුවන් දේවල් තමයි අපි ආණ්ඩුවක් හැටියට කරන්නේ.

ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපේ ආණ්ඩුව, අපේ ඇමතිවරු මේ රටේ ජනතාවගේ බදු මුදල් සාංසික දේපළ වාගේ ආරක්ෂා කරනවා කියන පොරොන්දුව මත බලය ලබා ගත් දේශපාලන ව්‍යාපාරයක් හැටියට ගෙවී ගිය මාස කිහිපය තුළ අපේ හැම අමාත්‍යාංශයකම, හැම දෙපාර්තමේන්තුවකම කටයුතු ඉතා විධිමත්ව සිදු කෙරුණු බව. විධිමත්ව ඒ කාර්ය පටිපාටිය ඇතුළේ කටයුතු කරන කොට අය වැය ඉදිරිපත් කරලා සම්මත කර ගත්තේ මාර්තු මාසයේ. අප්‍රේල් මස මැතිවරණයක් ප්‍රකාශයට පත් වුණා. ඒ නිසා මැයි අග වනකල් කිසිදු කටයුත්තක් කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඉන්පසු මාස කිහිපය තුළ තමයි මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිද්ධ වුණේ.

අපේ රටේ අධිකරණය සම්බන්ධයෙන් අපි මූලධර්මයක් හැටියට ප්‍රකාශ කළ දෙයක් තමයි, සාම්ප්‍රදායිකව ඔහේ වර්ධනය වෙච්ච අධිකරණ ක්‍රියාවලියක්, මේවා ඇතුළේ පහසුකම් නැහැ, මේවා විධිමත්ව පවත්වාගෙන යන්න පැවති රජයන් කටයුතු කළේ නැහැ කියන එක. විශේෂයෙන්ම සිවිල් නඩු සහ අපරාධ නඩු ගත්තාම, ලක්ෂ ගණනක් -ලක්ෂ 11කට අධික ප්‍රමාණයක්- අධිකරණය තුළ ගොඩ ගැසී තිබෙනවා. මේවා නිසා පීඩාවට පත් වෙලා තිබෙන්නේ රටේ ජනතාව. ලංකාවේ සමාජය තුළ තිබෙන සංස්කෘතික ලක්ෂණත් එක්ක ගත්තාම, ඉඩම් සම්බන්ධයෙන් තිබෙන ගැටලුව ඉතාම බරපතළයි. මේ සියල්ල ගැටගැහිලා තිබෙන්නේ අපේ රටේ පැවති දේශපාලන සංස්කෘතිය සහ පාලකයන්ගේ අවිධිමත් ක්‍රියාවලිය ඇතුළේ. ඒ නිසා අපට මේ සියලු ගැටලු ලිහාගෙන තමයි ඉස්සරහට යන්න වෙන්නේ.

ගරු සභාපතිතුමනි, සංවර්ධන ක්‍රියාවලිය ගත්තොත්, පසුගිය කාලයේ අපට පෙනුණු දෙයක් තමයි, රාජ්‍ය ආයෝජනවලට ඉඩම් නිදහස් කිරීම, ව්‍යාපෘතිවලට ඉඩම් ලබා ගැනීම කියන කාරණාවලදී හැම ඉඩමකටම නඩු පැවතීම. විවිධ ආරවුල් නිසා මේවා නිරවුල් කර ගැනීමේ කටයුතු වේගයෙන් ක්‍රියාත්මක කිරීමට පුළුවන්කමක් නැහැ. මේ තත්ත්වයන්ට ආණ්ඩුවක් හැටියට අපට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. සෑම ක්ෂේත්‍රයකම තිබෙන වියවුල් සහගතභාවය නිරවුල් කරගෙන තමයි අපට ඉදිරියට යන්න වෙන්නේ.

ගරු සභාපතිතුමනි, මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ පූගොඩ අධිකරණය ගත්තොත්, ඉතා දුෂ්කර තත්ත්වයක් යටතේ තමයි ඒ අධිකරණය පවත්වාගෙන යන්නේ. ඒ අධිකරණය අවුරුදු 5කට ආසන්න කාලයක් තිස්සේ කුලී බිල්ඩින් එකක පවත්වාගෙන යන්නේ. අපට හිතාගන්න බැහැ, මේ කුලී බිල්ඩින් කොහොමද මේගොල්ලන් ලබා ගත්තේ කියලා. රුපියල් ලක්ෂ හතරහමාරයි, පහයි කුලිය. අධිකරණයක් පවත්වාගෙන යෑමට සුදුසු තත්ත්වයක් ඒ බිල්ඩින්වල නැහැ. ඒ අධිකරණ ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා වියදම් කරපු මුදලට ආසන්න මුදල් ප්‍රමාණයක් ගෙවන්න වෙලා තිබෙනවා, කුලී ගොඩනැඟිල්ලක පවත්වාගෙන යෑමට සිදු වීමෙන්. විශේෂයෙන් පූගොඩ අධිකරණ සංකීර්ණය ගත්තොත්, පසුගිය කාලයේ ඉදිකිරීම් කටයුතු අඩාළ වෙලා තිබුණා. ගිය වසරේ අපේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමා සහභාගි වෙලා, ඒ ස්ථානය නිරීක්ෂණය කරලා වැඩ කටයුතු පටන් ගත්තා. නමුත් පසුගිය දවස්වල නැවත ඒ කටයුතු අඩපණ වෙලා තිබෙන තත්ත්වයක් දකින්න ලැබුණා. නැවත යථා තත්ත්වයට පත් කරලා එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබෙනවා. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව තමයි මෙහි ඉදිකිරීම් කටයුතු කරන්නේ. ඒවා උපකොන්ත්‍රාත්කරුවන්ට ලබා දී කටයුතු කිරීමේදී ගැටලු පැන නැඟිලා තිබෙනවා.

ඊළඟට, ගම්පහ අධිකරණ සංකීර්ණය සම්බන්ධයෙන් නීතිඥ සංගමය මඟින් ඉල්ලීමක් කර තිබෙනවා. ඒ ඉල්ලීම අනුව නගර සැලැස්මට අනුකූලව ගම්පහ අධිකරණ සංකීර්ණය ඉදිකිරීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම අධිකරණ අමාත්‍යාංශයේ අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අධිකරණ ඇමතිතුමා සාකච්ඡාවක් සිදු කිරීමට අවස්ථාව ලබා දීමට පොරොන්දු වෙලා තිබෙනවා. මේ විධියට ගත්තාම, ලංකාව පුරාම අධිකරණ ක්ෂේත්‍රයේ තිබෙන යටිතල පහසුකම් ඉහළ නැංවීම අවශ්‍යයි; මේ යටිතල පහසුකම් යථා තත්ත්වයට පත් කිරීම අවශ්‍යයි. ඒ වාගේම කාර්ය මණ්ඩලවල ගැටලුත් තිබෙනවා. අපි දන්නවා, අධිකරණ ක්ෂේත්‍රයේ විනිශ්චයකාරවරුන්ට අවශ්‍ය කරන පහසුකම් ලබා දෙන්න ඕනෑ බව. අපි ආණ්ඩුවක් හැටියට පොරොන්දු වෙලා තිබෙනවා, විනිශ්චයකාරවරුන්ට අවශ්‍ය කරන පර්යේෂණ සහායකයින් ලබා දෙන්න. ඒ වාගේම මහෙස්ත්‍රාත්වරුන් 50දෙනෙක් බඳවා ගැනීමට පසුගිය දිනවල කටයුතු කළා. මේ විධියට ගත්තාම, මේ ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු සියල්ල හඳුනා ගනිමින්, අධ්‍යයනය කරමින් කටයුතු කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා.

මේ වනකොට අපි බලයට පත් වෙලා වසරක් ගත වෙලා තිබෙන්නේ. ඒ වසර ඇතුළත අපි කටයුතු විශාල ප්‍රමාණයක් කර තිබෙනවා. ඒ වාගේම ක්ෂේත්‍ර ගණනාවකට අදාළ කටයුතු පිළිබඳ තීරණය කිරීම සඳහා අපි කමිටු පත් කර තිබෙනවා; විශේෂයෙන්ම කමිටු 13ක් පත් කර තිබෙනවා. මම ගිය වාරයේ මගේ කථාවේදී ඉතා පැහැදිලිව කිව්වා, අධිකරණවල විශාල ගැටලුවක්ව තිබෙන, ගොඩ ගැහිලා තිබෙන නඩු භාණ්ඩ ප්‍රමාණය අඩු කර ගන්නේ කොහොමද කියලා.

ඒ සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා, අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා හැටියට අග්‍ර විනිශ්චයකාරතුමා නියෝගයක් දීලා තිබෙනවා, දෙසැම්බර් 31වන දාට ඉස්සරවෙලා මේ කටයුතු ක්‍රියාත්මක කරලා, Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ හැකි තරම් මේ අධිකරණ පරිශ්‍ර පිරිසිදු කිරීමට සහ නිදහස් කිරීමට හැකි නඩු භාණ්ඩ නිදහස් කර, අවශ්‍යම නඩු අයිතමයන් පමණක් අධිකරණවල තබා ගැනීමට කටයුතු කරන ලෙස. මේ ආදී වශයෙන් ගත්තාම අපට විශාල අභියෝගයක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. අධිකරණ ක්ෂේත්‍රයේ විතරක් නොවෙයි, ලංකාවේ සෑම ක්ෂේත්‍රයකම ඇති කර තිබෙන ව්‍යාකූලතා, නොසැලකිල්ල, අනවධානය, විශේෂයෙන්ම අමාත්‍යාංශ භාරව කටයුතු කරපු සහ පාලනය කරපු දේශපාලනඥයන්ගේ අදුරදර්ශී ක්‍රියා නිසා සෑම ක්ෂේත්‍රයකම දක්නට ලැබෙන වියවුල් නිරාකරණය කරගෙන කටයුතු කරන්න අපට සිදුවෙලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. අපි ඉදිරි වසර කිහිපය තුළ මේ කටයුතු නිරාකරණය කරගෙන, සෑම ක්ෂේත්‍රයක්ම විධිමත් කරමින්, අපි පොරොන්දු වෙච්ච පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් සඳහා අවශ්‍ය කරන ගමන් මඟේ ගමන් කරන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Chamara Sampath Dasanayake, please. You have 19 minutes.

[අ.භා. 12.02]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු සභාපතිතුමනි, මම මුලින්ම මේ කාරණය කියන්න ඕනෑ, අද උදේ පාන්දර පොලීසිය භාර අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මැතිතුමා ප්‍රකාශ කළා ත්‍රිකුණාමලයේ බුදු පිළිමය ගලවාගෙන ගිය එක ගැන. බුදු පිළිමය ගෙනැල්ලා තිබෙනවා කියලා පට්ටපල් පවයක් හලලා ගියා. ඩෝසරයකුත් ගෙනැල්ලා මේ වෙනකොටත් ත්‍රිකුණාමලයේ ලොකු ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. මොකද, අපි නම් බෞද්ධයෝ. අපටත් ප්‍රශ්නයක් තිබෙනවා. ඕනෑ කෙනෙකුට ඕනෑම ආගමක් අදහන්න පුළුවන්. ත්‍රිකුණාමලය වාගේ ප්‍රදේශයක බෞද්ධයින් බොහොම පොඩි ප්‍රමාණයක් ජීවත් වෙන්නේ. හැබැයි, තවම ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ, පොලීසිය භාර ඇමතිතුමා කිව්වාට. පොලීසිය භාර ඇමතිතුමාට ආගමක් තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. නමුත්, අපට ආගමක් තිබෙනවා. ඒ ප්‍රශ්නය තවම විසඳිලා නැහැ, ත්‍රිකුණාමලයේ. උදේ පාන්දර පට්ටපල් පවයක් කියලා ගියා.

ගරු සභාපතිතුමනි, රාජ්‍ය පරිපාලන ඇමති කියන්නේ රටේ ප්‍රධාන ඇමති. එතුමා උදේ එකක් කියලා ඊට පස්සේ ඇවිල්ලා ඒ කථාව වෙනස් කරනවා. එහෙම වෙනස් කරන්න බැහැ මේ පාර්ලිමේන්තුවේ. උදේ ප්‍රශ්නයට දීපු උත්තරය හැන්සාඩ්ගත වෙලා තිබෙනවා. අපි හැන්සාඩ් වාර්තාව ගන්නවා. හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා, එතුමා උදේ ප්‍රශ්නයට ලබා දීපු උත්තරය. එතුමා දන්නේ නැහැ, මේ පාර්ලිමේන්තුවේ කියන දේවල් හැන්සාඩ්ගත වෙනවා කියලා. එතුමාට උදේ කියපු දේ හවස වෙනස් කරන්න බැහැ. ඒවා හැන්සාඩ්ගත වෙලා තිබෙනවා.

ඊළඟට තව කාරණයක් කියන්න තිබෙනවා. මේ වෙලාවේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක ඇමතිතුමා සභාවෙන් එළියට ගියා. අද මේ ආණ්ඩුව බලාපොරොත්තු වෙන්නේ විදේශ ශ්‍රමිකයන්ගේ මුදල්. අද වෙනකොට ඊශ්‍රායලයට යවන්න විශාල පිරිසක් interview කරලා තිබෙනවා. ඒ ඊශ්‍රායලයට යවන එකේ පොඩි ප්‍රමාදයක් තිබෙනවා. මේ අවස්ථාවේ විදේශ කටයුතු ඇමතිතුමා නැවත සභාවට එනවා. බොහොම ස්තුතියි, ඇමතිතුමා ආපසු ආපු එක ගැන. ඊශ්‍රායල් ශ්‍රමිකයින්ගේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, interview කරලා යන්න ප්‍රමාද වීම නිසා දැන් පෝලිමක් බලාගෙන ඉන්නවා ලංකාවේ, නැවත ඊශ්‍රායලයට යන්න. දැන් ඊශ්‍රායලයේ පැවැති යුද්ධයත් ඉවරයි. ඒ නිසා මම හිතනවා, ඒ අය යවාගන්න පුළුවන් නම් හොඳයි කියලා.

අද දින අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවත් විවාද කරනවා. අධිකරණ අමාත්‍යාංශය කියන්නේ රටේ වැදගත්ම අමාත්‍යාංශය. මම මේ වෙලාවේ මේ කාරණය කියන්න ඕනෑ, අධිකරණ ඇමතිතුමනි. කලින් රත්නසිරි වික්‍රමනායක, නිශ්ශංක විජයරත්න, ටිරෝන් ප්‍රනාන්දු, ලක්ෂ්මන් කිරිඇල්ල, අබ්දුල් කාදර්, ෂාහුල් හමීඩ්, ජී.එල්. පීරිස්, වි.ජ.මු. ලොකු බණ්ඩාර, රනිල් වික්‍රමසිංහ වාගේ වැදගත් නීතිඥ ඇමතිවරු හිටපු අමාත්‍යාංශයක් තමයි මේ අධිකරණ අමාත්‍යාංශය. අධිකරණ අමාත්‍යාංශය යටතේ අද මම කරුණු කිහිපයක් කථා කරනවා. මීට කලින් විපක්ෂ නායකතුමාත් කථා කළා, හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ ප්‍රශ්නය ගැන. දැන් මේ ආණ්ඩුව බල්ලෝ වළ දමන්න රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා. මිනිස්සු මැරුණාම ඒ ගැන පරීක්ෂා කරන හදිසි මරණ පරීක්ෂකවරුන්ටත් අද ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ ප්‍රශ්නය ගැන මමත් පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. මෙතැන බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මැති ඇමතිවරුත් ඉන්න නිසා විශේෂයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. බදුල්ලේ මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තිබෙනවා. මීගහකිවුලේ ඉඳන් පිටමාරුවට ගිහින් එන්න පැය 3ක් යනවා. පිටමාරුවේ ඉඳන් මීගහකිවුලට නැවත එන්න පැය 3ක් යනවා. හදිසි මරණ පරීක්ෂක කෙනෙක් යන්න ඕනෑ මීගහකිවුලේ සිට පිටමාරුවට. පිටමාරුවට යන්න පැය 3ක් යනවා. රුපියල් 1,000යි මරණයකට ගෙවන්නේ. බදුල්ල දිස්ත්‍රික්කයේ තිබෙනවා සමහර තැන්, විශේෂයෙන්ම ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දොඩම්ගොල්ල, ඉලුක්පැලැස්ස, උඩවාඩිය කියලා ගම් තිබෙනවා. ඒවායේ මරණ තවමත් කද බැඳගෙන යන්නේ. ගහකින් වැටුණාම, සර්පයෙක් ගැහුවාම කද බැඳගෙන යන්නේ. හදිසි මරණ පරීක්ෂවරයෙකුට ගෙවන්නේ රුපියල් 1,000යි. ගරු අධිකරණ ඇමතිතුමනි, හදිසි මරණ පරීක්ෂවරුන්ට ඒ ගෙවන රුපියල් 1,000 ප්‍රමාණවත් නැහැ. දැන් රුපියල් 1,000කින් තෙල් ටිකක්වත් ගහගෙන යන්න බැහැ. එම නිසා මම ඉල්ලා සිටිනවා, හදිසි මරණ පරීක්ෂකවරුන්ට ලබා දෙන එම දීමනාව අඩුම වශයෙන් රුපියල් 3,000ක්වත් කරන්න කියලා. මොකද, අපේ පළාත වාගේ දුෂ්කර පළාත්වල අයට මැරුණු කෙනාගේ දේහය බදුල්ලට රැගෙන යන්න වෙනවා. බදුල්ලට ගෙනියලා බදුල්ලේ මහ ඉස්පිරිතාලයේ තමයි මරණ පරීක්ෂණය කරන්නේ. හදිසි මරණ පරීක්ෂකවරයෙක් බදුල්ලට ඇවිත් ආයේ ගමට යන්න ඕනෑ. ඒකට දවස් දෙකක් යනවා. ඒක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ ගැන සැලකිල්ල යොමු කරන්න කියලා මම මේ වෙලාවේ කියනවා.

ගරු අධිකරණ ඇමතිතුමනි, අධිකරණය ගැන රටේ මිනිසුන්ගේ විශ්වාසය යම් ප්‍රමාණයකට නැති වෙලා තිබෙනවා; විශ්වාසය පලුදු වෙලා තිබෙනවා. මොකක්ද ඒකට හේතුව? ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. ඔබතුමා ගැන මගේ ලොකු විශ්වාසයක් තිබෙනවා. හැබැයි, මේ සිදු වන ඒවා ගැනත් අපි කියන්න ඕනෑ.

වැල්ලවාය මහෙස්ත්‍රාත්තුමා - චතුරංග මහත්මයා - අයින් කළේ කොහොමද? එතුමා අයින් කළේ passport එකක් release කළා කියලා. මේ රටේ passports release කරපු DGලාත් ඉන්නවා නේ. අර්ජුන මහේන්ද්‍රන් මේ රටින් පිට කරන්න passport එක නිදහස් කළ කෙනා දැන් DG කෙනෙක්. ඒ අධ්‍යක්ෂ ජනරාල්ට එක නීතියක්; වැල්ලවාය මහෙස්ත්‍රාත්වරයාට එක නීතියක්. වැල්ලවාය මහෙස්ත්‍රාත්වරයාගේ වැඩ තහනම් කළා. වැල්ලවාය මහෙස්ත්‍රාත්වරයාගේ වැඩ තහනම් කළේ මොකද? වැල්ලවාය මහෙස්ත්‍රාත්වරයාගේ වැඩ තහනම් කළේ passport එකක් release කළා කියලා. අන්න ඒකෙන් අධිකරණය කෙරෙහි තිබෙන විශ්වාසය කඩ වෙලා තිබෙනවා. අපි කවුරුත් උසාවියකට ගියාම ඇඳුමේ බොත්තම් හරියට දාගෙන දෙකට නැමිලා ගරු කරනවා. නඩු තීන්දුව අනුව හිරේ දැම්මත්, "බොහොම ස්තුතියි, ස්වාමිනි" කියලායි හිරේට යන්නේ. එහෙම තමයි අධිකරණයට කවුරුත් සලකන්නේ. හැබැයි, එහෙම තිබෙන අධිකරණය ගැනයි මම මේ කියන්නේ.

ඊළඟ එක, තිළිණ ගමගේ මහත්මයා පිළිබඳ කාරණය. එතුමා නිදොස් කොට නිදහස් කරලා තිබුණා. ඇත් පැටවාගේ case එකෙන් නිදොස් කොට නිදහස් කර සිටි තිළිණ ගමගේ මහත්මයා අද නඩු නැතුව ගෙදර යවලා. කලින් නිදොස් කොට නිදහස් කළ එතුමා ආයේ interdict කරලා.

ඊළඟට, මිනුවන්ගොඩ මහෙස්ත්‍රාත්තුමිය හා සම්බන්ධ කාරණය. මිනුවන්ගොඩ මහෙස්ත්‍රාත් තේනබදු මහත්මිය ගෙනැල්ලා ඉල්ලා අස්වීමේ ලිපිය බලෙන් අරගෙන තිබෙනවා. සාමාන්‍යයෙන් මිනිස්සු අධිකරණයට බයයි. හැබැයි, දැන් අධිකරණයට බය වෙලා ඉන්න සිදු වෙලා තිබෙන්නේ මිනිසුන්ට නොවෙයි, නඩුකාරවරුන්ටයි. නඩුකාර උන්නාන්සේලා පුදුම බයකින් ඉන්නේ, කොයි වෙලාවේ ගෙනැල්ලා කට උත්තරයක් අරගෙන කටයුතු කරයිද කියලා. මේ වනකොට නඩුකාරවරුන් කීදෙනෙකුගේ -මහෙස්ත්‍රාත්වරුන් කීදෙනෙකුගේ- නම් වැඩ තහනම් කරලා තිබෙනවාද?

ගරු ඇමතිතුමනි, අධිකරණය ගැන කථා කරන කොට මම ඔබතුමාට මේ කාරණයත් කියන්න ඕනෑ. පසු ගිය කාලයේ මහාධිකරණ විනිශ්චයකාර පත්වීම් 18ක් දුන්නා. මාව දවස් 28ක් රිමාන්ඩ් කළේ, කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ අංක 1 උසාවියේ මහෙස්ත්‍රාත් තනූජා ලක්මාලි මැතිනියයි. එතුමියයි මාව රිමාන්ඩ් කළේ. මාව රිමාන්ඩ් කළාට කමක් නැහැ. මාව රිමාන්ඩ් කළාට එතුමියට සාධාරණය ඉෂ්ට වුණාද? නැහැ. එතුමිය තමයි ජ්‍යෙෂ්ඨත්වයෙන් 12වැනියාට හිටියේ. එතුමියව දැම්මා අංක 1 උසාවියෙන් වෙනත් උසාවියකට; පහළ උසාවියකට. නමුත්, එතුමිය ජ්‍යෙෂ්ඨත්වයෙන් 12වැනියාට හිටියේ. දැන් මහාධිකරණ විනිශ්චයකාරවරුන් 18දෙනෙකු පත් කර තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහනවා, මහාධිකරණ විනිශ්චයකාරවරුන් පත් කරන්න ඔබතුමන්ලා මෙතෙක් කල් පදනම් කර ගත්තේ මොකක්ද කියලා. ඒ, ජ්‍යෙෂ්ඨත්වයයි. තනතුරු තානාන්තර දෙනකොට සුද්දාගේ කාලයේ ඉඳන් ජ්‍යෙෂ්ඨත්වයට තමයි දුන්නේ. මහාධිකරණ විනිශ්චයකාර ධුරය දුන්නේත් ජ්‍යෙෂ්ඨත්වයට. මේ සැරේ දීලා තිබෙන්නේ මොකකට අනුවද? මේ සැරේ දීලා තිබෙන්නේ නිපුණතාවට ලු. නිපුණතාවට දුන්නා නම් ඒ ලකුණු ටික ගෙනැත් පාර්ලිමේන්තුවේ සභාගත කරන්න. නිපුණතාවට දුන් ක්‍රමය සොයා දෙන්න. රටට එය පෙන්වන්න. එහෙම එකක් වෙලා නැහැ. නිපුණතාවට නොවෙයි, ඒ මහාධිකරණ විනිශ්චයකාරවරුන් 18දෙනාම පත් කළේ. ඒ මහාධිකරණ විනිශ්චයකාරවරුන් පත් කළේ කොහොමද? සබරගමුවේ ආණ්ඩුකාරවරයායි, උතුරුමැද ආණ්ඩුකාරවරයායි, අර DG යි, ඔබතුමායි ජනාධිපති ලේකම් කාර්යාලයයි විසින් පත් කරලා තමයි -ඔබතුමන්ලා- කොමිෂන් සභාවට එව්වේ. ඊට පස්සේ ඒ list එක තමයි කොමිෂන් සභාව ගෙන ආවේ.

අධිකරණයෙන් අපට අසාධාරණකම් වෙන්න පුළුවන්. හැබැයි, මේ රටේ මිනිසුන්ට අධිකරණය කෙරෙහි විශ්වාසය තිබෙන්න ඕනෑ. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා, ධර්මිෂ්ඨ ආණ්ඩු කරපු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා වාගේම මේ රටේ ආණ්ඩු කරපු තවත් නායකයෝ හිටියා. ඒ අයගේ කාලවල අධිකරණය ගැන විශ්වාසයක් නැහැ කියලා ඔබතුමන්ලා කිව්වා. නමුත්, අද අධිකරණය ගැන ඊටත් වඩා විශ්වාසය නැති වෙලා තිබෙනවා. ප්‍රේමදාස මහත්මයාගේ ආණ්ඩුව, ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ආණ්ඩුව, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව පැවැති කාලවලට වඩා අද අධිකරණය කෙරෙහි විශ්වාසය නැති වෙලා තිබෙනවා. එහෙම විශ්වාසය නැති වෙන්නේ ඇයි? මහාධිකරණ විනිශ්චයකාර පත්වීම් 18ක් දුන්නා. දීපු ක්‍රමවේදය මොකක්ද? මීට කලින් ජ්‍යෙෂ්ඨත්වය අනුව තමයි දුන්නේ. ජ්‍යෙෂ්ඨයෝ තණමල්විල, වැල්ලවාය, හම්බන්තොට ආදි වෙනත් තැන්වලට මාරු කරලා ජ්‍යෙෂ්ඨත්වය නැති අයට පත්වීම් දීලා තිබෙනවා. ජ්‍යෙෂ්ඨත්වයට දුන්නා නම් මේ 18දෙනා ඉන්න ඕනෑ කොයි තැන්වලද? ඒ පත්වීම් දීලා තිබෙන්නේ නිපුණතාව අනුවයි කියනවා. නිපුණතාව අනුව දුන්නා කියනවා නම්, ඒ අයගේ ලකුණු මට්ටමක් තිබෙනවා නේ. ඒ ලකුණු මට්ටම පාර්ලිමේන්තුවේ සභාගත කරන්න.

දැන් අධිකරණය සම්බන්ධව විශාල ප්‍රශ්න ගොඩක් ඇති වෙලා තිබෙනවා. ඔබතුමාට ඒක පිළිගන්න වෙනවා, ගරු අධිකරණ ඇමතිතුමනි. මේ රටේ පිළිගත්තු ඇමතිවරයෙකු හැටියට කටයුතු කරන, මේ රටේ පිළිගත්තු පුද්ගලයෙකුගේ පුත්‍ර රත්නයක් වන, නීතිපති දෙපාර්තමේන්තුවේ වැඩ කළ නීතිඥයෙකු වන ඔබතුමාගෙන් අධිකරණයට සාධාරණය ඉෂ්ට වෙයි කියලා අපි විශ්වාස කළා. මට ඕනෑ විධියටවත්, තවත් කාටවත් ඕනෑ විධියටවත් අධිකරණ ඇමතිකම කරන්න බැහැ. හරි නම් මේ රටේ ජනාධිපතිතුමාවත් අධිකරණ ඇමතිකමට සුදුසු නැහැ. අධිකරණ ඇමතිකමට මේ චාමර සම්පත් සුදුසු නැහැ. අධිකරණ ඇමතිකම කියන්නේ මේ රටේ උත්තරීතර තනතුරක්. ඒ උත්තරීතර තනතුරට උත්තරීතර මිනිසුන් තමයි පත් වෙන්න ඕනෑ. උත්තරීතර මිනිසුන් පත් වෙනවා නම්, ඒ අය අධිකරණය ආරක්ෂා කර ගන්න ඕනෑ. අපි කොළඹ උසාවියට යනවා, හැම උසාවියකටම වාගේ යනවා. ඊයේ පෙරේදා මම බදුල්ලේ නඩුවකට ගියා. බදුල්ල උසාවියේ නීතිඥයන්, කොළඹ උසාවියේ නීතිඥයන්- *[බාධා කිරීමක්]* විශ්වාසය නැති කරගන්න එපා. මේක මේ ආණ්ඩුවට විතරක් නොවෙයි, ඔබතුමන්ලාගෙන් පසුව එන ආණ්ඩුවලටත් බලපානවා. මේ විධියට ගියොත්, අධිකරණය කෙරෙහි තිබෙන විශ්වාසය කඩාකප්පල් වුණොත්, පලුදු වුණොත්, මේ රටේ නීතිය සාමය ආරක්ෂා කරලා නිවැරැදි තීන්දු දෙන අධිකරණයට ලොකු ප්‍රශ්නයක් වෙනවා. දැනටත් ඒක වෙලා තිබෙනවා. නැහැ, කියන්න බැහැ. ඉල්ලා අස්වීමේ ලිපිය දුන්නේ නැත්නම් කියනවා ලු, Bribery Commission එකට දානවා, DGට කියනවා, Bribery Commission එකට දාලා වැඩ තහනම් කරනවා කියලා. ඒ අනුව තමයි මිනුවන්ගොඩ තේනබදු මහෙස්ත්‍රාත්වරිය අද ඉල්ලා අස්වීමේ ලිපිය දීලා තිබෙන්නේ; වැල්ලවාය මහෙස්ත්‍රාත්තුමා - චතුරංග මහත්මයා - interdict කරලා තිබෙන්නේ. නීතිය කාටත් සමාන වෙන්න ඕනෑ. Passport එක අර්ජුන මහේන්ද්‍රන්ට නිකුත් කළේ කවුද? කොයි උසාවියද? එයාට එක නීතියක්, වැල්ලවාය මහෙස්ත්‍රාත්තුමාට එක නීතියක්. එහෙම වෙන්න බැහැ, මේ රටේ. නීතිය කාටත් පොදු වෙන්න ඕනෑ. නීතිය කෙරෙහි විශ්වාසය තියා ගත්තේ නැත්නම්, ඒ විශ්වාසය පලුදු වුණොත් මේ රටේ සමස්ත නීති පද්ධතිය බිඳ වැටෙනවා. ඒක වට්ටගන්න එපා. අපි කවුරුවත් මේවා කියන්නේ නැත්නම් මොකද වෙන්නේ? විපක්ෂ නායකතුමාටත් මම කියනවා, පාර්ලිමේන්තුවේදී මේවා කථා කරන්න කියලා. විපක්ෂයේ ඉන්න හැම කෙනෙකුටම මම එය කියනවා.

අපේ ගරු අජිත් පී. පෙරේරා මහත්මයා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ගරු විපක්ෂ නායකතුමා ඉන්නවා, ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා ඉන්නවා, විපක්ෂයේ ද්‍රවිඩ මන්ත්‍රීවරයෙකුත් ඉන්නවා. සාමාජිකයෝ දසදෙනෙක් ඉන්නවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තමයි අග්‍ර විනිශ්චයකාරවරයා, නීතිපතිවරයා ආදි ධුරවලට නිර්දේශිත නාම යෝජනා අනුමත කරන්නේ. එතකොට විපක්ෂයේ අයට අයිතියක් නැද්ද? අපි ඔක්කොම එක්ව කරපු සාකච්ඡාවකදී තමයි අග්‍ර විනිශ්චයකාරතුමා පත් කරන්න ඒ ගොල්ලන්ගේ කැමැත්ත දුන්නේ. ඒ පත්වීමට කැමැත්ත දෙන්න කියලා අපි ඔක්කෝම කිව්වා. නීතිය හැමෝටම සමානව තිබෙන්න ඕනෑ. නීතිය එක්කෙනෙකුට එක විධියක්, තව කෙනෙකුට තව විධියක් වෙන්න බැහැ. සුනිල් වටගල මහත්මයා, ඔබතුමාත් ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙක්; ඔබතුමා ලංකාවේ ප්‍රසිද්ධ නීතිඥවරයෙක්. හර්ෂණ නානායක්කාර කියන්නේ, ලංකාවේ ප්‍රසිද්ධ නීතිඥවරයෙක්. ඔබතුමන්ලා ගැන මේ රටේ ජනතාවට ලොකු විශ්වාසයක් තිබෙනවා. ඔබතුමන්ලා නිකම් නීතිඥයෝ නොවෙයි, ඔබතුමන්ලා බැරිස්ටර් විභාගය පාස් වෙච්ච අය. අප වාගේ අයද? නැහැ. ඔය වාගේ තනතුරු මේ අප වාගේ අය කළා නම් ඔන්න මේ රටේ මිනිස්සු පිළිගන්නේ නැති වෙයි. ඒකයි අප වාගේ අය නැතිව ඔබතුමන්ලා පත් කරලා තිබෙන්නේ. එහෙම වුණාම නීතිය හරියාකාරව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. උසාවියේ නඩුකාරයෝත් එක්ක සෙල්ලම් කරන එක හොඳ දෙයක් නොවෙයි. ඒකයි අද මම මේ කථාව කරන්න ගත්තේ. ගරු ඇමතිතුමනි, ඒ ගැන ඔබතුමා තරහා වෙන්න එපා. අපට ඔබතුමාත් එක්ක කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා අධිකරණ ඇමති, ඔබතුමාගේ බලයෙන් පිට

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

වෙනත් අයට ඇඟිලි ගහන්න දෙන්න බැහැ, ඔබතුමාගේ බලයෙන් පිට වෙන කට්ටියට, කොහේවත් ඉන්න ආණ්ඩුකාරවරුන්ට බලය පාවිච්චි කරන්න දෙන්න බැහැ. කොහේවත් ඉන්න ආණ්ඩුකාරයන්ට list හදන්න බැහැ. අපි හොඳට දන්නවා, ඒවා හදන තැන, හදපු තැන, ආපු විධිය, ඒ ඔක්කෝම දන්නවා. නිපුණතාවට දුන්නා නම් ඔබතුමා සහාගත කරන්න, මෙන්න මේ මේ නිපුණතාවටයි දුන්නේ කියලා. සුද්දාගේ කාලයේ ඉඳලා ජ්‍යෙෂ්ඨත්වයට දීපු මහාධිකරණ විනිශ්චයකාර තනතුරු මේ වනාවේ විතරක් මොකද වෙනත් විධියකට දෙන්නේ? එහෙම වෙන්න බැහැ. ඒකයි අප කියන්නේ. අපි කාට වුණත් කෙළින් කථා කරනවා, කිව යුතු දේ ඕනෑම තැනක කියනවා. හිර ගෙවල් හතක ගියත්, මොන තරම් දුකක් වින්දත් කියන්න තිබෙන දේ කියන්නයි අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නේ.

ඊළඟ කාරණාව මේකයි. බන්ධනාගාරවලට මේ අවුරුද්දේ රුපියල් මිලියන 2,000ක් දීලා තිබෙන බව එදා මේ ගරු සභාවේදී ගරු ජනාධිපතිතුමා කිව්වා. ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. බන්ධනාගාරවල සිරකරුවන් ඉන්න පුළුවන් 10,750යි. නමුත්, මේ වෙනකොට බන්ධනාගාරවල සිරකරුවන් 37,000ක් ඉන්නවා. සිරකරුවන් 37,000ක් කියන්නේ ලොකු ප්‍රමාණයක්. දැන් වැලිකඩ මැගසින් බන්ධනාගාරය - CRP එක - පුපුරන්න යන්නේ. සිරකරුවන් හිටගෙන නිදියනවා. හිටගෙන ඉන්නවා, රැට 500ක් විතර. ඉන්න තැනක් නැහැ. වැසිකිළි නැහැ. අමාරුයි මේක. දරා ගන්න බැහැ. කොයි වෙලාවක හෝ මේක පුපුරලා එළියට යනවා. සිරකරුවන් 37,000ක් කියන්නේ පොඩි ප්‍රමාණයක්ද? හරි, වැරදිකාරයෝ අල්ලනවා, උසාවි දානවා. ඒක අපි නැහැ කියන්නේ නැහැ. වැරදිකාරයෝ වැඩි වෙන්න, වැඩි වෙන්න හිර ගෙවල්වල තදබදය ඇති වෙනවා. හිරගෙවල් කඩා ගෙන බිඳ ගෙන යන්න වෙනවා. ළඟදී CRP එකේ ලොකු බැම්මෙන් හිරකාරයෙක් පැන්නා. ජේලර්ලා දෙදෙනෙකුගේ වැඩ තහනම් වුණා. අද වෙනතුරු හිරකාරයාව අල්ලන්න බැරි වුණා. එහෙම ප්‍රශ්න තිබෙනවා. ඒක නිසා මේ වෙන් කර තිබෙන රුපියල් මිලියන 2,000න් ටක් ගාලා ටෙන්ඩර් කැඳවලා හරි පුළුවන් තරම් ඉක්මනට බිල්ඩින් ටිකක්, වාට්ටු ටිකක් හදන්න. වාට්ටු ටිකක් හදලා, සිර මැදිරිවල තිබෙන තදබදය ටිකක් අඩු කරන්න වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා බන්ධනාගාර විෂය භාරවත් කටයුතු කරනවා. බන්ධනාගාරවල ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. සිරකරුවන් 10,750කට හරියන නිලධාරි ප්‍රමාණයක්, 37,000ක පිරිසක් පාලනය කරන්නේ කොහොමද? සිරකරුවන් 37,000ක් සිර ගෙවල් තුළ පාලනය කරන්න ඔවුන්ට සිදු වෙලා තිබෙනවා. කොහොමද, ඔවුන් පාලනය කරන්නේ? අද බන්ධනාගාරවල නිලධාරීන් පැය 24ම වැඩ කරනවා. පැය 24ම වැඩ කළාම ඒ මිනිස්සු යන්නේ එන්නේ කොහොමද? ඒ නිසා බන්ධනාගාරවල වැඩ කරන අයට ප්‍රශ්න ගොඩාක් තිබෙනවා.

අනෙක් කරුණ මේකයි, ගරු සභාපතිතුමනි. හිටපු බන්ධනාගාර කොමසාරිස් ජනරාල් උපුල්දෙණිය මහත්තයාගේ වැඩ තහනම් කළා, අනුරාධපුරයේ සිදු වුණු සිද්ධියට. මේ වනතුරුත් ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ. ඒක විසඳුණේත් නැහැ. එක්කෝ ඔහුගේ වැඩ තහනම් නම්, ඔහු dismissed නම්, ඔහු වැරදි නැත්නම් නිදොස්කොට නිදහස් නම් ඔහුට අවශ්‍ය නීතිමය පියවර ගන්න ඕනෑ. ඒ නිසා ක්‍රමවේදයකට අනුව මේ රට පවත්වාගෙන යන්න වෙනවා. අපි සෙල්ලම් කරන්නේ නිකම් මිනිස්සුත් එක්ක නොවෙයි. හිර ගෙවල්වල ඉන්න දරුණු අපරාධවලට අහු වෙච්ච මිනිස්සු එක්කයි මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු කරන්න වෙන්නේ. ඒක නිසා මේ අමාත්‍යාංශය වැදගත් විධියට කරයි කියලා අපේ රටේ මිනිස්සු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා කෙරෙහි ලොකු විශ්වාසයක් තබා තිබෙනවා. ඒක අපේ රටේ මිනිස්සු ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. ඒ විශ්වාසය බිඳ ගන්න නම් එපා. ඔබතුමා ඒ විශ්වාසය බිඳ ගෙන නම් තිබෙන්නේ ආපසු ගිහිල්ලා "ඇගේ වෛරය" වාගේ චිත්‍රපටයක රඟපාන්න. මොකද, ඔබතුමා "ඇගේ වෛරය" චිත්‍රපටයේ රඟපෑවා. තවත් චිත්‍රපට කිහිපයකත් රඟපෑවා. මම ඔබතුමා ගැන හොඳට දන්නවා. මම ඔබතුමා ගැන පෞද්ගලිකවත් දන්නවා. අපි ඔබතුමාගේ තාත්තා -යසපාලිත නානායක්කාර මහත්තයා- ගැන දන්නවා. ඔබතුමා විජය කුමාරණතුංගගේ දරුවෙක් වාගේ හිටියා කියාත් අපි දන්නවා. චන්ද්‍රිකා මැඩම් එක්ක හිටියා කියාත් අපි දන්නවා. එතුමිය ඔබතුමා වඩා ගෙන හිටියා කියාත් අපි දන්නවා. ඒ කාලයේ යසපාලිත නානායක්කාර මහත්තයාගේ චිත්‍රපටයක් - show එකක් - කිව්වාම, අපි ශත 50ක් දීලා ගැලරියට ගිහිල්ලා වාඩිවෙලා බලනවා. ඒ නිසා ඔබතුමාට මම කියනවා, බැරි නම් ඕකෙන් අයින් වෙන්න කියලා. හැබැයි, ඔබතුමා ඒ ගෞරවය තියා ගන්න. ඔබතුමා නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු නීතිඥයෙක්. ඒ නිසා මේ වාගේ දේවල් වෙන්න වෙන්න, මහෙස්ත්‍රාත්වරු භය වෙන්න භය වෙන්න, මහෙස්ත්‍රාත්වරු තුළ තිබෙන විශ්වාසය නැති වුණාම කොහොමද අපි නීතිය පවත්වා ගෙන යන්නේ.

ගරු සභාපතිතුමනි, 2009දී අපි යුද්ධය දිනුවා. මම 2011දී මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවේ ඌව පළාත් සභාවේ ඇමති ලෙස හිටියා. ඒ වෙලාවේ මට අවුරුදු 5ක අත්හිටවූ සිර දඬුවමක් ලබා දුන්නා. අපි කාටවත් බලපෑම් කළේ නැහැ. ඊට පස්සේ මම High Court එකේ,- අනිල් සිල්වා තුන් වතාවක් බදුල්ලට ගියා. එතුමා තුන් වතාවක් බදුල්ලට ගිහිල්ලා තමයි ඒ නඩුවට පෙනී හිටියේ. ඒ නිසා මේවා සෙල්ලම් නොවෙයි. මේකත් එක්ක දේශපාලනය කරන්න එපා. මේක ලස්සනට යන්න දෙන්න. මේක එහෙම ගියේ නැත්නම් වෙන්නේ මොකක්ද? ඔය වාගේ සුදු චරිත, කළු කර ගන්න එපා. හරිද? මම නම් ලොකු විශ්වාසයක් තැබුවා, මේ අධිකරණ ක්ෂේත්‍රයට මේ ආණ්ඩුව ආපු ගමන්. මොකද, අපිටත් ඒ වාගේ අසාධාරණකම් වුණා. විජිත හේරත් ඇමතිතුමා දන්නවා, 1988-1989 කාලයේ අපිට ආණ්ඩුවලින් කොච්චර අසාධාරණකම් වුණාද කියලා. අපි කොච්චර හැංගිලා හිටියාද? අපි ගෙවල්වල හිටියාද? අපිට ගෙවල්වල ඉන්න ඉඩ දුන්නාද? ඒ කාලයේ JVP, ශ්‍රී ලංකා කිය-කියා හොය හොයා හිටියේ නැහැ. අහු වෙච්ච කෙනා කුදලගෙන ගියා. අහු වෙච්ච කෙනා අරගෙන ගිහිල්ලා කඳවුරුවලට දැම්මා. සමහරු එළියට ආවේ 1992, 1993දී. අපි දන්නවා ඒවා. අපි ඒවාට මුහුණ දීපු අය. මෙතැන ඉන්න ගොඩාක් තරුණ අය ඒ වාගේ ඒවාට මුහුණ දීලා නැහැ. අපි භීෂණවලට මුහුණ දුන්නා. ඒ නිසා තමයි අපි කියන්නේ මේ අධිකරණ ක්ෂේත්‍රයේ වැරදි ගොඩාක් තිබෙනවා කියලා. අපි ඒවා පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළේ නැත්නම් කවුද මේවා කියන්නේ? කවුරුවත් මේවා ගැන කියන්නේ නැහැ. දැන් මේවා කිව්වා කියලා සමහර විට මට ප්‍රශ්න එන්න පුළුවන්. හැබැයි, මට ප්‍රශ්න ආවට කමක් නැහැ. මට හෙටත් නඩුවක් තිබෙනවා, අංක 01හි. මම ඒ නඩුවට යනවා. ඒක වෙනම කථාවක්. නමුත්, කොයි නඩුකාරයා හිටියත්,- එහෙනම් මට කියන්න තිබුණා නේ, මාව දවස් 28ක් රිමාන්ඩ් කරපු තනුජා ලක්මාලි මැතිනිය,- එතුමිය 12වැනියාට හිටියේ. එතුමියව වෙන තැනකට දැම්මා. එතුමියට උසස්වීමක්වත් නැහැ. නමුත්, මේක සාධාරණව වැඩ කරන්න ඕනෑ තැනක්. බන්ධනාගාරය කියන්නේ ලෙහෙසි තැනක් නොවෙයි. ඒ වාගේම බන්ධනාගාරවල සේවය කරන නිලධාරීන්ට ගොඩක් ප්‍රශ්න තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා සැහෙන්න මහන්සිවෙලා, මේ ගැන උනන්දුවෙන් කටයුතු කරනවා කියලා මට තේරෙනවා. හැබැයි, අපට එහෙම තේරිලා විතරක් මදි. ඔබතුමන්ලා මීට වඩා වගකීමෙන් යුතුව මේ ගැන කටයුතු කරන්න ඕනෑ.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, විජිත හේරත් ඇමතිතුමා ගැන. මම විජිත හේරත් මැතිතුමාව සලකන්නේ මේ පාර්ලිමේන්තුවේ දෙවැනියා හැටියට. ජනාධිපතිතුමාගෙන් පස්සේ මේ පාර්ලිමේන්තුවේ හිටියේ විජිත හේරත් ඇමතිතුමා. ඊට පස්සේ හරිනි අමරසූරිය අගමැතිතුමිය. මේ ආණ්ඩුවේ ඉන්න විජිත හේරත් කියන්නේ, අද ඊයේ පාර්ලිමේන්තුවට ආපු කෙනෙක් නොවෙයි. විජිත හේරත් ඇමතිතුමා සභාවේ ඉන්න හින්දා මම මේ කාරණය කියන්න ඕනෑ. දැන් රාජ්‍ය සේවකයින් 20,000කට වාහන පර්මිට් ලබා දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ රාජ්‍ය සේවකයින් 20,000ම ඔයගොල්ලන්ට ඡන්දය දුන්නා, උදවු කළා. ඒගොල්ලන් ඒක ලැබෙන තුරු බලාගෙන ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභාපතිතුමනි, මට තව තත්පර කීපයක් දෙන්න.

ඒ මිනිස්සුන්ට ඒ වාහන පර්මිට් 20,000 දීලා ඉවර කරන්න. ඒ මිනිස්සු දැන් කියනවා, ඒක පුච්චලා "අපි නළලේ අළු ගා ගන්නවා" කියලා. එතැන විශ්වවිද්‍යාල ආචාර්යවරු ඉන්නවා. ඔබතුමාට එහා පැත්තේ අසුනේ ඉන්නේත් විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක්. ඒ වාගේම දොස්තරවරු ඉන්නවා. ඒ වාගේ නොයෙකුත් ක්ෂේත්‍ර නියෝජනය කරන රාජ්‍ය සේවකයින් ඒ අතරේ ඉන්නවා. ඒ අය 2020දී කොවිඩ් වසංගතයට මුහුණ දීපු අය. ඒ වාගේම ඒගොල්ලන් ආර්ථික අර්බුදයට මුහුණ දීපු අය. ඒ මිනිස්සුන්ට ඒ වාහන පර්මිට් 20,000 දෙන්න. එහෙම නැත්නම්, ඔබතුමන්ලාට මුදල් තිබෙනවා නම් වාහන පර්මිට් ටික අරගෙන ඒ අහිංසක මිනිස්සුන්ට මුදලක් හරි දෙන්න. දැන්, දොස්තරලා තරහ වෙනවා; රාජ්‍ය සේවකයෝ තරහ වෙනවා; පරිපාලන සේවයේ නිලධාරින් තරහ වෙනවා; ඒ වාගේ ගොඩක් අය මේ වැඩෙන් තරහ වෙනවා. ඒ නිසා ඔය වාහන පර්මිට් 20,000 ප්‍රශ්නය විසඳන්න. මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එදා ජනාධිපතිතුමා කිව්වා, පර්මිට් දෙන්නේ නැහැ කියලා. අපට වාහන පර්මිට් 2015දී ලැබුණේත් නැහැ, 2019දී ලැබුණේත් නැහැ. අපිට වාහන පර්මිට් ලැබුණේ නැහැ. අපිට වාහන පර්මිට් ඕනෑ නැහැ. නමුත් රාජ්‍ය සේවකයින්ට සාධාරණයක් ඉටු කරන්න. ඔබතුමන්ලාගේ මේ අවුරුද්දේ මම හිතන විධියට ප්‍රාග්ධන වියදම්වලින් සියයට 24 වියදම් වුණේ. ඒ ඉතුරු වුණු සල්ලිවලින් ඒ ටික දෙන්න. අපි කැබිනට් තීන්දුවක් ගන්න ගියා. අනිල් ජයන්ත මහත්මයා මට ඇවිල්ලා කිව්වා, එහෙම එකක් අරගෙන තිබුණේ නැහැ කියලා. නමුත් අපි ඒ වෙලාවේදී කිව්වා, වාහන පර්මිට් අරගෙන සල්ලි දෙමු, එහෙම නැතුව වාහන 20,000ක් ගෙන්වන්න දුන්නොත් ලොකු ප්‍රශ්නයක් මතු වෙයි කියලා. දැන් වාහන ප්‍රශ්නය තිබෙනවා.

අනිද්දා -19වැනි දා- පාර්ලිමේන්තුව ඉස්සරහ වටලනවා. පාර්ලිමේන්තුව ඉස්සරහට එන්නේ කවුද? 2024දී විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයින්. විශ්‍රාමිකයින් 153,000ක් ඉන්නවා. ඒ, 153,000ම 19වැනි දා මේ පාර්ලිමේන්තුව ඉස්සරහට එනවා. ඒකට හේතුව මොකක්ද? 2024 දෙසැම්බර් 31වන දා පෙන්ෂන් ගියා නම් ඒ නිලධාරියාට ලැබෙන්නේ 2025 ජනවාරි මාසයේ පෙන්ෂන් ගිය නිලධාරියාට වඩා රුපියල් 40,000ක් අඩුවෙන්. ඉංජිනේරුවෙක් ගත්තොත් 2025 ජනවාරි මාසයේ පෙන්ෂන් ගිය කෙනාට රුපියල් 70,000ක් වැඩියි. හැබැයි, 2024 දෙසැම්බර් 31වැනි දා පෙන්ෂන් යන කෙනාට ඊට වඩා අඩුයි. එකම ක්ෂේත්‍රයේ, එකම කාලයේ, එකට සේවයට බැඳිච්ච, එකම වයසේ, එකම තනතුරේ හිටපු දෙදෙනෙකුගෙන් එක් කෙනෙක් රුපියල් 70,000ක් අඩුවෙන් පඩි ගන්නවා. හැබැයි, දෙදෙනාම ගිහිල්ලා එක කඩෙන් බඩු ගන්නේ. දෙදෙනාම පෙන්ෂන් එක දවසට බදුල්ලේ Food City එකෙන් තමයි බඩු ගන්නේ. එතකොට එක් කෙනෙකුට පඩිය රුපියල් 150,000යි. අනෙක් කෙනාගේ පඩිය රුපියල් 90,000යි. එතකොට ඒක සම වෙනවාද? හැමෝමට එක සමාන ලෙස සැලකෙනවාද? නැහැ. මෙන්න මේවා ගැන හොයා බලන්න කියායි අපි කියන්නේ. මේ රාජ්‍ය යන්ත්‍රණයට, මේ ජනාධිපතිතුමාට, අය වැයට, භාණ්ඩාගාරයට මේ 153,000ක් වන විශ්‍රාමික රාජ්‍ය සේවකයින්ගේ වැටුප ලොකු ප්‍රශ්නයක්. ඒ වාගේම වාහන පර්මිට් එකත් ලොකු ප්‍රශ්නයක්. මේවා විසඳන්න කටයුතු කරන්න කියමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Hon. Chairman -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Minister?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මම ඉතාම කෙටියෙන් කාරණා කිහිපයක් පැහැදිලි කරන්නම්. ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා දක්වපු සමහර කරුණු බොහොම සාධනීය කරුණු. මූලිකවම මරණ පරීක්ෂකවරුන්ගේ දීමනාව සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කාරණාව ගත්තොත්, අපි මේ වෙනකොට ඒ ගැන සාකච්ඡා කරමින් පවතිනවා. හැබැයි, ගරු මන්ත්‍රීතුමනි, මරණ පරීක්ෂක තනතුර කියන්නේ ගරු තනතුරක්. ඒගොල්ලන් ඒ තනතුර භාර ගන්න අවස්ථාවේදී දන්නවා, ඒ තනතුර ආදායමක් ලබා ගත හැකි මාර්ගයක් තිබෙන තනතුරක් නොවන බව. ඒ නිසා ඔවුන්ට විශාල අගතියක් සිදුවෙලා තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. මොකද, එය ගරු තනතුරක් කියලා ඔවුන් දන්නා නිසා. කෙසේ වෙතත්, ඒ දීමනාව වැඩි කරන්න මේ දවස්වල සාකච්ඡා පවත්වනවා.

දෙවන කාරණය මේකයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මේ කාරණය පිළිබඳව අවබෝධයක් තිබුණේ නැහැ කියලා මම හිතනවා. අධිකරණ සේවා කොමිෂන් සභාව කියන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111L. ව්‍යවස්ථාව අනුව ස්වාධීන කොමිෂන් සභාවක්. ඒ කොමිෂන් සභාවෙන් ගන්නා වූ තීන්දු තීරණ සම්බන්ධයෙන් කරුණු දක්වන්න, බලපෑම් කරන්න බැහැ. ඔවුන්ගේ තීන්දු වැරදියි කියලා අධි චෝදනා පත්‍රයක් ලැබුණොත් ඒක අවුරුදු 3ක් දක්වා උපරිම සිර දඬුවමකට යටත් වෙන්න ඕනෑ. එම නිසා ඔබතුමා අද ඔය කාරණා ටික මෙතැන කියපු එක හොඳයි. පාර්ලිමේන්තුවෙන් පිටතදී ඔය කාරණා ටික කිව්වා නම් ලොකු ප්‍රශ්නයක් වෙනවා. මොකද, මේ පාර්ලිමේන්තු වරප්‍රසාද නිසා ඔබතුමා ඒ වරදට දැන් අහුවෙන්නේ නැහැ. නමුත්, සිද්ධිමය වශයෙන් ඒ වරද සිදු වූ බව විතරක් මා සඳහන් කර තබන්නම්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, we have a time constraint. You will have nine minutes at the end of the day as well.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මේ කාරණයත් කියලා මම ඉක්මනට අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි.

ඊට අමතරව බන්ධනාගාරයේ තදබදය පිළිබඳව ඔබතුමා කියපු කරුණු නිවැරදියි. ඒ ටික එහෙමම තිබෙනවා. අපි මේ වන විටත් පල්ලන්සේන වාගේ ස්ථාන ගණනාවකට විතැන් කිරීම සහ ඒ කටයුතු ආරම්භ කිරීම පටන් ගෙන තිබෙනවා. තදබදය පිළිබඳව ඔබතුමා දක්වපු කරුණු නිවැරදියි. ඒ වාගේම බන්ධනාගාරයට අලුතින් සේවකයන් 1,080ක් අපි බඳවා ගන්නවා. ඔවුන්ගේ ප්‍රශ්නය විසඳන්න අනිවාර්යයෙන්ම කටයුතු කරනවා. මේ නිශ්චිත මොහොතේ මහේස්ත්‍රාත්වරු බය වෙලා නැහැ. ඔබතුමා හිත හොඳ මන්ත්‍රීවරයකු නිසා, යම් පුද්ගලයෙකු ඔබතුමාට කරුණු කිව්වාම ඔබතුමාත් ඇවිල්ලා ඒක පාර්ලිමේන්තුවේ කියනවා. නමුත්, ඔබතුමාට ලැබුණු සමහර කරුණු වැරදියි. මොකද, ඒ හැම අධිකරණ නිලධාරියෙකුම ඉවත් කරලා තිබෙන්නේ නිසි විභාගයකින්, විමර්ශනයකින් පසුවයි. ඒ, පළමුවැනි කාරණය.

දෙවැනි කාරණාව තමයි ඒ ඉවත් කිරීම එන්නේ අධිකරණ සේවා කොමිසමේ ලේකම්ගේ ලියුමෙන් නේ. එතකොට ඒ නියෝගය පවා රිට් එකක් මඟින් උසාවියේ අභියෝගයට ලක් කරන්න පුළුවන්. ඒ ඉවත් කරපු කිසි කෙනෙක් එම තීන්දුව උසාවියක අභියෝගයට ලක් කරලා නැහැ. ඔබතුමා ලවා කරුණු දැක්වීම පමණයි මෙතැන කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Would you please make it brief because we have to move on.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
That is all. Thank you, Sir.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභාපතිතුමනි, මෙතුමා මගේ නම කිව්වා. මට විනාඩියක්, - *[බාධා කිරීමක්]*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණා තමයි එතුමා පැහැදිලි කළේ. - *[බාධා කිරීම්]* මම විනාඩියක් දෙන්නම්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මේ උත්තරීතර පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු 225යි ඇවිල්ලා තිබෙන්නේ. ගරු අධිකරණ ඇමතිතුමනි, රටේ ඉන්න නඩුකාරවරු තියා වෙන කාටවත් මෙතැනට එන්න බැහැ. එම නිසා තමයි අපට මෙතැන කථා කරන්න අයිතියක් තිබෙන්නේ. නඩුකාරතුමන්ලාට කථා කරන්න තැනක් නැත්නම්, දොස්තරලාට කථා කරන්න තැනක් නැත්නම්, රාජ්‍ය නිලධාරීන්ට කථා කරන්න තැනක් නැත්නම් ඒ අය වෙනුවෙන් කථා කරන්න තමයි මිනිස්සු අපව මෙතැනට තෝරලා එවලා තිබෙන්නේ. ඔබතුමා කියපු විධියට හිර ගෙවල්වල දාන්න, කියන කියන දේවල් කරන්න, හිතෙන හිතෙන දේවල් කරන්න කොමිෂන් සභාවලට බලය තිබෙනවා නම් අපට කට වහගෙන ඉන්න බැහැ. අපට කියන්න තිබෙන දේ අපි කියනවා. අපි බය නැහැ, ඒවාට.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Ramanathan Archchuna, why are you on your feet? Are you raising a point of Order? මම දන්නේ නැහැ, මොකක්ද කියලා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට කියන්නේ Standing Order 91(o) අනුව. එහි පැහැදිලිව කියා තිබෙන දෙයට අනුව, the Hon. Speaker, the Hon. Deputy Speaker or the Hon. Member who is sitting in the Chair is responsible for allotting time.

සමහර වෙලාවට අපි දෙමළෙන් කථා කරනකොට ඒක headset එකෙන් අහන්නේ නැතිව, අපි point of Order එකක් කියනකොට ඒක දෙමළෙන් අහන්නේ නැතිව අපට වාඩි වෙන්න කියනවා. එතකොට අපට දෙමළෙන් කථා කරන්න තිබෙන අවස්ථාව නැති වෙනවා. ගරු සභාපතිතුමනි, එම නිසා ඔය Chair එකේ වාඩිවෙන හැම පුද්ගලයාටම කරුණාකරලා කියන්න, අපි දෙමළෙන් කියන දේවල් headset එකෙන් අහන්න කියලා. එදා ප්‍රදීප් මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරලා බැන්නා. මම දෙමළෙන් උත්තර දෙන්න යනකොට ඒක අහන්නේ නැතිව මගේ mike එක නැවැත්වූවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay, Hon. Member, your point is noted.

Next, I call upon the Hon. (Dr.) Prasanna Gunasena. Hon. Deputy Miniser, we only have two minutes left before we suspend for lunch. So, do you wish to start now or shall we commence after lunch?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)
Sir, I will start after lunch.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay.

Order, please! The ongoing Proceedings of the Committee of the whole Parliament is suspended till 1.00 p.m. for lunch.

***ස්ථිම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, වැදගත් වැය ශීර්ෂ දෙකක් සාකච්ඡාවට බඳුන් වන අද දවසේ කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතියි.

අපි දන්නවා, අපේ රටේ ඩොලර් ආර්ථිකය රඳා පවතින්නේ ප්‍රධාන කාරණා හතරක් මත බව. ලංකාවට ඩොලර් එන ප්‍රධාන කාරණා හතරක් තිබෙනවා. එකක්, අපනයන ආදායම. අපේ රටේ භාණ්ඩ හා සේවා පිටරටට යවලා අප රටට ගලා එන ඩොලර්වලින් අපේ ආර්ථිකය සුරක්ෂා වෙනවා. අපි මීට කලිනුත් මේ සභාවේදී ඉලක්කම් සහිතව කියලා තිබෙනවා, ගිය අවුරුද්දේ පළමු මාස 10ට සාපේක්ෂව මේ අවුරුද්දේ පළමු මාස 10 තුළ කොහොමද අපි එහි වැඩි අගයක් වාර්තා කළේ කියලා.

විදේශ ප්‍රේෂණ ගත්තොත්, විදේශගතව සිටින අපේ රටේ ශ්‍රමිකයන් අපේ රටට එවන ඩොලර් ප්‍රමාණයත් ගිය අවුරුද්දේ පළමු මාස 10ට සාපේක්ෂව මේ අවුරුද්දේ පළමු මාස 10 තුළ කෙසේද වැඩි වුණේ කියන එක අපි ඉලක්කම් සහිතව මේ සභාවට කියලා තිබෙනවා. සෘජු විදේශ ආයෝජන - foreign direct investments - පිළිබඳවත් ඒ ආකාරයෙන්ම ඉලක්කම් සහිතව අපි කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා.

හතරවෙනි කාරණය තමයි, විදේශ සංචාරකයන්ගේ ප්‍රමාණය. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලංකාවට වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙන්නේ මෑත ඉතිහාසය ගත්තොත්, 2018 අවුරුද්දේ. දළ වශයෙන් එය මිලියන 2.3ක් වාගේ ප්‍රමාණයක්. අපි ගිය අවුරුද්දේ පළමු මාස 10ත් එක්ක මේ අවුරුද්දේ පළමු මාස 10 සංසන්දනය කළොත්, මේ රටට පැමිණි සංචාරකයන්ගේ පැහැදිලි වැඩිවීමක් වෙලා තිබෙනවා. අපි ගත්තොත්, නොවැම්බර් 12වෙනි දා වනකොට ලංකාවට සංචාරකයන් 1,972,957ක් ඇවිල්ලා තිබෙනවා. මෙම සංචාරකයන්ගේ පැමිණීම හරහා ලැබෙන ආදායම තමයි මෙහිදී අපට වැදගත් වන්නේ. The number of foreignersලා වාගේම, එම ඉලක්කම වාගේම, අපට ලැබෙන ආදායමත් මෙහිදී වැදගත් වනවා. අපට ඒ හරහා මේ වනකොට ඩොලර් මිලියන 2,659ක ආදායමක් ලැබිලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2024 අවුරුද්දේ පළමු මාස 10ට සාපේක්ෂව එය සියයට 4.9ක වර්ධනයක්.

සංචාරකයෙක් ලංකාවට ඇවිල්ලා ගත කරන දින ගණනට කියනවා, tourist nights කියලා. සාමාන්‍යයෙන් දින අටහමාරක වාගේ කාලයක් තමයි සංචාරකයෙක් ලංකාවේ ගත කරන්නේ. ඒ වාගේම සංචාරකයෙක් ලංකාවට ඇවිල්ලා දවසකට වියදම් කරන මුදල් ප්‍රමාණය ගත්තොත්, ඩොලර් 172ක් විතර වනවා. හැබැයි, එය අපට තිබෙන අභියෝගයක්. ඒ අභියෝගයට අපි සාර්ථකව මුහුණ දෙමින් ඉන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලංකාවට එන සංචාරකයා දවස් අටහමාරට ඩොලර් 1,500කට, 2,000කට අඩුවෙන් වියදම් කරනවා වාගේම, ඒ සංචාරකයා මාලදිවයිනට ගියොත්, ඒ කාලයටම සාමාන්‍යයෙන් ඩොලර් 4,500ක් වාගේ ප්‍රමාණයක් වියදම් කරනවා. එතකොට අපි agenda එක හදලා තිබෙන්නේ, රජය විධියට සහ අමාත්‍යාංශය විධියට බලාපොරොත්තු වන්නේ, ලංකාවට පැමිණෙන සංචාරකයෙක් ගත කරන දින ගණන වැඩි කර ගැනීමට සහ දිනකට වියදම් කරන ඩොලර් ප්‍රමාණය වැඩි කර ගැනීමටයි. ඒ හරහා තමයි අපට සංචාරක කර්මාන්තයෙන් වැඩි මුදලක් උත්පාදනය කරන්න හැකියාව ලැබෙන්නේ. සංචාරකයෙක් වැඩි දින ගණනක් රට තුළ රඳවා ගැනීමට සහ වැඩිපුර වියදම් කරවා ගැනීමට අපට නොයෙක් ක්‍රියාකාරකම් - activities - අවශ්‍ය වනවා. ඒ වෙනුවෙන් අපි යම් වැඩ කටයුතු ප්‍රමාණයක් කළා.

උදාහරණයක් විධියට හැමෝම දන්නවා, ඇල්ල දුම්රිය ගමනාන්තය සංචාරකයන් අතර ප්‍රසිද්ධ වූ බව. සාමාන්‍යයෙන් විදේශ සංචාර organize කරන අය, arrange කරන අයගේ itinerary එකේ ඇතුළත් කරලා තිබුණා, Ella destination එක, ටිකට් එකත් එක්කම. ඒ හරහා තවත් මාෆියාවකුත් නිර්මාණය වුණා. නමුත් අපට ඒක සෑහෙනදුරට කළමනාකරණය කර ගන්න හැකියාව ලැබුණා. ඒක එකක්. ඒක ජාතික මට්ටමේ වැඩක්. ඒ වාගේම අපි ප්‍රාදේශීය මට්ටමේනුත් මේ සඳහා යම් වැඩ පිළිවෙළ හදන්න ඕනෑ. ඒකට තමයි අපි අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් ප්‍රාදේශීය කමිටු හදලා තිබෙන්නේ. ඒ සඳහා අපි එක් එක් දිස්ත්‍රික්කවල කමිටු හදලා තිබෙනවා. අපි ඒ ප්‍රාදේශීය කමිටු හරහා සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමේ වැඩ පිළිවෙළක් මේ වනකොටත් සකස් කරලා තිබෙනවා. ඒක සාර්ථකව ක්‍රියාත්මක වනවා.

මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමියක් ද මීට කලින් සංචාරක ව්‍යාපාරය පිළිබඳ කරුණු ඉදිරිපත් කළා. ඉතින් මම ඒ මන්ත්‍රීතුමියටත් ආරාධනා කරනවා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට මීට වඩා මැදිහත් වන්න; කාලය ගත කරන්න කියලා. ඒ හරහා එතුමියගේත් යම්කිසි අදහස් යෝජනා තිබෙනවා නම්, අපට ලබා ගන්න පුළුවන්. ඉතින් මේ ආකාරයෙන් තමයි සංචාරකයන් රට ඇතුළට ඇද ගැනීමේ වැඩ පිළිවෙළ අපි කරගෙන යන්නේ.

ඒ වාගේම මම තවත් කරුණක් මතු කරන්න කැමැතියි. උදේ කථා කරපු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාත් මෙම කරුණ යොමු කළා. අපි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ කවුළුවක් විවෘත කළා, ඒ සංචාරකයන්ට රියදුරු බලපත්‍ර - driving licences - ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඒක එතැනින් ගැනීමට. ඒ පහසුකම එතැන තිබෙනවා. හැබැයි, මේ රියදුරු බලපත්‍රය එතැනින් නොගත්තත්, මීට කලින් අවුරුදුවලත් සංචාරකයෝ වෙරළහැරට ගිහිල්ලා, ඒ රියදුරු බලපත්‍රය ගත්තා. මේකත් එක්ක විපක්ෂයේ සමහර උදවිය ගැටලුවක් මතු කරන්න උත්සාහ කළා, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව රියදුරු වෘත්තියේ යෙදෙන අය සම්බන්ධයෙන්. මේ නිසා ඒ අයගේ වෘත්තීයභාවය අහෝසි වනවා කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, නමුත් ඉලක්කම් සහිතව කිව්වොත්, මේක සම්පූර්ණ සාවද්‍යයක්. අපි මේ වැඩේ පටන් ගත්තේ, මේ කවුළුව විවෘත කළේ මේ අවුරුද්දේ අගෝස්තු 03වෙනි දා. මේ අවුරුද්දේ අගෝස්තු 03වෙනි දා ඉඳලා

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

අගෝස්තු 31 දක්වා කාලය ගත්තොත් ලංකාවට ඇවිල්ලා තිබෙනවා, සංචාරකයන් 198,235ක්. සංචාරකයන් 198,235ක් ලංකාවට එනකොට, එම කවුළුවෙන් රියදුරු බලපත්‍ර - driving licences - අරගෙන තිබෙන්නේ 2,306දෙනායි. ඒක, පැමිණි සංචාරකයන් ප්‍රමාණයත් එක්ක ගත්තාම සියයට 1.16ක්. සැප්තැම්බර් 01වැනි දා ඉඳලා සැප්තැම්බර් 30 දක්වා මාසය ගත්තොත්, සංචාරකයන් 150,971ක් ලංකාවට ඇවිල්ලා තිබෙනවා. හැබැයි ඒ කවුළුවෙන් රියදුරු බලපත්‍ර - driving licences - අරගෙන තිබෙන්නේ 1,965දෙනායි. ඒ කියන්නේ, සියයට 1.24ක්. ඔක්තෝබර් 01වැනි දා සිට ඔක්තෝබර් 31 දක්වා කාලය ගත්තොත් ලංකාවට ඇවිත් තිබෙනවා, සංචාරකයන් 165,193ක්. ඒ කවුළුව හරහා රියදුරු බලපත්‍ර අරගෙන තිබෙන්නේ, 1,977දෙනායි. එය ප්‍රතිශතයක් වශයෙන් ගත්තොත් 1.26යි. මේ මාසයේ නොවැම්බර් 01වැනි දා සිට 14 දක්වා සංචාරකයන් 82,270ක් ලංකාවට ඇවිල්ලා තිබෙනවා. ගුවන් තොටුපොළේ තිබෙන ඒ කවුළුව හරහා රියදුරු බලපත්‍ර අරගෙන තිබෙන්නේ 947දෙනායි. ඒ කියන්නේ, සියයට 1.15ක්. එතකොට අගෝස්තු 03වැනි දා සිට මේ දක්වා කාලය තුළ පැමිණි සියලු සංචාරකයන් ප්‍රමාණය 604,669යි. ඒ කවුළුව හරහා රියදුරු බලපත්‍ර අරගෙන තිබෙන්නේ 7,195දෙනායි. එහි ප්‍රතිශතය 1.19යි. ඒ කියන්නේ, සංචාරකයන්ගෙන් සියයට 98.89ක්ම රියදුරු බලපත්‍ර අරගෙන නැහැ. මේ කාල පරිච්ඡේදය තුළ මේ කවුළුව හරහා අපි උපයා තිබෙනවා, රුපියල් මිලියන 15ක්.

හැබැයි, මේ හරහා අපි සංචාරක ව්‍යාපාරයට දෙන ප්‍රතිරූපය - image එක - මොකක්ද? සමහර සංචාරකයන් එනවා, adventureවලට. මේ විධියට එක එක දේවල්වලට සංචාරකයන් අපේ රටට එනවා. සමහර සංචාරකයන් එනවා, මොකුත් හේතුවක් නැහැ, bubble එකක් හැටියට run කරනවා; bubble එකක් විධියට තමන්ගේ ගමනාන්තවලට යනවා. තවත් සමහර සංචාරකයන් කැමැතියි, ලංකාවේ තිබෙන දේශීයත්වය, ලංකාවේ තිබෙන ප්‍රවාහන සේවා අත්විඳලා අත්දැකීම් ගන්න. ත්‍රාසජනක ක්‍රියාකාරකම්වලට - adventuresවලට - තවත් සමහර සංචාරකයන් කැමැතියි. එවැනි සංචාරකයන් වැඩි ප්‍රමාණයක් තමයි මේ රියදුරු බලපත්‍ර ගන්නේ. ඒක සංචාරක ව්‍යාපාරය තුළ රියදුරු වෘත්තියේ යෙදෙන පිරිසට අභියෝගයක් වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ රියදුරු සංගම්වලින් ඉල්ලීමක් තිබුණා, මෙම කවුළුව හරහා අය කරන ගාස්තුව මදි, එය වැඩි කරන්න කියලා. ඒ ගැසට් එකට ඊයේ ගරු ඇමතිතුමා අත්සන් තැබුවා. සතියක් දෙකක් ඇතුළත අපට ඒ නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒකේ මෙහෙමයි තිබෙන්නේ. මම ඒක කියවන්නම්. "2022 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 2301/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2022 අංක 03 දරන මෝටර් වාහන නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ." යනුවෙන් එහි සඳහන් වනවා. මම එහි අදාළ කාරණා විතරක් කියවන්නම්. මෙහි 12(ආ)(1) අනුව, විදේශීය රියදුරු බලපත්‍රයක් මත පදනම්ව ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රයක් විදේශීය පුරවැසියෙකු වෙත නිකුත් කිරීමේදී කලින් අය කළ මුදල රුපියල් 15,000යි. දැන් එය රුපියල් 60,000 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම විදේශීය පුරවැසියෙකුගේ විකෘති වූ බලපත්‍රය වෙනුවට නව ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීමේදී කලින් තිබුණේ රුපියල් 25,000යි. දැන් එය රුපියල් 45,000 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම විදේශීය පුරවැසියෙකුගේ විකෘති වූ, හානි වූ හෝ දුර්වර්ණ වූ ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රයක් වෙනුවට අනු පිටපතක් නිකුත් කිරීමේ ගාස්තුව රුපියල් 15,000 ලෙස දක්වා තිබෙනවා. විදේශීය පුරවැසියෙකුගේ අස්ථානගත වූ ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රයක් වෙනුවට අනු පිටපතක් නිකුත් කිරීම සඳහා කවුළුවෙන් රුපියල් 30,000ක මුදලක් ගන්නවා. විදේශීය පුරවැසියෙකු වෙත ආගන්තුක තාවකාලික බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා සාමාන්‍යයෙන් මාසයක කාලයක් සඳහා ගත්තේ රුපියල් 15,000යි. මාසයකට වැඩි හා මාස දෙකක කාල සීමාවක් සඳහා රුපියල් 21,000යි. මාස 2ට වැඩි සහ මාස 6ක කාල සීමාවක් සඳහා රුපියල් 30,000යි. මාස 6ට වැඩි හා මාස 12ක කාල සීමාවක් සඳහා රුපියල් 45,000ක් වශයෙන් ගාස්තු අය කිරීම් සංශෝධනය කරලා, අගය වැඩි කරලා තිබෙනවා.

මේ ආකාරයෙන් අපි සංචාරක ව්‍යාපාරය ගැන හිතනවා. හැබැයි, මේ කාරණයත් මතක තියාගන්න ඕනෑ. අපට තිබෙනවා, ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍ර ශ්‍රී ලංකාවේ පිළිගන්නා ආකාරයක්. මෝටර් වාහන පනතේ 132ආ. වගන්තියේ තිබෙනවා, 1968.11.08 දිනැති වියානා රථ වාහන සම්මුතියට ගිවිසුම්ගත වෙලා තිබෙන රාජ්‍යයන්වලින් හරි ගිවිසුමට එකඟ වෙලා තිබෙන රාජ්‍යයන්වලින් හරි ජාත්‍යන්තර රියදුරු බලපත්‍රයක් සමඟ ලංකාවට පැමිණෙන සංචාරකයෙකුට රියදුරු බලපත්‍ර නිකුත් කළ යුතු බව. ඒ වාගේම 1947 - රථ වාහන සම්බන්ධ ජිනීවා සම්මුතිය සමඟ ගිවිසුම්ගත වෙලා තිබෙන රාජ්‍යයක කෙනෙක් ඒ ජාත්‍යන්තර රියදුරු බලපත්‍ර සහිතව සංචාරකයන් ලංකාවට පැමිණියාම ඒ අයටත් මේ රියදුරු බලපත්‍ර නිකුත් කළ යුතු වනවා. මේ සංචාරක ව්‍යාපාරය බද්ධ වෙලා තිබෙනවා, අද අපි කථා කරන අනෙක් අමාත්‍යාංශයත් එක්ක. රටේ නීතියක් නැත්නම්, සමාජය ව්‍යාකූල නම්, ආර්ථික ස්ථාවරයක් නැත්නම් සංචාරකයන් ලංකාවට එන්නේ නැහැ.

අපි දන්නවා, රටේ නීතිය කලින් තිබුණේ කොහොමද කියලා. ඔබතුමන්ලා දන්නවා, හිරුණිකාලා ඩිෆෙන්ඩර්වලින් මිනිස්සු පැහැර ගෙන ගොස් දඬුවම් කළේ කොහොමද කියලා. එදා නීතිය ඒ අයගේ අතට අරගෙනයි තිබුණේ. අපි දන්නවා, කලින් කථා කළ චාමර සම්පත් මන්ත්‍රීතුමා ගුරුවරියෝ දණ ගස්සවලා නීතිය ක්‍රියාත්මක කළේ කොහොමද, නීතිය තමන්ගේ අතට ගත්තේ කොහොමද කියලා. ඒ වාගේම, අපි දැක්කා, මර්වින් සිල්වලා රාජ්‍ය සේවකයා ගස් බැන්ද ආකාරය. දැන් එතුමන්ලාට රාජ්‍ය සේවකයෝ ගැන දුකයි. නීතිය තමන්ගේ අතට ගත්තා. රාජ්‍ය සේවකයා ගස් බැඳලා තමයි නීතිය ක්‍රියාත්මක කළේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒකේ දිගුවක් තමයි අද ගෙනෙන්නේ. අපිට අභියෝග කරන්න හදනවා, අපිව භය කරන්න හදනවා. අපි වතු කම්කරු ජනතාවගේ වැටුප රුපියල් 200කින් වැඩි කරලා දෙන්න හදනකොට මොකක්ද කියන්නේ? "මේකට අත්සන් කළොත් ඔයගොල්ලන්ට නීතිය ක්‍රියාත්මක වෙයි. මේක අනීතික වැඩක්" කියනවා. මොකක්ද මේ කරන්නේ? මර්වින් සිල්වා කරපු එකේම දිගුවක්. රාජ්‍ය නිලධාරියා ගස් බඳිනවා, පාර්ලිමේන්තුව පාවිච්චි කරලා. මේ ආකාරයෙන් තමයි වතු කම්කරුවන්ට දෙන්න යන රුපියල් 200 නවත්වන්න හදන්නේ.

ඒ විතරක් නොවෙයි. කොහොමද ගෝඨාභය රාජපක්ෂ කථා කළේ? තමන්ගේ මුවින් පිට වෙන සෑම වචනයක්ම ගැසට් එකක් කියලා එතුමා කිව්වා. එහෙමයි රටේ නීතිය තිබුණේ. මම කථා කරන්න කැමති නැහැ, මැරුණු අය ගැන. බන්ධනාගාර ඇමති වෙලා ඉන්නකොටත් රෑ 12.00ට බීලා, හෙලිකොප්ටරයෙන් ගිහිල්ලා බන්ධනාගාරයට බැහැලා, රැඳවියෝ එළියට අරගෙන පිස්තෝලය කනට තියලා තමයි නීතිය ක්‍රියාත්මක කළේ. එහෙව් රටක තමයි අපි නීතිය වෙනස් කළේ. නීතියේ ස්වාධිපත්‍යය නැති කළේ එහෙම, සමාජ සාධාරණත්වය ඇති කළේ එහෙම. එහෙම පරිසරයක තමයි සංචාරකයා එන්නේ, විදේශ ආයෝජකයා එන්නේ. එහෙම නැතුව අපිට මේ රට ගොඩදාන්න බැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එහෙම රටක් තමයි අපි හදලා තිබෙන්නේ. ඒකේ දිගුවක් තමයි ඉදිරියටම යන්නේ. ඉදිරි වර්ෂ 5 ඇතුළත සංචාරක ව්‍යාපාරය දියුණු කරමින්, නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කරමින් අපි මේ රට ස්ථාවර කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.12]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි. විශේෂයෙන්ම ප්‍රධාන අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ තමයි අද විවාදයට ගැනෙන්නේ. මොකද, ඒවා එක පැත්තකින් රටේ ආර්ථිකයට සහ අනෙක් පැත්තෙන් රටේ නීතිය හා සාමයට වැදගත් වන අමාත්‍යාංශ.

සංචාරක ව්‍යාපාරය අපේ රටට විශාල ආදායමක් උත්පාදනය කරන ක්ෂේත්‍රයක්. මේ රටේ සංචාරක ව්‍යාපාරය කාලානුරූපව අඩු -වැඩි වශයෙන් ප්‍රවර්ධනය වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, යුද්ධය පැවතුණු කාල සීමාවේදීත් අපේ රට යම්තාක් දුරකට සංචාරකයන්ගෙන් පිරුණු රටක් කිව්වොත් මා නිවැරදියි. යුද්ධය තිබුණු වෙලාවේදීත් සංචාරකයෝ ලක්ෂ 3ක්, 4ක් ලංකාවට ආවා. ත්‍රස්තවාදය අවසන්වීමත්, රටේ යටිතල පහසුකම් සංවර්ධනයත් එක්ක ක්‍රමානුකූලව අපි එහි ශීඝ්‍ර වර්ධනයකට ළඟා වුණා. සමහර වෙලාවට තර්කයක් නැඟුණා, මේ ශීඝ්‍ර වර්ධනයට රට සූදානම්ද කියලා. ඒ වාගේම, ජාත්‍යන්තර තලයේ hotels, නැත්නම් ආයෝජන ලංකාවට ඇවිල්ලා ඉහළ පෙළේ සංචාරකයන්ට, නැත්නම් ඉහළ වියදමක් දරලා එන්න පුළුවන් සංචාරකයන්ට මේ රටේ නිවාඩුවක් ගත කරන්න, ආයෝජනය කරන්න, ව්‍යාපාර කරන්න පුළුවන් වෙන ආකාරයේ පසුබිමක් ගොඩනැඟුණා. හැබැයි, අපේ රටේ සංචාරක ව්‍යාපාරය අභියෝගවලටත් මුහුණ දුන්නා. එක පැත්තකින් පාස්කු ඉරුදින ප්‍රහාරය නිසා සංචාරක ව්‍යාපාරය බින්දුවටම වැටුණා. අනෙක් පැත්තෙන් කොවිඩ් - 19 වසංගතය නිසා සංචාරක ව්‍යාපාරය බින්දුවටම වැටුණා. හැබැයි මම විශ්වාස කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු අමාත්‍යතුමනි, අපේ රටේ පෞද්ගලික අංශය විසින් තමයි මේ රටේ සංචාරක ව්‍යාපාරය ක්‍රියාත්මක කරන්නේ කියලා. බලයට එන ආණ්ඩු අඩු-වැඩි වශයෙන් ඒකට සහයෝගය ලබා දෙනවා. හැබැයි, මේ රටේ සංචාරක ව්‍යාපාරයේ කොඳු නාරටිය තමයි, පෞද්ගලික අංශය. ඒ අය මහා පරිමාණයේ සංචාරක ව්‍යාපාරිකයෝ වෙන්න පුළුවන්, කුඩා හා මධ්‍ය පරිමාණ සංචාරක ව්‍යාපාරිකයෝ වෙන්න පුළුවන්. මේ අය තමයි යුද්ධයක් පවතිනකොටත්, පාස්කු ඉරුදින ප්‍රහාර කාල සීමාවෙන් පසුවත්, කොවිඩ් - 19 වසංගතයෙන් පසුවත් අපේ රටේ සංචාරක ව්‍යාපාරය අල්ලාගෙන හිටියේ. ආණ්ඩු ප්‍රතිපත්තිමය කාරණා මත මේකට සහයෝගය ලබා දෙන යම් අවස්ථා තිබෙනවා. සමහර ආණ්ඩු මේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන්න උත්සාහ කරන අවස්ථා තිබෙනවා. හැබැයි, ඒ කාරණා ඇතුළේ පෞද්ගලික අංශය තමයි මේ සංචාරක ව්‍යාපාරය ඉදිරියට අරගෙන යන්නේ.

ගරු අමාත්‍යතුමනි, අපේ රටේ volume එක තිබෙනවා. හැබැයි, මේ volume එකට සරිලන value එකක් රටට ලැබෙනවාද, නැද්ද කියන ප්‍රශ්නයත් තිබෙනවා. Volume එක ඕනෑ. ඒ වාගේම value එකත් ඕනෑ. එහෙම නම් අපේ රටේ සංචාරක ව්‍යාපාරය තුළ සංචාරකයන්ගේ ප්‍රමාණාත්මක වර්ධනය වාගේම ඒ ප්‍රමාණාත්මක වර්ධනය ඇතුළේ ගුණාත්මක වර්ධනයකුත් තිබෙන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මොකද, ආදායම ගත්තාම ප්‍රමාණය වැඩි වුණත්, ඩොලර්වලට සාපේක්ෂව අපි උත්පාදනය කරන ආදායම වැඩි වෙලා නැත්නම් ඒ තුළ යම් ගැටලුවක් තිබෙනවා. ඔව්, අද ලංකාව සංචාරක ව්‍යාපාරයේ එකම කේන්ද්‍රස්ථානය - destination එක- නොවෙයි. සංචාරකයන්ට ලෝකයේ ඕනෑ තරම් තැන් තිබෙනවා, යන්න, බලන්න, නිවාඩුවක් ගත කරන්න. හැබැයි, අපිට ආවේණික වුණු හෙළ සංස්කෘතිය ඇතුළේ අපේ රටට විශාල වටිනාකමක් තිබෙනවා. අපි මේ වටිනාකම ස්වභාව ධර්මයත් එක්ක එකට එකතු කරලා, ලංකාව සංචාරක ව්‍යාපාරයේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්නේ කොහොමද?

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා අප රට ඉලක්ක කරන්නා වූ තැන්වලට යන්න ඕනෑ නම් පළමු කාරණය විධියට Airport එක expand කරන්න ඕනෑ. අද මාලදිවයිනත් ලක්ෂ 70කට සේවා සපයන්න පුළුවන් ගුවන් තොටුපළක් හදලා තිබෙනවා. අපි තවම ලක්ෂ 60කට, 65කට සේවා සපයන්න පුළුවන් තත්ත්වයක ඉන්නේ. අපි ඉතුරු ලක්ෂ 10ට සේවා සපයන්න කටයුතු කළාට pack කරලා බොහොම අමාරුවෙන් තමයි ඒ කටයුත්ත කරන්නේ. එහෙමනම් ගුවන් තොටුපළේ සේවා සැපයීම සඳහා අවශ්‍ය ආයෝජන ගේන්න ඕනෑ. දැන් e-gates ටික ගෙනැල්ලා තවම සවි කරලා ක්‍රියාත්මක කරගන්න බැරිව තිබෙනවා. මම දන්නේ නැහැ, ඒකට හේතුව මොකක්ද කියලා. ගරු අමාත්‍යතුමනි, ඉතාම ඉක්මනින් e-gates ටික trial එකට දමන්න. මොකද, airport එක තමයි, පළමුවැනි impression එක. එතැනදී ලැබෙන පණිවුඩය තමයි සංචාරකයා රටින් පිටතටත්, රට ඇතුළටත් ලබා දෙන්නේ.

ඒ වාගේම තමයි, TDL එකෙන් අය කර ගන්න ඒ මුදල ආයෝජනය කරන්නේ කොහොමද? අපි ඒ මුදල මුදල් අමාත්‍යාංශයට සෘජුවම භාර දෙනවා. හැබැයි, එතැනින් එහාට ප්‍රාදේශීය සභාවලින් කරන සේවා වෙනුවෙන් ඒ ප්‍රාදේශීය සභාවලට ගෙවීමක් වෙන්නේත් නැහැ. සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන්න හරිහමන් මුදලක් එතැනින් ලැබෙන්නේත් නැහැ. තමුන්නාන්සේලා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන්න කටයුතු කිරීමේදී මේ කාරණාවලටත් අවධානය යොමු කරන්න ඕනෑ කියා මම විශ්වාස කරනවා.

ඒ වාගේම අපි මහා පරිමාණයේ සංචාරක ව්‍යාපාරිකයන් වාගේම කුඩා හා මධ්‍ය පරිමාණයේ සංචාරක ව්‍යාපාරිකයනුත් ආරක්ෂා කරන්න ඕනෑ. පසුගිය කාල සීමාව තුළ හික්කඩුව, මිරිස්ස, වැලිගම, තංගල්ල, හිරිකැටිය ආදී ප්‍රදේශවල කුඩා පරිමාණයෙන් සංචාරක ව්‍යාපාරයේ නියැළුණු විශාල පිරිසකගේ ව්‍යාපාර ස්ථාන කඩා දමන්න කටයුතු කළා. ඔවුන් අවුරුදු 20ක්, 30ක් ඒ ව්‍යාපාර කරපු අය. ඒවායේ නීත්‍යනුකූලභාවය පිළිබඳ ගැටලුවක් තිබෙනවා නම් ඒ අයට යම් සාධාරණයක් ඉෂ්ට කරන්න ආණ්ඩුවට වගකීමක් තිබෙනවා. ඒවා නීත්‍යනුකූල කිරීම නොවෙයි. ඒකට අවශ්‍ය යම් regulation එකක් හදලා, රාමුවක් හදලා ඒ රාමුව ඇතුළේ ඒ අයට ව්‍යාපාර කරගෙන යන්න අවශ්‍ය පරිසරය හදලා දෙන්න ඕනෑ. මහා පරිමාණයේ ව්‍යාපාරිකයන්ගෙන් පමණයි මේ රටේ සංචාරක ව්‍යාපාරය යැපෙන්නේ කියලා අපි හිතනවා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒක සාර්ථක වෙන්නේ නැහැ.

විදේශ රැකියා සම්බන්ධයෙන් ගත්තාම තවදුරටත් මේ රටේ තරුණ පරම්පරාව විදේශගත රැකියාවලට යොමු කරන්න අවශ්‍ය සහයෝගය ආණ්ඩුවක් විධියට ලබා දෙන්න ඕනෑ කියාත් අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අධිකරණ අමාත්‍යාංශය ගත්තොත්, මම හිතන විධියට අමාත්‍යාංශයක් විධියට වැඩියෙන්ම දේශපාලනීකරණයට ලක් වෙච්ච කාල සීමාව තමයි, මේ කාල සීමාව. මෑත අවුරුද්දක්, මාස ගණනක් -මේ කාල සීමාව- ඇතුළත වැඩියෙන්ම එය දේශපාලනීකරණයට ලක් වුණා. අද වනකොට පොලිස්පතිවරයාගේ පැමිණිල්ලකට පහළ උසාවියේ ගරු

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

විනිශ්චයකාරවරුන්ගේ වැඩ තහනම් කරනවා. ඒ, පොලිස්පතිවරයාගේ පැමිණිල්ලකට. පොලිස්පතිවරයාගේ පැමිණිල්ලට පහළ උසාවියේ විනිශ්චයකාරවරයෙකුගේ වැඩ තහනම් කරනවා නම් ඒකෙන් හැඟෙන්නේ මොකක්ද? පොලිස්පතිවරයාට අවශ්‍ය විධියට පහළ උසාවිය, අධිකරණය හැසිරෙන්නේ නැහැ කියන එක. හැබැයි, පහළ උසාවිය ලබා දුන් යම් තීන්දුවක ප්‍රශ්නයක් තිබෙනවා නම්, තව ඉහළ උසාවි තුනක් තිබෙනවා, ඒවාට යන්න පුළුවන්. වැඩ තහනම් කරන්න ඕනෑ නැහැ. හැබැයි, දැන් වැඩ තහනම් කරනවා.

අනෙක් පැත්තෙන් ගරු විනිශ්චයකාරවරුන්ගේ මාරුවීම් සම්බන්ධයෙන්, උසස්වීම් සම්බන්ධයෙන් ගත්තාම, වෙන දා මේ රටේ ඒකට ක්‍රමයක් තිබුණා, ජ්‍යෝෂ්ඨත්වයට අනුව, පළපුරුද්දට අනුව උසස්වීම් ලබා දෙන. හැබැයි, අද ඊට හාත්පසින්ම වෙනස් ක්‍රමයකට මේ ආණ්ඩුව අනුගත වෙච්ච බවක් අපට පෙනෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ තුළින් කඩා වැටෙන්නේ මේ රටේ අධිකරණ පද්ධතියයි. ආණ්ඩුව මේ පිළිබඳව මතයක් ගොඩනඟන්න උත්සාහ කරන්න පුළුවන්, අපි මේ අධිකරණ පද්ධතිය සුද්ද කරන්න හදනවා කියලා. නැහැ, ඒකෙන් අධිකරණ පද්ධතිය කෙරෙහි තිබෙන විශ්වාසය බිඳ වැටෙනවා. ගරු විනිශ්චයකාරුවන්ට මාරුවීම් ලබා දුන්නාම ඒ අයගේ දරුවන් පාසල්වලට දමා ගන්න ඔබතුමන්ලා ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද? අදටත් ගරු විනිශ්චයකාරවරුන්ගේ මාරුවීම්වලින් පස්සේ ඒ අයගේ දරුවන් පාසල්වලට දමා ගන්න විධියක් නැතුව ඉන්නවා. ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලා මේවා පිළිබඳව හොයා බැලුවාද? හැබැයි, තමන්ගේ අවශ්‍යතාව ඉටු කරගන්න කටයුතු කරනවා. අපි දැක්කා නේ, මේ ඉදිරි පෙළ වාඩිවෙලා ඉන්න අයගේ නඩු තිබෙන උසාවිවල ගරු විනිශ්චයකාරවරුන්, ගරු විනිශ්චයකාරවරියන් අවුරුදු තුනක කාල සීමාව ගත වෙන්නත් කලින් transfer ගිය අවස්ථා. එහෙම නේද? ඒ අය මාරුවීම් ලැබුවා. ඒකට ඔබතුමන්ලාට විග්‍රහයක් ඇති. අපි ඒක ගැන තර්ක කරන්න යන්නේ නැහැ. හැබැයි, බැලූ බැල්මට පෙනෙන්නේ මොකක්ද? වෙන දා ජ්‍යෝෂ්ඨත්වයට, කැපවීමට, පළපුරුද්දට promotion එකක් ලැබෙනවා වෙනුවට, අද ඒකට හාත්පසින්ම වෙනස් ක්‍රමයක් අනුගමනය කරනවා නම්, ඒ ගරු අධිකරණය ඇතුළේ මේ කැබිනට් මණ්ඩලයේ ඉන්න අයගේ නඩුවක් තිබෙනකොට ඒ විනිශ්චයකාරවරයා හෝ විනිශ්චයකාරවරිය මාරු වෙනවා නම්, පොලිස්පතිවරයාගේ පැමිණිල්ලකට ගරු විනිශ්චයකාරවරයෙකුගේ වැඩ තහනම් වෙනවා නම්, ආණ්ඩුවේ දේශපාලන අවශ්‍යතාව ඉෂ්ට කරගන්න මේ රටේ අධිකරණ පද්ධතිය පාවිච්චි කිරීමේ උත්සාහයක් මේ ආණ්ඩුව සතුව පවතිනවාද කියන සැකය අපට පහළ වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

බන්ධනාගාර සම්බන්ධයෙන් ගත්තාමත් එහෙමයි. දැන් මේ ගරු සභාවේ අමාත්‍යවරයා හිටියා නම් හොඳයි. ගරු අමාත්‍යතුමා කියනවා මම දැක්කා, බන්ධනාගාර, පාසල් බවට පත් කරන්න ඕනෑ කියලා. ඔව්. එක දවසක් මත්ද්‍රව්‍ය පාවිච්චි කරලා බන්ධනාගාරයට යන කෙනා බන්ධනාගාරය ඇතුළේදී lifetime drug dealer කෙනෙක් වෙන්න ඉගෙන ගන්නවා. ඒ තැනට මේ බන්ධනාගාර පත් වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේක අද ඊයේ වෙච්ච දෙයක් නොවෙයි. කාලානුරූපව, කාලයෙන් කාලයට පැවතුණු හැම පරිපාලනයක් තුළම මේ කාරණය සිද්ධ වුණා.

ඒ වාගේම තමයි, එන හැම ආණ්ඩුවක්ම මත්ද්‍රව්‍ය වළක්වන්න යම් ව්‍යාපෘතියක් කරනවා. ඒක හොඳයි. පසුගිය ආණ්ඩුවෙන් "යුක්තිය" කියලා මෙහෙයුමක් කළා. මේ ආණ්ඩුවෙන් කරනවා, "ඉවත්වෙනු" කියලා වැඩ පිළිවෙළක්. මම දැක්කා, ඔබතුමන්ලාගේ විදුහල්පතිවරයෙක් පාසල ඇතුළේ කුඩු විකුණන්න ගිහිල්ලා හසු වෙලා තිබෙනවා. ඒවායෙනුත් ඉවත් කරන්න ඕනෑ. ඒකත් කියන්න ඕනෑ නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එහෙම නැත්නම් එක පැත්තකට විතරක් චෝදනා කරනවා නේ. මම දැක්කා, ඔබතුමන්ලාගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ඊයේ දෙහිවලදී අත්අඩංගුවට අරගෙන තිබෙනවා කියලා සමාජ මාධ්‍ය හා මධ්‍ය තුළින් ප්‍රචාරය වුණා. ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අදහස් කියන්න, ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, නීතිය හැමෝටම ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියන තැන අපි ඉන්නවා සහ ඒ නීතිය ක්‍රියාත්මක කළ යුතුමයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ගරු අමාත්‍යතුමනි, අධිකරණ පද්ධතියේ වාගේම බන්ධනාගාර ඇතුළේ තිබෙන පහසුකම් ගැනත් සොයා බලන්න. ඔබතුමන්ලා එක දවසක්වත් බන්ධනාගාර බලන්න ගියාද, වාට්ටුවකට ගියාද, ඒ රැඳවියෝ එක්ක කථා කළාද? ඒ සමහර අයගේ රස පරීක්ෂක වාර්තා ඇවිල්ලා නැහැ. ඒ නිසා මාස ගණනක්, අවුරුදු ගණනක් රිමාන්ඩ් වෙලා ඉන්නවා. හැබැයි, රස පරීක්ෂක වාර්තාව එනකොට, ඒකෙන් මත්ද්‍රව්‍ය අඩංගුයි කියලා තහවුරු වෙන්නේත් නැහැ. තවත් සමහරු පිටරටින් ඇවිල්ලා ඉන්නවා. ඒ රටේ sentence එක ක්‍රියාත්මක කරන්න, මෙහේට ගෙනැල්ලා තිබෙන convicted prisonersලාට. ඒ විධියට කුවේට්වලින් ආපු කණ්ඩායමක් ඉන්නවා, මාලදිවයිනෙන් ආපු කණ්ඩායමක් ඉන්නවා. මේ අයට ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලා ගන්න පියවර මොකක්ද? හැමදාම දේශපාලන සිරකරුවන් කියලා එක පාර්ශ්වයක් ගැන විතරයි, ඔබතුමන්ලා කථා කරන්නේ. ඒ නිසා කරුණාකර ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලන්නේ, බන්ධනාගාරයට යන්න, ගිහිල්ලා රැඳවියෝ එක්ක කථා කරන්න, ඒ අයගේ ප්‍රශ්න සොයා බලන්න කියලායි. "සිරකරුවෝ ද මනුෂ්‍යයෝ ය" කියලා බෝඩ් එකක් ගහ ගත්තාට හරියන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එක වාට්ටුවක 150ක්, 200ක් දාලා වහලා තිබෙන්නේ. කී දෙනෙක් ඇතුළේ ඉන්නවාද කියලා නිලධාරින්ට සොයා ගන්නත් බැහැ. නිලධාරිනුත් ප්‍රමාණවත් නැහැ. මේ කාරණා පිළිබඳව තමුන්නාන්සේලා අවධානය යොමු කරන්න. අය වැයෙන් සල්ලි වෙන් කරනවා. ඒ වෙන් කළාට, ඔබතුමන්ලාට ඒ වැඩ කර ගන්න විධියක් නැහැ. රුපියල් මිලියන 100ක් වෙන් කරලාත්, ගරු ජනාධිපතිතුමාගේ ගමේ railway station එක හදා ගන්න බැරි වුණා නේ. එහෙම ආණ්ඩුවක් කොච්චර සල්ලි වෙන් කළත්, බන්ධනාගාරවල හෝ අධිකරණ පද්ධතියේ සංවර්ධනයක් දකින්න ලැබෙන්නේ නැහැ. අධිකරණ පද්ධතිය digitalize කරන එක - court automation - ඉක්මන් කරලා කරන්න. ඒකට පසුගිය ආණ්ඩුව කාලයේ ටෙන්ඩරය කැඳවා තිබියදී තමයි ඒක cancel කළේ. ඔබතුමන්ලාට පුළුවන් ඒක කඩිනමින් ක්‍රියාත්මක කරලා, අධිකරණ පද්ධතිය digitalize කරන්න. එතකොට මේ ප්‍රශ්න බොහොමයක් විසඳෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තව විනාඩියක් දෙන්න.

ඒ වාගේම, ඊයේ ත්‍රිකුණාමලයේ විහාරස්ථානයක් සම්බන්ධව ගැටලුවක් ඇති වුණා. අද උදේ පොලීසිය භාර අමාත්‍යවරයා කියනවා, බුදු පිළිමයේ ආරක්ෂාවටයි බුදු පිළිමය එළියට වැඩමෙව්වේ කියලා. හැබැයි, බුදු පිළිමයේ ආරක්ෂාවට එළියට

වඩම්මන කොට හාමුදුරුවෝ දෙනමක් පොලීසියෙන් ගහලා ඉස්පිරිතාලේ! බුදු පිළිමය එළියට වැඩමෙව්වේ බුදු පිළිමයේ ආරක්ෂාවටද, හාමුදුරුවන්ගේ ආරක්ෂාවටද, නැත්නම් පොලීසියෙන් බුදු පිළිමය බේරා ගන්නද කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, තව විනාඩියක් දෙන්න. මම විනාඩියෙන් අවසන් කරනවා.

මේක, 1951දී ස්ථාපනය කරලා, 2004දී පූජා භූමියක් බවට පත් කරලා, නැඟෙනහිර පළාතේ පරණම දහම් පාසල තිබෙන විහාරස්ථානය. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ, ආණ්ඩුව විධියට මැදිහත් වෙලා මේ කාරණය සාකච්ඡා කරන්න කියලායි. මේක ජාතිවාදී ප්‍රශ්නයක් බවට පත් කරන්න එපා. මේක ජාතිවාදී ආරවුලක් බවට පරිවර්තනය කරන්න එපා. මේ සඳහා තමුන්නාන්සේලා මැදිහත් වෙලා, ආණ්ඩුවේ ස්ථාවරය කියලා, මේ දෙපාර්ශ්වයම ගෙන්වලා සාධාරණයක් කරන්න. දැන් නැඟෙනහිර පළාත් සභා මැතිවරණය එනවා, උතුරු පළාත් සභා මැතිවරණය එනවා. ඒවා එන නිසා ජාතිවාදී ගැටලුවක් අවශ්‍යයි කියලා හිතනවා නම්, ඒක ඔබතුමන්ලාගේ දේශපාලනය.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තත්පර 30ක් දෙන්න.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මගේ කථාවෙන් පස්සේ ඔබතුමා කියන්න. මගේ කථාවේ අන්තිම විනාඩිය යන්නේ.

ඇමතිතුමා දැන් ඇවිල්ලා ඉන්නවා, එතුමා ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරයි. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා මේකට මැදිහත් වෙන්න. දැන් ඒ ස්වාමීන් වහන්සේලා දෙනමක් ඉස්පිරිතාලේ ඉන්නවා කියලා දැන ගන්න ලැබිලා තිබෙනවා. ඒ, පොලීසියත් එක්ක ඇති වෙච්ච ආරාවුල නිසා. මේ වාගේ දේවල් වෙන්න දෙන්න එපා. මේ වාගේ දේවල් වුණාම අවසානයේ ඒකෙන් ජාතිවාදී ප්‍රශ්නයක්, රටේ කැලඹීමක් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා ඒකත් වළක්වන්න ඔබතුමන්ලා මැදිහත් වෙන්න කියලා ඉල්ලනවා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම උදේත් කරුණු පැහැදිලි කළා, ඊයේ ඒ සිදුවීම ගැන. ත්‍රිකුණාමලය වරාය පොලීසියට ලැබුණු තොරතුරක් මත, බුදු පිළිමයට යම් හානියක් සිදු කරයි කියන තොරතුර අනුව තමයි ත්‍රිකුණාමලය වරාය පොලීසිය විසින් බුදු පිළිමය ඒ ස්ථානයෙන් ඉවත් කරලා තිබුණේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ආකාරයට ඒකට පොලිස් ආරක්ෂාවක් සපයන්න අවස්ථාවක් නැති වුණේ, රාත්‍රී 10ට පමණ තමයි ඒ බුදු පිළිමය ඒ ස්ථානයේ තැන්පත් කරලා තිබෙන්නේ. ඒ නිසා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අද උදෑසන එය ත්‍රිකුණාමලය වරාය පොලීසියට රැගෙන ගොස් තිබුණා. ඔබතුමන්ලාට ඒක විශ්වාස නැත්නම් බලන්න පුළුවන්, වරාය පොලීසියේ සටහන් යොදලා තිබෙනවා, මොන කාරණයක් නිසාද ඒ විධියට කටයුතු කළේ කියලා. ඒ අනුව නැවත පැහැදිලි,-*[බාධා කිරීමක්]* ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ටිකක් ඉන්න. ඔබතුමා මගේ කථාවෙන් පසුව කථා කරන්න. ඊට පස්සේ අපි පොලීසියට උපදෙස් දුන්නා, ආරක්ෂාව තහවුරු කරලා බුදු පිළිමය තිබුණු ස්ථානයේ නැවත තැන්පත් කරන්න කියලා. ඒ සඳහා කටයුතු කර තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේම, පන්සලේ නායක ස්වාමීන් වහන්සේලා ඇතුළු අනෙකුත් ස්වාමීන් වහන්සේලා සමඟ මේ වන විටත් අපේ මන්ත්‍රීවරු යම් ප්‍රමාණයක් සාකච්ඡාවකට සම්බන්ධ වෙලා ඉන්නවා. ඒකට දිස්ත්‍රික් ලේකම්තුමාත් සම්බන්ධ වෙලා ඉන්නවා. ඒ සියලුදෙනාම සාකච්ඡා කරලා මේක විසඳාගත යුතුයි. කිසිවෙකුටත් අපි මේ හරහා ජාතිවාදය අවුස්සන්න කිසිම ඉඩක් දෙන්නේ නැහැ. ඒ සඳහා ඉඩක් ඇත්තේම නැහැ. අතීතයේදී කරපු දේවල් කරන්න අපි කිසිම කෙනෙකුට ඉඩ දෙන්නේත් නැහැ. මේක දේශපාලනය සඳහා යොදා ගන්න අපි ඉඩ දෙන්නේත් නැහැ. අපි අනිවාර්යයෙන්ම මේකට සම්බන්ධ පාර්ශ්ව එක්ක සාකච්ඡා කරලා විසඳා ගන්නවා. සමහර කරුණු අධිකරණයට වාර්තා කරන්න තිබෙනවා. ඒ වාර්තා කිරීම අපි සිද්ධ කරනවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු ඇමතිතුමාගෙන් පොඩි පැහැදිලි කර ගැනීමක් සඳහා තත්පර කිහිපයක් මට ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, මේක විවාදයක් කර ගන්න එපා. තත්පර 15කින් අවසන් කරන්න.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, එම කාරණයට ඔබතුමන්ලා මැදිහත්වීම වෙනුවෙන් බොහොම ස්තුතියි. හැබැයි, අර වීඩියෝ එකේම තිබෙනවා, පොලීසිය ඒ වැට කපලා තමයි ඒ බුදු පිළිමය ආරක්ෂා කරන්න යන්නේ. ස්වාමීන් වහන්සේලා දෙනමකට පහර දුන්නේ කවුද කියලාත් හොයලා නීතිය ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[1.26 p.m.]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I am going to concentrate only on the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism this afternoon, Hon. Deputy Chairperson. I listened to the Hon. Minister. I was hoping that he would explain this Government's Foreign Policy and based on that, would justify the kind of allocations made in the Budget. Yes, he did speak about some matters - about bilateral discussions and foreign visits - but, I am sorry to say, he did not really

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

articulate the Government's position, what our Foreign Policy objectives are and how we are allocating monies to meet those objectives. Madam, I am not going to go into that any further.

I think, Madam Chair, we need to think of our Foreign Policy in terms of an economic strategy. Forget all the rhetoric, you know, that we are non-aligned or whatever. Those are rhetoric; that is from the past. Now, we have got to be dynamic; we have got to understand how the world is moving, the new opportunities that are arising and use our Foreign Policy as an economic strategy. If you really look at the growth that we require, it is going to rely on external matters: exports, investments, remittances and tourism. Do not forget, even the debt restructure is an external matter. You know that it was because India and China agreed to restructure our debt that we were able to come out of the horrible state we were in and the reason why those countries helped us was because we had built a strong relationship both with India and China and they were ready to help us. So, think about this as an economic strategy going forward.

Then, I will take up a few other things. On the website of the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism, the most important thing, the way I see it, is Economic Diplomacy. If you click on the tab titled "Economic Diplomacy" - Madam Chair, in today's context, everybody is online and now, we are talking about a digital Sri Lanka and so on and so forth - you would notice that they still talk about things that happened in 2018 and 2019. And, if you look into "Technical Cooperation" under "Economic Diplomacy", it states that the main ongoing special project is Expo Dubai in 2020 - we are in 2025 - and goes on to state about things that happened in 2020. Also, it states, "The Economic Affairs Division is the focal point of the following important regional organizations ...." et cetera.

At the moment, the biggest thing they are talking about is, overseas Sri Lankans. We want overseas Sri Lankans to invest in this country. Now, there is something called the Office for Overseas Sri Lankan Affairs. Then, I went to the website of the Sri Lankan High Commission in Australia, which is actually the Melbourne Office. You can just google it. When you go to the website of the Melbourne Office, it has the "Office for Overseas Sri Lankan Affairs" and there is a QR code. I tried to scan the QR code and go to the website. Assume I am an overseas Sri Lankan who wants to invest in Sri Lanka and I go to the website of the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism. What does it say when the QR code is scanned? It states, "Oops!"; that is what it says. "Oops!" is not a foreign policy. What does "Oops!" mean? It means that it does not exist. On your official website, you say economic diplomacy is key, you want investors to come in and that you are trying to attract overseas Sri Lankans to invest, but that Office does not exist! The Hon. Minister, in his reply, can say whether an Office for Overseas Sri Lankan Affairs actually exists in the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism.

Then, you look at exports. When we go to your website, under "Economic Diplomacy", we find "Invest in Sri Lanka", where you are talking about what happened in October, 2019! What is wrong with the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism? How is it necessary to have things that happened in 2019 on the website? Then - Madam, just look at this - if you go to "Trade with Sri Lanka" under "Economic Diplomacy", you find the trade activities conducted in 2018 and 2019: Australia/Sydney in 2018/2019, Bahrain in 2018, Havana in 2019, France/ Paris in 2019 et cetera. I am bit critical, but I also want to be positive here. Kindly look at the website of the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism because that is your platform for investors, overseas Sri Lankans and our exporters. So, that must be done, first of all.

Now, if we look at the issues that we have been dealing with - the Hon. Minister did not speak about Geneva at all and I am not going to either - I must say that the Government has taken a reasonable middle path. I must say that. That reasonable middle path is different to what the Rajapaksas took. Here, the Opposition is not trying to take short-term political credit. We need a resolution to the problem that we have been facing for a long period of time. There is a four-pillar - truth and justice, accountability, reparation and non-recurrence - structure and what we need to do is to ensure that, based on that, we are actually interested in and devoted to establishing and implementing what we promised to the world, to the agencies in Geneva and elsewhere. Recently, the ITAK criticized the Government for appointing three out of five members of the Office for Reparations from the military sector. So, that would not work.

Then, you must understand the issues of our Sri Lankans overseas. We have two types of overseas Sri Lankans. One group is, those who go and work in West Asia and South-East Asia. They bring us remittances, well and good. They bring in the highest amount of dollars into the country and that is what that builds our foreign reserves. Then, there are those in the West, who sort of seem to have gotten left behind and who say, "You must try to understand the issues we are facing and you must talk to us". So, those are important things, I think, the Ministry must engage in, instead of talking about what happened five, six or seven years ago.

Also, think about the ocean surrounding us. The Hon. Minister spoke about IORA, but I think we lost an opportunity there. We are not just, literally, a State in the Indian Ocean, but we are the centre of the Indian Ocean. We talk about freedom of navigation, rules-based order in the Indian Ocean, data cables under the sea et cetera. Madam, we have to punch above our weight class. Sri Lanka is a small country, we always say - it is not that small, to start with, as we have 22 million people and the geography is also fairly large - but we have an amazing opportunity because of our positioning in the global context. Therefore, we must punch above our weight class.

So, in that context, we have to be able to make sure that our Foreign Policy is such that we balance the East and the West. India is important to us. We have to talk about trade agreements with India. But, unfortunately, nobody talks about the ETCA or the CEPA. I challenge the Government. The Hon. President and the Hon. Prime Minister visited India, but nothing was spoken about the ETCA; there was nothing in the Joint Statement, just like with China. China is absolutely important investment partner for us. For instance, look at the Colombo Port City. Now that the Chinese-Indian relationship has thawed and they are working together, there is an ideal geostrategic opportunity for us to take advantage of.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I am going to wind up, Madam. Just give me one last minute.

Tourism is the final point I want to deal with. In tourism, there are multiple issues to deal with. I do not know whether US Dollars 175 per person per day - that is, US Dollars 350 per couple - is actually true and if that is not true, you have to have the correct data in order to have strategies to ensure that we get the tourism industry right.

If we take the proposed tourism Act, there were reasons why it was broken into three. If you have other reasons to consolidate it, then you must be logical about it. - *[Interruption.]* I understand, it is a skewed distribution. There are only a few large players and many small players. I understand that you need to bring in the small players also, but ensure that you have the industry's support for doing that.

Thank you very much for giving me time, Madam.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නීතිඥ සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.36]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම අධිකරණය ඉලක්ක කරලා මේ ගරු සභාවේ විපක්ෂය පැත්තෙන් කථා කිහිපයක් ඉදිරිපත් වුණා. අප විශ්වාස කරපු නීතිය තමයි, අධිකරණය, ව්‍යවස්ථාදායකය සහ විධායකය කියන ත්‍රිත්වය සමබර හා තුලන ක්‍රමයක් මත ක්‍රියාත්මක විය යුතුයි කියන එක. ඒ සිද්ධාන්තය තමයි අපට නීති විද්‍යාලවල ඉගැන්නුවේ. අපි මේ ක්‍රමය එනකල් බලාගෙන හිටියා. මේ ක්‍රමය ඇතුළේ පසුගිය වකවානු තුළ සමබර හා තුලන ක්‍රමයක් අපට කවදාවත් හමු වෙලා නැහැ. මොන්ටෙස්ක්‍යු න්‍යාය අනුව සංවරණ හා තුලන ක්‍රමයේ ඇත්ත practice එක ඇවිල්ලා තිබෙන්නේ දැන් තමයි. මොකද, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විධායකය, විධායකය විධියටත්, ව්‍යවස්ථාදායකය, ව්‍යවස්ථාදායකය විධියටත්, අධිකරණය, අධිකරණය විධියටත් ජනතාවගේ පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කරන ආයතන තුනක් හැටියට ස්වාධීන හා තුලන ක්‍රමයක් මත ක්‍රියාත්මක වෙන්න ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ අවස්ථාව ලබා දීලා තිබෙන්නේ නවවන ජනාධිපතිවරයා යටතේයි.

අටවන ජනාධිපතිවරයා අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් අනෙක් පැත්තට හැරෙව්වා. නමුත්, දැන් මොකක්ද විපක්ෂයෙන් මේ ගරු සභාව තුළ කියැවුණේ? විශේෂයෙන්ම චාමර සම්පත් මන්ත්‍රීතුමා කිව්වා, දැන් අධිකරණය ජේආර්ගේ ක්‍රමයටත් වඩා නරකයි, ප්‍රේමදාසගේ ක්‍රමයටත් වඩා නරකයි, චන්ද්‍රිකා බණ්ඩාරනායකගේ ක්‍රමයටත් වඩා නරකයි කියලා. ජේආර් ගිහිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගල් ගැහුවා. මේ ආණ්ඩුවේ කවුරු හරි විනිශ්චයකාරවරුන්ට එවැනි අයුතු බලපෑමක් කරලා තිබෙනවාද? අඩුම ගණනේ අපේ කාලය ඇතුළේ හරි? අද මෙතැනදී නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කළා. අම්මෝ, මාර ප්‍රජාතන්ත්‍රවාදය! මාර වැඩේ, පොලිස්පතිවරයාගේ පැමිණිල්ලකට ක්‍රියාත්මක වුණේ නැහැ කියලා විනිශ්චයකාරවරිය සේවයෙන් ඉවත් කරලා ලූ. ඒ වාගේම, මේ අධිකරණය ස්වාධීන නැහැ, මේ අධිකරණය ස්වාධීනව පවත්වාගෙන යන්න අවස්ථාවක් නැහැ කියලාත් කිව්වා. කවුද, එහෙම කිව්වේ? නාමල් රාජපක්ෂ. නාමල් රාජපක්ෂ එහෙම කිව්වා. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. දැන් තිබෙන්නේ, ඒ තරම් හොඳ නැති අධිකරණයක් කියලා නේ ඒ කියන්නේ.

එතුමන්ලාගේ ආණ්ඩු කාලයේ ආපු බලපෑම් මොනවාද? බැසිල් රාජපක්ෂගේ lawyer ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක් කළා. ඒ, බැසිල් රාජපක්ෂගේ නඩු කරමින් හිටපු කෙනා. එයා  දැම්මා, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අහන්න. ඊට පස්සේ බැසිල් රාජපක්ෂගේ දිවිනැඟුම නඩුවේ තීන්දුව හරියට ලිව්වේ නැහැ කියලා, ඒ පවුල වෙනුවෙන් තීන්දු ලියන්නේ නැහැ කියලා ශිරානි බණ්ඩාරනායක මහත්මිය අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් පන්නලා දැම්මා. ඊට පස්සේ සෙලාන් බැංකුවේ හිටපු සභාපති ගෙනැල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ පුටුවේ ඉන්දුවා. අන්න එදා කරපු දේවල්. ඒ අය දැන් අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරන්න එනවා. කෝ, දැන් නාමල්? මෙහෙම නේ වෙන්නේ. මෙතැනට ඇවිත් කථා කරනවා, දුවනවා. අහන ප්‍රශ්නයට උත්තරය දෙනකොට පැත්ත පළාතක ඉන්නේ නැහැ. Practice එකක් විධියටම එන්නේ විනාඩි 10ක් කථා කරන්නයි. කථා කළා, "ටක්" ගාලා පැනලා ගියා. මොකද, හිටියොත් මේ කියන ටික අහගන්න සිද්ධ වෙනවා නේ. නමුත්, මේ ටික අහගන්න එතුමාට හැකියාවක් නැහැ, ශක්තියක් නැහැ.

ඔන්න, එක්සත් ජාතික පක්ෂ පාලන කාලයේ අධිකරණයේ ස්වාධීනත්වය පැවැති ආකාරය. දැන් ඔය සමගි ජන බලවේගය කිව්වාට, ඒ කණ්ඩායමම නේ ඉන්නේ. එක්සත් ජාතික පක්ෂය ඒ කාලයේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ට සලකා තිබෙන්නේ කොහොමද, අධිකරණයට කරපු බලපෑම් මොනවාද කියලා ඉතිහාසයේ ලියැවිලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ කඳවුර අධිකරණයට බලපෑම් කළේ කොහොමද කියන එක ඉතිහාසයේ ලියැවී තිබෙනවා. ඊට අමතරව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවල සමබරව ලියා තිබෙනවා, 1වන විධායක ජනාධිපතිවරයාගේ සිට 8වන විධායක ජනාධිපතිවරයා දක්වා හිටපු විධායක

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

ජනාධිපතිවරුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කළේ කොහොමද කියලා. ඉතින්, අධිකරණයේ ස්වාධීනත්වය ගැන මොන කටින්ද මේ අය මේ කථා කරන්නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද තමයි අධිකරණය ඇත්ත වශයෙන්ම ස්වාධීනව කටයුතු කරගෙන යන්නේ.

දැන් මෙතැන කථා කළා, විනිශ්චයකාරවරුන් මාරු කිරීමක් පිළිබඳව. විනිශ්චයකාරවරුන්ට සවන්දීමකින් තොරව විනිශ්චයකාරවරුන් මාරු කිරීමක් පිළිබඳව කථා වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒක ආණ්ඩුව කරන වැඩක් නොවෙයි නේ. ඒ ස්වාධීන ආයතනයට බලයක් දීලා තිබෙනවා. අධිකරණ සේවා කොමිසම කියන්නේ සම්පූර්ණයෙන්ම ස්වාධීන ආයතනයක්. ඒගොල්ලන්ගේ කටයුතුවලට ඇඟිලි ගහන්න බැහැ කියලා Article 111L යටතේ සඳහන් වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපට හරිම කනගාටුවක් ඇති වෙනවා. මොකද, සමහරු එළියේ කියන්න බැරි ඕනෑම කාරණයක් මෙතැනට ඇවිල්ලා කියලා, දුවනවා.

ඇත්ත වශයෙන්ම අපි ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ, ස්ථාවර නියෝග සංශෝධනයක් කරන්න පුළුවන්ද කියලා, එළියේ offence එකක් වන එකක් වරප්‍රසාද පාවිච්චි කරලා සභාව ඇතුළේ කියන්න බැහැ කියන කාරණය ගැන. නැත්නම් මේක හරිම විහිළුවක් වෙනවා. දැන් මෙතැනදී කියපු දේවල් ටික එළියේ කිව්වා නම්, Article 111L යටතට වැටෙනවා. ඉතින් එළියේ කියන්න බැරි කාරණා මෙතැනට ඇවිල්ලා කියලා දුවනවා. මම කියන්නේ, ඒ ස්වාධීන ආයතනයෙන් ගන්නා තීරණවලට අනුව කටයුතු කරන්න ඉඩ දෙමු කියන එකයි.

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? අපි දන්නවා, දැන් විනිශ්චයකාරවරුන් යම් ප්‍රමාණයක් වැඩ තහනමට ලක් වෙලා තිබෙනවා කියලා. ඇත්ත. සමහර අය ඉල්ලා අස්වෙලාත් තිබෙනවා. දැනටත් ඒ තීන්දුව - ඒ ඉවත්වීමට කරන ලද ප්‍රකාශය - අභියෝගයට ලක් කරලා මම දන්නා විධියට විනිශ්චයකාරවරුන් දෙදෙනෙක් තරග කරනවා. හරි. දැන් තරග කරන්නත් අවස්ථාව තිබෙනවා; ඉල්ලා අස් වෙන කෙනාට ඉල්ලා අස් වෙන්නත් අවස්ථාව තිබෙනවා. දැන් මේ කරන්න හදන්නේ මොකක්ද දන්නවාද? අග්‍රවිනිශ්චයකාරවරයා ඇතුළු කොමිසම කළු කරන්නයි හදන්නේ. කොමිසම කළු කළාට පසුව මේගොල්ලන්ට ලේසියි, මේ වැඩේ ගෙනියන්න; අධිකරණය ස්වාධීන නැහැ කියන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි මේ ස්වාධීන ආයතනවලට කිසිදු බලපෑමක් කරන්නේ නැහැ. මෙතැනදී කථිකයෝ දෙදෙනෙක් මොකක්ද කළේ? අර ත්‍රිකුණාමලයේ ඇති වුණු සිද්ධිය පාදක කරගෙන - *[බාධා කිරීමක්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම point of Order එකක් ඉල්ලනවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

නම කියපු පළියට point of Order එකක් නැහැ. *[බාධා කිරීම්]* පොඩ්ඩක් වාඩිවෙන්න. නම කියපු පළියට points of Order කොහේද දෙන්නේ? *[බාධා කිරීම්]* නම කියපු පළියට - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාව අවසානයේ ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ත්‍රිකුණාමලයේ සිද්ධිය පදනම් කරගෙන - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ත්‍රිකුණාමලයේ ඇති වුණු සිද්ධිය පදනම් කරගෙන මෙතැනදී ප්‍රකාශ දෙක තුනක් කළා. ආගම පදනම් කරගෙන, ජාතිවාදී ස්වරූපයකින් කටයුතු කරන්න හදනවා කිව්වා. *[බාධා කිරීම්]* එතැන යම් කිසි සිද්ධියක් වුණා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. සිද්ධියක් වෙලා තිබෙනවා. *[බාධා කිරීම්]* පොලීසිය ඒකට මැදිහත් වෙලා තිබෙනවා. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106වැනි වගන්තිය යටතේ ගරු අධිකරණයට කරුණු වාර්තා කර තිබෙනවා. එතකොට ඒක අධිකරණයේ කටයුත්තක්. මට කියන්න කොහේද එතැන දේශපාලනය මැදිහත් වෙලා තිබෙන්නේ කියලා? අපි මැදිහත් වෙලා, ආණ්ඩුව මැදිහත් වෙලා ජාතිවාදය වපුරා තිබෙන තැනක් කියන්න. නමුත් මෙතැන කථා වෙන්නේ අපි ලොකු ආගම් ප්‍රශ්නයක් ඇති කළා වාගෙයි. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරිච්ඡේදයක් ගැන සඳහන් කරමින්, බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දිය යුතුයි කියන කාරණය සඳහන් කළා.

අපි ආණ්ඩුවක් විධියට බුද්ධාගමට නොසලකා ඉඳලා තිබෙනවාද? අපි ආගමට ගැරහුමක් කරලා තිබෙනවාද? හැබැයි මෙතැනට ඇවිල්ලා යම්කිසි සිද්ධියක් පදනම් කරගෙන ඒක වෙන පැත්තකට පරිවර්තනය කරන්න හදනවා. ඒ නිසා විපක්ෂ නායකවරයාට අපි කියනවා, ඔබ ඔය කියන දේ ඉතාම පහළ තත්ත්වයේ එකක්. සිද්ධියක් පදනම් කරගෙන ඒක ජාතිවාදී, ආගම්වාදී ස්වරූපයකට පරිවර්තනය කරන්න හදන්න එපා කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

හොඳයි. මම නම් සඳහන් කරපු ගරු මන්ත්‍රීවරුන්ට අගෞරවයක් වෙන්න නොවෙයි ඒ කරුණු කිව්වේ. එතුමන්ලාගේ තර්කවලට ප්‍රතිතර්කයක් මම ඉදිරිපත් කළේ. අධිකරණයේ ස්වාධීනත්වය ගත්තොත්, අධිකරණයේ ස්වාධීනත්වය ඉතාම ඉහළින් රැකපු ආණ්ඩුවක් තමයි මේ තිබෙන්නේ කියන කාරණාව මම අනිවාර්යයෙන්ම ඔබතුමියගේ ගරු අවධානයට යොමු කරනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි දිවා ආහාරයට රැස්වීම නතර කරලා පැය භාගයකට පස්සේ තමයි නැවත රැස්වුණේ. නියෝජ්‍ය ඇමතිවරයා කියනවා, අපි ප්‍රශ්නවලට පිටුපාලා පැනලා යනවා කියලා. අපි පැනලා යන මන්ත්‍රීවරු නොවෙයි. එතුමාගේ කථාවේදී කිව්වා, -

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඔබතුමාට නොවෙයි කිව්වේ. නාමල් ගැන කිව්වේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
නාමල්ට කිව්වත් එකයි, චාමරට කිව්වත් එකයි. චාමරගේත් නම කිව්වා. මම මේ කාරණයත් කියන්නම්. ඔබතුමා කිව්වා, මහින්ද රාජපක්ෂගේ කාලයේ, ප්‍රේමදාසගේ කාලයේ කියලා. ඒක නිසා තමයි 159කට ඡන්දය දුන්නේ මිනිස්සු. නැත්නම් දෙකයි පනහේ නීතිඥයන්ට කොළඹින් එන්න වෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
විවාදයකට යන්නේ නැතුව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.48]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක ඇමතිතුමා මේ සභාවේ ඉන්න වෙලාවේ මේ කාරණය කියන්න ඕනෑ. මේ අපේ රටට ඩොලර් ආදායම වැදගත් මොහොතක්. මොකද රුපියල්වලින් භාණ්ඩාගාරය උතුරන්න පුරවලා තිබෙනවා කිව්වාට, විදේශ ණය රුපියල්වලින් ගෙවන්න බැහැ. ඩොලර්වලින් තමයි විදේශ ණය ගෙවන්න වෙන්නේ. විදේශ ණය ගෙවන්න වෙන්නේ 2028දී කියලා කථාවක් හදලා තිබෙනවා. ඒක පට්ටපල් බොරුවක්. 2028දී ගෙවන්න තිබෙන්නේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලින් අරගෙන තිබෙන ඩොලර් බිලියන දහහතර හමාරක ණය මුදල විතරයි. එතෙක් ලෝක බැංකුවෙන්, ආසියානු සංවර්ධන බැංකුවෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වාගේ ආයතනවලින් ගත්ත ණය ගෙවන්න තිබෙනවා. දැනටමත් ඇමෙරිකාවේ බද්ද වැඩි වුණාට පස්සේ ආනයන-අපනයන පරතරය ඩොලර් මිලියන 600කට වැඩි වෙලා තිබෙනවා.

අපි විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. අපේ සංචිතයේ තිබෙන්නේත් ඩොලර් බිලියන 6.2යි. Serve කරන්න තිබෙන විදේශ ණය ලබන අවුරුද්දේත් ගෙවන්න ඕනෑ. ඒක නිසා විශේෂයෙන්ම අපි ඒ කාරණය විදේශ කටයුතු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. ගිය අවුරුද්දේ ජනවාරි සිට සැප්තැම්බර් මාසයත් එක්ක මේ අවුරුද්දේ ජනවාරි සිට සැප්තැම්බර් මාසය අරගෙන බැලුවාම, සංචාරක කර්මාන්තයේ number of touristsලා යම් ප්‍රමාණයක් වැඩි වුණාට ආදායම ඩොලර් මිලියන 100ක් තමයි වැඩි වෙලා තිබෙන්නේ. ඒ වාගේම තමයි විදේශ ශ්‍රමිකයන්ගෙන් එන ප්‍රේෂණ ප්‍රමාණය. ඒකත් ඩොලර් මිලියන 100ත්, 200ත් අතර ගණනකින් වැඩි වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ මොහොතේ රට ස්ථාවර වෙන්න, ණය ගෙවමින් ස්ථාවර වෙන්න වාගේම, ආනයන-අපනයන පරතරය අඩු කර ගන්නත් අනිවාර්යයෙන්ම ඩොලර් ඕනෑ.

ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ අය කිහිප වතාවක් විදේශ රටවලට ගියාට විදේශ ආයෝජන ගෙනෙන්න පුළුවන්කමක් ඇති වෙලා නැහැ. ආයෝජකයන් ගෙනැල්ලා, මෙහේ නිෂ්පාදනය වැඩි කරලා, ඩොලර් ගෙනැල්ලා, නිෂ්පාදන ප්‍රතිඅපනයන කරලා, ඩොලර් හෙව්වේ දක්ෂතාවක් වර්තමාන ආණ්ඩුවට නැහැ. විදේශ කටයුතු ඇමතිතුමනි, අවුරුදු ගණනක් තිස්සේ අපේ රටට එන සාම්ප්‍රදායික ආදායම් මාර්ග දෙකක් තමයි, සංචාරක කර්මාන්තයයි, විදේශ ප්‍රේෂණයි. දැන් බලන්න, ඉතාම දක්ෂයෝ පිරිසක් ඉන්න ආණ්ඩුවක් ආවා කිව්වා. හැබැයි, දැන් ආණ්ඩුවට අවුරුද්දක් වෙනවා. ඒ නිසා අඩුම ගණනේ නිර්මාණාත්මක දේවල් කිහිපයක් introduce කරලා දෙන්න, ගරු ඇමතිතුමනි.

පසුගිය ආණ්ඩුව කාලයේ සිදු වෙච්ච අවුලකින් තමයි කටුනායක ගුවන් තොටුපොළ දෙවන අදියර ක්‍රියාත්මක කරන්න බැරි වුණේ. ඒක ඇත්ත. ඒ අයට දඬුවම් දෙන්න. ඒකට ප්‍රශ්නයකුත් නැහැ. හැබැයි, අද විශාල වශයෙන් සංචාරකයන් ආකර්ෂණය කර ගන්න බැරි වෙන්න එක හේතුවක් තමයි, ගුවන් තොටුපොළේ ඉඩ ප්‍රමාණය මදිකම. කනගාටු වෙන්න, අපේ රටේ තත්ත්වය ගැන. අද පෞද්ගලික අංශය එකතු වෙලා marquees 12ක් ගහලා තමයි සංචාරකයන් ගෙන්වා ගන්න සිදු වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමාට අපි යෝජනාවක් කරන්න කැමැතියි. පසුගිය දවස්වල අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේදීත් ඒ ගැන කථා කළා. කටුනායක ගුවන් තොටුපොළේ දෙවන අදියර අවසන් වෙනකල් budget touristsලාට අඩුම ගණනේ රත්මලාන ගුවන් තොටුපොළවත් විවෘත කරන්න. මම ඒ සම්බන්ධ විස්තරය සභාගත කළා. දැන් මම ළඟ ඒ document එක නැහැ.

යුද්ධය කාලයේ ලැබී තිබුණු නියෝගයක් අනුව තමයි මේ පාර්ලිමේන්තුවට උඩින් ගුවන් යානා යන්න බැහැ කියලා රත්මලානට ජ්ලේන් ගොඩබාන එක නවත්වලා තිබෙන්නේ. ඇත්තටම London City Airport එකේ runway එකට වඩා දිගින් වැඩියි, රත්මලාන ගුවන් තොටුපොළේ runway එක. පෙන්ටගනයට උඩින් ගුවන් යානා යන්න පුළුවන් නම්, ලංකාවේ පාර්ලිමේන්තුවට උඩින් යන්න බැරි මොකද? ඒ ගැන ඇහුවාම දැන් කියනවා, යුද හමුදා මූලස්ථානය තිබෙනවා ලු, ඒ නිසා බැරිලු. මේ යල් පැන ගිය අදහස්වලින් ඔබ්බට ගිහිල්ලා, අද රටේ තිබෙන අවශ්‍යතාව තේරුම් ගන්න. ඩොලර් ආදායම වැඩි කර ගැනීම සඳහා, ණය ගෙවීමට අවශ්‍ය ඩොලර් ආදායම වැඩි කර ගැනීම සඳහා සංචාරක කර්මාන්තයට අවශ්‍ය පහසුකම් ටික දියුණු කරලා, සංචාරකයන් වැඩිපුර ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු ටික කරන්න.

ඒ වාගේම පරාටා කාලා ජ්ලේන්ට් ගහන සංචාරකයෝ ඇවිල්ලා වැඩකුත් නැහැ. ආරුගම්බේ පැත්තට එහෙම ගියා නම් ඒක බලන්න පුළුවන්. දැන් ආරුගම්බේ ඊශ්‍රායලයට සින්නක්කර ලියා දීලා ඉවරයි ඔබතුමන්ලා. ඔබතුමන්ලා පලස්තීනයට පක්ෂව උද්ඝෝෂණ කරපු අය, ඒ ගැන වැඩමුළු කරපු අය, ඒ වෙනුවෙන් පෙනී හිටපු අය. ආණ්ඩුවට ආවාට පස්සේ දැන් පලස්තීනය ගැන කථාවක්වත් නැහැ. ඒක වෙනම කථාවක්. ඉතින් ඒ දෙබිඩි පිළිවෙත අපි පැත්තකින් තියමු කෝ. දැන් ආරුගම්බේ ගිහිල්ලා

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

බලන්නකෝ. ඔක්කෝම යුද්දෙට ගිය මානසික රෝගීන් ටිකක් එහේට ඇවිල්ලා ඉන්නේ. ප්ලේන්ට් ගහලා පරාටා කන කට්ටිය ඉන්නේ. අඩුම ගණනේ per-tourist spending එක වැඩි කිරීම සඳහාවත් අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. අපි නිධානයක් උඩ වාඩි වෙලා ඉඳගෙන හිඟා කනවා කිය කියා ඉඳලා හරි යන්නේ නැහැ. ඒ වාගේ කථා ඔක්කෝම විපක්ෂයේ ඉන්නකොට කිව්වා නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කොළඹ නගරයේ five-star hotelsවලට ගිහිල්ලා බලන්න. එක brochure එකක් නැහැ. කොළඹට එන සුද්දෝ දන්නේ නැහැ, දෙහිවල සත්වෝද්‍යානයක් තිබෙනවා කියලා. සමහර සුද්දෝ ගෝල්ෆේස් එක ළඟ ඉඳගෙන ඉණට අත තියාගෙන අහස දිහා බලාගෙන ඉන්නවා. කඩල ගොට්ටක් කාලා ඉන්නද ඒ ගොල්ලන්? ඒ නිසා ඒ පිළිබඳව දැනුවත් වීමේ වැඩසටහන් ආරම්භ කිරීමත් වැදගත්. මොකද, Tourism Promotion Bureau එකෙන් tourism promotion කියලා හිතාගෙන ඉන්නේ, London World Travel Market එකට යන එක, Germany Travel Mart එකට යන එක, රට යන එක විතරයි promote කරන්න තිබෙන එකම දේ කියලා. ඒ නිසා domestic promotion කෙරෙන්නේ නැති බව තේරුම් අරගෙන, ඒකට අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම five-star hotel එකකට ආපු සුද්දෙක් පාරට බැහැලා ටැක්සි එකකට නැඟලා කොහේටද යන්න පුළුවන් කියලා ඇහුවාම, කියන්න දන්නේ නැහැ. ඒ නිසා අඩු ගණනේ ඒ සඳහා පුහුණු කරපු කණ්ඩායමක් දමන්න. ඒක අමාත්‍යාංශයේ වගකීමක්. ඒක කාර්යාංශයේ වගකීමක්. ඒ වාගේ කටයුතු කරන්නේ නැතුව සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න පුළුවන් කියලා මම නම් හිතන්නේ නැහැ.

ඒ වාගේම දියුණු කරන්න පුළුවන් තවත් පැත්තක් තමයි wildlife tourism කියන්නේ. අපේ රටේ ජාතික වනෝද්‍යාන 17ක් තිබෙනවා. ඒ 17හි පරණ බංගලා බර ගණනක් තිබෙනවා. රුපියල් 25,000යි nights දෙකකට ගන්නේ. දැන් තර්කයක් ගෙනෙනවා, රටේ සාමාන්‍ය මිනිසුන්ටත් ගිහිල්ලා ගෙවලා ඉන්න පුළුවන් විධියට ඒවා තිබෙන්න ඕනෑ ලු. කොටසක් තියන්න, ඒ විධියට. කොටසක් අලුත්වැඩියා කරන්න. High-spendersලා target කරලා develop කරන්න. එතකොට ගණන් හදලා බැලුවොත් ඒක අනිවාර්යයෙන් අතිරේක ආදායමක් වෙනවා. මට මතකයි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ මම මේ පිළිබඳව ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමාට - එතුමාට දොස් කියන්න නරකයි, එතුමා දැන් මිය ගිහිල්ලා නිසා- පිටු 104ක පොතක් ලියලා දුන්නා, අවුරුද්දට ඩොලර් බිලියනයක ආදායමක් හොයන විධිය කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මට විනාඩි 10ක් තිබුණා නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔව්, විනාඩි 10න් 8ක් ඉවරයි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
හරි.

ඇමතිතුමා ඉන්න වෙලාවේ තවත් ගොඩක් දේවල් කියන්න තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. හැමදාම මේවා කියන්න හම්බ වෙන්නේ නැහැ නේ.

ගරු ඇමතිතුමනි, wildlife tourism කියන්නේ වැඩි මුදලක් වියදම් කරන්නේ නැතුව immediately ආදායමක් බවට පරිවර්තනය කර ගන්න පුළුවන් එකක්. ඒක Renovate කළාද, ඊළඟ දවසේ website එකේ launch කරලා "Booking.com" එකේ දමන්න, ආදායම එනවා එතැනින් එහාට. ඒවා තමයි වැඩිපුර ආදායම හොයන්න පුළුවන් ක්ෂේත්‍ර.

මට නියමිත වෙලාව අවසන් කියපු නිසා, කථාව අවසන් කරන්න කලින් මේ ගැනත් කියන්න ඕනෑ. දැන් මේ ආණ්ඩුව නේ සර්ව සාධාරණ ආණ්ඩුව. අපේ වටගල නියෝජ්‍ය ඇමතිතුමා - කොළඹ දිස්ත්‍රික්කයේ මගේ මිත්‍රයා - කිව්වා, එතුමන්ලා තරම් සාධාරණ කවුරුවත් නැහැ කියලා. නමුත් නීතියේ ආධිපත්‍යය රකිනවාය කියපු මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ, මිනී මැරුම් පනස් ගණනක් සිදු වෙලා තිබෙනවා; වෙඩි තැබීම් එකසිය ගණනක් සිදු වෙලා තිබෙනවා. ඒ වුණත් මහජන ආරක්ෂාව තිබෙනවාය කියලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව අයින් කරලා තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දුන්නොත්, මහජන ආරක්ෂාව නැති වෙයි ලු. එහෙම කියන පොලීසිය භාර ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට එන්නේත් STF එකත් එක්ක. STF එක uniform නැතුව backup එකක එන්නේ. මේ ඡායාරූපයේ තිබෙන්නේ, KX-5289 රථය. මෙන්න. මේ පසුගිය බ්‍රහස්පතින්දා හවස 2.39ට එතුමා පාර්ලිමේන්තුවෙන් එළියට යනකොට backup එක ඇවිල්ලා එතුමා අරගෙන යනකොට මම ෆොටෝ එකක් ගහගත්තා.

එතුමාට STF එක අරගෙන යන්න හොඳයි. රටේ මහජන ආරක්ෂාව තිබෙනවා නම්, පොලීසිය භාර ඇමති STF එක අරගෙන යන්න ඕනෑ නැහැ නේ. *[බාධා කිරීමක්]* ඔබතුමාටත් දීලා නැහැ, මම දන්නවා ඒක. පුළුවන් නම් කියන්න කෝ. එහෙම දීලා නැහැ නේ. නැත්නම් ඉතින් ඔබතුමාත් police driversලා අරගෙන, uniform අන්දවන්නේ නැතිව අරගෙන යන්න ඕනෑ. හැබැයි, ඔබතුමාට එහෙම ලැබිලා නැහැ. නමුත්, ඒ අය යනවා. සන්දර්ශන දාලා අරක තිබෙනවා, මේක තිබෙනවා කියනවා. මෙන්න, හොරා පොලිස් වැඩ මේවා. වාහනයේ නොම්මරයත් එක්කම මම කිව්වා.

ඔබතුමන්ලා කටින් වැඩ කරන්න හරි දක්ෂයි. මහ පොළොවේ කෙසේ වෙතත්, ප්‍රායෝගිකව කෙසේ වෙතත් කටින් වැඩ කරන්න හරි දක්ෂයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මම අවසන් කරනවා.

ඔබතුමන්ලා මත් ද්‍රව්‍ය අල්ලනවා කියලා සන්දර්ශනයක් දමනවා නේ. හැබැයි, ඒ මත් ද්‍රව්‍ය පුච්චනවා පෙන්වන්නේ නැහැ නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. එතකොට මිනිස්සුන්ට සැකයක් එනවා, මේවා දුඹුරු සීනි ද, පාන් පිටි ද කියලා. මොකද,

ඔය අල්ලන ඇල්ලිල්ලේ හැටියට දැන් මත් කුඩු හිත වෙලා, කුඩු ගහන්න බැරිව "සික්" ගහපු එවුන් ඉන්න එපැයි. අපි යනකොට කිසි තැනක "සික්" ගහපු කට්ටිය දකින්න නැහැ නේ. ඒ නිසා මේ සන්දර්ශන මාෆියාව නවත්වලා, වැඩේ හරියට කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද උදේ මම විනාඩියක කාලයක් ඉල්ලුවා. ඒ වෙන කාරණයකට නොවෙයි. බුද්ධාගම වෙනුවෙන් මේ රටේ ඇමති කෙනෙක් මේ ආණ්ඩුවේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වැනි ව්‍යවස්ථාවෙන් බුද්ධාගම ආරක්ෂා කරන්න පහසුකම් සලසා තිබෙනවා. නමුත් බුද්ධාගමට ඇමති කෙනෙක් නැහැ. මුස්ලිම් අමාත්‍යවරයෙක් ඉන්නවා, එතුමා මොනවා කරනවාද කියලා අපි දන්නේ නැහැ. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා වන ගමගෙදර දිසානායක මැතිතුමා, ඇමතිවරයා ලෙස දිවුරුම් දීලාත් නැහැ.

ඊයේ රාත්‍රියේ ත්‍රිකුණාමලය විහාරස්ථානයක බුදු පිළිමයක් ඉවත් කිරීම සම්බන්ධයෙන් ඇති වූ ප්‍රශ්නය ගැන කථා කරන්න විනාඩි දෙකක් දෙන්න කියලායි මම කථානායකතුමාගෙන් ඉල්ලුවේ. හේතුව, මෙය 1951 සිට තිබෙන විහාරස්ථානයක්. එය 2004 සුනාමිය අවස්ථාවේ විනාශ වුණා. ඉන් පස්සේ ඒකට අලුත් ධර්ම ශාලාවක් හදන්න වැඩ කටයුතු ටික ලෑස්ති කළා. ඊයේ උදේ ඊට අදාළ මුල්ගල තියලා වැඩ පටන් අරගෙන ධර්ම ශාලාව හදලා හවස බුදු පිළිමය තැන්පත් කළා. ඊට පස්සේ මොකක්ද වුණේ? පොලීසියෙන් ඇවිල්ලා හාමුදුරුවන්ට පහර දීලා තිබෙනවා. බුදු පිළිමය ආරක්ෂා කරලා තිබුණු මුතු කුඩය දෙකට කඩලා හාමුදුරුවන්ට පහර දෙන්නේ. මේවායින් අපට රිදෙන්නේ නැද්ද? ඉතිහාසයේ කවදාකවත් අපි ජාතිවාදී ලෙස හැසිරිලා නැහැ. සිංහල බෞද්ධයෝ, සිංහල බෞද්ධයෝ විධියට ඉන්න ඕනෑ. දමිළ ජනතාවටත් ඒ අයගේ අයිතිය තිබෙන්න ඕනෑ. මුස්ලිම් ජනතාවටත් ඒ අයගේ අයිතිය තිබෙන්න ඕනෑ. මේක අලුතින් බුදු පිළිමයක් හදන එකක්වත්, අලුත් වැඩක් කරන්න හදන එකක්වත් නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේ සම්බන්ධව පොලීසියට පැමිණිල්ලක් ආවා නම්, හාමුදුරුවන් කැඳවලා ඒක විභාග කළා නම් ඉවරයි. එහෙම නැතිව මොකක්ද මේ කරන්නේ? කාගෙන් හරි call එකක් එනවා ඇමතිට, ඇමති ඒකට කථා කරනවා මෙහෙම කරන්න කියලා. ඊට පස්සේ අපේ හාමුදුරුවන්ට පහර දීලා බුදු පිළිමය ඔසවාගෙන යනවා. උදේ ඇවිල්ලා මහජන ආරක්ෂක ඇමති කිව්වා, දවල් වනකොට බුදු පිළිමය වඩම්මවනවා කියලා. ඩම්මවන්න දෙයක් නැහැ. මේ විහාරස්ථානයේ තිබුණු බුදු පිළිමය තමයි ඔසවාගෙන යන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේක මෙතැනින් නතර වන එකක් නොවෙයි. මේ එකක් නොවෙයි. ගිය සතියට එපිට සතියේ ගල්කිස්ස - දෙහිවල මහ නගර සභා පරිශ්‍රයේ ස්ථාපිතකොට තිබූ බුදු පිළිමය ඉවත් කර තිබුණා. මේ වාගේ හැම තැනකම මේක සිද්ධ වනවා. ඒ නිසා කරුණාකරලා මේ රටේ බෞද්ධාගම රකින්න වැඩ පිළිවෙළක් සකස් කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, දැන් විනාඩි 3ක් ගත වුණා. අවසන් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමියත් බෞද්ධ කාන්තාවක් නිසා මම මේ අවස්ථාවේ ඔබතුමියගෙන් කරුණාවෙන් ඉල්ලීමක් කරනවා. මේ විධියට ගියොත් හෙට අනිද්දා වනකොට මහමෙව්නාවේ තිබෙන සමාධි බුදු පිළිමයත් ඔසවාගෙන යයි, ප්‍රශ්නයක් වෙයි කියලා. ඒ නිසා ආණ්ඩුවෙන් මේ පිළිබඳව නිවැරදි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියා අපි නැවත වාරයක් ඉල්ලනවා.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මේ වාගේ දේවල් එතුමන්ලාට කියලා දෙන්න බැහැ. මන්ත්‍රීවරයෙකුට පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඕනෑ දෙයක් කියන්න පුළුවන් කියලා මේ වාගේ අපහාස කරන්න පුළුවන්ද? *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මොකක්ද ඔබතුමියගේ point of Order එක? *[බාධා කිරීම්]*

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මේ වාගේ අපහාස කරන්න පුළුවන්ද? [බාධා කිරීම්] නැහැ, නැහැ. දෙහිවල - [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි, - *[බාධා කිරීම් ]* ගරු මන්ත්‍රීවරුන් මේක විවාදයක් කර ගන්න එපා. *[බාධා කිරීම් ]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමිය point of Order එකක් කියලා එහෙම ඉඩ දෙන එක ඇත්තටම වැරදියි. Point of Order එකකට ඉඩ දුන්නේ කොහොමද? ඔබතුමිය DCC. *[බාධා කිරීම් ]* ඔබතුමිය කොහොමද එතුමියට point of Order එකකට ඉඩ දුන්නේ? *[බාධා කිරීම් ]* එතුමිය බිමල් රත්නායක ඇමතිතුමාගේ භාර්යාව නිසා ද, point of Order එකකට ඉඩ දුන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් ලැබෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

බිමල් රත්නායක ඇමතිතුමාගේ භාර්යාව නිසා ද point of Order එකක් ලබා දුන්නේ? සභානායකගේ නෝනාට එහෙම වෙලාව දෙන්න පුළුවන්ද? *[බාධා කිරීම් ]*

එහෙම දෙන්න බැහැ. මේ, පාර්ලිමේන්තුව. ඔබතුමිය ඉස්සෙල්ලාම අනෙක් මන්ත්‍රීවරු පාලනය කරලා, මට සභාව නිශ්ශබ්ද කරලා දෙන්න. මගේ කථාව පටන් ගන්න කලින් ඔබතුමිය සභාව නිශ්ශබ්ද කරලා දෙන්න.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ඉස්සෙල්ලා point of Order එක කියලා ඉන්න.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

ඉල්ලීමක් කරනවා, නිවැරදි කිරීමකට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ඉස්සෙල්ලා point of Order එක කියලා ඉන්න, ගරු මන්ත්‍රීතුමිය. *[බාධා කිරීම්]*

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

ඔබතුමියගෙන් මම ඉල්ලීමක් කරනවා, නිවැරදි කිරීමක් කරන්න. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

Point of Order එක කියලා ඉන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Point of Order එක මොකක්ද කියලා අහන්න.*[බාධා කිරීම්]*

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

සාවද්‍ය කරුණක් කිව්වා. *[බාධා කිරීම්]* නොමඟ යවන්න දෙන්න බැහැ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න. ඔබතුමට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මට කථාව කරන්න ඔබතුමිය සභාව පාලනය කරලා දෙන්න. මට කථා කරන්න බැහැ. *[බාධා කිරීම්]* සභාව පාලනය කරලා දෙන්න. ඔබතුමියගේ අතින් වැරැද්දක් සිදු වුණා කියලා ඔබතුමිය පිළිඅරගෙන සභාව පාලනය කරලා දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වන්න. *[බාධා කිරීම්]* ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මට ඇහෙන්නේ නැහැ. Deputy Chairperson, මට ඇහෙන්නේ නැහැ. *[බාධා කිරීම්]* සභාව පාලනය කරලා දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ඒ කාරණය විවාදයකට ගෙන යන්න එපා. ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා කථා කරන්න.*[බාධා කිරීම්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මට ඇහෙන්නේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමිය ඉල්ලීමක් කළේ යම් පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ඔබතුමිය සභාව පාලනය කරලා දෙන්න. *[බාධා කිරීම්]* ඔබතුමිය කොහොමද, මොන පදනම යටතේද එතුමියට අවස්ථාව දුන්නේ? මොන ස්ථාවර නියෝගය යටතේද අවස්ථාව දුන්නේ

කියලා කියන්න. නැත්නම් මේ මන්ත්‍රීවරුන්ටත් අවස්ථාව දෙන්න. සභාව පාලනය කරලා දෙන්න. මට ඇහෙන්නේ නැහැ. *[බාධා කිරීම්]* මට කිසි දෙයක් ඇහෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
එතුමිය යම් පැහැදිලි කිරීමක් කළේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඔබතුමිය සභාව පාලනය කරලා දෙන්න. නැත්නම් මට කථා කරන්න අමාරුයි. මට අද වැදගත් කාරණා කිහිපයක් කථා කරන්න තිබෙනවා. සභාව පාලනය කරලා දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
අද දින ශීර්ෂයට අදාළ කරුණක් නොවෙයි, එතුමිය යම් පැහැදිලි කිරීමක් කරන්නයි අවස්ථාව ඉල්ලුවේ. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එහෙම පැහැදිලි කරන්නේ කොහොමද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාගේ කාලය පටන් ගත්තා. *[බාධා කිරීම්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට කථා කරන්න කරුණාකරලා සභාව පාලනය කරලා දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කරුණාකරලා ගරු මන්ත්‍රීවරුන් නිහඬ වෙන්න. ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාගේ වෙලාව ආරම්භ වෙලා තිබෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමිය මෙතුමන්ලා පොඩ්ඩක් පාලනය කරලා දෙන්න. නැත්නම් මට කථාව කරන්න බැහැ. *[බාධා කිරීම්]* මට ඇහෙන්නේ නැහැ නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා කථා කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම කොහොමද කථා කරන්නේ? *[බාධා කිරීම්]* ඒක මූලසුනේ වැඩක් නේ. මට එහෙම කථා කරන්න බැහැ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා. කාලය කළමනාකරණය කරන්න ඕනෑ. ඔබතුමාට තත්පර 15ක් දෙන්නම්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එතුමියට අවස්ථාව දීපු එක නොවෙයි, අපේ ප්‍රශ්නය. මම ස්ථාවර නියෝගයත් කියන්නම්. ස්ථාවර නියෝගය 92(2)(ආ). ආණ්ඩු පක්ෂයට එහෙම අවස්ථාව දීලා ඔබතුමිය වැරැද්දක් කරන්න එපා. ඔබතුමියගේ නමට හොඳ නැහැ.

Thank you.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.04]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙය අපේ පක්ෂයට ඉතා වැදගත් විවාදයක්. සභාවේ බාධා කරනකොට මට කථා කරන්න බැහැ. මම පාපිස්සක්වත්, පොල් ලෙල්ලක්වත් නොවෙයි. මම දිස්ත්‍රික්කය දිනලා ආවේ. මට කථා කරන්න අයිතියක් තිබෙනවා. දැන් වෙලාව පස් වරු 2.04යි. මගේ වෙලාව පටන් ගන්නේ දැන්. මෙතැන් සිට මට වෙන් කළ වෙලාව දෙන්න.

Madam, today, at the Committee Stage Discussion, the allocation of funds for a couple of very important Ministries is being discussed.

First of all, I would like to touch upon the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism, of which both the Hon. Minister and the Deputy Minister are present in the Chamber. Hon. Minister, improvement of the tourism sector in the Northern and the Eastern Provinces is not going to happen with any allocations you make through the Tourism Development Authority or by building a small park in the North or a small garden in the East. That is not how you could develop tourism in the North and the East. The only way to develop the tourism sector in the North and the East, which could also contribute to this country's economy, is through developing connectivity to the North and the East. Now, a year had passed under this NPP Government and one such avenue of improving connectivity to those provinces, the KKS Harbour, has been delayed. Now, we are beginning to hear the good news that the KKS Harbour will finally be commissioned for development this year. So, we are happy and we thank you for that.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

At the same time, we would like to urge you to look into developing the Palaly International Airport. We recently concluded a tour in the Palaly International Airport and the Civil Aviation Authority told us that the surface of the runway built in 1948 needs to be re-laid for an A-320 aircraft to land. That is not a major development that you need to do, Hon. Minister. So, if you are really interested in developing the tourism sector in the North, please look into improving connectivity. I know that ports and aviation is not under your Ministry, but still, as Minister of Tourism, I would like to encourage you to look into that as well.

At the same time, there are some allocations made in this Budget to develop the Hingurakgoda Domestic Airport. Along with that, the Batticaloa International Airport is also there and it could also function. If you all are unable to intervene, please give us, the Tamil parties and the Tamil Members of Parliament, that responsibility. We will help you improve connectivity to the North and the East. So is the Talaimannar-Rameswaran ferry. To build the pier, there are investors who are ready to spend money. So, without talking about the various projects you are planning to undertake to develop the tourism sector there, please look into the connectivity aspect.

Then, moving on to the Foreign Employment Bureau, I would like to thank my Friend, the Hon. Arun Hemachandra. There is a new scheme that has been launched to give migrant workers airline tickets on a concessionary basis. That is a move that we welcome. At the same time, Hon. Deputy Minister, I would like to urge you to look into the Foreign Employment Bureau's activities. Some men and women who fly to the Middle-Eastern countries without proper visas or on tourist visas are arrested there and their lives get destroyed. Many of them are languishing in prisons there. So, I would like you to look into that as well.

There is one more thing. I know that you boast about the number of tourist arrivals into this country, but whether we really get the estimated revenue from them is a big question because most of the tourists that we see today are not ones who spend over US Dollars 150 per day, as your Ministry has put out. So, please look into that. Both the Hon. Minister and the Hon. Deputy Minister have a huge responsibility because the Foreign Employment Bureau and the Ministry of Tourism are two main streams for foreign exchange earnings into this country. So, you have a big responsibility in your hands and I would like to wish you all the best!

Then, moving onto foreign affairs, it is very unfortunate that the Minister-in-charge has gone to Geneva and suggested to the Office of the UN High Commissioner for Human Rights that a domestic mechanism will be used to address the accountability issues in this country. Hon. Minister, you are very well aware that the victim community has rejected any domestic mechanism. I do not know whom you are planning to engage with on implementing your domestic mechanism or whether you are even aware what your domestic mechanism is.

The previous governments spoke about a Truth and Reconciliation Commission. We rejected that as well because there was no international participation, no accountability or a judicial mechanism. So, I do not know whether you even know what your own domestic mechanism is, but you keep on saying that the NPP Government's stance is a domestic mechanism. The reason you give for that is, there would be a divide among the communities, if there would be international involvement. In that regard, I would say that both this Ministry and the Ministry of Justice and National Integration are connected. We have also rejected the Office on Missing Persons and the Office for Reparations under the Ministry of Justice and National Integration. I heard the Hon. (Dr.) Harsha de Silva saying something that I said with regard to the Office for Reparation. Out of the five members the President had endorsed for the Office for Reparations, three have a military background. I do not have a personal issue with the persons who have been nominated to that. On principle, how can you have an Office for Reparations looking into paying war victims' reparation or compensation when three of its members were involved with the military? That is unacceptable!

Along with that, Madam, there is another important matter I would like to raise.

நேற்று மதியம் திருகோணமலையிலே நடந்த துரதிருஷ்டவசமான சம்பவமொன்றைக் கண்கூடாகப் பார்க்கக்கூடியதாக இருந்தது. திருகோணமலைக் கடற்கரைக்கு அருகில் சட்டவிரோதமாக ஒரு விகாரை புதிதாக உருவெடுத்தது. இன்று எனக்கு முன்பு பேசிய கௌரவ தயாசிறி ஜயசேகர அவர்களுக்கு நான் எச்சரிக்கை விடுக்கிறேன், நீங்கள் அரசியல் செய்வதற்காகத் தயவுசெய்து சட்ட விரோதமான செயற்பாடுகளை அனுதிக்கக் கூடாது. கௌரவ எதிர்க்கட்சித் தலைவர் அவர்களும் அரசியலமைப்பிலே பௌத்த மதத்துக்கு முதன்மை ஸ்தானம் வழங்கப்பட்டிருப்பதைச் சுட்டிக்காட்டி அதற்கு ஆதரவாகப் பேசியிருந்தார். பௌத்த மதத்தினதோ அல்லது வேறு எந்த மதத்தினதோ சட்ட விரோதமான செயற்பாடுகளுக்கு அனுமதியளிக்கக் கூடாது. அது நானாக இருந்தாலும் சரி! பௌத்த மதத் துறவியாக இருந்தாலும் சரி! யாராக இருந்தாலும் சரி!

மஹிந்த ராஜபக்ஷ அரசாங்கக் காலத்திலும் கோட்டாபய காலத்திலும் இவ்வாறான சட்ட விரோதமான செயற்பாடுகள் நடந்தன. இந்த அரசாங்கக் காலத்தில் அவ்வாறு நடக்காதென நாங்கள் எதிர்பார்த்தோம். ஆனால், இன்றும் சில இனவாதத் துறவிகள் ஏதேதோ வேலைகளைச் செய்கிறார்கள். நான் அறிந்த வகையில், அந்த விடயம் சம்பந்தமாக திருகோணமலை மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் நண்பர் அருண் ஹேமசந்திரா அவர்களும் கரிசனையோடு செயற்பட்டதை நான் இந்த இடத்திலே சொல்ல வேண்டும்.

இதுபற்றி அந்த இடத்திலே இருந்த கரையோரப் பாதுகாப்புப் பிரிவைச் சேர்ந்தவர்கள் பொலிஸ் நிலையத்தில் முறைப்பாடு செய்தார்கள். அந்த முறைப்பாட்டுக்கிணங்க பொலிஸார் விசாரணை செய்து, அது சட்ட விரோதமானது என்று அதை நிறுத்துவார்கள் என்ற நம்பிக்கையில் நாங்களும் இருந்தோம். ஆனால், இரவு 8 மணியளவில் எங்கேயோ இருந்து ஒரு சிலையைக் கொண்டுவந்து பொலிஸ் பாதுகாப்புடன் அங்கே வைத்த பிற்பாடு, நான் கௌரவ அமைச்சர் ஆனந்த விஜேபால அவர்களை தொலைபேசியில்

தொடர்புகொண்டு, "இது ஓர் இனவாதமான செயற்பாடு; எதிர்காலத்தில் மதங்களுக்கு, இனங்களுக்கு இடையில் முரண்பாட்டைத் தோற்றுவிக்கும் விடயம்; இதிலே நீங்கள் கவனம் செலுத்த வேண்டும்" எனச் சொன்னேன்.

இரவு 10-11 மணியளவில் சட்டவிரோதமாக அமைக்கப்பட்ட விகாரைக்குள் இருந்த அந்தச் சிலையை அகற்றிச் சென்றார்கள். உண்மையில் நான் கௌரவ அமைச்சர் அவர்களுடைய செயற்பாட்டை - தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் செயற்பாட்டை - வரவேற்றிருந்தேன். ஆனால், இன்று காலையிலே கௌரவ அமைச்சர் அவர்களும் இனவாதிகளுடைய கருத்துகளுக்குப் பயந்து, "அந்தச் சிலையைப் பாதுகாப்பதற்காகத்தான் - சிலைக்குப் பாதுகாப்பு இல்லாதபடியினால்தான் - வெளியே எடுத்துச் சென்றோம். சிலையை வைத்தது பிழை இல்லை" என்று சொன்னார். அந்தக் காணொளிகளைப் பார்த்தால், சிலையைப் பாதுகாப்பதற்காக எடுத்துச் செல்லப்பட்டதாகத் தெரியவில்லை; அது அகற்றப்பட்டதுதான்! ஆனால், "சிலைக்குப் பாதுகாப்பில்லாதபடியால்தான் நாங்கள் அதனை அகற்றினோம்" என்று சொன்னார். கௌரவ அமைச்சர் அவர்கள் சபையில் இல்லை. கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இருக்கின்றார். அமைச்சர் அவர்களுடைய அந்தக் கருத்தை நான் வன்மையாகக் கண்டிக்கிறேன்.

முப்பது வருடங்கள் யுத்தம் நடைபெற்ற காலப்பகுதியிலும்கூட வடக்கு, கிழக்கிலே பௌத்த மதத்தோடு சம்பந்தப்பட்ட எந்தவொரு சின்னமும் விடுதலைப் புலிகளால்கூட அழிக்கப்படவில்லை. தமிழ் மக்கள் இரவோடு இரவாகப் போய்ச் சிலைகளை உடைக்கின்ற மக்கள் அல்ல! எக்காரணத்தைக்கொண்டும் - இன்னுமொரு மதத்தினுடைய அடையாளங்கள் சட்டவிரோதமாக வைக்கப்படுகின்றபோது எதிர்த்தாலும்கூட - வன்முறையில் ஈடுபட்டு ஒரு சிலையை உடைக்கின்ற அளவுக்குக் கேவலமான இனம் தமிழ் இனம் அல்ல! சில இனத்தவர் சைவ சமயத்தவர் வழிபாடு செய்த ஆலயங்களை இடித்திருக்கின்றார்கள்; கிறிஸ்தவ தேவாலயங்களை இடித்திருக்கின்றார்கள். நாங்கள் அவ்வாறான விடயங்களைச் செய்யவில்லை. ஏன், இராணுவம்கூட வட மாகாகணத்தில், மயிலிட்டி, பலாலிப் பிரதேசங்களில் தமது கட்டுப்பாட்டுக்குள் இருந்த இடங்களில் அமைந்திருந்த கத்தோலிக்கத் தேவாலயங்களை இடித்திருக்கின்றது. நாங்கள் அவ்வாறு செய்பவர்கள் அல்லர்! ஆனால், இந்த விடயம் முழுக்க முழுக்கச் சட்டவிரோமானதொரு செயற்பாடு!

உண்மையிலேயே தோழர் அருண் ஹேமச்சந்திரா அவர்களே, நீங்கள் உங்களுடைய பதவியைத் துறந்துவிட்டு எங்களுடைய கட்சியில் வந்து சேருங்கள்! ஏனென்னால், இது உங்களுக்குப் பொருத்தமில்லாத கட்சி! நானும் கடந்த காலங்களில் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியில் ஓர் அமைப்பாளராக இருந்தேன். அந்தக் கட்சியுடைய இனவாதமான செயற்பாடுகளும் இவ்வாறுதான் இருந்தது. நீங்கள் தற்பொழுது இருக்கின்ற இந்தக் கட்சியும்கூட முழுக்க முழுக்க அவ்வாறுதான் செயற்படுகிறது. எனக்குத் தெரியும், நீங்கள் திருகோணமலை மாவட்டத்தில் அதிகூடிய தமிழ் மக்களின் வாக்குகளினால் தெரிவுசெய்யப்பட்டு வந்தவர்; உங்களுடைய சங்கடம் எனக்கு விளங்குகின்றது. எங்களுடைய வடக்கு, கிழக்கைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பல தோழர்கள்கூட - நான் பெயர் குறிப்பிட விரும்பவில்லை - இந்த விடயத்தில் எங்களுடன் இணங்குவார்கள். சகோதரர் இளங்குமரன் இருக்கின்றார், றஜீவன் இருக்கின்றார், திலகநாதன் இருக்கின்றார், கலைச் செல்வி அக்காகூட இருக்கின்றார். நீங்கள் உங்களுடைய மனசாட்சிப்படி ஏற்றுக்கொள்கின்றீர்களா, தேசிய மக்கள் சக்தி செய்த இந்த விடயம் சரியானதென்று? பிழையான விடயம் பிழையானது! துரதிருஷ்டவசமாக -

Madam, it was a very unfortunate incident and the Hon. Minister did the right thing. A group of illegal encroachers came there all of a sudden and there has been an illegal construction made. If there is some legal basis to this temple, why do they have to come on a Sunday? They could have come on a Monday or on a Tuesday and constructed the Temple.

විපක්ෂ නායකතුමා ඇතුළු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාටත් මම කිව්වා, නීති විරෝධී දේවල්වලට දේශපාලනය නිසා අත දාන්න යන්න එපා කියලා. වැරදි නම් වැරදියි කියන්න. මේක නීත්‍යානුකූලව හදන පන්සලක් නම්, ඒකට අවශ්‍ය documents ටික ඔක්කෝම තිබෙනවා නම් ගිහිල්ලා ප්‍රාදේශීය ලේකම් හම්බ වෙලා අහන්න. ඉරිදා වාගේ නිවාඩු දවසක උදේ ඇවිල්ලා මුල් ගල් තියලා, රෑ වෙනකොට පන්සල හදලා, රෑ 9.30 වෙනකොට පිළිමයක් වඩම්මනවා කියන කාරණයෙන්ම තේරෙන්නේ නැද්ද, මේකේ යම් කාරණයක් තිබෙනවා කියලා? මට නම් හිතෙන්නේ නොවැම්බර් 21 රැස්වීමට පෙර සූදානමට තමයි මේ දේ කළේ. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. නොවැම්බර් 21 රැස්වීමට සෙනඟ ගෙනෙන්න ඕනෑ නම් වෙන කාරණා පටන් ගන්න. මේ රටේ ජාතිවාදය වපුරන්න එපා, නීති විරෝධී දේවල් කරලා. ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා හරි දේ කරලාත් ජාතිවාදී කණ්ඩායමේ ඡන්ද පදනම නිසා පොඩ්ඩක් පසු බැස්සාද කියන සැකය තිබෙනවා. ඒ ගැන මම කනගාටු වෙනවා.

I am concerned that the Hon. Minister succumbed to the pressures of the chauvinists in this country. Had S.W.R.D. Bandaranaike not torn apart the Bandaranaike-Chelvanayakam Pact, we would not have faced a 30-year war. But, remember what happened to him as well. He was shot by a monk. So, to this Government also, I say, do not succumb to pressures from those chauvinist and nationalist people. There are also minorities in this country. People defeated those chauvinists and gave you the mandate to do the right thing.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, நாளைய தினம் நாங்களும் இந்த விடயம் சம்பந்தமாக ஆயிரக்கணக்கான மக்களைத் திருகோணமலைக்குக் கொண்டுவந்து, இந்த நாட்டின் அமைதியைக் குழப்பும் வகையில் ஒரு பாரிய போராட்டத்தை முன்னெடுக்கலாம். ஆனால், எங்களுடைய கட்சி பொறுப்புள்ள ஒரு கட்சி! பொறுப்புள்ள ஒரு கட்சியாக இருந்துகொண்டு இந்த நாட்டிலே மீண்டும் போராட்டத்தைச் செய்தால், ராஜபக்ஷ கோஷ்டியினர் இன்னுமொரு போராட்டத்தைச் செய்வார்கள். இவ்வாறு இரண்டு தரப்பினரும் அடிபட்டு, நாடு இன்னும் மோசமான நிலைக்குப் போகும்! நாங்கள் தொடர்ச்சியாகச் சொல்லிவருகின்ற ஒரு விடயம், தேசிய மக்கள் சக்தியில் இருக்கின்ற குறைகளைச் சொல்வது தேசிய மக்கள் சக்தியை சரியான வழிக்குக் கொண்டுவருவதற்குத்தான் என்பது. நண்பர் திலித் ஜயவீர அவர்களும் சபைக்கு வந்திருக்கிறார். The Hon. Dilith Jayaweera is here. I am sure he also would fuel this tension over that viharaya. He is listed to speak after me. This is a good opportunity for them and the Hon. Dilith Jayaweera would use that to fuel tension, to say that the NPP Government is destroying the Buddhist culture; he will do that. Wait and see! His speech is right after mine.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
You are giving me ideas.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am urging you, Hon. Dilith Jayaweera, please refrain from doing such things in the interest of the country. That is what I would like to urge you to do.

Then, I would like to refer to the Easter Sunday attacks also. The Easter Sunday attacks are, again, an accountability issue. The Cardinal himself, a few years after the Easter Sunday attacks, came out and said that he has no faith in a domestic mechanism. He said that. The Cardinal, not recently, but a few years after the Easter Sunday attacks happened, came out and said that he has no faith in a domestic mechanism. And, the President's comments the other day about investigations into the Easter Sunday attacks being a little difficult because the State has to investigate the State justify the Cardinal's position. So, now, the Cardinal, a few years after the Easter Sunday attacks, has asked for an international investigation.

Also, our party - we are the largest party which represents the victim community - for 16 years since 2009 and it will be 17 years in a few months, have been raising about this domestic mechanism. When do you think our people would finally get to know the truth? You all have no reason to protect the Rajapaksas. Why are you all worried? Were you all part of the group who committed or accused of committing those crimes? No.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Yes, they were.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Yes, they were very much part of it.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sorry, the Hon. Gajan Ponnambalam is here and he is correcting me that they were part of it, but the command responsibility would directly lie with the Rajapaksas. That is what I would say. The then President and the Head of the Armed Forces was Mahinda Rajapaksa and the Acting Defence Minister was Maithripala Sirisena. They are the ones who should be worried. Why are you all worried? You are trying to protect the State. Why are you trying to protect the State? It is because that is a significant vote bank. If you put together the number of military personnel in this country - I will speak on that tomorrow as well - they would be about 300,000 to 400,000, and if you multiply that by three, four or even by five at times, it would come to about 1.5 million votes! You all are worried that you would lose those votes. Are you here to do the right thing or just to keep winning elections?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Let me check. මට තව විනාඩියක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
නැහැ. දැන් වෙලාව 2.21යි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
2.04ට මම පටන් ගත්තේ. ඔබතුමිය කීයට පටන් ගත්තාද මම දන්නේ නැහැ. මට කථා කරන්න වෙලාව දුන්නේ 2.04ට, තවම 2.21යි වෙලාව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
2.04ට පටන් ගත්තා. දැන් විනාඩි 17ක් ගතවෙලා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
හරි, ඒකට කාලය නාස්ති කරන්න ඕනෑ නැහැ. මම තව විනාඩියෙන් අවසන් කරන්නම්.

මේ අවස්ථාවේ ගරු විජිත හේරත් ඇමතිතුමා තමයි කැබිනට් ඇමතිවරයකු හැටියට ඉදිරි පේළියේ ඉන්නේ. ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් දුන්නු පොරොන්දු ඉෂ්ට කරන්න කියලා පමණයි අපි ඉල්ලන්නේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳව ගරු ඇමතිතුමා එක්ක මම කථා කළා. එතුමා කිව්වා ඒ ගැන කමිටුවක් පත් කරලා, ඒ කමිටු වාර්තාව ලැබිලා තිබෙනවා කියලා. මම ඉල්ලා සිටිනවා ඒ කමිටු වාර්තාව ප්‍රසිද්ධ කරන්න, අපටත් ඒ කමිටු වාර්තාව දෙන්න කියලා, මොකක්ද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම ගැන කියලා තිබෙන්නේ කියලා දැනගන්න. Online Safety Act එක පිළිබඳව ඔබතුමන්ලාගේ ස්ථාවරය අපි තවම දන්නේ නැහැ. වගවීම පිළිබඳව ඔබතුමන්ලා ජාත්‍යන්තරයට පොරොන්දු දීලා තිබෙනවා. හැබැයි ඔබතුමන්ලා, ඔබතුමන්ලාගේ plan එක මොකක්ද කියලා දන්නවාද මම දන්නේ නැහැ. වගවීම පිළිබඳව ඔබතුමන්ලාගේ ස්ථාවරය ඔබතුමන්ලා දන්නවාද කියලා මම දන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මට අපේ පක්ෂයේ මන්ත්‍රීතුමාගෙන් තව විනාඩියක් දෙන්න. පාස්කු ප්‍රහාරය පිළිබඳව ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ගයේ ප්‍රගතිය පිළිබඳව අපට සතුටක් නැහැ. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම පිළිබඳව තවම අපට හරි වචනයක් නැහැ. පළාත් සභා මැතිවරණය පිළිබඳව කිව්වා. තවම ඒක

පිළිබඳවත් තීරණයක් නැහැ. වගවීම, ආණ්ඩුකරණය පිළිබඳව ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන කාරණා පිළිබඳව තමයි අපි ඔබතුමන්ලාගෙන් කරුණු ඉල්ලන්නේ. එහෙම නැතිව අපි අලුතින් කාරණා මවලා නැහැ. මේ වැදගත් විවාදයේදී කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ස්තුතියි. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි,-[බාධා කිරීම්] ස්ථාවර නියෝග 91(ඊ) -[බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
විනාඩියක් ගන්න, ගරු සුනිල් වටගල ඇමතිතුමා. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අහගන්න, අහ ගන්න, මේ point of Order එක අහ ගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා, කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙතැනදී දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ත්‍රිකුණාමලයේ ඇති වූ සිද්ධිය ගැන ඉදිරිපත් කළ කාරණයම මන්ත්‍රීවරු ගණනාවක් ඉදිරිපත් කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පැහැදිලිවම අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරියකගේ උපදෙස් මතයි මම මේ කථා කරන්නේ. මම එතුමියගෙන් ඇහුවා මේ කාරණාව මොකක්ද කියලා. එතුමිය පැහැදිලිවම කිව්වා, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106 වගන්තිය යටතේ පොලීසිය මඟින් ගරු අධිකරණයට කරුණු වාර්තා කරලා තිබෙන්නේ කියලා. එතකොට, කරුණු වාර්තා කළ කාරණයක් ගැන අපි මේ සභාවේ වාද විවාද කරනවා. එහෙම කරන්න බැහැ. ඒක එකක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ කාරණය දැන් වෙනත් අන්තයකට යන්න යනවා. ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා හොඳ ප්‍රවේශයකට ආවා, මේක කොහොමද ව්‍යාප්ත කර ගන්නේ කියලා. මේ සිද්ධිය දැන් දෙහිවලටත් ආවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ දෙහිවල සිද්ධිය හරිම පැහැදිලියි. ඒක අපි බලයට එන්නත් කලින් වෙච්ච සිද්ධියක්. හැබැයි, ඒ බුදු පිළිමය අපි ආවාට පස්සේ වඩම්මලා තිබෙනවා. ඒක හොරා අරගෙන ගිහිල්ලා, හොරාම ආපහු ගෙනැවිත් තියලා තිබෙනවා. ඒක ජාතිවාදයට, ආගම්වාදයට පටලවා ගන්නේ කොහොමද කියලා බලනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඉතා නරක තැනකට මේ විවාදය යමින් තිබෙනවා. ඒ නිසා වහාම ඔබතුමිය මැදිහත් වෙලා මේක නතර කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අධිකරණයේ විනිශ්චයකට භාජන වී ඇතැයි කියන කාරණයක් "බී" වාර්තාවක් තිබෙන වෙලාවට අදාළ වෙන්නේ නැහැයි කියලා මේ පාර්ලිමේන්තුවේ අනන්ත වාරයක් කථානායකවරු විනිශ්චය කර තිබෙනවා. ඒ නිසා පවතින නඩු විභාගයක් ගැන කථා කිරීම "බී" වාර්තාවක් තිබුණාය කියන හුදු කාරණය මත සීමා කරන්න බැහැ. කොහොමටත් බෞද්ධ විරෝධිකම ඇඟේ තිබෙනකොට ඔය ප්‍රශ්න මතු වෙනවා. එච්චරයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.25]

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම හිතනවා මේ මොහොතේ සිට මගේ කාලය ආරම්භ වෙයි කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද විවාදයට අදාළ කරුණු දක්වන්න කලින් මම මුලින්ම මේ කාරණය කියන්න කැමැතියි. මේ රටේ ජනතාවටත්, මේ ගෞරවනීය සභාවටත් මම කියන්න ඕනෑ, පසුගිය 2024 වර්ෂයේ සිට මේ රටේ ජාතිවාදය, ආගම්වාදය උපයෝගි කරගෙන දේශපාලනය කිරීමේ දේශපාලනය අවසන් වෙලා තිබෙනවාය කියන එක. ඒ නිසා විපක්ෂයට ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා, පෞද්ගලික දේශපාලන වුවමනා එපාකම් ඉෂ්ට කරගන්න පටු ජාතිවාදී, ආගම්වාදී තැනට වැටෙන්න එපා කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද අධිකරණ අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂය විවාදයට ගන්නා මොහොතේ ඒ පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. නූතන, කාර්යක්ෂම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියක් අනාගත කාලයේ මේ රටට ගේන්න සහ ආර්ථික සහ සමාජයීය වශයෙන් කරන ආයෝජනයක් විධියට මේ අය වැය හරහා අධිකරණ අමාත්‍යාංශයට මේ මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් වන විවාදයේදී කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දීර්ඝ කාලයක

[ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා]

ඉතිහාසය පරීක්ෂා කර බලද්දී මේ රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට තිබිච්ච බාධා මොනවාද? මම විශ්වාස කරනවා, මේ අය වැය මෙන්න මේ තිබිච්ච බාධා, මේ තිබිච්ච ගැටලුසහගත තත්ත්ව තේරුම් අරගෙන අනාගතවාදී දැක්මකින් යුතුව ඉදිරිපත් කරන ලද අය වැයක් කියලා.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, බ්‍රිතාන්‍යයේ හිටපු අග්‍රාමාත්‍යවරයෙක් වන විලියම් ඊ. ග්ලැඩ්ස්ටන් මහත්මයා වරෙක කියනවා, "Justice delayed is justice denied" කියා. ඒ කියන්නේ, යුක්තිය ප්‍රමාද වීම යුක්තිය ඉටු නොවීමට සමානයි කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ යුක්තිය ප්‍රමාද වීම, යුක්තිය ඉටු නොවීම සම්බන්ධයෙන් සලකා බැලුවාම අපට දීර්ඝකාලීනව පැවැති ගැටලු තිබුණා. ඒ මොනවාද? අපේ අධිකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් යටිතල පහසුකම් සම්බන්ධ ප්‍රශ්න තිබුණා. මේ ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරපු වත්මන් ජාතික ජන බලවේගයේ රජය විසින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශාල වශයෙන් මුදල් වෙන් කර තිබෙනවා, මේ අය වැය මඟින්.

විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, අධිකරණ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 1,373ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, රත්නපුර, වැලිමඩ අධිකරණ සංකීර්ණ, වලපනේ මහෙස්ත්‍රාත් අධිකරණ සංකීර්ණය, ඒ වාගේම කඩුවෙල අධිකරණ සංකීර්ණය වාගේ අධිකරණ ඉදිකිරීම සඳහා, ඒවායේ තිබෙන අඩුපාඩුකම්, ඒවායේ තිබෙන අලුත්වැඩියා කටයුතු සඳහා මේ අය වැය මඟින් මුදල් වෙන් කිරීමට යෝජනා කර තිබෙනවා. ඒ වාගේම, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු අධිකරණ ඇමතිතුමාගේ කථාවේත් ප්‍රකාශ කළා, මේ කාර්යාවලියට තිබුණු ප්‍රධානම ගැටලුවක් තමයි කාර්ය මණ්ඩලය, සේවක හිඟකම කියලා. ඒ අනුව ඉදිරි වසරේදී අධිකරණය සඳහා 1,315කුත්, බන්ධනාගාර සඳහා 1,086කුත් වශයෙන් නව බඳවා ගැනීම් 2,871ක් සඳහා මේ වන විට අනුමැතිය ලැබී තිබෙනවා. ඒ හරහා අනාගතයේදී මේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමේ පියවර මේ රජය විසින් අරගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ වාගේම, ලෝකයේ දියුණු රටවලට සාපේක්ෂව අපේ අධිකරණ පද්ධතියට, අපේ යුක්තිය ඉටු කිරීමේ කාර්යාවලියට තාක්ෂණය මැදිහත් කරගන්නේ කොහොමද, නව තාක්ෂණය යොදා ගන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ වන විටත් මීගමුව අධිකරණ සංකීර්ණය මූලිකකොටගෙන අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීමේ මූලික වැඩසටහනක් - pilot programme- ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ අනුසාරව ඉදිරි කාලයේදී ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ නව තාක්ෂණය භාවිත කරමින් මේ රටේ ජනතාවට යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ක්‍රමවත් සහ කාර්යක්ෂම කරන්නේ කොහොමද කියා මේ රජය විසින් අවධානයට ලක් කර තිබෙනවා. මේ වන විටත් ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික උපකරණ 100ක් ලබා ගැනීම සඳහා අවසර ලබාගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම, අපි දන්නවා මේ ගත වුණු වසරක කාලය ඇතුළත 2025 අංක 7 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතින් ගෙනාපු සංශෝධනය හරහා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය හරහා සැකකරුවන්, සාක්ෂිකරුවන් ඇතුළු පාර්ශ්වවලින් විද්‍යුත් මාර්ගයෙන් සාක්ෂි ලබා ගැනීම සඳහා අවශ්‍ය වෙච්ච නෛතික සංශෝධන ගෙනාවා. ඒ වාගේම, සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ 167වන වගන්තියට සංශෝධන ගෙන ඒම සඳහා අදාළ යෝජනා නීතිපතිවරයා වෙත යොමු කර තිබෙනවා.

මේ යුක්තිය පසිඳලීමේ කාර්යාවලියට අවශ්‍ය නව නීති විශාල ප්‍රමාණයක් මේ ජාතික ජන බලවේගයේ රජය විසින් මේ වන විට මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරගෙන තිබෙනවා. තවත් යම් ප්‍රමාණයක් කෙටුම්පත් කරමින් තිබෙනවා. තවත් යම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් සාකච්ඡා වෙමින් පවතිනවා. මම උදාහරණ කිහිපයක් ප්‍රකාශ කරන්න කැමැතියි, මට ලැබී තිබෙන කාල වේලාව අනුව. 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත සම්මත කර තිබෙනවා. ඒ වාගේම, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් මහ මුහුදේදී අත් අඩංගුවට ගන්නා විදේශිකයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් අදාළ කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර තිබෙනවා. ඒ වාගේම, ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත දැනටමත් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරගෙන තිබෙනවා. ඒ වාගේම, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දියුණු බන්ධනාගාර පද්ධතියක් ඇති කිරීම සම්බන්ධයෙන් අපි මේ අය වැයේදී විශේෂයෙන් අවධානය යොමු කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කියද්දී බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියට ජීවමිතික දත්ත පද්ධතියක් ඒකාබද්ධ කිරීම සඳහා රුපියල් මිලියන 7.5ක මුදලක් වෙන් කරන්න යෝජනා කර තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ වාගේම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සහ බන්ධනාගාර නවීකරණය කිරීම සඳහා රුපියල් මිලියන 2,000ක් වෙන් කරලා තිබෙනවා. පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා ක්‍රියා මාර්ග ගනිමින් තිබෙනවා. Community-based correction centres හඳන්න අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා. ඒ වාගේම, ලෝකයේ අද භාවිත කරන ක්‍රමයක් වන නිවාස අඩස්සියේ - house arrest - තියලා, ඒ කියන්නේ රිමාන්ඩ් සිරකරුවෙකු බන්ධනාගාරයක් තුළට ගෙන යන්නේ නැතිව අදාළ කාලය තුළ රඳවා තබා ගන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් අවධානය යොමු කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

විශේෂයෙන් තවත් කරුණක් කියන්න ඕනෑ. මගේ ආසනය වන හෝමාගම ආසනය තුළ වටරැක බන්ධනාගාරය ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 100ක මුදලක් වෙන් කරලා තිබෙනවා. වටරැක බන්ධනාගාරය කියන්නේ විශේෂයෙන් තරුණ රැඳවියන් පුනරුත්ථාපනයට ලක් කරමින් කටයුතු කරන එළිමහන් බන්ධනාගාරයක්. මේ සියලු නව ප්‍රවේශ තුළින් මේ රටේ ජනතාවට නීතිය, යුක්තිය සමානව ඉෂ්ට වන රටක්, රාජ්‍යයක් ගොඩනැඟීම තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අපේක්ෂාව වන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.33]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විෂය භාර ගරු ඇමතිතුමාත් අද මේ ගරු සභාවේ ඉන්න නිසා මම ඇත්තටම විශේෂ අවධානයක් යොමු කරවන්න බලාපොරොත්තු වුණේ, සංචාරක ක්ෂේත්‍රය පිළිබඳවයි. නමුත්, මේ අවස්ථාවේ මතු වී ඇති තත්ත්වයට හේතුව සංවේදී කරුණක් වන නිසා අප ඒ ගැන රජයේ අවධානය යොමු කළ යුතුයි කියා මම හිතනවා. මා මිත්‍ර ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාත් ඒ කාරණය මතු කළා. ඇත්තම කිව්වොත්, සංචාරක ව්‍යාපාරය නොවෙයි, මොන ව්‍යාපාරයක් කරන්නත් මේ රටේ පැහැදිලි සාමයක්, අවබෝධයක්, එකමුතුකමක් ජනතාව අතර තිබෙන්නට ඕනෑ. ඊයේ ශ්‍රී සම්බුද්ධ ජයන්ති බෝධිරාජ විහාරය ආශ්‍රිතව මතු වුණු තත්ත්වය ගැන අපේ ෂාණක්කියන් මිතුරා කෙසේ පැවසුවද, එහි යථාර්ථය වන්නේ මේ රජය සහ මේ රජය කරවන අය බලයට එන්න කලින් දේශපාලන වේදිකාවේ නිර්මාණය කරන ලද තත්ත්වයයි.

පාර්ලිමේන්තුවේ ඉන්න සියලු ගරු මන්ත්‍රීවරු, විශේෂයෙන්ම විවිධ ජාති, ආගම් නියෝජනය කරන මන්ත්‍රීවරු බොහොම විවෘතව මේ රටේ සිංහල බෞද්ධ සභ්‍යත්වය සහ ඒ සභ්‍යත්වය හා බැඳුණු ගුණගරුකකම්වලට, වටිනාකම්වලට ගෞරවයක් දක්වන පුද්ගලයන්. මං හිතන්නේ, එහි කිසිම ගැටලුවක් නැහැ. ෂාණක්කියන් මන්ත්‍රීතුමා කොහොම කිව්වත්, සිංහල බෞද්ධ සභ්‍යත්වයක් තිබෙන මේ රටේ කුඩා කණ්ඩායම් - minorities - කියන එක තිබෙන්න විධියක් නැහැ. මොකද, අපේ සභ්‍යත්වයට දර්ශනය සපයන්නේ බුදු දහමින්. බුදු දහමේම කියලා තිබෙනවා, කෙනෙක් උපතින් වර්ගයකට අයිති වෙනවා කියා සලකන්නට එපා කියලා. එය, ශ්‍රේෂ්ඨ බුදු වදනක්. අපේ රට, ලෝකයේ අතළොස්සක් වන ශ්‍රේෂ්ඨ සභ්‍යත්වයකට අයිති රටක්. මේ රටේ තිබෙනවා මේ සභ්‍යත්වය හා බැඳුණු සංස්කෘතික ක්‍රියාදාමයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දැනට ඉන්න කැබිනට් අමාත්‍යවරයෙක් දේශපාලන වේදිකාවේ කිව්වා, පිළිම වන්දනාව කියන්නේ නිකම් අනවශ්‍ය වැඩක්, ඒක යල් පැන ගිය ගෝත්‍රික වැඩක් කියලා. මෙන්න මේ මතය ඔවුන් හදවතින්ම මූලධර්මයක් ලෙස දැන් විශ්වාස කරන නිසා තමයි ඇත්ත වශයෙන්ම මේ තත්ත්වය මතු වන්නේ. පිළිම වන්දනාව ගෝත්‍රික වැඩක් නම්, ශ්‍රී මහා බෝධිය කපා දමන්න ඕනෑ නම්, මේ වාගේ මතයක් ඇති කරපු පිරිසක් ආණ්ඩුවේ ඉන්න කොට, ආණ්ඩුවේ ඇමතිවරයෙකු කිව්වාම පන්සලට ගිහිල්ලා ආරාවුල විසඳන්න කියලා, ඒ ගිය පොලීසිය හාමුදුරුවන් වහන්සේලාට අල්ලාගෙන ගහනවා. අපේ කස්සප හාමුදුරුවන් වහන්සේට සිවුර ගලවලා ගැහුවේ. මම ජාතිවාදය නොවෙයි මේ කථා කරන්නේ. මොකද එහෙම ගහන්නේ? මම කියන්නේ නැහැ, ඇමතිවරයා ගහන්න කිව්වා කියලා. හැබැයි, ඇමතිවරයා ගහන්න කිව්වා කියලා ඒ අයට හිතෙනවා. මොකද, මේ ඇමතිවරුන් තුළ මේ රටේ මේ සභ්‍යත්වය, අපේ දර්ශනය වන බුද්ධදහම ආදිය ගැන මූලධර්මීය වශයෙන් ඇති චින්තනය ඒක.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

දළ දා මාළිගාවටත් බෝම්බ ගැහුවා නේ.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ඔව්, ඒක තමයි චින්තනය. මට ෂාණක්කියන් මන්ත්‍රීතුමාත් එක්ක ගැටලුවක් නැහැ. එතුමාගේ දේශපාලනය එතුමා කරනවා. එතුමාට කියන්න ඕනෑ දේවල් එතුමාගේ දෘෂ්ටි කෝණයෙන් කියනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අප විසඳා ගත යුතු ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ අවිහිංසාවාදී දහමක් වන, සැමට එක සේ ගරු කළ යුතු යැයි කියන, ජාතිවාදය මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන දහමක්, දර්ශනයක් සම්බන්ධයෙන් මේ විධියට කටයුතු කරන්නේ ඇයි? ඒ ගැන කියන කොට අබිං කැවා වාගේ දඟලන්නේ ඇයි? මේ රටේ ජාතිවාදයක් තිබෙනවා කියලා හැම තිස්සේම අතිශයෝක්තියෙන් උත්කර්ෂයට ගෙන එන්නේ වෙනත් කවුරුවත් නොවෙයි, මේ ආණ්ඩුව. මේ ආණ්ඩුව තමයි මේ රටේ නැති ජාතිවාදයක් තිබෙනවා කියලා හැම දාම, උදේ හවස බෙරිහන් දෙන්නේ. එතකොට මේ රටේ ඉන්න අහිංසක පොලිස් නිලධාරියා මොකක්ද හිතන්නේ?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

සභාවේ සිනා!

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ඔබතුමන්ලා සිනා වුණාට මම අද කියන්නම් ගරු ඇමතිවරුනි, මේ රටට අයිති වෙච්ච ඒ සභ්‍යත්වයේ පෝෂණය ඔබ විසින් අභියෝගයට ලක් කරන හැම මොහොතකම මේ රටේ මිනිස්සු කිසිම ජාති, ආගම් භේදයකින් තොරව ඔබට එරෙහිව නැඟී සිටිනවා කියලා. නුදුරු දිනයකදීම නැඟී සිටිනවා. ඒක මතක තබා ගන්න. හිතන්න එපා, මේ රටේ හාමුදුරුවන් වහන්සේලාට අල්ලාගෙන ගහලා ඔය වැඩේ කරන්න පුළුවන් කියලා. ඔබතුමන්ලා හිතනවා නම්, මේ රටේ පිළිම වන්දනාව ගෝත්‍රික වැඩක් කියලා, ඔබතුමන්ලා කාටද ඒ අපහාස කරන්නේ? එහෙම නම් මේ හින්දු භක්තිකයන්ටත් අපහාස කරනවා. හින්දු භක්තිකයනුත් කරන්නේ පිළිම වන්දනාව තමයි. කතෝලික භක්තිකයනුත් ඒක කරනවා. එතකොට ඒක ගෝත්‍රිකද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

එතකොට, නයි වන්දනාව?

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

නයි වන්දනාවත් එහෙම තමයි. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා හිනා වුණාට, ඒක අපේ ශ්‍රේෂ්ඨ බෞද්ධ දර්ශනයෙන් ආපු සංස්කෘතිකමය දායාදයක්. ඒක හින්දු ආගමේ පවා තිබෙනවා. ඔබ හිනා වෙන්නේ මේ හින්දු භක්තිකයන්ට. ඔබ හිනා වෙන්නේ මේ රටේ බෞද්ධයන්ට. ඇමතිතුමනි, ඔබතුමා හිනා වෙන්නේ අපේ සංස්කෘතියට කියලා මතක තබා ගන්න. ඔබට මේ සංස්කෘතිය වැඩක් නැති වුණාට මේ රටේ ඉන්න සියලු මිනිසුන්ට මේ රටේ සංස්කෘතිය අවශ්‍යයි. ඔවුන් සංස්කෘතියේ කොටස්කරුවන්. ඔවුන් සංස්කෘතිය මතයි ජීවත් වෙන්නේ. අන්න ඒක මතක තබා ගන්න. ඔබ ඔය විධියට දිගටම කටයුතු කරන්න. මේ සංස්කෘතියත් එක්ක හැප්පිලා ඔබට වෙන දේ බලන්න. ඒක, මම අද කිව්වා කියලා මතක තබා ගන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම කනගාටු වෙනවා. මේ කොහෙන් ආපු අදහසක්ද? අපිත් එක්ක එකට පන්ති 5ට ගිය, අපිත් එක්ක ගමෙන් ආපු කොල්ලෝ තමයි අද මේ කථා කරන්නේ. ඇමෙරිකාව එක්ක ගිවිසුමක් ගහලා, ඒ ගිවිසුම හොරෙන් ගහන්න පුළුවන් කියලා කියන්න පුළුවන් මිනිස්සු කොහෙන්ද ආවේ? ඇමෙරිකානු අධිරාජ්‍ය විරෝධය, ඉන්දියානු විරෝධය ඉස්සරහට දාලා අප පාරට ගෙනාවේ අපේ මේ මිත්‍රයෝ. *[බාධා කිරීමක්]* අර පන්ති 5න් ආර්ථික පන්තිය අද කෝ? පෙට්ටි

[ගරු දිලිත් ජයවීර මහතා]

කඩේට VAT එක ගහලා පොර ටෝක් දෙන නිර්ධන පාන්තික පක්ෂයද, ඔය? ඉල්මහ විරුවෝ කියලා සැමරුවේ ඒකද? ඒ මිනිස්සු මැරුණේ ඒකටද? ඔබතුමන්ලා කොමියුනිස්ට්කාරයෝ මැරුවේ, සමසමාජකාරයෝ මැරුවේ නිර්ධන පන්තිය මදි කියලා. අපේ ගමේ ජෝර්ජ් රත්නායක මහත්මයා මරලා දැම්මේ, ඔහු නිර්ධන පාන්තිකකම මදි කොමියුනිස්ට්කාරයෙක් කියලා. දැන්, ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? ඔක්කෝම අධිරාජ්‍යවාදීන්ගෙන් උපදෙස් අරගෙන රූකඩ වාගේ නටනවා. මේක රූකඩ ආණ්ඩුවක්. මේක සම්පූර්ණයෙන්ම රූකඩ ආණ්ඩුවක්. පෞරුෂයක් නැති ආණ්ඩුවක්. තමන්ගේ රට නියෝජනය කරන්න බැරි ආණ්ඩුවක්. තමන්ට ඡන්දය දුන් ගමේ මිනිහා,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, තවත් විනාඩි 2ක කාලයක් ඔබතුමාට තිබෙන්නේ.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, බලන්න, අදටත් මේ පක්ෂයේ ගමේ යාන්ත්‍රණය තිබෙන්නේ අර අහිංසක කාඩර්වරු අතේ. ඔවුන් කොහොමද ගමට මුහුණ දෙන්නේ? ඒක, කැබ් දීලා බේරා ගන්න බැහැ. ඒ ගමේ යාන්ත්‍රණයට කැබ් දීලා බේරා ගන්න බැහැ. දැන් ඒ මිනිසුන්ට පාරේ යන්න බැරි වෙලායි තිබෙන්නේ. මට පෙනෙන හැටියට, ඔබතුමන්ලාගේ ඇඳුමෙන් පැලඳුමෙන්, කථා බහෙන්, මේ සියල්ලෙන්ම ඔබතුමන්ලාට කවදාවත් ගන්න බැරි වෙයි කියලා සිහින මව මවා ඉඳපු *[බාධා කිරීමක්]* මහා ධනවාදී තැනකට ගිහිල්ලා පට්ටම ලිබරල් අය වැයක් ඉදිරිපත් කරලා ට්‍රිලියනයක් බැංකුවේ දමා ගත්තා කියලා- *[බාධා කිරීමක්]* මොන කථාද ඇමතිතුමා, මේවා!

මොන විලිලජ්ජා නැති කථාද? ඕවා ගමේ ගිහිල්ලා කියන්න පුළුවන්ද? *[බාධා කිරීමක්]* එන්න, මාත් එක්ක ගිහිල්ලා ගමට කථා කරන්න. *[බාධා කිරීමක්]* කථා කරමු, ගිහිල්ලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම කනගාටු වෙනවා. මට අවශ්‍ය වුණා, අපේ සංචාරක කර්මාන්තය ඉදිරියට ගෙන යෑමේදී අද සංචාරක කර්මාන්තය මුහුණ දී තිබෙන ගැටලුවලට විසඳුම් සාකච්ඡා කරන්න. නමුත්, අද තවදුරටත් තහවුරු කරපු එක කාරණයක් තමයි ආණ්ඩු පක්ෂයේ මෙතුමන්ලා මේ රටේ ශ්‍රී ලාංකිකයන් නියෝජනය කරන්නේ නැහැ කියන එක. මෙතුමන්ලා මේ රටේ ශ්‍රී ලාංකිකයන් නියෝජනය කරන්නේ නැහැ. මම හැමදාම කිව්වා වාගේ ඔබ නොදන්නා,- *[බාධා කිරීමක්]* මට දුකයි, ඔබ ගැන. ඔබ හිනා වෙන්න එපා. මට දුකයි, ඔබ ගැන. ඔබ රූකඩ බවට පත් කරලා තිබෙන්නේ. ඔබ කොහෙන් හරි ආපු එකක් අල්ලාගෙන දඟලනවා. අපරාදේ, අපරාදේ, අපරාදේ! *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම ඔබතුමියට එකක් කියන්නට ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මෙය ඉතාම සංවේදී ප්‍රශ්නයක්, මෙය දුරදිග යන්නට පුළුවන් ප්‍රශ්නයක්. අර නියෝජ්‍ය ඇමතිතුමා මොන තරම් පහත් උත්තරයක්ද දුන්නේ? එතුමාට මම යෝජනා කරනවා, ත්‍රිකුණාමලයේ සිදු වුණු ඒ සිදු වීම ගැන රටේ පොදු සහෝදරත්ව දෘෂ්ටිකෝණයෙන් බලලා, ඒ ප්‍රශ්නය ජාති ආගම් භේදයෙන් තොරව විග්‍රහ කරලා, තවදුරටත් ඔබු දුවන්නේ නැති ආකාරයකට විසඳලා, සාමයට ආදරය කරන ශ්‍රී ලාංකිකයන් අතර සාමය රැක දෙන්න කියලා. ඒ යෝජනාව කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.44]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක යන අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ විවාදයයි පැවැත්වෙන්නේ. ජාතීන් අතර පවතින ඒකාබද්ධතාව සහ ජාතීන්ට ගරු කිරීම පිළිබඳ අදහසක් ඉස්මතු වන කාල සීමාවක, මූල්‍ය පරිපාලන බලය තිබෙන පාර්ලිමේන්තුවේදී වතු කම්කරුවන්ගේ වැටුප පිළිබඳව පසුගිය සතියේ අප ප්‍රශ්න කළාම ඒක ඔබතුමන්ලා ජාතීන් අතර අර්බුදයක් බවට පත් කරන්න උත්සාහ කළා. මෙතැනින් එහාට මේක විසඳා ගන්න අවශ්‍යයි. මේ වෙලාවේ ආණ්ඩුවේ විදේශ කටයුතු ඇමතිතුමාත් ඉන්නවා නේ. රූපවාහිනී විවාදයකට එන්න පුළුවන් කවුරු හරි කෙනෙක් අත උස්සන්න, වතු කම්කරු ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡාවකට. විදේශ කටයුතු ඇමතිතුමා වන විජිත හේරත් මැතිතුමාත් මේ ගැන voice-cut එකක් දෙනවා මම දැක්කා. විජිත හේරත් මැතිතුමනි, කැමැතිද එන්න? *[බාධා කිරීම්]* එන්න කැමැති කෙනෙක් ඉන්නවාද? අනං මනං වැඩක් නැහැ. කැමැතිද? *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපි ඌරෙක් එක්ක ලගින්නේ නැහැ.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ආ, ඌරෙක් එක්ක ලගින්නේ නැහැ කියන්නේ මට නේ. ඌරෝ ප්‍රශ්නයක් නැහැ. විවාදයට එන්න කැමැති කෙනෙක් ඉන්නවාද? *[බාධා කිරීමක්]* බැරි නම් මතක තියා ගන්න,- *[බාධා කිරීම්]* අපි මේක විසඳා ගනිමු. එතකොට අපට විනාඩිය, දෙක අවශ්‍ය නැහැ. කවුරු හරි කෙනෙක් අත උස්සන්න. ඉන්නවාද? *[බාධා කිරීම්]* ඉන්නවාද? *[බාධා කිරීම්]* ඔබතුමන්ලා එන්නේ නැත්නම් මතක තියා ගන්න,- *[බාධා කිරීම්]* පැලවත්තේ මල් පැළවලට අපට අභියෝග කරන්න පුළුවන්, මේ වාගේ තැන්වලට

මුවා වෙලා. කෙනෙක් ඉන්නවා නම් විවාදයකට එන්න. අරටුවක් එක්ක හැදෙන මිනිසුන්ට මල් පැළ, වල් පැළ අභියෝග කරන්න එන්න එපා කියලා ඉස්සෙල්ලාම කියනවා. *[බාධා කිරීම්]* ඉන්නවා නම් එන්න. ඉන්නවා නම් විවාදයකට එන්න. *[බාධා කිරීම්]* එනවා ද? එනවා ද? කෝ? කෝ? එක් කෙනෙක්හරි අත උස්සන්න, පුළුවන් නම්. කයිය ගහන්නේ. කෝ? 159 කෝ? එනවාද? *[බාධා කිරීම්]* එන්න. *[බාධා කිරීම්]* එනවා ද? *[බාධා කිරීම්]* අත උස්සන්න බය නැතුව. බැරි නම් මතක තියා ගන්න, වතු කම්කරුවන් රවටන්න තමයි මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්නේ කියන එක. *[බාධා කිරීම්]* හරි, එන්න එහෙම නම්. ඔබතුමා එනවා ද? දොම්පේ මන්ත්‍රීතුමා එනවා ද? *[බාධා කිරීමක්]* එනවා ද? අත උස්සන්න. *[බාධා කිරීමක්]* අනම් මනම් ඕනෑ නැහැ. ඔබතුමා හරි එන්න. එනවා ද? එනවා ද? *[බාධා කිරීම්]* වතු කම්කරු ජනතාව මතක තියා ගන්න, මේ කණ්ඩායම ඔබ රවට්ටන්න පාර්ලිමේන්තුව පාවිච්චි කරන බව. ආයෙත් අවසාන වශයෙන් අහනවා. මේ 159දෙනාගෙන් විවාදයට එන්න කැමති කවුරු හරි ඉන්නවා නම්, අත උස්සන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විපක්ෂ නායකතුමා එනවා ලු.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
කෑ ගහන්න විතරයි පුළුවන්. විනය, විනය, *[බාධා කිරීම්]* විනය. නිවාස අඩස්සියේ තියයි. විනය, විනය. *[බාධා කිරීමක්]* නිවාස අඩස්සියේ තියයි. විනය, විනය, විනය. *[බාධා කිරීමක්]* එන්න බැහැ නේ? එහෙම නම් මේ රටේ මිනිස්සු දැන ගන්න ඕනෑ දෙයක් තිබෙනවා. කයිවාරු ගැහුවාට, අප අපහසුතාවට පත් කරන්න 159දෙනෙක් එව්වාට, කශේරුකාවක් තිබෙන කෙනෙක් නැහැ, මේ අභියෝගය භාර ගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විපක්ෂ නායකතුමා එවන්න. ඔබතුමා යෝජනා කරන ඕනෑම කෙනෙක් එනවා. *[බාධා කිරීම්]*

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ඔය කියන්නේ, ඔය කියන්නේ. එහෙම නම් කථාව ඉවරයි. ඔබතුමන්ලා 159දෙනාගෙන් කාට හරි හොඳ කශේරුකාවක් තිබෙනවා නම්,- *[බාධා කිරීම්]* බැරි ඇයි කියලාත් කියන්නම්. පැලවත්තෙන් පණිවුඩය එනකල් අත උස්සන්න හයියක් නැහැ. *[බාධා කිරීම්]* ආධ්‍යාත්මික නායකයා ඒ ඉන්නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඇත්ත කථාව ඒක.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
එයා කියනකල් මෙතැන එක් කෙනෙකුටවත් අත උස්සන්න බැහැ, කයිවාරු ගැහුවාට. ඔහොම කෑ ගහන්න පුළුවන්. හැබැයි, නිශ්චිත ලෙස අත උස්සලා එන්න බැහැ. *[බාධා කිරීමක්]*

අරහෙන් ආධ්‍යාත්මික නායකයාගෙන් පණිවිඩය එන්න ඕනෑ. ඒක තමයි ඇත්ත. *[බාධා කිරීම්]* කයිවාරු ඕනෑ නැහැ. එහෙම නම් අත උස්සන්න කෝ. බැරි නම්, තවදුරටත් මේ කථාව අරගෙන යන්න එපා කියන ඉල්ලීම කරනවා. *[බාධා කිරීම්]* හරි, එහෙම නම් කථාව පැහැදිලියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද සංචාරක ව්‍යාපාරය පිළිබඳව තමයි අපි සාකච්ඡා කරමින් ඉන්නේ. ලංකාවේ සංචාරක ව්‍යාපාරය කියන්නේ මේ රටට විදේශ විනිමය රැගෙන එන ප්‍රධාන මාර්ග තුනෙන් එකක්. සංචාරක ව්‍යාපාරය මේ රටේ ජන ජීවිතය හා සම්පූර්ණයෙන්ම, සෘජුව බැඳිලා තිබෙනවා. හේතුව, වෙනත් ව්‍යාපාර වාගේ නොවෙයි, සංචාරකයා රැගෙන එන මුදල් කිසිම වෙනත් තැනකට යොමු වෙන්නේ නැතුව, චක්‍රාකාරයට නැතුව කෙළින්ම - සෘජුව - සමාජය තුළට ගලා ගෙන යන system එකක් තිබෙන නිසා. ඒ නිසා සංචාරක ව්‍යාපාරය මේ රටේ පුළුවන් තරම් ගුණාත්මකභාවයෙන් යුක්තව දියුණු කිරීම අත්‍යවශ්‍යයි කියන එක අපි විශ්වාස කරනවා.

මේ වෙලාවේ සංචාරක කටයුතු ඇමතිවරයාත් ඉන්න නිසා මම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, මේ ව්‍යාපාරයේ මීට වඩා ලොකු පිම්මක් ගන්න ඕනෑ නම්, ලංකාවට එන සෑම සංචාරකයෙකුටම App එකක් හඳුන්වා දෙන්න කියලා. ඒ App එක තමයි මේ වෙලාවේ සංචාරක ව්‍යාපාරයේ ඊළඟ පිම්ම ගන්න වුවමනා කරන සාධකය. ඇයි, මම එහෙම කියන්නේ? ලංකාවට එන සංචාරකයන්ගේ පැමිණීම මෙන්ම, ඒ සංචාරකයන් හා සම්බන්ධ පොඩි පොඩි අර්බුද ටිකක් තිබෙනවා. පළමුවෙනි කාරණාව මේකයි. මේ රටට පැමිණෙන සංචාරකයන්ගේ රුචි අරුචිකම් හඳුනා ගන්නේ නැතුව, ඒ pattern එක හඳුනා ගන්නේ නැතුව, ඊළඟ පිම්ම අපට ගන්න බැහැ. හැබැයි, App එකක් හඳුන්වා දුන්නොත්, ඒ අය යන hotelsවලට ඒ App එක හරහා, ඒ QR code එක හරහා ඒ ගොල්ලන් order කරන්නේ මොනවාද කියලා බලා ගන්න පුළුවන්. ඒ අය කන්න කැමති කෑමවල ඉඳන්, යන්න කැමති තැන්වල ඉඳන්, ඒ හැම දෙයක්ම හඳුනා ගන්න පුළුවන්. ඒකෙන් පළමුවෙන්ම අපට පුළුවන් වෙනවා, ඒ සංචාරකයන්ගේ pattern එක හඳුනා ගන්න. ඒ අය study කරන්න. App එකක්, එහෙම නැත්නම් QR code එකක් හඳුන්වා දුන්නොත්, කොයි කොයි රටවලින් එන සංචාරකයන්, කොයි කොයි සංචාරක කේන්ද්‍රස්ථානවලටද යන්නේ කියලා ඒ හරහා හඳුනා ගන්න පුළුවන්.

දෙවැනි කාරණාව මේකයි. මම දැක්කා ආගමන විගමන පාලකතුමාත් කියනවා, ලංකාවට එන සංචාරකයන් අදාළ කාල සීමාව ඉක්මවාත් රට ඇතුළේ ඉන්නවා කියලා. හැබැයි, hotel එකකට check-in වන වෙලාවේ ඉඳලා check-out වන වෙලාව දක්වා ඔක්කෝම App එකක් හරහා, QR code එකක් හරහා යනවා නම්, එතැනින් එහාට වීසා කාලසීමාව අවසන් වුණු ගමන් ඒ අයට ලංකාවේ කිසිදු හෝටලයකට එන්න බැරුව යනවා. ඊළඟ එක තමයි, මෙහෙම system එකක් පාවිච්චි කළොත්, සියලු සංචාරකයන් හෝටල්වලට පැමිණීමේදී දැනට සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වෙලා නැති සියලු ආයතන, - සමහර විට villa එකක් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ගෙවල්වල කාමර ලබා දෙන තැන් වෙන්න පුළුවන්; තරු පහේ හෝටල් වෙන්න පුළුවන් - ඒ හැම එකක්ම අර App එක හරහා රජයේ කිසියම් දත්ත පද්ධතියකට ඇතුළත් වෙනවා. ඒ හරහා ඇත්තටම මේ රටට ආදායම් බදු සැලකිය යුතු ප්‍රමාණයක් උපයා ගන්නත් පුළුවන් වෙනවා. ඒ නිසා එවැනි App එකකින් කරන්න පුළුවන් දේවල් ප්‍රමාණය අතිවිශාලයි. ඒ ගැන විශේෂයෙන්ම සැලකිලිමත් වෙන්න කියන කාරණාව මම කියනවා. මේක අමාරු වැඩක් නොවෙයි. QR code එකක් හරහා පසුගිය කාලයේ පෙට්‍රල් ගැහුවා වාගේ QR code system එකකට අනුව හැම සංචාරකයෙකුටම අදාළව මේ

[ගරු අමිල ප්‍රසාද් මහතා]

රට ඇතුළේ සියලු සංචාරක තැන් සහ වියදම් කරන සියලු දේවල් සොයා ගත්තොත්, ලොකු පිම්මක් එක පාර ගන්න පුළුවන්. ඩිජිටල්කරණය පිළිබඳව කථා කරන අවස්ථාවක මේ ගැන ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මම කරනවා.

හැබැයි, මේ අය වැය වාර්තාව තුළ මම බැලුවා, ඒ වාගේ ලොකු පිම්මක් ගන්න මුදල් වෙන් කරලා නැහැ. මෙහි කිසිම තැනක එවැනි සඳහනක් නැහැ. ආණ්ඩුවට දැක්මක් තිබෙනවා නම්, ඔය වාගේ දේවලට අනිවාර්යයෙන්ම මුදල් වෙන් කරලා තිබෙන්නේ ඕනෑ. නමුත් මෙහි කිසිම තැනක එවැන්නක් නැහැ. පිටු අංක 52 මම දැනුත් බැලුවා. ඒ කිසිම තැනක එහෙම එකකට මුදල් වෙන් කරලා නැහැ. ඒ කියන්නේ, ඔබට එවැනි ඉදිරි දැක්මක් නැහැ. හැබැයි, ඒ වෙනුවට ඔබට තිබෙනවා, සංචාරකයන්ට ලයිසන්ස් ලබා දීමේ ක්‍රමයක්. සංචාරකයන්ට ලයිසන්ස් ලබා දීමේ ක්‍රමය ඇත්තටම මේ මොහොතේදී නොකළ යුතුව පවතින දෙයක්. හේතුව, සංචාරකයන්ට මේ මාර්ග පද්ධතියේ ගමන් කිරීම සඳහා ගිය අවුරුද්දේ ලබා දුන්නු ලයිසන්ස්වලින් අවුරුද්දටම ගිහිල්ලා තිබෙන්නේ, 2,900ක වාගේ පිරිසක්. හැබැයි, ගරු නියෝජ්‍ය ප්‍රවාහන ඇමතිතුමාම කියන විධියට දැන් දවසකට 100ක් විතර යනවා, off season එකේත්. ඒ කියන්නේ අවුරුද්දකට 36,000ක්, 37,000ක් විතර අනිවාර්යයෙන් අවම වශයෙන් යනවා. සංචාරකයන් ලක්ෂ 20ක් මේ රටට ආවාට, ඒ සංචාරකයන් ලක්ෂ 20ම සංචාරය කරන අය නොවෙයි. ඒ සමහරු එන්නේ විවිධ සම්මන්ත්‍රණවලට වෙන්න පුළුවන්. සමහරු වෙනත් වැඩවලට එන අය වෙන්න පුළුවන්. ව්‍යාපාරික වැඩවලට එන අය වෙන්නත් පුළුවන්. ඒ සියලු දෙනාගෙන් සියයට 60, 70ක් තමයි රටේ සංචාරය කරන්නේ. ඒ ඔක්කොම තනි තනිව එන අයත් නොවෙයි. හතරදෙනා, පස්දෙනා, දහදෙනා, පහළොස්දෙනා වශයෙන් එන්නේ; කණ්ඩායම් වශයෙන් එන්නේ. ඒ එන සංචාරකයන්ගේ trip හැටියට ගත්තොත්, වැඩ හැටියට ගත්තොත්, තිබෙන්නේ ලක්ෂ 4ක්, 5ක් තමයි. මේ ටික අරගෙන ඒ අයගේ මුදල් ටික ලංකාව ඇතුළේ වියදම් කරවන ක්‍රියාවලිය කරන්නේ ඒ හරහා ක්‍රියාත්මක වන කණ්ඩායම් තුනක් විසින්. එක පිරිසක් තමයි සංචාරක මඟ පෙන්වන්නන් කියන අය.

අනෙක් අය තමයි සංචාරක මඟපෙන්වන්නන් සහ රියැදුරු කියන රැකියා දෙකම කරන අය. අනෙක් අය සංචාරක රියැදුරන්. මේ කණ්ඩායමේ රැකියාවලින් අවුරුද්දකට කරන්න තිබුණු රක්ෂා ප්‍රමාණය, ඒ කියන්නේ tours සංඛ්‍යාව ලක්ෂ 5ක් නම්, ඔබතුමන්ලා මේ ලයිසන් ලබාදීම හරහා මේ රටේ සංචාරක මඟ පෙන්වන්නන් සඳහා තිබුණු ඒ jobsවලින් සියයට 10කට වඩා වැඩි ප්‍රමාණයක් දැන්ම නැවතිලා ඉවරයි.

මේ වාගේ දේවල් හරහා සිද්ධ වෙන ඊළඟ බලපෑම මොකක්ද? ඊළඟ බලපෑම මේකයි. මේ සංචාරකයෝ ලංකාවට එන්නේ බොහෝ විට කටින් කට යන පණිවුඩවලින්. එහෙම නැත්නම් කලින් ආපු අයගෙන් තොරතුරු දැනගෙන. මේ ව්‍යාපාරය තුළ රැඳී සිටින මම සඳහන් කරපු පෞද්ගලික අංශයේ අය තමයි මේ සංචාරක ව්‍යාපාරය මේ දක්වා ඔසවාගෙන ගියේ. ඒ අය තමයි මේ සංචාරක ක්‍රියාවලිය වර්ධනය කළේ. පසුගිය කාල සීමාවේ සංචාරකයන්ට මේ රට ඇතුළේදී අපහසුතාවලට ලක් වෙන්න නොදී ඒ අය තමයි ඔවුන් මේ සංචාරක ගමනාන්තවලට අරගෙන ගිහිල්ලා, අලුත් ගමනාන්ත නිර්මාණය කරලා දුන්නේ. හැබැයි ඔබතුමන්ලා විසින් ගනු ලබන එක වැරදි තීරණයක් නිසා මේ සියල්ල කරපු අයගේ රැකියා දැන් සම්පූර්ණයෙන්ම අනෙක් පැත්තට හැරෙනවා.

ඒ වාගේම තමයි ඔබතුමන්ලා ආරම්භ කරපු සංචාරකයන්ට ලයිසන් ලබා දීමේ ක්‍රියාවලිය තායිලන්තයේ මීට කලින් කරලා තිබෙනවා. මේ අවුරුද්දේ ජූනි මාසයේ 20වැනි දා ඒක නැවත සීමා කරන්න තායිලන්තය තීරණය කර තිබෙනවා, මම දැක්කා. ඇයි? ඒ ගත්ත තීරණ වැරදියි. ඒ සංචාරක ක්‍රියාවලිය හරහා ධනවත් මැද මට්ටමේ අය වෙනුවට දුප්පත් සංචාරකයන් රටට පැමිණෙනවා. අවසානයේදී සිද්ධ වෙන්නේ ඔළුගෙඩි සංඛ්‍යාව වැඩි වෙන එක විතරයි. නමුත් ආදායම් ප්‍රමාණය පහළ යනවා. ඔබතුමන්ලාගේ ගිය අවුරුද්දේ වාර්තාවලට අනුව මේ අවුරුද්දේ සංචාරකයන් ලක්ෂ 30ක ඉලක්කයක් තමයි ආණ්ඩුව බලාපොරොත්තු වුණේ. නමුත් අපට තවමත් ඒ ඉලක්කය සම්පූර්ණ කරගන්න බැරි වෙලා තිබෙනවා. මේ කාල සීමාව තුළ සංචාරකයන් ලක්ෂ 20කට පමණ ආසන්න ප්‍රමාණයක් තමයි තවම ඇවිත් තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, තව විනාඩියකින් අවසන් කරනවා.

මේ මාසයේ සංචාරකයන් ආවත් ලක්ෂ 24කට ආසන්න ප්‍රමාණයක් තමයි එන්නේ. ඔබතුමන්ලාගේ මේ අවුරුද්ද තුළ අපේක්ෂිත ඉලක්ක සම්පූර්ණ වුණේ නැහැ කියන්නේ, මේ අවුරුද්ද තුළ සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් ගත්ත කිසිදු ක්‍රියාමාර්ගයක් සාර්ථක ප්‍රතිඵල ගෙනැල්ලා නැහැ කියන එකයි. ඒ වෙනුවට දුප්පත් සංචාරකයෝ ඇවිල්ලා පාරවල් දිගේ අලින්ට කෑම දෙමින් යනවා. සම්පූර්ණයෙන්ම සංචාරක ව්‍යාපාරය අසාර්ථක වෙමින් යනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු භාග්‍ය ශ්‍රී හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේ ගරු සෙල්ලතම්බි තිලකනාදන් මන්ත්‍රීතුමාට මූලසුන භාර කරනවා.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (DR.) SELLATHTHAMBY THILAGANATHAN took the Chair.*

[අ.භා. 2.54]

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගැනෙන්නේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයත්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයටත් අදාළ වැය ශීර්ෂ පිළිබඳවයි. මගේ කථාව ආරම්භ කරන්න හිතුවේ අධිකරණ අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂයෙන්. නමුත් අද පාර්ලිමේන්තුවේ වෙච්ච දේවල් දිහා බැලුවාම මේ කාරණය නොකියා බැහැ. මොකද, අද මේ කථා කරන හැම දෙයක්ම සමහර විට ජාතික නාළිකාවල, වෙනත් නාළිකාවල විවිධ අර්ථ

ඇතිව විකාශය වෙනවා. හෙට උදේ වෙද්දී ජනතාව මේ ගැන කථා කරනවා. ඒ නිසා පොඩි පැහැදිලි කිරීමක් කළ යුතුයි කියලා මම හිතනවා.

පළමුවැනි කාරණය මෙයයි. විපක්ෂයේ නායකත්වය නම් ස්ථිරයි වාගේ පේනවා. අත් දෙක දිගු කරලා කරන අභියෝගය දැක්කාම ආයෙමත් මතක් වෙන්නේ කලින් කරපු අභියෝගයම තමයි. අපට අභියෝග කළාට, අවසානයට පුටුත් එක්ක විවාද කරන්න වෙයිද දන්නේත් නැහැ. පුටුවක් එක්ක විවාද කළා අපට මතකයි. ඒ නිසා අඩුම තරමින් අභියෝගයක් කරනකොට තමන්ගේ නායකයෝ අභියෝග භාරගත්ත විදිය ගැනවත් කල්පනා කරලා ඉන්න ඕනෑ. එහෙම අය තමයි අභියෝග කරන්නේ. ඒකට කමක් නැහැ. *[බාධා කිරීම්]*

මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය දවස් දෙක, තුන බැලුවොත් විපක්ෂය නාන ගමන් හිටියේ කියලා පෙනුණා. විපක්ෂය හොඳට නෑවා. ඔය ජාතියේම කථාවක් කරන්න ගිහිල්ලා, ප්‍රකාශයක් කරන්න ගිහිල්ලා ඒ ඇතුළේ නාන ගමන් හිටියේ; කරකියාගන්න දෙයක් නැතුව හිටියේ. රුපියල් දෙසීය නිසා නැති වෙලා හිටියේ. හැබැයි දැන් මොකද වෙලා තිබෙන්නේ? ඒ අතර තව පිරිසක් 21වැනි දා මොනවා කරගන්න වෙයිද දන්නේ නැහැ කියලා ඒ අයත් නාන ගමන් හිටියේ. ඒක පෙනෙන්න තිබෙනවා නේ. හැබැයි දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් හදිසියේ ඒ නෑම නිකම් වෙන පැත්තකට හරවන්න උත්සාහ කරනවා වාගේ පේනවා. අද දවසේම තිබුණු කථාව මොකක්ද? අද දවසේ වැය ශීර්ෂ ගැන කථා පැත්තක. ඒ වෙනුවට වෙන ජාතිවාදී කථාවක් අල්ලාගෙන දැන්, ජාතිය අනතුරේ කියන නාට්‍යය ආයෙමත් රඟ දක්වන්න පටන් ගෙන තිබෙනවා.

මීට කලින් කථා කළ මන්ත්‍රීවරු අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරනවා වෙනුවට, ජාතිය අනතුරේ බව කියමින් කථා කළ ආකාරය අපි දැක්කා. ඒ කථාවලින් සමහර ඒවා Facebook pagesවල යනවා. මීට කලින් ගියේ "21 එන්න" කියලා. ඒ page එකේම අද යනවා, "ජාතිය අනතුරේ" කියලා. ඒ අනුව පැහැදිලියි, මේවා එකට බද්ධ වෙලා තිබෙන බව. මේවායින්, ජාතික වශයෙන් සාකච්ඡා වෙමින් තිබිච්ච කාරණා යට යන්න දෙන්න නරකයි. පසුගිය දවස්වල නුවරඑළිය පැත්තට යා ගන්න බැරිව හිටිය පිරිසක් ඒ මාතෘකාව යට කරගන්න හදනවා. ඒවා යට කරගන්න දෙන්න හොඳ නැහැ. මේ රටේ මිනිස්සුන්ට මේ ආණ්ඩුවෙන් වැඩක් කරවා ගන්න පුළුවන් නම්, ඒක කරවා ගන්න එපායැ. හැබැයි, විපක්ෂයට අවශ්‍යව තිබෙන්නේ මොකක්ද? ආණ්ඩුව ගන්න කුමන හෝ ප්‍රතිපත්තියක්, තීරණයක් නිසා ජනතා ප්‍රසාදය වැඩි වෙනවා නම්, ඒ තුළින් ජනතාව ආණ්ඩුව කෙරෙහි වැඩි ආකර්ෂණයක් දක්වනවා නම් ඒකට විරුද්ධ වෙනවා. පදනමක් නැතිව ඒකට විරුද්ධ වෙනවා. ජනතා හිතෛෂීභාවය එතැනදී වැඩක් නැහැ. තමන්ගේ පදනම කැඩෙයි වාගේ හිතෙනවා නම් විරුද්ධ වෙනවා. පසුගිය කාලයේ ඒක තමයි අපි දැක්කේ.

අද තිබෙන වැය ශීර්ෂ ගැන කිව්වොත්, මීට කලින් කථා කළ මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කළා. අපි දන්නවා, යම් පිරිසකට අධිකරණයත් එක්ක වෙන ඇරියස් එකක් තිබෙන බව. අධිකරණය ආරක්ෂා කරනවා වාගේ මෙතැන කථා කළාට, අධිකරණය ඉදිරියේ වැරදිකරුවන් වෙන්න ඉන්න අය දන්නවා, තමන් කරපු දේවල්. මොනවා වුණත් මේගොල්ලන්ට අධිකරණය එක්ක වෙන ඇරියස් එකක් තිබෙනවා. ඒ නිසා මේගොල්ලන් උත්සාහ කරනවා, අධිකරණයේ ස්වාධීනභාවයක් නැති බව පෙන්වන්න. තමන්ට විරුද්ධව තීන්දුවක් දුන් මහෙස්ත්‍රාත්තුමිය වෙනුවෙනුත් පෙනී ඉන්නවා වාගේ හැසිරෙන්න උත්සාහ කරනවා. අධිකරණය කෙරෙහි මේ රටේ මිනිස්සුන්ගේ තිබෙන ගෞරවය, ස්වාධීනත්වය පලුදු කරන්න තමයි මේ උත්සාහ කරන්නේ. නැහැ, එහෙම වුණේ ඉස්සර. මේ තිබෙන්නේ, මාලිමාවේ ආණ්ඩුවක්, NPP ආණ්ඩුවක්. අපට අධිකරණයත් එක්ක වෙන ඇරියස් එකකුත් නැහැ, බැඳීමකුත් නැහැ. මේ රටේ නීතියේ විධානයේ ආධිපත්‍ය ආරක්ෂා කරන්නත්, මේ රටේ මිනිස්සුන්ට මීට වඩා හොඳ ජීවන තත්ත්වයක් අත්පත් කර දෙන්නත් තමයි අපට ඕනෑ. ඒකට අධිකරණයේ ස්වාධීනත්වය ඉතාම වැදගත් බව අප විශ්වාස කරනවා.

මේ රටේ මිනිස්සුන්ට දැනෙන්න ඕනෑ නීතිය ඉදිරියේ අපි ඔක්කොම සමානයි කියලා. මිනිස්සුන්ගෙන් අහලා බලන්න, ඒ අයට වෙන දා තිබිච්ච හැඟීමට වඩා අද අධිකරණය ඉදිරියේ සමානයි කියන එක දැනෙන්නේ නැද්ද කියලා?ධනය, බලය ඉදිරියේ නීතිය වෙනස් විදියට ක්‍රියාත්මක වුණා කියලා හිතිච්ච මිනිස්සුම දැන් වෙනස් විදියට කටයුතු කරනවා කියන එක පෙනෙන්නේ නැද්ද? ඒ නිසා මිනිස්සුන්ගෙන් අහලා බැලුවොත්, එළියේ ඉන්න පුරවැසියන්ගෙන් අහලා බැලුවොත් ඔවුන් ඒ ගැන කියාවි. පුරවැසියන් ඉතාම කූල් එකේ වැඩේ කරගෙන යනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඇතුළේ ඉන්න අය? ඒගොල්ලන් දන්නවා, තමන්ට වෙන්න යන දේ. ඒ නිසා විවිධ අසමානතා, විවිධ ව්‍යාකූලතා නිර්මාණය කරන්න විවිධ විදියට උත්සාහ කරනවා. දැන් බොහෝ කථා viral කරනවා, "ජාතිය අනතුරේ, එකතු වෙමු, බේරාගමු"කියලා. අපි මේ හැම තැනදීම කියන්නේ, මේ ආණ්ඩුව නීතියේ විධානයේ ආධිපත්‍ය ආරක්ෂා කර තිබෙනවා කියලායි. වැරැද්දක් කරලා තිබෙනවා නම් ඒකට නිසි පරිදි දඬුවම් ලැබෙයි. හැබැයි, මේ විපක්ෂයේ හැසිරීම ගැනත් පොඩ්ඩක් touch එකේ ඉන්න කියලා අපි කියනවා.

කාලයක් තිස්සේ අපේ අධිකරණ පද්ධතිය තුළ ගොඩ නැගුණු ප්‍රශ්න ගොඩක් තිබුණා. එකක් තමයි, *[බාධා කිරීමක්]* වාඩි වෙන්න. කුඩා කාලයේදී අවධානය ලැබුණේ නැති වුණාට කරන්න දෙයක් නැහැ. දැන් ඉතින් අපට අවධානය දෙන්න බැහැ. කුඩා කාලයේ අවධානය නොලැබුණාට අපට කරන්න දෙයක් නැහැ. ඔන්න, දෙමව්පියන්ට බලාගන්න උදාහරණ තිබෙනවා. ඔක්කොටම කලින් කුඩා කාලයේදී දරුවන්ට අවධානය දෙන්න ඕනෑ. එහෙම නැත්නම් දරුවෝ ලොකු ලොකු තැන්වලට ඇවිල්ලාත් අවධානය ඉල්ලනවා. ඉතින් ඒකට අපට කරන්න දෙයක් නැහැ.

අධිකරණ පද්ධතිය තුළ කාලයක් තිස්සේ ගොඩ නැගුණු ප්‍රශ්න තිබුණා. එක පැත්තකින් අධිකරණ තුළ විශාල නඩු ප්‍රමාණයක් ගොඩ ගැහිලා තිබෙනවා. අනෙක් පැත්තෙන් යුක්තිය ඉෂ්ට නොවීම, ප්‍රමාද වීම සම්බන්ධ ප්‍රශ්න තිබුණා. බන්ධනාගාරවල තදබදයක් තිබුණා. තවත් පැත්තකින් අපරාධ වැඩි වෙමින් තිබුණා. මේ ප්‍රශ්න ඔක්කොම එකට බද්ධ වෙලායි තිබෙන්නේ. අපරාධ අඩු වෙන්නේ නැත්නම් රටේ යුක්තිය ඉෂ්ට කරන්න බැහැ, අධිකරණ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම නිවැරදි මාවතට ගන්න බැහැ. ඒ නිසා අපරාධ අඩු කිරීමත් රාජ්‍යයක කාර්යභාරයක්. අධිකරණ පද්ධතිය ගොඩ නැංවීමත් රාජ්‍යයක කාර්යභාරයක්. පුනරුත්ථාපනය පිළිබඳවත්, මිනිසුන් අපරාධ සඳහා පෙලඹීම, අපරාධයක වින්දිතයන් වීම වැනි තත්ත්ව පිළිබඳවත් සලකා බලන්න ඕනෑ. ඒ සියල්ලටම මුලින් අපේ රට තුළ ආර්ථික, සමාජයීය, දේශපාලන සාධාරණත්වයක් ඇති කරන්න ඕනෑ. ඒ කිසිවක් නැතිව අධිකරණ ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්න විසඳන්න බැහැ.

අධිකරණයේ බඳවා ගැනීම් සම්බන්ධයෙන් මම ඉතාම කෙටියෙන් කියන්නම්. ඒ ගැන මීට පෙරත් මේ ගරු පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා වුණා. අධිකරණයේ බඳවා ගැනීම් සම්බන්ධයෙන් අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. නිලධාරින්ගේ හිඟකමක් තිබෙනවා. ඒ නිසා 2,871දෙනෙක් මේ වෙද්දී බඳවා ගන්න තීරණය කර තිබෙනවා. ඒ අතරින් අධිකරණ ක්ෂේත්‍රයට 1,315ක් බඳවා ගන්නවා.

[ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා]

ඒ වාගේම බන්ධනාගාර නිලධාරින්ගේත් අඩුවක් තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. ඒ වෙනුවෙන් 1,086ක් බඳවා ගැනීමට තීරණය වෙලා තිබෙනවා.

අපි පසුගිය කාලයේ කිව්වා, සියලුදෙනාට ඉතා ඉක්මනින් යුක්තිය ඉෂ්ට කරවා ගැනීම සඳහා, එහෙම නැත්නම් අධිකරණයට ඉතා ඉක්මනින් ළඟා වීම සඳහා හැකියාවක් තිබෙන්න ඕනෑය කියලා. ඒකට එක පැත්තකින් යුක්තිය ඉෂ්ට වන ක්‍රියාවලිය වේගවත් වනවා වාගේම, තමන් ජීවත් වන ප්‍රදේශයේ අධිකරණයක් පැවතීමත් වැදගත් වනවා. ඒ සම්බන්ධයෙන් සලකා බලා අපි මේ වෙද්දි යම් තීරණයක් අරගෙන තිබෙනවා. පුත්තලමේ, පොළොන්නරුවේ සහ අනුරාධපුරයේ අතිරේක මහේස්ත්‍රාත් අධිකරණ මේ වෙද්දීත් ක්‍රියාත්මක වනවා. ඊට අමතරව අලුතින් පිහිටුවන ලද අතිරේක මහේස්ත්‍රාත් අධිකරණත් ක්‍රියාත්මක වනවා. මනම්පිටිය සහ කල්පිටිය සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ, මහේස්ත්‍රාත් අධිකරණ දක්වා උසස් කරලා තිබෙනවා. බිබිල, හෙට්ටිපොල, දෙයියන්දර, තඹුත්තේගම, අඟුණුකොළපැලැස්ස, ආනමඩුව, ගල්ගමුව ආදී මහේස්ත්‍රාත් අධිකරණවලට "දිසා/මහේස්ත්‍රාත් අධිකරණ" ලෙසට කටයුතු කිරීමට බලය ලබා දීමට අවශ්‍ය කටයුතු කරමින් යනවා. ඒක මේ වෙද්දී ගැසට් කරලා තිබෙනවා. තව ටික දවසක් යද්දි එම ගැසට් පත්‍රය නිකුත් වනවා. ඒ වාගේම අලුත් දිසා අධිකරණත් ගොඩ නැඟෙනවා. මේ තමයි ජනතාවට ලැබිලා තිබෙන සහන. මේ තමයි අධිකරණ අමාත්‍යාංශයෙන් මේ වෙද්දි ඉටු වෙලා තිබෙන කාර්යභාරය.

අධිකරණ අමාත්‍යාංශය කියන්නේ, බන්ධනාගාර සහ අධිකරණ විතරක්ම අදාළ වන තැනක් නොවෙයි. මේ රටේ නීති සම්පාදනය කිරීමේදීත් අධිකරණ අමාත්‍යාංශයෙන් විශාල කාර්යභාරයක් සිද්ධ වෙමින් තිබෙනවා. මේ වෙද්දී එවැනි පනත් කෙටුම්පත් බොහොමයක් මේ පාර්ලිමේන්තුවේ සම්මත වෙලා තිබෙනවා. තවත් පනත් කෙටුම්පත් සම්මත වෙන්නත් නියමිතයි. ගරු අධිකරණ ඇමතිතුමා ඒ ගැන දීර්ඝ පැහැදිලි කිරීමක් කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up. Please wind up.

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
මේ අවස්ථාවේ වැදගත්ම පනත් දෙකක් ගැන විතරක් කියලා මගේ කථාව අවසන් කරනවා. අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත සහ ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත කියන්නේ ගොඩක් අයට රිදෙන පනත්. ඒ නිසා කෙරෙන කෑගැහිලි, අඳෝනා දෙස අපි බලාගෙන ඉඳිමු.

මම මේ අවස්ථාවේ වැදගත් කාරණයක් විශේෂයෙන් කියනවා. දෙපිරිසක් වේශ දෙකකින් ජාතිවාදය අවුස්සන්න උත්සාහ කරමින් ඉන්නවා. එකම frame එකේත් සමහර අය වාඩි වෙලා ඉන්නවා පෙනෙනවා. ඒ නිසා මේ රටේ මිනිස්සු හොඳ අවධානයෙන් ඉඳලා ජාතිවාදය නැවත නැවත පරාද කරලා, මේ රට ගොඩනැඟීම සඳහා සහයෝගය දෙන්න ඕනෑය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.
බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Gayantha Karunathilleka. You have eight minutes.

[අ.භා. 3.05]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
I had 11 minutes, Sir.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් අමාත්‍යාංශ කිහිපයක් ගැන සාකච්ඡා වන අවස්ථාවේ, අංශ දෙකක් පිළිබඳව අපේ දිස්ත්‍රික්කයටත්, පොදුවේ රටටත් බලපාන නිසා කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක ව්‍යාපාරය ගැන කථා කරනකොට, සංචාරකයන් එනවා, අච්චර එනවා, මෙච්චර එනවා කිව්වාට මදි. ඔවුන්ගේ පැමිණීමෙන් අපේ රටට ආදායමක් ලැබෙන්න ඕනෑ. මෑත කාලයේ වැඩිම සංචාරක පැමිණීම වාර්තා වෙලා තිබෙන්නේ 2018 අවුරුද්දේ යහ පාලන ආණ්ඩුව පැවති කාලයේදීයි. ඒ අවුරුද්දේ සංචාරකයන් 2,333,796ක් ලංකාවට ඇවිත් තිබෙනවා. 2018දී සංචාරක කර්මාන්තයෙන් රටට ලැබුණු ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 4.38ක්. මේ අවුරුද්දේ - 2025 - ආණ්ඩුව පුරෝකථනය කළා, ලක්ෂ 30ක් - මිලියන 3ක් - සංචාරකයන් ගෙන්වා ගන්න පුළුවන් වෙයි කියලා. නමුත් අද වන විට -මේ අවුරුද්දේ නොවැම්බර් මාසයෙනුත් භාගයක් ගියාට පස්සේ- ඇවිත් තිබෙන්නේ සංචාරකයන් ලක්ෂ 20කට - මිලියන දෙකකට - ආසන්න ප්‍රමාණයක්. අද වෙද්දි අපට පෙනී යන විධියට ඉදිරි මාස එකහමාර තුළ අපි හිතන උපරිම සංචාරකයන් සංඛ්‍යාව ලංකාවට ආවත්, අර ඉලක්කයට යන්න බැරි වෙයි. ආණ්ඩුව දිගටම කිව්වේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල තිබෙන හොඳකම නිසා මේ අවුරුද්දේ ඩොලර් බිලියන 5ක ආදායමක් සංචාරක ව්‍යාපාරයෙන් ලබා ගන්න පුළුවන් වෙනවා කියලායි. නමුත් මේ අවුරුද්දේ දැනට සංචාරක ව්‍යාපාරයෙන් ලැබිලා තිබෙන්නේ ඩොලර් බිලියන 2.65යි. ඒ අනුව අපට ඉතාම පැහැදිලිව පෙනෙන දෙයක් තමයි, 2018දී අපේ යහ පාලන සමයේ ලැබූ ආදායමට වඩා 2025දී ලැබුණු ආදායමේ ඩොලර් බිලියන එකහමාරක, දෙකක අඩුවක් සිද්ධ වන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දත්ත දිහා බැලුවාම අපට පෙනෙනවා, ලංකාවේ කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරපු ලොකුම හෝටල් සමාගම්වලින් සියයට 90ක් විතර පසුගිය මාස හයක කාලය තුළ පාඩු ලබමින් තමයි පවත්වාගෙන ගිහින් තිබෙන්නේ කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තත්ත්වයට ප්‍රධාන වශයෙන්ම බලපාන හේතුවක් තමයි, ආණ්ඩුව විසින් කළ යුතුව තිබෙන සංචාරක ප්‍රවර්ධන කටයුතු නිසි ලෙස ඉටු නොකිරීම. අපි ඉලක්ක කරන්නට ඕනෑ, වැඩි වැඩියෙන් අපේ රට තුළට වියදම් කරන්න පුළුවන් සංචාරකයෝ ගෙන්වා ගන්න. ඇමෙරිකානු ඩොලර් වැඩි ප්‍රමාණයක් ගේන්න පුළුවන් සංචාරකයෝ අපේ රටට ආකර්ෂණය කර ගන්නත්, ගෙන්වා ගන්නත් අවශ්‍යයි. ඒ සඳහා නිසි සැලැස්මක් සහිතව, සංචාරක ප්‍රවර්ධන කටයුතු කළ යුතුව තිබෙනවා. අද අපේ රටේ ක්‍රියාත්මක කරන සංචාරක ප්‍රවර්ධන කටයුතු පිළිබඳව අපට කිසිසේත්ම සෑහීමකට පත් වන්න පුළුවන්කමක් නැහැ. විෂය භාර ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. එතුමාගේ විශේෂ අවධානය මේ සම්බන්ධයෙන් යොමු කළ යුතුව තිබෙනවා. රටට ඩොලර් ආදායම වැඩි කර ගන්නේ නැතිව, අච්චර ආවා, මෙච්චර ආවා කිය කියා ඉලක්කම් හරඹයක් පෙන්වා සිටීමෙන් කිසිම වැඩක් වෙන්නේ නැහැ.

ඒ වාගේම අපේ රටේ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ සියලු ආයතනවලින් සංචාරක මණ්ඩලය සියයට 1ක බද්දක් අය කර ගන්නවා. ලෝකය පුරා අපේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරන්න කියලා තමයි ඒක අය කරන්නේ. ඒ සියයට 1ක බද්දෙන් රුපියල් බිලියන 15ක ආදායමක් රජය සතු කරගෙන තිබෙනවා.

නමුත්, ආණ්ඩුවේ නොහැකියාව නිසා, නිසි වැඩ පිළිවෙළක් නොමැතිවීම නිසා, හරි අධීක්ෂණයක් නොවන නිසා, ව්‍යාපාරිකයන් ඒ බදු මුදල් දුන්නත් ඒකේ පරමාර්ථය හරි හැටි ඉටු කර ගන්න අපොහොසත් වෙලා තිබෙනවා. අද වන විට ඒ නියමිත ප්‍රවර්ධන කටයුතුවලට මුදල් යොදවන්නේ නැතුව, නාගරික සංවර්ධන අධිකාරියෙන් හෝ කොළඹ මහ නගර සභාවෙන් කළ යුතු වැඩක් වන බේරේ වැව ප්‍රතිසංස්කරණය සඳහා, අර බදු මුදල්වලින් රුපියල් මිලියන 500ක් යොදවා තිබෙනවා. මේ යන විධියට බැලුවොත්, රටට සංචාරක ව්‍යාපාරයෙන් ඉලක්කගත ආදායම ලබා ගන්නත් බැරිව යයි, සංචාරක ව්‍යාපාරයේ නිරත වෙලා සිටින පිරිසට යහපතක් වෙන්නේත් නැතිව යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය දිගටම තිබුණොත්, විදේශ ආයෝජකයන් සහ දේශීය ව්‍යාපාරිකයන් තුළ තවදුරටත් මේ රටේ සංචාරක ව්‍යාපාරයට ආයෝජනය කිරීමට තිබෙන උනන්දුව නැතිව යයි. රජය 2028දී ණය ගෙවන්න පටන් ගත්තාම අපට ආදායම් ලැබෙන ප්‍රධාන ඉලක්කයක් වන්නේ, සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන ආදායමින් ඩොලර් ගෙන්වා ගැනීමයි. මෙහෙම ගියොත් ඒවා ගැනත් හිතන්න වෙයි. රටේ දළ දේශීය නිෂ්පාදනයේ ඉලක්කගත වැඩිවීම්වලටත් මේක බලපාන්න පුළුවන්.

සංචාරක ව්‍යාපාරය පවතින ප්‍රදේශයක් නියෝජනය කරන මහජන නියෝජිතයෙකු හැටියට, සංචාරක ව්‍යාපාරයට ප්‍රධාන වශයෙන් බලපාන කාරණා කිහිපයක් මා කියන්න කැමැතියි, ගරු ඇමතිතුමාගේ අවධානය පිණිස. සංචාරක ව්‍යාපාරය පවතින ප්‍රදේශවල තිබෙන ප්‍රධාන ගැටලුවක් තමයි, කැළි කසළ බැහැර කිරීමට නිසි වැඩ පිළිවෙළක් නොමැතිවීම. ඒ වාගේම ඒ ප්‍රදේශවල අපජලය බැහැර කිරීමටත් නිසි වැඩ පිළිවෙළක් නැහැ. ඒ නිසා පරිසර හානියකුත් සිදු වනවා. සංචාරක කර්මාන්තය තිබෙන ප්‍රදේශවලට අවශ්‍ය නළ ජලය ප්‍රමාණවත් පරිදි ලැබෙන්නේත් නැහැ. ඒ වාගේම සංචාරක ව්‍යාපාරයට අවශ්‍ය පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟයත් ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

අවසාන වශයෙන් මේ අංශය ගැන මට කියන්න තිබෙන්නේ, අපේ කලාපයේ තිබෙන සෙසු රටවල ආරක්ෂක තත්ත්වය ගැනත් හිතනකොට, පාස්කු ඉරුදින ප්‍රහාරයේ අත්දැකීම් ගැනත් හිතනකොට, සංචාරක ව්‍යාපාරයට රටේ ජාතික ආරක්ෂාව ඉතාම වැදගත් වනවාය කියන එක අපි කල්පනාවට ගත යුතුව තිබෙන බවයි. මොකද රටේ ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් ඇති වුණොත්, අපේ සංචාරක ව්‍යාපාරය හුහක්දුරට පසු බසිනවා.

මම අවසාන විනාඩි කිහිපයේදී අපේ දිස්ත්‍රික්කයටත් එක ලෙස බලපාන අධිකරණ ක්ෂේත්‍රයේ අඩු පාඩු කිහිපයක් ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have two more minutes.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මට තව අමතර විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

නීතිඥයන්ගේ කටයුතු කරගෙන යන්න අවශ්‍ය නිල කාමර නැති එක අද විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. සමහර තැන්වල නීතිඥ පරිශ්‍ර තිබෙනවා. විශේෂයෙන්ම අපේ දිස්ත්‍රික්කයේ බලපිටිය, ඇල්පිටිය, උඩුගම වැනි අධිකරණ සංකීර්ණ තිබෙන තැන්වලත්, නීතිඥයන්ට ඉඩ පහසුකම් නැති එක අද ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඒ ස්ථාන ගැන අවධානයට ලක් කරලා තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නඩු වාර්තා ගන්න ගියාමත් නීතිඥයන්ට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වනවා. අපි දන්නවා, දැනට අවුරුදු 25කට, 30කට කලින් උප්පැන්න සහතිකයක් ගන්න වුණොත්, ඒ අදාළ ලියාපදිංචි කරපු කාර්යාලය හොයාගෙන රටේ කොහේට හරි යන්න ඕනෑ. නමුත්, අද එහෙම නොවෙයි. කන්කසන්තුරේ, යාපනය හා මඩකලපුව වාගේ ප්‍රදේශවල කෙනෙකුට වුණත්, ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගිහිල්ලා රුපියල් 100ක් ගෙව්වාම ඉතා ඉක්මනින් උප්පැන්න සහතිකය ගන්න පුළුවන්. අපි අහලා තිබෙන විධියට, මේ වැඩ පිළිවෙළ ඇති කළ යුතු බව 70 දශකයේ මුල් භාගයේ දිවංගත රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී කියලා තිබෙනවා.

එතකොට එතුමාට හිනාවෙලා තිබෙනවා; සමච්චල් කරලා තිබෙනවා. නමුත්, එතුමා ජනාධිපති වුණාට පස්සේ වසර 50ක්, 60ක් පරණ උප්පැන්නයක් වුණත් පරිගණකගත කරන්න පටන් ගත්තා. එහි ප්‍රතිඵලයක් හැටියට දැන් රටේ ඕනෑම පුරවැසියෙකුට ක්ෂණිකව ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගිහිල්ලා උප්පැන්න සහතිකයේ පිටපත ගන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඒ විධියටම උසාවිවල නඩු වාර්තා ආදියත් පරිගණකගත කරනවා නම් ඒක රටේ ජනතාවටත්, අපේ නීතිඥ ප්‍රජාවටත් ලොකු සහනයක් වේවි. අද වනකොට නීතිඥවරු පෙනී සිටින නඩුවලට අවශ්‍ය නඩු වාර්තා ගන්න එක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. බොහෝ වෙලාවට ඊළඟ නඩු දිනයටත් ඒ නඩු වාර්තා ලබා ගන්න බැරිව ගිහින් තිබෙනවා. මේකට ප්‍රධාන හේතුව තමයි, උසාවිවල ප්‍රමාණවත් තරම් පරිගණක නොමැති වීම. ජනාධිපතිතුමාගේ කථාවේදීත් කිව්වා, පරණ පරිගණකයට තට්ටු කළාම තමයි වැඩ කරන්නේ කියලා. ඒ නිසා ප්‍රමාණවත් තරම් පරිගණක දෙනවා නම් වටිනවා. නමුත්, පරිගණක ක්‍රියාකරුවන් ඇත්තේත් නැහැ. එම නිසා මේ ප්‍රශ්න දිහාත් ඔබතුමා බලන්න.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම තිබෙන අනෙක් ලොකුම ප්‍රශ්නය තමයි, නඩු ප්‍රමාදය. විශේෂයෙන්ම ඉඩම් නඩු ගැන කථා කරනකොට අපේ රටේ මිනිසුන් අතර සාමාන්‍ය කියමනක් තිබෙනවා, යම් දෙයක් ඕනෑවටත් වඩා වැඩි කාලයක් ඇදෙනවා නම් හරියට ඉඩම් නඩුවකට පැටලුණා වාගේ කියලා. මම හිතන විධියට නඩු ලක්ෂ ගණනක් ගොඩගැහිලා තිබෙනවා. මේක මහේස්ත්‍රාත් උසාවිවල, දිස්ත්‍රික් උසාවිවල, මහාධිකරණවල, අභියාචනාධිකරණයේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ පවා දකින්න තිබෙන පොදු ගැටලුවක්. මේකට බලපාන ප්‍රධාන හේතුවක් තමයි, විත්තිකරුවන්ට සිතාසි ආදිය භාර දීමේදී ඇති වන ප්‍රමාදය. මේ ගරු සභාවේ නීතිඥ මහත්වරු ගොඩක් ඉන්නවා. අපට වඩා ඒ ගැන එතුමන්ලා හොඳට දන්නවා ඇති. දැනට සිතාසි භාර දීම කරන්නේ පිස්කල්වරු සහ ග්‍රාම නිලධාරි මාර්ගයෙන්. සමහර වෙලාවට මේ සිතාසි භාර දෙන්න විත්තිකරුවන් සොයා ගන්න බැරිව යනවා. සමහර විත්තිකරුවන් හිතාමතාම මේ සිතාසි භාර ගැනීම මඟ හරිනවා. මෙවැනි දේවල් ලොකු බලපෑමක් කරනවා, මේ නඩු ප්‍රමාදයට. අපේ රටේ අධිකරණවල නඩු ගොඩගැසීමට මෙවැනි සිදුවීම් හේතුවෙලා තිබෙනවා. අපි දැක තිබෙනවා, හිටපු අධිකරණ ඇමතිවරු අලුත් තාක්ෂණය භාවිත කරලා සිතාසි භාර දීමේ නව ක්‍රමයක් ඇති කරන්න උත්සාහ කරපු අවස්ථා. එක් අවස්ථාවක් හැටියට 2017 අංක 8 දරන පනතින් සිවිල් නඩු විධාන

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සංග්‍රහයේ 28වන වගන්තිය සංශෝධනය කරලා, සෑම නීතිඥවරයෙකුටම විද්‍යුත් ලිපිනයක් ලබා දිය යුතුයි කියලා නව නීති සම්මත කළා. 2024 අංක 43 දරන පනත මඟින් electronic ක්‍රමයට නියෝග හෝ සිතාසි භාර දීමට පුළුවන් බවට නීති සම්මත කර ගත්තත් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, ඒ සඳහා රෙජිස්ට්‍රාර්වරුන්ටත් එම පහසුකම් ලබා දෙන්න ඕනෑ වීමයි. ඒ වාගේම WhatsApp පහසුකම් තිබෙන දුරකථන ආදිය ලබා දිය යුතුව තිබෙනවා. මේ අඩුපාඩු නිසා, නීති සම්මත කළාට ප්‍රායෝගිකව ඒවා ක්‍රියාත්මක කිරීමේ ගැටලු මතුවෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you time is over. Please wind up now.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව විනාඩියකින් මගේ කථාව අවසන් කරන්නම්.

ඒ වාගේම විනිශ්චයකාරවරුන්ට ස්ථාන මාරුවක් ලැබුණාම ඒ අයගේ දරුවෝ ඒ අදාළ ප්‍රදේශයේ තිබෙන ජනප්‍රිය පාසලකට ඇතුළත් කිරීමේ හැකියාව තිබුණා. මේ වෙනකොට ඒ පහසුකම් ඉවත් කර තිබෙනවා. එවැනි මට්ටමේ කෙනෙක් කාගේවත් ළඟට ගිහිල්ලා, කාගේවත් පස්සෙන් ගිහිල්ලා ඒවා කරගන්න ගියොත් මම හිතන විධියට ඒක අධිකරණයේ ස්වාධීනත්වයටත් බලපාන ප්‍රශ්නයක් වෙනවා. එම නිසා ඒ ගැනත් කල්පනා කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

දැන් නීතිඥවරු බිහි වෙන්නේ නීති විද්‍යාලයෙන් පමණක් නොවෙයි. අපේ අධිකරණ ඇමතිතුමන්ලා වාගේ පිට රට ගිහිල්ලා ඒ විශ්වවිද්‍යාලවලින් ඉගෙන ගෙන ලංකාවට ඇවිල්ලා නීතිඥවරු වන පිරිසකුත් අද අපේ රටේ ඉන්නවා. මම හරියටම ඒ ගැන දන්නේ නැහැ. වසරකට 2,000ක්වත් අලුතින් මේ වෘත්තියට ඇතුළත් වෙනවා කියලා තමයි අපි අහලා තිබෙන්නේ. ඒ නිසා නීතිඥයන් අතර ලොකු තරගයක් ඇතිවෙලා තිබෙනවා. සමහරු වෘත්තීය ගරුත්වයට නොගැළපෙන දේවල් කරන්නත් පෙලඹෙනවා. හොර ඔප්පු ලියනවා වාගේ නොයෙකුත් දේවල් කරන්න සමහර නීතිඥවරු පෙලඹෙනවා. එම නිසා මේ වෘත්තියට ගැළපෙන විධියට ඒ අයට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා රජයේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you time is over. Please wind up.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තත්පර කීපයකින් මම කථාව අවසන් කරන්නම්.

අපේ දිස්ත්‍රික්කයේ ඉමදූව, හබරාදූව වාගේ ප්‍රදේශ ආවරණය වන පරිදි උසාවියක් ස්ථාපනය කළොත් ඒ ජනතාවට ඒක සහනයක් වෙයි. අපේ ගරු ඇමතිතුමාගේ කාලයේ ඒක කළොත් හොඳයි. මොකද, ඔබතුමා කොළඹින් ඡන්දය ඉල්ලුවාට ගාලු දිස්ත්‍රික්කයේ ඉඩකඩම් තිබෙන, ඥාතීන් ඉන්න ඇමතිවරයෙක්. ඔබතුමා ගාල්ලට උරුමයක් තිබෙන කෙනෙක් නිසා ඒ ගැන අවධානය යොමු කරන්න.

මීට වඩා කථා කරන්න කාලය නැති නිසා අවසාන වශයෙන් මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. එන්න එන්න ජනගහනය වැඩි වෙනකොට අධිකරණවල නඩුත් වැඩි වෙනවා. ඊට සරිලන විධියට අපේ උසාවි පද්ධතියත් සකස් කිරීමට අවධානය යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා. මේ අංශ දෙක ගැනම යමක් කියන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Harshana Rajakaruna. You have nine minutes.

[අ.භා. 3.17]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තමුන්නාන්සේලා බලය ලබා ගන්නකොට මේ රටේ ජනතාවට විශාල බලාපොරොත්තුවක් තිබුණා, විශේෂයෙන්ම පසුගිය කාලයේ විසඳුණේ නැති නඩු පිළිබඳව.

මීට වසර කිහිපයකට කලින් මේ රටේ කථා බහට ලක් වුණු, අනිවාර්යයෙන්ම සාධාරණයක් විය යුතු පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන ඔබතුමන්ලා දන්නවා. තමුන්නාන්සේලා මැතිවරණවලදී ඉතා පැහැදිලිවම ප්‍රකාශ කළා, ඉතා කෙටි කාලයක් තුළ පාස්කු ඉරුදින ප්‍රහාරයේ මහ මොළකරු සහ ඊට සම්බන්ධ පුද්ගලයන් නීතිය හමුවට ගෙනෙනවා කියලා. දැන් අවුරුද්දක් ගතවෙලා තිබෙනවා. අපට මතකයි, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා පසුගිය දා පාස්කු දිනය සමරමින් "අනිවාර්යයෙන්ම එහි වගකිව යුත්තන් හෙළි කරනවා" කිව්වා. මාධ්‍යයට ඇවිල්ලා තමයි එතුමා එහෙම කිව්වේ. නමුත්, දැන් තමුන්නාන්සේලා ඒ ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ. ඒක දැන් අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාටත් අමතක වෙලා, තමුන්නාන්සේලාටත් අමතක වෙලා.

මේ රටේ ජනතාව බලාගෙන හිටියා, පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳව සත්‍ය සොයයි කියලා. ඇත්තටම තමුන්නාන්සේලා මැතිවරණයේදී පාස්කු ප්‍රහාරය වික්කා. ගම්පහ දිස්ත්‍රික්කයේ අපේ ප්‍රදේශවල වුණත්, විශේෂයෙන්ම තමුන්නාන්සේලා පාස්කු ප්‍රහාරය විකුණපු නිසා තමයි සමස්තයක් හැටියට කතෝලික ජනතාව තමුන්නාන්සේලාට ඡන්දය දුන්නේ. කාදිනල්තුමාත් රැවටුවා. තමුන්නාන්සේලා ඒ කිව්ව දේවල්වලට කාදිනල්තුමාටත් ලොකු විශ්වාසයක් ඇති වුණා. කියන්න ඉතාම කනගාටුයි, දැන් ඒ පිළිබඳව කථා කරන්නේවත් නැහැ.ඒ විතරක් නොවෙයි. අපට මතකයි, එදා අනුර කුමාර දිසානායක මැතිතුමා අපිත් එක්ක මේ පැත්තේ වාඩිවෙලා ඉන්නකොට එතුමාටත් වුවමනා වෙලා තිබුණා, මේ පරීක්ෂණය තවත් සාර්ථක කර ගන්න ජාත්‍යන්තර වශයෙනුත් උදවු ගන්න. එතුමාත් ඉතා පැහැදිලිවම පිළිගත්තා, Scotland Yard වාගේ විශේෂඥ දැනුමක් සහිත සංවිධානයකට ඒ පරීක්ෂණ කටයුතු සඳහා අවස්ථාව ලබා දෙන්න ඕනෑ කියලා. හැබැයි, අද ආණ්ඩුවට ඇවිල්ලා එතුමා Scotland Yard එකත් අමතක කරලා තිබෙනවා. තමුන්නාන්සේලා ඒ ගැන කථා කරන්නේ නැහැ.

තමුන්නාන්සේලා දිගින් දිගටම කිව්ව කාරණයක් තමයි, පසුගිය රාජපක්ෂ යුගයේ සිදු වූ මාධ්‍යවේදීන්ගේ ඝාතන සහ හිරිහැර. ප්‍රගීත් එක්නැලිගොඩ මැතිතුමාට මොකක්ද වුණේ? එහි

සත්‍ය සොයන්න තවම හැකිවෙලා නැහැ. තමුන්නාන්සේලා මුලදී ඒ ගැන අවධානය යොමු කරලා තිබුණා. ඒ වාගේම ලසන්ත වික්‍රමතුංග ඝාතනය පිළිබඳ පරීක්ෂණ කරනවා කිව්වා. තමුන්නාන්සේලා වේදිකාවක්, වේදිකාවක් ගාණේ කිව්ව දේවල් තමයි මේ. අවුරුද්දක් ගත වුණත් තවමත් ඒ පිළිබඳව සොයා බලා නැහැ. ඒ විතරක් නොවෙයි. "සිරස" ආයතනයට, "සියත" ආයතනයට බෝම්බ ප්‍රහාර එල්ල කරලා, ඒ මාධ්‍ය ආයතනවලට කරපු හානිය පිළිබඳව අපි තමුන්නාන්සේලාට මතක් කරනවා. කරුණාකරලා ඒ පිළිබඳව අවධානය යොමු කරලා, ඒ පරීක්ෂණවලට ප්‍රමුඛත්වයක් ලබා දීලා කටයුතු කරන්න කියලා අපි කියනවා.

ඒ වාගේම තමයි, තාජුඩීන් ඝාතනය. තාජුඩීන් ඝාතනය පිළිබඳව මීට මාස කිහිපයකට කලින් කථා බහට ලක් වුණා. හැබැයි, දැන් ඒකත් යට ගිහිල්ලා තිබෙනවා. අපි ඉල්ලීමක් කරනවා, මේ රටේ මෑත ඉතිහාසයේ සිදු වුණු ඉතාම කනගාටුදායක අපරාධ පිළිබඳව ඔබේ අවධානය යොමු කරන්න කියලා. ඔබේ ආණ්ඩුකරණය තුළ ප්‍රමුඛත්වයක් ලබා දිය යුතු කාරණා පිළිබඳව තමයි මම මේ කියන්නේ. මම හිතන්නේ නැහැ, මේ රටේ කවුරුවත් ඊට විරුද්ධ වෙයි කියලා. විපක්ෂයක් හැටියට අපි හැමෝම ඒකමතිකව තමුන්නාන්සේලාට බල කරනවා, කරුණාකරලා මේවා සම්බන්ධ අධිකරණ ක්‍රියාවලිය වේගවත් කිරීමට තමුන්නාන්සේලාට කළ හැකි හැම දෙයක්ම කරන්න කියලා. විශේෂයෙන්ම පාස්කු ඉරුදින ප්‍රහාරය, ලසන්ත වික්‍රමතුංග ඝාතනය, ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීම, "සිරස", "සියත" වාගේ ආයතනවලට කරපු ප්‍රහාර වාගේම තාජුඩීන් ඝාතනය පිළිබඳවත් වැඩි අවධානයක් යොමු කරන්න කියලා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මේ අධිකරණ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා කටයුතු කිරීමටත් තමුන්නාන්සේලා විශේෂ අවධානයක් යොමු කරන්න. මොකද, දැන් සමස්තයක් හැටියටම මේ අධිකරණ ක්‍රියාවලිය වේගවත් කළ යුතුමයි. ඇත්තටම සමහරු අධිකරණයේ නඩුවක් ගොනු කරන්න අධිකරණයට යෑමටත් මැළිකමක් දක්වනවා. මොකද, "අධිකරණයට ගියොත් අපට අවුරුදු 10ක්, අවුරුදු 15ක් බලාගෙන ඉන්න වෙයි. එතකොට අපි මැරිලා තියේවි." කියලා සමහර අය කියනවා. අධිකරණයට යන්නවත් බොහෝ අය මැළිකමක් දක්වනවා. එම නිසා මේ අධිකරණය ක්‍රියාවලිය වේගවත් කිරීම අත්‍යවශ්‍යයි. ඒක, එක දෙයකට පමණක් සීමා විය යුතු දෙයක් නොවෙයි, සමස්තයක් හැටියට සිදු විය යුතු කාරණයක්. තමුන්නාන්සේලාත් ඒක පිළිගනියි. ඒ නිසා ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

විදේශ කටයුතු අමාත්‍යාංශය ගැනත් මේ අවස්ථාවේදී සඳහන් කළ යුතුයි. තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්නකොට, එවකට පැවැති ආණ්ඩු වෙනත් රටක් එක්ක යම් ගිවිසුමක් අත්සන් කරනකොට, තමුන්නාන්සේලා නිතරම කියපු කාරණාවක් තමයි ඒ ගිවිසුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියන එක. මට මතක් වෙනවා, විජිත හේරත් මන්ත්‍රීවරයා එවකට ජනතා විමුක්ති පෙරමුණේ විදේශ කටයුතු භාරව හිටපු පුද්ගලයා. විදේශ කටයුතු භාරව හිටපු පුද්ගලයා හැටියට එතුමා මේ විපක්ෂය පැත්තේ ඉඳිමින් හැම දාම කළේ මොකක්ද? එවකට පැවැති රජය යම් ගිවිසුමක් අත්සන් කළා නම්, එතුමා කියනවා අනිවාර්යයෙන්ම ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. අනුර කුමාර දිසානායක මැතිතුමාත් අනිවාර්යයෙන්ම කියනවා, ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න, ඒක ජනතාව දැන ගන්න ඕනෑ, පාර්ලිමේන්තුව දැන ගන්න ඕනෑ කියලා. දැන් ඔබතුමන්ලා මේ කෙටි කාලය තුළ චීනය සමඟ ගිවිසුම් 18කට පමණ එකඟ වෙලා තිබෙනවා. ඉන්දියාව සමඟ ගිවිසුම් 8කට එකඟ වෙලා තිබෙනවා. ඊයේ-පෙරේදා ඇමෙරිකාව සමඟ ගිවිසුම්ගත වුණා. අපි අහනවා, තමුන්නාන්සේලාට අර අමතක වීමේ රෝගය වන amnesia කියන රෝගය හැදිලාද කියලා? එදා තමුන්නාන්සේලා කියපු දේ අද කරන්නේ නැත්තේ මොකද? අද තමුන්නාන්සේලාට ඒ ගිවිසුම් ගැන මේ පාර්ලිමේන්තුව දැනුවත් කිරීමට හැකියාවක් නැද්ද? තමුන්නාන්සේලා විපක්ෂයේදී කියපු දේවල් ආණ්ඩුවට පත් වුණාට පසුව ආදර්ශයක් හැටියට ක්‍රියාත්මක කරන්න, මේ පාර්ලිමේන්තුවට එම ගිවිසුම් පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්නය කියලා මේ වෙලාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම සංචාරක අමාත්‍යාංශය ගැනත් මම ඉතා කෙටියෙන් කාරණාවක් ප්‍රකාශ කරන්න ඕනෑ. සංචාරක වීසාවලින් පැමිණෙන සංචාරකයන් අපේ රට තුළ ව්‍යාපාර ආරම්භ කර තිබෙනවා. සංචාරක වීසා අරගෙන අපේ රටට පැමිණෙන විදේශිකයන් අපේ රටේ තිබෙන සංචාරක ප්‍රදේශවල - දකුණේ වෙන්න පුළුවන්, එහෙම නැත්නම් වෙනත් වෙරළ තීරවල වෙන්න පුළුවන් - ව්‍යාපාර කරනවා. ඒ ව්‍යාපාර තුළින් ලංකාවට ආදායමක් ලැබෙන්නේ නැහැ. ඒ ව්‍යාපාරවලින් කෙළින්ම පිටරට බැංකුවලට තමයි මුදල් යන්නේ. එම නිසා විදේශිකයන් සංචාරක වීසාවලින් ලංකාවට ඇවිල්ලා ව්‍යාපාර කිරීම පිළිබඳව සම්පූර්ණ විරෝධය ප්‍රකාශ කරමින්, ඔබතුමන්ලා ඒ කාරණයට මැදිහත්ව සාධාරණය ඉටු කරන්න කියා අපි ඉල්ලා සිටිනවා. මොකද, අපේ රටේ සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට බාධාවක් වෙන විධියට මේ ව්‍යාපාර සිදු වෙනවා. ඒ ගැන අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. (Mrs.) Thushari Jayasinghe. You have eight minutes.

[අ.භා. 3.26]

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පාලනයට අදාළ වන මූලික ආයතන තුනෙන් එක බල කණුවක් තමයි අධිකරණය. එය ප්‍රධානම ආයතනයක්. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට මෙවර අය වැයෙන් රුපියල් බිලියන 58.5ක් වෙන් කර තිබෙනවා.

මේ වාගේ මුදල් ප්‍රමාණයක් වෙන් කරලා අපි බලාපොරොත්තු වෙනවා, මේ රටේ ජනතාවට යුක්තිය ඉටු කිරීමට. අපි බලාපොරොත්තු වෙනවා, සෑම විටම නීතියේ විධානය සහ පාලනය මේ රටේ ඇති කිරීමට. නීතියේ විධානය, නීතියේ බලය රැක ගැනීම රාජ්‍ය පාලනයේ අත්‍යවශ්‍ය කටයුත්තක්. අපි රජයක් හැටියට ලෝකය ඉදිරියේ කෙළින් කථා කරනවා. අපි ඒ සඳහා ඇති කරලා තිබෙන ප්‍රධාන කාරණයක් තමයි, අධිකරණයේ ස්වාධීනත්වය රැක ගැනීම. අධිකරණ අමාත්‍යතුමා එතුමාගේ කථාවේදී පැහැදිලි කරලා කිව්වා, කොයි කොයි විධියටද අධිකරණ සඳහා මුදල් වෙන් කරලා තිබෙන්නේ කියලා. එතුමා අධිකරණ ගොඩනැඟිලි ඉදිකිරීම්, අධිකරණ කාර්ය මණ්ඩල ගැන කිව්වා. මහාධිකරණ, දිසා අධිකරණ, පූර්ව නඩු විභාග අධිකරණ ස්ථාපිත කිරීම ගැන එතුමා කිව්වා. අපි නීතිඥවරු හැටියට දන්නවා, වෘත්තිය කටයුතු කරගෙන යන කොට පූර්ව නඩු විභාග අවස්ථාව කියන එක ඉතාම වැදගත් අවස්ථාවක් කියලා. දැන් ඒක නීතියෙන් ඇති කරලා තිබුණාට, ඒ විභාගය වෙනම පවත්වන්න අපේ රටේ අධිකරණ ශාලා පහසුකම් නැහැ. ඒ අධිකරණ ශාලා පහසුකම් ඇති වෙන්නට ඕනෑ.

[ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහතා]

අවුරුදු ගණනාවක් විභාග වෙන්න තිබෙන නඩුවක පූර්ව නඩු විභාග අවධිය නීතියේ ප්‍රතිපාදන ප්‍රකාරව පවත්වාගෙන යන්න පුළුවන් නම්, නඩු කටයුතු ඉක්මනින් අවසන් කර ගන්න බොහෝ විට අවස්ථාව ලැබෙනවා. වෘත්තිය පළපුරුද්ද තුළින් අපි දන්නවා, එවැනි අවස්ථා ඉතාම වටිනවා කියලා. ඒ නිසා ඒ සඳහා භෞතික පහසුකම් සැපයීම වැදගත් කටයුත්තක්. තවත් කාරණයක් තිබෙනවා, අධිකරණ ආයතනවලට පහසුකම් සහ මූල්‍ය පහසුකම් සැලසීම සම්බන්ධව. මෙතැනදී කථා වුණා, අධිකරණය ගැන. අධිකරණයේ තිබෙන ප්‍රමාදය ගැන. ඔව්. ඒක අඩු කරගන්න අපට ගන්න පුළුවන් තව එක පියවරක් තිබෙනවා. මේ රට තුළම තිබෙනවා, අධිකරණමය කටයුතු කරන අර්ධ අධිකරණමය ආයතන කිහිපයක්. උදාහරණයක් විධියට කිව්වොත්, අපට බේරුම්කරණය සලකන්න පුළුවන්. බොහෝ ගැටලු අධිකරණයකට ගිහිල්ලා වසර ගණනාවක් ගත කරනවා වෙනුවට, ඒ පාර්ශ්වයන්ගේ එකඟත්වයෙන් බේරුම්කරණය තුළින් විසඳා ගන්න උත්සාහ දරන්න පුළුවන්. එවැනි කටයුතු දිරිමත් කරන තරමට අපට පුළුවන් වෙනවා, අධිකරණයේ කාර්ය බහුලත්වය අඩු කර ගන්න.

තව උදාහරණයක් විධියට ණය සහන මණ්ඩලය වාගේ ආයතනයක් දක්වන්න පුළුවන්. ණය සහන මණ්ඩලය ජනතාව වෙනුවෙන් ඇති කරලා තිබෙන, ජනතාවගෙන් කිසිදු මුදලක් අය කරන්නේ නැති - free of charge - මුද්දර ගාස්තුවක්වත් වැය වෙන්නේ නැති ආයතනයක්. ජනතාව ඒ වාගේ ආයතන පිළිබඳවත් දැනුවත් වෙනවා නම් උසාවිවල workload එක අඩු කර ගන්න පුළුවන්. එවැනි ආයතනයකට ගිහිල්ලා, එහිදී ලැබෙන එකඟතාවක්, තීන්දුවක් ඒ තීන්දුවෙන් බැඳී සිටින පාර්ශ්වය ක්‍රියාත්මක කරන්නේ නැත්නම්, අන්න එතැනදී විතරක් අධිකරණයේ සහාය ගන්න පුළුවන්, ලඝු නඩු කටයුත්තකින්. එවැනි කටයුතු කර ගන්න අපට හැකියාව තිබෙනවා. ඒ සඳහා ඒ ආයතන දිරිමත් කරන්න ඕනෑ, ඒවාට මූල්‍ය පහසුකම් දෙන්න ඕනෑ. අන්න ඒ සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ ආයතන තුළින් නඩු කටයුතු ඉක්මන් කිරීමේ හැකියාව ඉතාම වටිනවා.

උදේ ඉඳලා මෙතැන කථා වුණා, විනිශ්චයකාරවරුන්ට පහසුකම් සැලසීම ගැන. අපේ අධිකරණය ස්වාධීනයි. දැන් විනිශ්චයකාරවරු ගැන කිඹුල් කඳුළු හෙළීමක් පටන් අරගෙන තිබෙනවා පෙනුණා. ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා, විනිශ්චයකාරවරුන්ට ස්ථාන මාරු ලැබිලා ගියාම ඒ අයගේ දරුවෝ පාසල්වලට ඇතුළත් කර ගන්න ගැටලු තිබෙනවා කියලා. මේ හිටිහැටියේ තමයි විනිශ්චයකාරවරු ගැන අනුකම්පාවක් ඇවිල්ලා එහෙම කථා කරන්නේ. ඒ ඇයි කියලා අපට තේරෙනවා. අපි දන්නවා, මොකක්ද මේ කියන්නේ කියලා. අපි කියනවා, අපේ අධිකරණ ඉතාම අපක්ෂපාතියි කියලා. අධිකරණයේ ස්වාධීනත්වය තිබෙනවා. ඒවාට බලපෑම් සිදු වෙච්ච කාලවල් තිබුණා. නමුත් අපි ඒ ආයතන එවැනි බලපෑම්වලින් මුදවලා තිබෙනවා.

ඉතාම ගෞරවයෙන් කියනවා, ඒ වාගේම ඉතාම කරුණාවෙන් කියනවා, ඔය ඇමවලට උගත් ගරු අධිකරණය නැවෙන්නේ නැති බව. දැන් ඒ කාලය ගිහිල්ලා. "මෙන්න මෙහෙමයි" කියලා ඔබතුමන්ලා ඔය කියන්නේ "අපි දිහා බලන්න" කියන එක නේ. ඔය නොකියා කියන්නේ ඒක නේ. විනිශ්චයකාරවරුන්ගේ අඩු පාඩු ගැන කථා කරන්න හේතු වෙලා තිබෙන්නේත් ඒක නේ. ඔය කොච්චර කොහොම කථා කළත් 21වැනි දාට ඔච්චර තමයි. දැන් එක එක්කෙනා හැලෙනවා; 21වැනිදාට නොයන්න හේතු පහදනවා. 21වැනිදාට නොගිහින් ඉන්න හේතු දැක්වීම් තමයි ඔය කරමින් යන්නේ. අපට ඒක තේරෙනවා. ඒ වාගේම කාරණයක් තමයි මේ කියන්නේත්. ඒ කොහොම කිව්වත්, අධිකරණයට බලපෑමක් කරන්න ඔබට බැහැ; කරන්න හැකියාවකුත් නැහැ; එහෙම වෙන්නේත් නැහැ. අපි ඒක දන්නවා.

ඒ වාගේම මෙතැනදී කථා කළා, නඩු වාර්තා ප්‍රමාදය ගැනත්. අපි කියනවා, නඩු වාර්තා ප්‍රමාදයක් අධිකරණවල තවමත් පවතින බව. එය අවම කරන්න තමයි අපි ඩිජිටල්කරණය සහ අනෙකුත් පහසුකම් ලබා දී තිබෙන්නේ, එවැනි පහසුකම් සලස්වමින් යන්නේ. හැබැයි, අපි අමතක කරන්න හොඳ නැහැ, නඩු වාර්තාවක් ගන්න අධිකරණයේ කඩදාසි තිබුණේ නැති යුගයක් තිබුණු බව. එදා අදාළ අයට කිව්වා, කොළ ගෙනැල්ලා දුන්නොත් පිටපත ගහලා දෙන්නම් කියලා. අපි එවැනි යුගයක් පසු කරමින් ආවේ නැද්ද? එදා එහෙම තමයි මේ රටේ සිද්ධ වුණේ. අපට එය මතකයි. එවැනි යුගයක මේ රට පාලනය කරපු නායකයන් තමයි දැන් නඩු වාර්තා ප්‍රමාදයක් ගැන කථා කරන්නේ. මම හිතන්නේ නැහැ, එදා වාගේ යුගයක් දැන් තිබෙනවා කියලා. දැන් සාමාන්‍ය වශයෙන් කටයුතු සිද්ධ වෙමින් පවතිනවා. අපට කිසිම බාධාවක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up.

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
මා මුලින්ම කිව්වා වාගේ නඩු කටයුතු ප්‍රමාදයෙන් තොරව කරගෙන යෑමට අවශ්‍ය මුදලත් ඇතුළුව තමයි මේ රුපියල් බිලියන 58.5ක් වෙන් කරලා තිබෙන්නේ. මේ අය වැය සම්මත කර ගැනීමෙන් අනතුරුව මේ කියන බාධකවලින් තොරව අධිකරණ ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා කටයුතු කරන්න හැකියාව ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.34]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරන මේ මොහොතේ අපේ දිස්ත්‍රික්කයට බලපාන ප්‍රධාන කර්මාන්තයක් වන සංචාරක කර්මාන්තය ගැන අදහස් හා යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්න මම මේ අවස්ථාවේ බලාපොරොත්තු වෙනවා.

සංචාරක ව්‍යාපාරය කියන්නේ, ලංකාවට ආදායම් උත්පාදනය කරන ප්‍රධාන ක්‍රම තුනෙන් එකක්. අපේ රටේ සංචාරක ව්‍යාපාරය දියුණු කළ හැකි විශාල වැඩ පිළිවෙළ රාශියක් තිබෙනවා. මේ රට සුන්දර දේශගුණයක්, සුන්දර වෙරළ තීරයක්, සුන්දර කඳුකරයක් සහිත ආසා හිතෙන රටක්; ආකර්ෂණීය රටක්; අභිමානවත් රටක්. මේ රට, නිධානයක්. සුන්දර මිනිසුන් ඉන්න මේ රට නිධානයක්. මේ නිධානය මඟින් සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න පුළුවන් වැඩ පිළිවෙළ, ව්‍යාප්ති විශාල ප්‍රමාණයක් තිබෙනවා. නමුත් ඉදිරි වර්ෂය සඳහා සංචාරක අමාත්‍යාංශයේ දියුණුව වෙනුවෙන්, ඉදිරි නැග්මක් වෙනුවෙන් වන කිසිම වැඩ පිළිවෙළක් මේ අය වැයෙන් ඉදිරිපත් කරලා තිබෙන බවක්

පෙනෙන්නට නැහැ. අපේ සංචාරක ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා හැම තිස්සේම වාගේ රට යනවා. අපේ ජනාධිපතිතුමා සමඟත් රට යනවා. ගරු ඇමතිතුමනි, රට රටවලට යන ඔබතුමා ඒ රටවල් සමඟ සාකච්ඡා කරලා අපේ රටේ සංචාරක කර්මාන්තයේ දියුණුවට කටයුතු කරන්න ඕනෑ.

අපේ හරින් ප්‍රනාන්දු හිටපු ඇමතිතුමා යහපාලන ආණ්ඩුව කාලයේ මේ රටට සංචාරකයන් ගෙන්වා ගැනීමේ වැඩ පිළිවෙළ සාර්ථකව ක්‍රියාත්මක කළා. 2018, 2019 වර්ෂවල සංචාරකයන්ගේ පැමිණීම වාර්තාගත එකක් වුණා. 2019දී හොඳම සංචාරක ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව නම් කළා. එදා හොඳ ආදායමක් උත්පාදනය වුණා, කොරෝනා වසංගත අවස්ථාවේදීත්. එදා යහපාලන රජය කාලයේදී හරින් ප්‍රානාන්දු මැතිතුමා සංචාරක ක්ෂේත්‍රයෙන් අපේ රටට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ලබා ගන්න කටයුතු කළා. මේ රජයටත් අපි කියන්නේ, සංචාරක කර්මාන්තය මේ රටට ආදායම් උත්පාදනය කරන හොඳ කර්මාන්තයක් බවයි. ඒ නිසා මේ කර්මාන්තය නඟාසිටුවන්න ඔබතුමන්ලාත් කටයුතු කරන්න කියා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

අපේ දිස්ත්‍රික්කය ගත්තොත්, අපේ දිස්ත්‍රික්කයේ කෙරෙන ප්‍රධාන කර්මාන්ත තමයි කෘෂි කර්මාන්තය, ධීවර කර්මාන්තය සහ සංචාරක කර්මාන්තය.

අපේ දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය ආරම්භ කළේ වැල්ලකරයේ ඉන්න ධීවර ජනතාවගේ දරුවෝ. ඒ දරුවෝ ඒක ආරම්භ කළේ, තමන් ඉන්න ඉඩමේ හෝ ගෙදර කාමර 3ක්, 4ක්, 5ක්, 6ක් හදාගෙන, මුහුදු වෙරළත් පිරිසිදු කරගෙන. සංචාරක ව්‍යාපාරය එදා බිම් මට්ටමින් ආරම්භ කළේ ධීවර ජනතාවගේ දරුවෝ. මම අද ඒ ගැන කාරණා කිහිපයක් කියන්න බලාපොරොත්තු වෙනවා.

එදා guest-houses හදාගෙන අපේ දිස්ත්‍රික්කයේ බිම් මට්ටමින් ආරම්භ කරපු සංචාරක ව්‍යාපාරයට කිසිම සහයෝගයක් මේ රජයෙන් ලබා දෙන්නේ නැහැ. පසුගිය රජය කාලයේ අපි ඒ සහයෝගය පෞද්ගලිකව ලබා දුන්නා. සුළු පරිමාණ වශයෙන් සංචාරක ව්‍යාපාරයේ නියැළෙන ඒ ව්‍යාපාරිකයන්ට අද බියර් බෝතලයක් විකුණා ගන්න අවස්ථාවක් ලබා දෙන්නේ නැහැ. ගරු සංචාරක ඇමතිතුමනි, මේ කාරණයට හොඳින් සවන් දෙන්න. අද five-star, three-star හෝටල් ඔක්කෝටම අවශ්‍ය බලපත්‍ර ආදි සෑම දෙයක්ම තිබෙනවා. ඒ වාගේම රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ කාලයේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධන වැඩසටහන යටතේ බාර් පර්මිට් ලබා දුන්නා. නමුත්, ඒ guest-house හිමියන්ට ඒවා ලැබුණේ නැහැ.

අද ලංකාව පුරා සුළු පරිමාණයෙන් ව්‍යාපාර කටයුතු කරන guest-house හිමියෝ 8,000ක් 10,000ක් විතර ඉන්නවා. මම මේ කියන්නේ ඒ අය ගැන. ඒ guest-house හිමියන්ට ඒ බලපත්‍රය ලැබිලා නැහැ. මම උදාහරණයක් කියන්නම්. තංගල්ල නගර සභා බල ප්‍රදේශයේ, තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ guest-houses 400කට වඩා තිබෙනවා. අපේ ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාවේ ඉන්නවාද දන්නේ නැහැ. එතුමාත් දන්නවා, ඒ කට්ටිය ඒ ව්‍යාපාරය කරගෙන යන බව. එම බල ප්‍රදේශයේ guest-houses 400ක් විතර තිබෙනවා. ඒ guest-houses 400ට අද බියර් බෝතලයක් විකුණා ගන්න අවස්ථාව ලබා දෙන්නේ නැහැ. ඒවාට පොලීසියෙන් පනිනවා, සුරාබදු දෙපාර්තමේන්තුවෙන් පනිනවා, ගාල්ල සුරාබදු විශේෂ මෙහෙයුම් ඒකකයෙන් එනවා, පානදුර වලාන දූෂණ මර්දන ඒකකයෙන් එනවා. මේ ආයතන හතරපහෙන්ම වර්ෂයකට තුන්හතර වතාවක් ඇවිල්ලා දඩ ගහනවා.

මම කියන්නේ මේකයි. මහා පරිමාණ හෝටල් හිමියන්ට බාර් පර්මිට් තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා දුන්නා, කාමර 7ක් සහ පොඩි restaurant එකක් හිමි අයට ලිකර් බලපත්‍රය. නමුත්, කුඩා ආර්ථික ඉපැයීමක් කරන, බිම් මට්ටමේ කාමර 4ක්, 5ක්, 6ක්, 7ක් තබාගෙන, මුහුදු වෙරළ ආරක්ෂා කරගෙන සංචාරක ව්‍යාපාරයේ නියැළෙන කෙනාට සංචාරකයාට බියර් බෝතලයක් විකුණා ගන්න අවස්ථාව දෙන්නේ නැහැ. ඒ guest-houses සියල්ලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බලපත්‍ර ලබාගෙන තිබෙන්නේ. ප්‍රාදේශීය සභාවේ, නගර සභාවේ business registration එක අරගෙන තිබෙන්නේ. ප්‍රාදේශීය සභාවට, නගර සභාවට පුළුවන්, සුරාබදු අධිකාරියට ගෙවනවා හා සමාන බද්දක් ඒ guest-houses 400න් අය කර ගන්න. ගරු ඇමතිතුමනි, තංගල්ල ප්‍රදේශයේ තිබෙන guest-houses 400න් වර්ෂයකට රුපියල් 50,000 බැගින් අය කරන්න. අය කරලා බලපත්‍ර දෙන්න. සංචාරකයන්ට පමණක් බියර් බෝතලයක් විකුණන්න බලපත්‍රය ලබා දෙන්න. රුපියල් 50,000 බැගින් ගත්තොත්, ඒ හෝටල් ආශ්‍රයෙන් රුපියල් ලක්ෂ 20ක ආදායමක් ඒ ප්‍රාදේශීය සභාවට, නගර සභාවට ලැබෙනවා. එතකොට ඒ ප්‍රදේශය පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියට ඒ මුදල් යොමු කරන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, අපේ ආණ්ඩුව කාලයේ, රාජපක්ෂ ආණ්ඩුව කාලයේ අපි පොලිස් අධිකාරිතුමාට කථා කරලා, සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න නම්, ඒ guest-housesවලට පනින්නේ නැතිව, බියර් අල්ලන්නේ නැතිව, ඒවා සම්බන්ධයෙන් රාජකාරි කරන්නේ නැතිව ඉන්න කියලා උපදෙස් දීලා අපි ඒ අවසරය ලබා දීමේ කටයුත්ත කළා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමාත් ඒ දේ කරලා දෙන්න කියලා. එමඟින් හොඳ ආදායමක් උපයාගන්න පුළුවන් වෙයි. මොකද, රට වටේ එවැනි guest-houses 8,000ක්, 10,000ක් විතර තිබෙනවා. සෑම ප්‍රාදේශීය සභාවකටම, නගර සභාවකටම යම් මුදලක් උත්පාදනය කර ගනිමින් ඒ ව්‍යාපාරිකයන්ට ඒවා කරගෙන යන්න ඉඩ ලබා දෙන්න පුළුවන්. සංචාරකයන්ට පමණක් අළෙවි කිරීම සඳහා beer case එකක් තියා ගන්න අවසර දෙන්න. ඒ කියන්නේ, බියර් බෝතල් 12ක්. ඒක ඉවර වුණාම තව බියර් බෝතල් 12ක් ගෙනෙයි. එම ව්‍යාපාරය දියුණු කරන්න ඕනෑ නම්, අන්න ඒ අවසරය ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

ඊළඟ ලොකුම ප්‍රශ්නය මා කියන්නම්. මේක "බිග් කුච්චන්" එකක් නොවෙයි, big problem එකක්.

ලංකාවේ ආර්ථිකයට වැඩියෙන්ම ආදායම් උත්පාදනය කරන්නේ සංචාරක ව්‍යාපාරයෙන්. හම්බන්තොට දිස්ත්‍රික්කයේ යාල ජාතික වනෝද්‍යානයෙන් තමයි විශාල ආදායමක් උත්පාදනය කරන්නේ. එතකොට, යාල වනෝද්‍යානය තිස්සමහාරාමය අවට ජීප් 727කට බලපත්‍ර ලබා දීලා තිබෙනවා. 2017දී බලපත්‍ර ලබා දීම නතර කරලා තිබෙනවා. 567කට බලපත්‍ර තිබෙනවා. 175කට බලපත්‍ර නැහැ. ඒ නිසා පසුගිය දවස්වල උද්ඝෝෂණය කළා. සෆාරි ජීප්වලට යන්න දුන්නේ නැහැ, පොලීසියෙන් ඇවිල්ලා සෆාරි ජීප් නතර කළා. ලොකු බලපෑමක් කළා. ඒ දේශපාලන බලපෑම්ද කියලා මම දන්නේ නැහැ. හැබැයි, ඔබතුමන්ලා දේශපාලන බලපෑම් කරන්නේ නම් නැහැ. මම හිතන විධියට ඒ සියලුදෙනා, සියයට 90ක් ඡන්දය දුන්නේ ජනතා විමුක්ති පෙරමුණට. ඒ අපේ හිතවතුන්, අපේ මිත්‍රයෝ, අපේ යාළුවෝ. ඒ අය අපට ඡන්දය දුන්නේ නැහැ. ඒ ඔක්කෝම ඡන්ය දුන්නේ ජනතා විමුක්ති පෙරමුණට. ඒ වුණත් මම ඒගොල්ලන් ගැන කථා කරන්න ඕනෑ. ඒ අපේ ගමේ මිනිස්සු. ඒ ජීප් 175කට බලපත්‍ර නැහැ. ගරු ඇමතිතුමනි, ඒ ජීප් 175 අයිතිකරුවන් කවුද කියලා දන්නවාද? අවුරුදු 15ක්, 20ක් පමණ සෆාරි ජීප් 30ක්, 40ක් තියාගෙන හිටපු අය ඉන්නවා. දැන් තිබෙන සෆාරි ජීප් 30ක්, 40ක් තිබෙන පෞද්ගලික අයිතිකරුවන් ඉන්නවා. අන්න ඒ ජීප්වල වැඩ කළ රියැදුරු මහත්වරු තමයි සල්ලි එක්කහු කරගෙන, ණයට

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

අරගෙන, පොලියට අරගෙන ඒ ජීප් අරගෙන තිබෙන්නේ. ඒ ජීප් යාල වනෝද්‍යානයට ඇතුළු කරන්න බලධාරීන් ඉඩ දෙන්නේ නැහැ. බලධාරීන් අල්ලසට අහු වෙලාද දන්නෙත් නැහැ. මොන දේකට අහු වෙලාද දන්නේ නැහැ. තිස්සමහාරාමයේ රියැදුරන් 175ක් ඒ ජීප් අරගෙන තිබෙනවා. අද එම ජීප් වනෝද්‍යානයට ඇතුළු කරන්න අවසර දෙන්නේ නැහැ. ඒ අයත් මේ ඉල්ලීම කරන්න කිව්වා. මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේ ජීප් 175ටත් බලපත්‍ර දීලා ඒ අයටත් අර බලපත්‍ර තිබෙන ජීප් රථ එක්ක turn ක්‍රමයට හෝ අවස්ථාව ලබා දෙන්න කියලායි. නැත්නම් ජීප් 30, 40 තිබෙන අයගේ බලපත්‍ර ප්‍රමාණය අඩු කරලා, මේ ජීප් රථ 175ට අවස්ථාව ලබා දෙන්න. ඒ අහිංසක තරුණයෝ දුක් විඳලා, රියැදුරුවරු හැටියට වැඩ කරලා තමයි ඒ ජීප් රථ අරගෙන තිබෙන්නේ. එම නිසා ඒ දේත් ඔබතුමා කරන්න.

සංචාරකයන්ට ආදරය කරන රියැදුරන් කණ්ඩායමක් තිස්සමහාරාමයේ බිහි වෙලා ඉන්නවා. රියැදුරන් 700 ගණනක් ඉන්නවා. ඔවුන් සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගත් ස්ථානවලට රැගෙන යනවා. ඔවුන් කොහොම හරි සංචාරකයන්ට අලියා පෙන්වනවා, කොටියා පෙන්වනවා, වලහා පෙන්වනවා, හිටියා නම් සිංහයාත් පෙන්වනවා. පෙන්වන්න පුළුවන් හැම සතෙකුම පෙන්වලා සංචාරකයන්ගෙන් රටට ආදායම් උත්පාදනය කරන්න කටයුතු කරනවා. ගරු ඇමතිතුමනි, එම නිසා ඔවුන්ගේ ජීප් රථවලටත් එම අවසරය ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. යාල ජාතික වනෝද්‍යානය කියන්නේ, අපේ රටේ මහා භාණ්ඩාගාරයට සංචාරක ව්‍යාපාරය තුළින් මුදල් උත්පාදනය කරන ස්ථානයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ඇමතිතුමා යාපනය දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කරන්න රුපියල් මිලියන 130ක් වෙන් කරලා තිබෙනවා. බොහොම හොඳයි. හැබැයි, වෙන් කළ මුදල මදි. යාපනය තමයි දැන් හොඳම සංචාරක ගමනාන්තය. ඒකට තව සල්ලි වෙන්න කරන්න. ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ඇති වෙන්න සල්ලි තිබෙනවා. ඒ සල්ලි අරගෙන වැඩකටයුතු ආරම්භ කරන්න. ලංකාවේ දිස්ත්‍රික්කයක් දිස්ත්‍රික්කයක් ගණනේ ගිහින් සංචාරක ව්‍යාපාරිකයන් හමු වෙලා, ත්‍රීවීලර් රියැදුරන් හමු වෙලා, ඒ අයගේ ප්‍රශ්න ගැන කථා කරන්න. යම් ව්‍යාපෘතියක් ආරම්භ කරන්නේ කොහොමද කියලා එවැනි වැඩ පිළිවෙළක් ගැන කථා කරන්න. ලංකාවේ මේ වැඩසටහන හරියට කළොත්, මේ රට ගොඩ දමාගන්න පුළුවන්. හැබැයි, හරියාකාරව වැඩකටයුතු කරන්න ඕනෑ, ගරු ඇමතිතුමනි.

ඊළඟට, නැඟෙනහිර පළාතේ Arugam Bay sunset view point එක ඉදිකිරීමට මුදල් ටිකක් වෙන් කරලා තිබෙනවා. බොහොම හොඳයි. ඒක අත්‍යවශ්‍ය දෙයක්. ඊළඟට, සංචාරක ආයතන දියුණු කරන්න මිලියන 800ක් වෙන් කරලා තිබෙනවා. මම යෝජනාවක් කරනවා. හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බොහොම හොඳ වැඩක් කළා. අඟුණුකොළපැලැස්සේ හොඳ අංගසම්පූර්ණ ජාත්‍යන්තර මට්ටමේ බන්ධනාගාරයක් හැදුවා. එම බන්ධනාගාරය හැදුවාම තංගල්ල බන්ධනාගාරය ඉවත් කරලා තිබෙනවා. එම ගොඩනැඟිල්ල නිකම් තිබෙන්නේ. මගේ ඔළුවේත් තිබුණා, ඒකට වැඩසටහනක්. මම ඔබතුමාට ඒක ඉදිරිපත් කරන්නම්. ඒ බන්ධනාගාරයේ අද "හරක් කටා" කියන පාතාල නායකයෙක් ගිහින් තියාගෙන ඉන්නවා, විශාල මුදලක් වියදම් කරලා. එය ලන්දේසි බලකොටුවක්; පෞරාණික ගොඩනැඟිල්ලක්. අතහැර දැමූ මහනුවර බන්ධනාගාරය දැන් හදලා තිබෙනවා වාගේ, මෙම බන්ධනාගාරයත් සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගත් තැනක් බවට පත් කරන්න. එහි කෞතුකාගාරයක් ඉදිකරන්න. එම ගොඩනැඟිල්ල නගරය මැද තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තංගල්ල බන්ධනාගාර ගොඩනැඟිල්ලත් සංවර්ධනය කර සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් යොදා ගන්න කටයුතු කරන්නය කියලා මම කියනවා.

ගරු ඇමතිතුමනි, මම තවත් යෝජනාවක් කරනවා. රෝහණ විජේවීර කියන්නේ අපේ නායකතුමා, අපේ ඥාතියා. අපේ මැදකැටිය ගෙවල් ළඟ එතුමාගේ ගෙදර තිබෙන්නේ. ඒ ගෙදර කඩා වැටිලා, විනාශ වෙලා. නයි පොළොංගුත් ඉන්නවා. ඒ ගෙදර Clean Sri Lanka වැඩසටහන යටතේවත් පිරිසිදු කරන්න. විජේවීර මහත්මයාගේ නිවස, "විජේවීර කෞතුකාගාරය" කියලා හරි ඔබතුමන්ලා හරිගස්සලා දෙන්න. අද ඔබතුමන්ලාගේ ජනාධිපතිවරයෙක් පත් වෙලා ඉන්නවා. ඔය පක්ෂයට සලකන හැටිද? පක්ෂයේ ආරක්ෂකයාට සලකන හැටිද? පක්ෂයේ නායකයාට සලකන හැටිද? පක්ෂයේ ආරම්භකයාට සලකන හැටිද? එතැන එතුමාගේ පිළිරුවක් තියලා කෞතුකාගාරයක් හදන්න. අද ආණ්ඩු බලයත් ලැබිලා තිබෙන නිසා, ඒ මනුස්සයා වෙනුවෙන් දෙයක් කරන්න. එතුමාගේ නංගිගේ මිනියවත් තියා ගන්න තැනක් නැති වුණා, ගේ කඩාගෙන වැටිලා නිසා. ඒ ගෙදර ඉඳගෙන තමයි ඒගොල්ල ඉගෙන ගත්තේ. ඒ මිනිය තියන්න ගෙයක් තිබුණේ නැහැ. නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාගේ ගෙදර තමයි මළ කඳ තියාගත්තේ. මේ ඇත්ත. එදා මම මේ කථාව කිව්වා. පැලවත්තේ සල්ලි stock කරගෙන තියාගෙන ඉඳලා වැඩක් නැහැ නේ. රෝහණ විජේවීර මහත්මයා වෙනුවෙන් කෞතුකාගාරයක් හදන්න. ඒ අපේ ඥාතියා. අපට ආඩම්බරයි. එතුමාගේ නායකත්වයෙන් හදපු පක්ෂය තුළින් ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා, ආණ්ඩුවක් පිහිටුවලා, ජනාධිපතිවරයෙක් පත් වෙලා ඉන්නවා. අද එතුමාට සලකන්නේ නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමාගේ නෝනා ත්‍රීවිල් එකේ යන්නේ.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඔව්, එතුමාගේ නෝනා ත්‍රීවිල් එකේ යන්නේ. රෝහණ විජේවීර හිටපු විප්ලවීය නායකයෙක් කියලා සංචාරකයන්ට පෙන්වන්න, කෞතුකාගාරයක් හදන්න. ඒ වාගේම ඒ බන්ධනාගාරයේ කෞතුකාගාරය හදන්න කියන ඉල්ලීමත් කරනවා.

අපේ කැබ් එකත් අපට ලබා දෙන්න. එපා කියන අයට එපා වුණාට, අපට ඒ වාහනය ලබා දෙන්න. අපට වැඩ කටයුතු කර ගන්න තිබෙනවා. ඒ ඉල්ලීමත් කරමින්, මට වේලාව ලබා දීම ගැන ස්තුති කරමින්, මා නිහඬ වෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, what is your point of Order.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
வணக்கம்! நிலையியற் கட்டளை 27(2)இன் இரண்டாவது பந்தியின்படி, கட்சித் தலைவர் என்ற அடிப்படையில் முக்கியமானதொரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். இன்றைய தினம் திருகோணமலையில் மிகப் பெரியதோர் அநியாயம் நடந்துகொண்டு இருக்கின்றது. இந்தச் சபையிலும் மாறி மாறி பொய் சொல்லப்பட்டுக்கொண்டு இருக்கின்றது. தமிழர்கள் வாழுகின்ற அந்தப் பிரதேசத்தில் இன்று இவர்கள் மறுபடியும் புத்தர் சிலையை வைத்திருக்கிறார்கள். இது மிகவும் தவறான ஒரு விடயம்! இந்த விடயம் தொடர்பில் இந்தப் பாராளுமன்றத்தில் திரும்பத் திரும்ப பொய் சொல்லிக்கொண்டு இருக்கிறார்கள். தயவுசெய்து, இதனைக் கவனத்தில் எடுக்கவும். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய கருத்தை எழுத்துமூலம் கௌரவ சபாநாயகருக்குத் தெரிவியுங்கள்!

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
Sir, I rise to a point of Order. මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉල්ලීමක් කළේ මට කැබ් එකක් ලබා දෙන්න කියලා නොවෙයි. ඒක නිවැරදි කර ගන්න ඕනෑ. මම කිව්වේ ඒ ලබා දෙන කැබ්වලින් එකක් විජේවීර මහත්මයාගේ නෝනාටත් ලබා දෙන්න කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ ரஊப் ஹகீம் அவர்கள்! உங்களுக்கு 9 நிமிடங்கள் உண்டு.

[3.50 p.m.]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Hon. Presiding Member, I am pleased to add my comments on the Votes of the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism as well as the Ministry of Justice and National Integration during the Committee Stage Discussion.

Initially, I would like to refer to the sudden eruption of communal tension pertaining to a temple being erected in Trincomalee. Several Hon. Members spoke before me about that. This is a very serious issue. Such issues come up all the time; from nowhere, suddenly, statues are brought and temples are erected and that creates unnecessary tension.

I suggest that the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism proposes to establish a race relations committee or board, refer these disputes to that and give them some powers to decide on those issues. In Britain, there is such an institution created by the Government to handle these issues. I know, governments get into unnecessary controversy and difficulty when it comes to dealing with religious tensions. That does not mean that I am justifying what happened in Trincomalee. It is a very serious matter. When such matters occur, you could, at least, say there are Buddhists in Trincomalee and therefore, temples are necessary. But, in this country, there are no Jews and yet, there are several Shabbat houses. Several such places of worship had been built for Jews when there is no single Jew in this country.

Now, what has happened? Recently, one of my party members in the Colombo Municipal Council brought in a resolution regarding a Sabbat house. He asked the Mayor why she had not included his resolution regarding that Sabbat house, a place of religious worship that has been set up for the convenience of Jews, in Colombo. The Hon. Prime Minister very clearly said in the House that that is an unauthorized attempt to create a religious institution; she said so in the House. Finally, what happened? When that member from my party in the Colombo Municipal Council raised this issue, asking why they did not include it for debate in the Colombo Municipal Council, immediately the next day, he was called to the Terrorist Investigation Department and was asked to give a statement as to why he had raised this issue. When he asked why he had been summoned, they said, "There are some Facebook comments about the motion you brought in at the Colombo Municipal Council." He said, "This issue had been discussed in Parliament; the Hon. Prime Minister had said that it is an unauthorized structure. Therefore, it must be removed. So, why is the Colombo Municipal Council, which is the relevant authority for the removal of this institution, not taking action?" Nothing had been done in that regard and whereas, he was summoned to the Terrorist Investigation Department, TID.

Similarly, the Pottuvil Pradeshiya Sabha took a decision to close the Sabbat house that had been set up in Pottuvil. Two days ago, two young members of the public who had put some comments on Facebook, had been summoned to the Pottuvil Police to make a statement. Thereafter, they had been summoned by the Terrorist Investigation Department. Why are you abusing the Prevention of Terrorism Act on such trivial matters? This is the very Government which went to the Geneva Human Rights Council and promised that they will abolish the PTA, whereas, now, the PTA is being used to summon innocent people who had put comments on social media about setting up Sabbat houses in this country, where there is not a single Jew. There are several such places of religious worship that are coming up. So, what is the meaning of this?

Similarly, look at the way the Ministry of Foreign Affairs issues a statement when Qatar, a friendly country, was attacked by Israel without any provocation. It states, I quote:

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

> "Sri Lanka expresses deep concern over the recent strikes reported in Qatar,..."
> "Sri Lanka emphasizes the need for restraint and to be committed to diplomatic dialogue …"

What is this meaningless statement? Why are you issuing a statement like this? Rather than issuing a statement of this nature, you could have just kept quiet.

You would notice that it is very insensitive, illogical and scornful to even attempt at drafting such a deliberately apathetic, one-sided and distorted statement, which has no audacity to name the aggressor or even talk about how it shared the sentiments of the Government and the people of the country whose sovereignty was so blatantly violated. You are not even prepared to name Israel as the aggressor when they went and bombed Qatar, a friendly country of ours and which, being a member of the Human Rights Council, supported us at the Human Rights Council on behalf of six Gulf States. Instead, you issued a statement which does not name the aggressor or the perpetrator and which does not even go to the extent of condemning the serious breaches committed by those strikes. You all are so frightened to name Israel as a perpetrator.

A few days ago, one British journalist in the US was arrested for having some meetings, condemning the actions of Israel in the United States. Similarly, you are doing the same thing here, summoning whoever who makes a comment in that regard. Only a few months ago, an innocent young man who posted a sticker showing his solidarity with Palestinians was summoned to the TID. Now, the TID has become a tool of the Israelis in this country. Is this the way you are treating innocent citizens in the country who show their outrage for the actions taken by Israelis in the Occupied Territories of Palestine? So, that must stop.

The Government has promised in Geneva to abolish the PTA. But, what has happened? Today, I saw a statement by the Attorney-General's Department that they are opposed to creating an independent Public Prosecutor's Office. - *[Interruption.]* No. You can reply after I comment. An independent Prosecutor's Office is an assurance the Government had given in Geneva to the international community. We know how the Attorney-General's Department was being used for political purposes. But, today, the Attorney-General's Department is up in arms issuing a statement, condemning or rather asking the Government to review this situation. Particularly, the Attorney-General's Department has been complicit in many politically-motivated prosecutions. The President, several others and I were summoned to a special Presidential Commission, where the Attorney-General's Department came for prosecution, and the result would have been the removal of our civic rights. The Attorney-General's Department was used to conduct the prosecutions.

Then, in filing indictments, see what has happened? One of their own officers, lawyer Hejaaz Hizbullah, had been framed very deliberately and falsely. In my opinion, it is a fancy fairy tale, where they had accused him of having gone to a place  in Karaitivu in Puttalam to set up an NGO called "Save the Pearls", which was created to rehabilitate poor children whose parents were drug offenders. That was created as a false pretext in order to show that Hejaaz Hizbullah was involved in terrorist ideologies. There is a case taken up in the Puttalam High Court. For several years, it has been dragging on; the Attorney-General has been taking several dates, but, I am told, it cannot be proceeded with anymore. While that is happening, the Attorney-General has been involved in politically-motivated prosecutions. The President himself has gone on record saying that the National Defence Fund had been used to fund terrorism in this country, to fund extremism both on the Buddhist side as well as on the Muslim side. In such issues, it has been said openly by the President, the Attorney-General has been involved in making politically-motivated prosecutions, unnecessarily dragging these matters before the High Court. Therefore, these matters should be concluded without delay. Only a few days ago, the Supreme Court had issued a direction to the Puttalam High Court to conclude that matter before June, next year, seing that it has been unnecessarily dragged on. Penal sanctions brought upon innocent lawyers have also been motivated by their political intentions. So, that must end. Therefore, an Independent Public Prosecutor's Office must be established and that is a *sine qua non.*

Having said that, Sir, I conclude.

Thank you.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තත්පර 10ක වාගේ කාලයක් ලබා දෙන්න, පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும்  உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Okay, Hon. Minister.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Thank you, Hon. Presiding Member. Hon. Rauff Hakeem, thank you very much for the points raised. All are well noted.

I will respond only with regard to two matters. One of them is the Prevention of Terrorism Act. I said in the morning - perhaps, you were not here at the time, Hon. Hakeem - that the drafting of the new law has been concluded. Currently, it is being translated into Sinhala and Tamil. So, within a very short period, the new Act relating to terrorism will be out for public consultations for a while. So, there will be enough time for people to give their ideas. Therefore, what we promised to the international community and to our people has been done.

Secondly, the Independent Prosecutor's Office. It is not something that we have promised because of any

international pressure, but because it was part of our Manifesto. When we said that we are going to establish an Independent Prosecutor's Office, we meant it. However, at the moment, there is a Committee headed by His Lordship Yasantha Kodagoda  considering the matter. The Hon. Attorney-General and many others are also part of it. Even with regard to that, at a particular stage, we intend to call for public consultations. Sir, I was sent this letter, not by the hand of the Attorney-General but by their trade union, the Legal Officers' Association, with their objections. Just like anyone else, they can air their views. But, that does not mean that this Government is going to take one view and let go of things simply and completely; we will consider all opinions. And, with whatever we promised the people in our Manifesto, we will continue, no matter what.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ முனீர் முலாபர் அவர்கள்! உங்களுக்கு 10 நிமிடங்கள் உண்டு.

Order, please! The Hon. Sujeewa Dissanayake will now take the Chair.

***අනතුරුව ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (DR.) SELLATHTHAMBY THILAGANATHAN left the Chair, and THE HON. SUJEEWA DISSANAYAKE took the Chair.*

[අ.භා. 4.03]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අපි විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය, ඒ වාගේම අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව විවාද කරනවා. විශේෂයෙන්ම මම බලාපොරොත්තු වෙනවා, ජාතික ඒකාබද්ධතාව පිළිබඳව මේ සභාව තුළ කරුණු-කාරණා සාකච්ඡා කිරීමට. මොකද එය ඉතා කාලෝචිත, අත්‍යවශ්‍ය කාරණයක් කියා මා විශ්වාස කරනවා. හේතුව, ශ්‍රී ලාංකිකයන් ලෙස අපි හැම කෙනාම දන්නවා, අපේ රටේ තිබුණු යුද්ධය නිසා විතරක් ආර්ථික වශයෙන් අපේ රටට අහිමි වෙච්ච දේවල් පිළිබඳව. ඒ යුද්ධය නිසා අපේ රටේ මුළු විදේශ ණයටත් වඩා වැඩි ප්‍රමාණයක් -ඇමෙරිකානු ඩොලර් බිලියන 90ක් වැනි ප්‍රමාණයක්- ආර්ථික වශයෙන් පාඩු වෙලා තිබෙනවා.  ඒ තුළින් ආර්ථිකයට එහා ගිය තවත් හානි රාශියක් අපට සිද්ධ වෙලා තිබෙනවා, ජීවිත සහ සමාජයීය වශයෙන්.

ඒ යුද්ධය පිළිබඳව සංවේදනයක් තිබෙන, සහකම්පනයක් තිබෙන, සැබෑවටම මේ රටට ආදරය කරන පුරවැසියන් වේ නම්, මේ රටේ සමගියට බාධා ඇති වන අවස්ථාවලදී ඉතා තුච්ඡ, පහත් තැනකට වැටිලා තමන්ගේ නාළිකා තුළ, තමන්ගේ මාධ්‍ය තුළ voice-cut එකක් දමා ගැනීම සඳහා කටයුතු කරයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. විශේෂයෙන් තමන්ගේ විවිධ අනන්‍යතා පිළිබඳව විවිධ පාර්ශ්ව කථා කරනවා. අපි හැම කෙනාටම ඒ සියලු අනන්‍යතාවලට වඩා අපට තිබෙන උතුම්ම අනන්‍යතාව වන්නේ මනුෂ්‍ය අනන්‍යතාව කියා මා විශ්වාස කරනවා. ඒ නිසා අපි තේරුම් ගන්න ඕනෑ, නැවත නැවත සුළු සිද්ධියකින් පවා රටම කැලඹෙන, ද්වේශ සහගත ලෙස පැටලෙන, ගැටුම් ඇති කරන වාතාවරණයක් රට තුළ ඇති කරන්නද අපේ රටේ ආදරණීය මිනිස්සු අපේ අනාගත පරපුර වෙනුවෙන් අප  මහජන නියෝජිතයින් ලෙස මේ පාර්ලිමේන්තුවට පත් කර එවා තිබෙන්නේ කියලා. මේ රටේ ජනතාවට ආදරය කරන මහජන නියෝජිතයන් ලෙස, රටේ සාමය පිළිබඳ සැබෑ වුවමනාවක් තිබෙන පිරිසක් ලෙස අප පාර්ලිමේන්තුවට එවා තිබෙනවා නම් ගැටුමක් ඇති වන විට ඒ ගැටුම නිවන්න අපි උත්සාහ කරන්න ඕනෑ. එහෙම නැතිව පැති දෙකකට බෙදිලා, කරුණු කියලා, ඒ ගැටුම තවතවත් මෝදු කරලා, ජනතාව අතර ප්‍රශ්න ඇති කරන්න නොවෙයි අප මේ පාර්ලිමේන්තුවට එවා තිබෙන්නේ.

විශේෂයෙන් මෙතැනදී මම දැක්කා, හැම විටම අපේ රටේ ව්‍යවසායකත්වය පිළිබඳව, ව්‍යවසායකත්ව රාජ්‍යයක් ගොඩනැඟීම පිළිබඳව පාරම් බාන, ඒ ගැන විශාල ලෙස අදහස් දක්වන කෙනෙක් කථා කළා. මම හිතන හැටියට ව්‍යවසායකත්ව රාජ්‍යයක් වුණත්, පොහොසත් රටක් වුණත්, ඕනෑම රටක් හදන්න රටේ තිබිය යුතු වැදගත්ම සාධකය තමයි,  සාමය. සාමය බිඳ වැටෙන විට, සාමය නැති වන විට අපට කිසි දෙයක් ගොඩනඟාගන්න බැරි වෙනවා.

අපි කථා කරනවා, බුද්ධි ගලනය පිළිබඳව. නිදහසෙන් පස්සේ බර්ගර් ජාතිකයන් අපේ රට අතහැර යන්නේ කුමක් නිසාද? ද්‍රවිඩ ජාතිකයන්, බෞද්ධ සහෝදරවරුන්, මුස්ලිම් සහෝදරවරුන්, මේ රටේ වෘත්තිකයන් අපේ රට අත හැර යන්නේ කුමන හේතුවක් මතද කියන එක අපි සොයා බලන්න ඕනෑ. විටින් විට ඇති වන විවිධ අර්බුද, ගැටුම් පිළිබඳ කලකිරීමෙන් සමහර අවස්ථාවල ඔවුන් රට හැර යනවා.

ව්‍යවසායකත්ව රාජ්‍යයක් ගොඩනඟනවා කියපු අය, ව්‍යවසායකත්ව රාජ්‍ය නොවෙයි ගොඩනඟන්න හැදුවේ. අපි දන්නවා, අතීතයේ තමන්ගේ නාළිකා ඔස්සේ සමහරු  මොනවාද කළේ කියලා. හෘදය සාක්ෂියක් තිබෙන මිනිස්සු ඒක දන්නවා. ඒ අය අදත් ඒක කරමින් ඉන්නවා, එදාත් ඒක කරමින් සිටියා. ඒගොල්ලන්ට වුවමනා වන්නේ  ලාභය පමණයි. රට කොතැනකට ගියත් ඒ අයට කමක් නැහැ. මේ රටේ ජාතික සමගිය පිළිබඳව කිසිම හැඟීමක් ඔවුන්ට නැහැ.

ශ්‍රී ලාංකික නියෝජනය පිළිබඳව අද කථා කළා. ඒ නියෝජනය නිසා වෙන්න ඇති, සැබෑ ශ්‍රී ලාංකික හැඟීම නිසා වෙන්න ඇති, ඒ හැඟීම මෝදු වෙලා වෙන්න ඇති, කොරෝනා සමයේ පීඩා විඳින ජනතාවගෙනුත් අමතර ආදායමක් ලබන තත්ත්වයකට ගියේ. විශේෂයෙන් මම හිතනවා, රටක් ලෙස අපට ඉදිරියට යන්න නම් සාමය අත්‍යවශ්‍ය සාධකයක් කියලා. යුද්ධය අවසන් වුණාට පස්සේ, නැවත අපේ රටේ යුද්ධයක් ඇති නොවෙන්න නම් ඒ අතීතයෙන් පාඩම් අරගෙන, රටක් ලෙස ඉදිරියට යන්න කොයි වාගේ වැඩ පිළිවෙළක්ද සූදානම් කර ගන්න ඕනෑ, ඒ වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ කොහොමද කියන ඒ යාන්ත්‍රණය අපි රටට හඳුන්වා දුන්නා. ඒ අනුව තමයි ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන කාර්යාලය, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, හානිපූරණය සඳහා වන කාර්යාලය වාගේ තවත් යාන්ත්‍රණ රාශියක් හරහා නැවත මේ රටේ සාමය ස්ථාපිත කරලා හැමකෙනාටම සතුටින් සාමයෙන් ජීවත් වන්න පුළුවන් රටක් හදන්න තමයි අපි මේ උත්සාහය දරන්නේ.

[ගරු මුනීර් මුලාෆර් මහතා]

2018 වර්ෂය සංචාරකයන් වැඩිම පිරිසක් මේ රටට පැමිණි වර්ෂය ලෙස අපි මේ සභාවේදී සාකච්ඡා කළා. හැබැයි 2019 වර්ෂය වනකොට අපේ රටට එන සංචාරකයන් ප්‍රමාණය අඩු වනවා. ඒකට ප්‍රධානම හේතුව මොකක්ද? අපි හැමකෙනාම පිළිකුල් කරන, අපි හැමකෙනාම අනුමත නොකරන පාස්කු ඉරුදින ප්‍රහාරය සමඟ සාමය බිඳ වැටීමත් එක්ක රටේ සංචාරක ක්ෂේත්‍රයට විශාල පහරක් එල්ල වුණා.

ඒ නිසා බංකොලොත් වුණු රට නැවත ගොඩනැඟෙනකොට මම හිතන්නේ අපි මීටත් වඩා සංවේදී වෙන්න ඕනෑ, මීටත් වඩා අවංක වෙන්න ඕනෑ බවයි. මම හිතන්නේ අපට එවිට පමණයි සැබෑ ශ්‍රී ලාංකික සමාජයක් ගොඩනඟන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා විශේෂයෙන් අද දින අපි සාකච්ඡා කරන මේ කාරණා ගැන සලකා බැලිය යුතු වෙනවා.

සංචාරක ක්ෂේත්‍රය කියන්නේ, අපේ රටට විදේශ විනිමය විශාල ලෙස ගෙන එන ක්ෂේත්‍රයක්. එම ක්ෂේත්‍රය දෙස බලනකොට මගේ නෙත ගැටුණු දෙයක් තමයි, 2019ට කලින් මැද පෙරදිගින් පමණක් සංචාරකයන් 71,000කට වැඩිය ඇවිල්ලා තිබෙනවාය කියන එක. හැබැයි, ඉන්පසු අවුරුද්ද තුළ සංචාරක ක්ෂේත්‍රය කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. අපි ආණ්ඩු බලය අරගෙන අවංකවම මේ අවුරුද්ද තුළ රටේ සාමය ගොඩනඟන්න, සමගිය වෙනුවෙන් කටයුතු කරලා තිබෙනවා. අපි ආණ්ඩුවක් ලෙස ජාතිවාදය පෝෂණය කිරීමට හෝ ඒ සඳහා උඩ ගෙඩි දෙමින් එය ශක්තිමත් කරන්න කිසිම අවස්ථාවක ඉඩ දුන්නේ නැහැ. ඉදිරියේදීත් අපි අනිවාර්යයෙන්ම ඒ විධියට කටයුතු කරනවා. මේ රටේ සමස්ත ජනතාවගේ ප්‍රාර්ථනා මොනවාද? සාමය මතින් අපේ විදේශ සම්පත වඩා ශක්තිමත් කරමින්, සංචාරක ක්ෂේත්‍රය ශක්තිමත් කරමින්, අපේ ආර්ථිකය ගොඩනඟමින්, ආර්ථිකමය වශයෙන් පමණක් නොවෙයි, සෑම අතින්ම පොහොසත් වුණු ලස්සන ජීවිතයක් අපි හැම කෙනාටම අත්‍යවශ්‍යයි. ඒ ගමන යන්න නම් අපේ ආර්ථිකය අපි ශක්තිමත් කර ගන්න ඕනෑ. ඒ නිසා අපි මේ මොහොත වනවිටත් විවිධ රටවල් සමඟ ගිවිසුම් 70කට වැඩිය ගිවිසුම්ගතවෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. රාජ්‍ය නොවන සම්මුතිකරුවන් වාගේම සංවර්ධන හවුල්කරුවන් සමඟත් අපි විශේෂ ගිවිසුම්වලට පැමිණිලා තිබෙනවා. පසුගිය සතියේ අපේ විදේශ කටයුතු ඇමතිවරයා සවුදි වාණිජ මණ්ඩල සම්මේලනය සමඟත් ගිවිසුමක් අත්සන් කළා. මේ ක්ෂේත්‍රය තුළින් හැකිතාක් දුරට රටට ආයෝජන ගෙනෙන්න පුළුවන් අය සමඟ සම්බන්ධකම් ඇති කරමින්, තවත් විදේශ සබඳතා පුළුල් කරමින් රට ඉදිරියට ගෙන යෑම සඳහා අපි විශාල උත්සාහයක් දරමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමතියි. විපක්ෂ නායක කාර්යාලයෙන් තමයි, 2026 අය වැය කාරක සභා අවස්ථාවේ වැඩසටහන හදලා තිබෙන්නේ. හැබැයි, විපක්ෂ නායක කාර්යාලයෙන් ඒක හදලා දුන්නත් ඒ නායකතුමාවත් දන්නේ නැහැ, අද මොන වැය ශීර්ෂය පිළිබඳව ද අපි සාකච්ඡා කරන්නේ කියලා. අපි ඒක තේරුම් ගන්න ඕනෑ. වැය ශීර්ෂයක් සම්බන්ධයෙන් පවත්වන විවාදයකදී ඒ ක්ෂේත්‍රයේ අඩුපාඩු තිබෙනවා නම්, රජයෙන් ඉදිරිපත් කළ කරුණු - කාරණා පෙන්වා දෙමින්, අලුත් යෝජනා එකතු කරමින් අපි, අපේ රට ඉදිරියට අරගෙන යමු, ඒ වෙනුවෙන් කටයුතු කරමු කියමින්, මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[4.13 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Hon. Presiding Member, I wish to commence my speech today by making reference to the incidents that took place in Trincomalee last evening and this morning. I think it is relevant to the Ministry of Justice and National Integration and I want to make it relevant to that Ministry.

Sir, this Government came to power on the clarion call to get rid of racism. One of the claims made was that the Tamil and Muslim people in this country have grievances because of racist policies that were pursued by consecutive governments since Independence. That is the position of the NPP and the JVP today. And, on that basis, the policy of the Government was going to be to put right those wrongs, to bring about a system change to ensure that that history does not repeat itself from now on.

Now, it is in that context, Sir, that I wish to properly put forward the Trincomalee incident. The Tamil population of Trincomalee in 1827 - it was the first census done - was 74.52 per cent, the Muslim population was 24.72 per cent and the Sinhala population was 0.53 per cent. Then, if you take the population just before Independence, in 1946, the census shows that the Tamil population of Trincomalee was 48.74 per cent, the Muslim population was 39.6 per cent and the Sinhala population was 9.87 per cent. That increase in the Sinhala population was because, due to World War II, the Eastern Naval Command was set up in Trincomalee and a significant Sinhala population was brought in to strengthen the harbour and the naval command. But, Sir, if you take the census of today, the Sinhala population of Trincomalee is 26.97 per cent. Today, the Tamil people talk in terms of an ethnic conflict because of the deliberate State-sponsored manoeuvres that have been systematically carried out over the last 76 years to make the Tamil-speaking people a minority in their own areas of historical habitation. That is the crux of the problem.

If you take Trincomalee today, the incidents that are happening must be seen in that context. All of these actions are part and parcel essentially of a deliberate policy to ensure that the people who have historically inhabited that area are put in their place and that they must leave because it is not safe for them, because they have no place there and because the State will back the occupiers and will not allow the habitual inhabitants to live peacefully in those areas. And, this incident is a part of it. We are not opposed to Buddhist temples being built there; we are not opposed to Sinhalese Buddhists coming into the North and the East and living there. I said that the other day in my speech during the Second Reading Debate of the Budget. So, that has never been a problem. But, when the State systematically manipulates a situation, putting the people who have historically inhabited the area at a severe disadvantage, that they are, in fact, disenfranchised with their identity being threatened, then, that is a cause for conflict, and that is what is happening.

That particular area where this viharaya is located had already been given to them. There was a small building and it got completely wiped out due to the tsunami in 2004. And, as a result, in 2004, that viharaya was relocated at the Sangamiththa Viharaya instead of this land, which is on the beach. The Government of 2004 allocated a land next to the Sangamiththa Viharaya and made this particular land a public land so that it could be used for tourism. If my information is correct, the Department of Coast Conservation and Coastal Resource Management has got the authorization not to allow any buildings to be built within 300 metres from the coastline in Trincomalee, and because of that, they were given alternative lands. But, in 2014, under the Mahinda Rajapaksa Government, despite the fact that an alternative land had been allocated because that area was declared a high-risk zone soon after the tsunami, again that land was allocated to this viharaya and that matter was just kept quiet; everything was going on smoothly. Then last week, a tuck shop was going to be built on that land and as a result, the Department of Coast Conservation and Coastal Resource Management took the vihara authorities to court saying that that structure was illegal and the relevant legal representations wanted one week's time until they get it sorted out, until they get the full brief. In the meantime, this incident has taken place. So, that is the background, Sir. When there was no ethnic issue, it was the Department of Coast Conservation and Coastal Resource Management that took certain legal action. Then, it was made an ethnic issue, a racist issue and all hell broke loose.

It is in that backdrop, Sir, that the Hon. Minister Ananda Wijepala was approached by several people and to his credit, whatever decisions that were taken yesterday were correct. That is what your Government came to power for, to stand by the law and ensure that there is no racism, but you backtracked. And today, that same Minister shamefully comes to this House, lies and says that the decisions taken yesterday were purely to protect that statue.

Now, Sir, how does the Ministry of Justice and National Integration comes into this? That Ministry has the responsibility to ensure that the racist acts of the past are done away with, that those racist mistakes of the past, which led to tension and were deliberately done soon after the war to exacerbate situations to ensure that colonization projects could take place at a pace, are reversed. That is where the Ministry of Justice and National Integration must come in. At the end of the day, that Ministry must prevail, if justice is to prevail. And, your steps must not be to give in to pressure because that pressure is coming from a significant minority in today's context in that area.

And if you are to take your mandate seriously, that racist attitude was defeated promptly. One hundred and fifty nine Members got elected for you all on the basis that you all would not act the same way that they did. But, today, what you all have done is, you have capitulated. No, instead, what you must do is, you must go to the Sinhala people. The Sinhala people did not oppose yesterday when those actions were taken. Who opposed it? Goons. Goons from the outskirts of the Trincomalee District were brought in. One of our Members of Parliament was assaulted by those very same goons. There are cases against those people. They were the ones who were brought in to create mayhem. The ordinary, Sinhala general public did not oppose it because they voted for you. They voted for the Hon. Tamil Member from Trincomalee who represents your party. So, it is your duty not to reverse and capitulate. On the contrary, what you must do is, you must go to the people and tell them the truth; you must explain to them what is right; you must explain to them the injustice that has been done. Instead of that, you have completely betrayed those Tamils and non-Sinhala voters who trusted you and voted for you. That is what you have done. So, Sir, this must change.

Finally, I wish to state that the special Office of the Independent Prosecutor was something that, even in the last Budget Debate, we welcomed; I welcomed it. I welcomed it because there is an inherent conflict of interest, which cannot be allowed to continue. These are international standards that we are talking of. So, this is not to try and make out that the honourable lawyers of the Attorney-General's Department are inherently biased, but because the system is faulty. And, "justice must not only be done, but must also be seen to be done" means that you cannot have a department that defends the government of the day and also prosecute against the government. That is the basic rule. However, Sir, this Government has tried to make this Office of the Independent Prosecutor the answer for the heinous crimes that the Sri Lankan military is accused of, that the Sri Lankan State is accused of during the war. Those are two different things, Hon. Presiding Member. Please be very clear. The Tamil people and also the Tamil parties will support the creation of the Office of the Independent Prosecutor because that must happen regardless of the heinous crimes that took place because if Sri Lanka is to have a credible system, that Office is fundamental. But if the Government, as it has tried to show in Geneva, tries to make out that such an Office could, in fact, deal with the war-related heinous crimes, the crimes of genocide, the crimes against humanity and war crimes, then that is a big mistake because that will never be accepted!

It is for that reason, Sir, that, when the ITAK calls for a Division today on the Votes of the Ministry of Justice and National Integration, we will be supporting their call to vote against it; it is because, on the question of the heinous crimes that were committed during the war, this Ministry and the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism have, in the same way that all previous governments behaved, systematically tried to ensure that the victims would not get justice. So, if you all are not going to follow in their footsteps, then, surely, you cannot be standing for the same principles and for the same actions they had been pursuing. So, for that simple reason, we will be voting against this Ministry, Sir.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ගරු අධිකරණ ඇමතිතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ත්‍රිකුණාමලයේ සිද්ධිය සම්බන්ධයෙන් ගරු ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා පවසන ලද අදහස්වලට මා සවන් දුන්නා. ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙනවා. අපේ රටේ දෙමළ පුද්ගලයන්ට, මුස්ලිම් පුද්ගලයන්ට කියලා වෙනම නීතියක් නැහැ. ඒ වාගේම හාමුදුරුවන්ට කියලා වෙනම නීතියක් නැහැ. හැමෝම එක නීතියකට යටත්. At the same time, I call everyone, whether you are in the North, the East or the South, to understand that you are Sri Lankans and you are safe with our Government. We will not allow racism to raise its ugly head, not at any point. So, firstly, I must say that.

Secondly, the Director of Public Prosecutions is an office that we are going to establish. So, thank you for agreeing with that mechanism. But, how you try to equate the war crimes and the DPP, I do not understand. We will discuss it later, perhaps. The DPP will prosecute every crime in this country. So, I do not understand your equation.

Finally, I want to say that all the people in this country are citizens and no matter to what race you belong or wherever you live, you are safe under our Government. We will not discriminate you.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

There is no equation, Hon. Minister. But, your Government's position in Geneva was that the Office of the Independent Public Prosecutor that you all hope to establish is the *sine quo non* for all the faults with regard to accountability. Our position is that, as far as all the crimes that were committed during the war are concerned, it is only an international investigation that would get to the bottom of it. Anything short of that will not give justice. That is a fact because the State was a party to the war and you cannot have that same State investigating itself.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[4.29 p.m.]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

Hon. Presiding Member, we want to know what happened to the solar power project in Sampur. When Indian Prime Minister Shri Narendra Modi was here, that project was inaugurated by leaders of both countries on the 05th of April, 2025. But, what has happened is, they have not published the tender.

මොකක්ද මේ කරලා තිබෙන්නේ? අපේ රටට ගරු නරේන්ද්‍ර මෝදි අග්‍රාමාත්‍යතුමා ඇවිල්ලා අපේ රටේ ජනාධිපතිතුමා සමඟ සාම්පූර් සූර්ය විදුලි බලාගාර ව්‍යාපෘතිය ආරම්භ කරන්න inauguration එක කළා. හැබැයි, ඒකේ tender එක publish කරලා නැහැ. Are you trying to fool the people of this country and India? That is the question we are asking. මේ රටේ මිනිස්සු සහ ඉන්දියාව ගොනාට අන්දන්න ද මේ හදන්නේ? සාම්පූර් ව්‍යාපෘතියේ transmission lines ටික සහ infrastructure ගොඩ නඟන්න ඕනෑ. They must go ahead with the transmission lines and the infrastructure, which is not happening. So, Sir, just like the Dambulla Cold Storage Project - ශීතාගාර project එක වාගේ - this project is also being postponed, and the people are also being fooled. So, what we clearly see is that the Government is incapable of proceeding with those projects.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණාව සංචාරක ක්ෂේත්‍රය ගැන. අපේ සංචාරක අමාත්‍යතුමාගේ සංචාරක අමාත්‍යාංශය යටතේ ආයතන 4ක් තිබෙනවා. ඒ ආයතනවල ඉන්න අධ්‍යක්ෂකවරු හමුවෙලා, ඒ associationsවල නිලධාරින් හමුවෙලා, travel associationsවල නිලධාරින් හමුවෙලා, සාකච්ඡා කරලා, තිබෙන අඩු පාඩු පිළිබඳව සොයා බැලුවාද? එහෙම දෙයක් සිදු වෙලා නැහැ කියලා තමයි ඒ අධ්‍යක්ෂකවරු සහ asociationsවල අය අපට කියන්නේ. ඒ විතරක් නොවෙයි. සංචාරක ක්ෂේත්‍රය ගැන කථා කරන කොට මේ කාරණයත් කියන්න ඕනෑ. සංචාරකයෙක් ලංකාවට ආපු ගමන් ගුවන් තොටුපළෙන් driving licence එක ගන්න පුළුවන්. ඊට පස්සේ වාහනයක් rent කරන්න පුළුවන්. Bookings ටික online දමා ගන්න පුළුවන්. එතකොට ඒ මුදල්වලින් සියයට 3ක්, නැත්නම් යම් ප්‍රමාණයක් booking.com එකෙන්, airbnb එකෙන්, Agoda එකෙන් පිට රටටයි යන්නේ. ඒ විතරක් නොවෙයි, taxi service එක ගත්තොත්, අද කුලී රථ රියැදුරන්ට රැකියාව නැති වෙලා තිබෙනවා. ඒ වාගේම, ඇතැම් ස්ථානවල වැසිකිළි කැසිකිළි පහසුකම් නැහැ. හෝර්ටන් තැන්නට යන්න; වැසිකිළියක් නැහැ. නුවරඑළියට යන්න; වැසිකිළියක් නැහැ.

අද සංචාරක ක්ෂේත්‍රයට මොකක්ද වෙලා තිබෙන්නේ? මේ අය කියන විදියට සංචාරකයෙක් දවසකට ඩොලර් 150ක් නම් වියදම් කරන්නේ, අපි ඒ ගැන දුක් වෙන්න ඕනෑ; කනගාටු වෙන්න ඕනෑ. මේ කලාපයේ ඉන්න සංචාරකයන් දවසකට ඩොලර් 600ක් වාගේ ප්‍රමාණයක් වියදම් කරනවා. Tourism Cess Fund එකක් තිබෙනවා. ඒකෙන් සංචාරක ප්‍රවර්ධනය සඳහා කරලා තිබෙන වැඩසටහන් මොනවාද? කරලා තිබෙන Social media promotions මොනවාද? ඒ වාගේම, කරලා තිබෙන advertisements මොනවාද? අප දැකපු විදියට කරපු එකම වැඩ පිළිවෙළ තමයි LGBTQ ප්‍රවර්ධනය කරන්න ලියුමක් ගහපු එක. ඒක තමයි කළේ. අපේ අර්චුනා මන්ත්‍රීතුමාත් ඒ පිළිබඳව කරුණු කාරණා කියලා තිබෙනවා මම දැක්කා. මොන පිස්සුවක්ද මේ

ගෙනැල්ලා තිබෙන්නේ කියන එක පිළිබඳව පාර්ලිමේන්තුවට කරුණු දක්වන්න ඕනෑ. නමුත් එහෙම කළේ නැහැ. මේ රටේ LGBTQ ප්‍රවර්ධනය කරන්නයි මේ ආණ්ඩුව කටයුතු කරලා තිබෙන්නේ. ඒක තමයි සංචාරක ක්ෂේත්‍රයට සිදු වෙලා තිබෙන්නේ.

අපි අධිකරණය ගැනත් කථා කරන්න ඕනෑ. අධිකරණයට වගකීමක් තිබෙනවා. මොකක්ද ඒ වගකීම? පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයට ලක් වෙච්ච අහිංසක කතෝලික ජනතාව ඇතුළු අපේ ජනතාවට යුක්තිය, සාධාරණය ඉෂ්ට කරන එක. හැබැයි, ඒ දේ සිදු වන්නේ නැහැ. පැහැදිලිවම ඒ දේ සිදු වන්නේ නැහැ. අධිකරණය ගැන කථා කරන කොට නීතිපති දෙපාර්තමේන්තුව ගැනත් දිගින් දිගටම කථා කළා. මම දැක්කා, අද "ලංකාදීප" පුවත්පතේ, "මව්බිම" පුවත්පතේ, "The Sunday Times" පුවත්පතේ "CID එක නීතිපතිට පිටුපා ලන්ඩනයට යයි" කියලා පුවෘත්තියක් පළ කරලා තිබෙනවා. නීතිපතිටත් කියන්නේ නැතිව තමයි ලන්ඩනයට ගිහිල්ලා තිබෙන්නේ. ඒ මොකටද? රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා දවස් දෙකක් එංගලන්තයට ගිය එක ගැන පරීක්ෂා කරන්න, ලංකාවේ CID එකේ 5 දෙනෙක් ලන්ඩනයට ගිහිල්ලා තිබෙනවා. එතකොට, ඒවාට වියදම් කළේ මේ රටේ මුදල් නොවෙයිද? නීතිපතිවරයාගෙන් අවසර ගන්නේ නැතිවයි, නීතිපතිවරයා දැනුවත් කරන්නේ නැතිවයි ගිහිල්ලා තිබෙන්නේ. අපේ රටේ CID එක Wolverhampton University එකට ගිහිල්ලා ප්‍රශ්න කළාම ඒ අය උත්තර දෙයිද? එංගලන්තයේ පොලීසියෙන් ඇවිල්ලා අපේ රටේ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ප්‍රශ්න කළොත් අපි ඒවාට උත්තර දෙනවාද? රාජ්‍ය තාන්ත්‍රිකභාවය ගැන දන්නේ නැහැ. රාජ්‍ය තාන්ත්‍රිකභාවය අනුව මොකක්ද කරන්න ඕනෑ? විජිත හේරත් මහත්මයාට කථා කරලා, අපේ රටේ ඉන්න එංගලන්තයේ තානාපතිට කථා කරලා ඊට පස්සේ ඒ තොරතුරු එංගලන්තයේ පොලීසියට යවලා තමයි මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ. හැබැයි, මෙන්න මේ අය නීතිපතිවරයාටත් හොරෙන් ගිහිල්ලා තමයි මේ ක්‍රියාදාමය කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රය ගැන කථා කරන කොට අප කනගාටු වෙන්න ඕනෑ කාරණය මොකක්ද? අපි දකිනවා, මේ රටට එන සංචාරකයන්ට අද ලිංගික අඩන්තේට්ටම් වෙනවා කියලා. තවමත් පොලීසියට අල්ලා ගන්න බැරි වෙලා තිබෙනවා, ඒ පුද්ගලයන් කවුද කියලා. *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇල්ලුවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ඇල්ලුවා ද? ලොකු දෙයක්, ලොකු දෙයක්! මේ රටේ සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරන්න නම් ඒ වාගේ කණ්ඩායම්වලට විරුද්ධව නීතිය හරියාකාරව ක්‍රියාත්මක කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, බුදු පිළිම පිළිබඳව මෙහිදී කථා කළා. අර ත්‍රිකුණාමලයේ සිදුවීමට අදාළ බුදු පිළිමය පිළිබඳවත් කථා කළා. මම කතෝලිකයෙක්. මගේ අම්මා බෞද්ධ. මතක තබා ගන්න, එදා සහරාන් ගිහිල්ලා බුදු පිළිම තමයි කැඩුවේ. ඊයේ පොලීසියේ ඒ නිලධාරිනුත් හැසිරුණු විධිය ඒ වාගේ තමයි අප දැක්කේ. මම දැක්කා, ඒ නිලධාරින් බැටන් පොලු අරගෙන, තල්ලු කරගෙන ගිහින් ගෞරවනීය බුදු රජාණන් වහන්සේගේ පිළිමය බලහත්කාරයෙන් උදුරා ගත්තේ කොහොමද කියලා. අර ගෞරවනීය ස්වාමීන්ද්‍රයන් වහන්සේට බිම දාගෙන ගහනවා, අපි දැක්කා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ස්වාමීන් වහන්සේලාට වැඳ නමස්කාර කරන්නේ බුදු රජාණන් වහන්සේට තිබෙන ගෞරවයට සහ ඒ සිවුරට තිබෙන ආදරයට. එහෙම තත්ත්වයක් තියෙද්දි පොලීසිය සලකන්නේ මෙහෙමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හරි නම් ඒ පොලිස් නිලධාරින්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. අපි අද සංචාරක ක්ෂේත්‍රය ගැනත් කථා කරනවා නේ. මේ රටට සංචාරකයන් එන්නේ මේ රටේ පිහිටි අටමස්ථානය ආදි ආගමික පූජනීය ස්ථානවලටත් යන්න; ඒවා දැක බලාගන්න. පාස්කු ඉරු දින ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණය ඉෂ්ට නොකරන ආණ්ඩුව මේ රටේ බෞද්ධ ජනතාවට අද පොලිස් මර්දනය ක්‍රියාත්මක කරනවා කියා මම ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, අපි තවත් කාරණයක් කියන්න ඕනෑ. මේ ආණ්ඩුව බලයට එනකොට මේ රටේ ජනතාවට බිල්ලෝ මැව්වා, මැති ඇමතිවරු නිවාස ගන්නේ නැහැ කිව්වා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඇමතිවරු හයදෙනෙක් නිල නිවාස අරගෙන තිබෙනවා. ඒ වාගේම එතුමන්ලා කිව්වා, "රටේ ජනතාවට නැති කිසිම දෙයක් අපිට එපා" කියලා. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා එහෙම කිව්වා. කිව්වේ නැහැ කියන්න, පුළුවන් නම්. "අපි ඉන්ධන ගන්නේ නැහැ" කිව්වා. ජනාධිපතිවරයා කියනවා මම දැක්කා, "පිටරටවල මැති ඇමතිවරු pushbike එකේ යනවා, බස් එකේ යනවා, කෝච්චියේ යනවා" එහෙම යුගයක් අපි ස්ථාපනය කරන්න ඕනෑ කියලා.

දැන් මේ ආණ්ඩුවේ වැඩේ කොහොමද? 2025 ජනවාරි 21වැනි දා නිකුත් කර තිබෙන චක්‍රලේඛය බලන්න. කිසිම ආණ්ඩුවකින් ඇමතිවරයෙකුට ඉන්ධන ලීටර් 900ක් දීලා නැහැ. නමුත්, මෙන්න මේක බලන්න. අමාත්‍යවරයෙකුගේ, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුගේ නිල වාහනය, වාහන වෙනුවෙන් එක් මාසයක් සඳහා උපරිම වශයෙන් ඉන්ධන ලීටර් 900ක් ලබා දෙන්න මෙතුමන්ලා කටයුතු කර තිබෙනවා. එතකොට එක වාහනයකටත් ඉන්ධන ලීටර් 900යි; වාහන දෙකක් තිබුණත් ඉන්ධන ලීටර් 900යි. හත්දෙයියනේ! එක වාහනයකට ඉන්ධන ලීටර් 900ක් ගහන්න පුළුවන්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කල්පනා කරලා බලන්න, මේ අය මේ රටේ අහිංසක මිනිසුන්ගේ ධනය කාබාසිනියා කර දමන විධිය. කිසිම ආණ්ඩුවක් ඇමතිවරයෙකුගේ වාහනයකට ඉන්ධන ලීටර් 900ක් දීලා නැහැ. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇමතිවරුන්ගේ ලේකම්වරුන් ඇතුළු අය -පෞද්ගලික ලේකම්, සම්බන්ධීකරණ ලේකම්, මාධ්‍ය ලේකම්, මහජන සම්බන්ධීකරණ නිලධාරි ඇතුළු අය- වාහන පාවිච්චි කරනවා. එක්කෙනෙකුට එක වාහනය ගාණේ වාහන 5යි. එතකොට මාසයකට රුපියල් මිලියන 1.12ක් වියදම් වෙනවා. ඒ කියන්නේ මෙතුමන්ලා මාසයකට රුපියල් ලක්ෂ 10කට වැඩි ප්‍රමාණයක් පෞද්ගලික ලේකම්වරුන් නඩත්තු කරන්න වියදම් කරනවා. මෙතුමන්ලා හැම වෙලේම lists ඉදිරිපත් කරනවා නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා වාර්ෂිකව රුපියල් මිලියන 14.4ක් වියදම් කරමින් පෞද්ගලික ලේකම්වරු නඩත්තු කරන්න කටයුතු කරනවා.

ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලේකම්වරයාගේ පඩිය රුපියල් 66,862යි, වෙනත් වියදම් සඳහා රුපියල් 27,300යි, ඉන්ධනවලට රුපියල් 68,855යි. මේ වාගේ ලේකම්වරු 5 දෙනෙක් ඉන්නවා. එක ලේකම්වරයෙකුට රුපියල් 163,017ක් ගෙවනවා. කණ්ඩායමේ ඔක්කෝම 15දෙනෙක් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මෙහෙමයි කැබිනට් ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් අද මේ රටේ මිනිසුන්ගේ මුදල් භාවිත කරන්නේ. හැබැයි එදා මෙතුමන්ලා කිව්වේ, බස් එකේ යනවා, වෑන් එකේ යනවා, කෝච්චියේ යනවා, පයින් යනවා, බයිසිකලයේ යනවා කියලායි. නමුත්, මෙතුමන්ලා අද යන්නේ මේ විධියටයි කියන එක මම මතක් කර දෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 91(h),-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩියකින් කියන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ නම සඳහන් කරලා, LGBTQ කථාවට මම පිස්සුවක් කියනවා කියලා කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා කිව්වා. අනේ, කරුණාකරලා මේක පැහැදිලි කරලා දෙන්න. ඒක මේ රටේ ඇමතිලා ගහපු ලියුමක්. මම නිකම් හිතලා ඇවිල්ලා කියපු එකක් නොවෙයි ඒක. මේ රට බෞද්ධ රටක් කියලා තමුන්නාන්සේලා තමයි කියන්නේ. බෞද්ධ රට LGBTQ කරන්නේ කොහොමද? ඊයේ පෙරේදා Trincomaleeවලට ගිහින් බැලුවාම, ඔයගොල්ලන්ගේ හාමුදුරුවරුන්ට ගහනවා. ඒක සම්පූර්ණ වැරැදියි. ඒ ලියුම අමාත්‍යාංශයෙන් ගහපු ලියුමක්. මම කිව්වේ නැහැ, මේ රට LGBTQ tourism කරනවා කියලා. ඒක අමාත්‍යාංශයෙන් ගහපු ලියුමක්.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අධිකරණ අමාත්‍යතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මම පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්.

CID එකට විමර්ශන කරන්න නීතිපතිගෙන් අවසරයක් අවශ්‍ය වන්නේ නැහැ. නීතිපතිට කියන්නේත් නැතිව විමර්ශන කරන්න CID එකට පුළුවන්, ඕනෑ නම් උපදෙස් ගන්නත් පුළුවන්. ඒ නිවැරදි කිරීම පමණයි මට කරන්න තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු ඇමතිතුමනි, මම කිව්වේ "ලංකාදීප", "මව්බිම", "ද සන්ඩේ ටයිම්ස්" පත්තරවල තිබෙන දේ. ඒවායෙන් තමයි මම quote කළේ. ඔබතුමා නීතිඥවරයෙක්. ඔබතුමා මට වඩා හොඳට නීතිය දන්නවා. ඔබතුමාට මේ කරුණු පැහැදිලි කරන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, මම ප්‍රකාශ කළේ පත්තරේ තිබෙන දේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට වරදක් කිව්වේ නැහැ. මා කිව්වේ නීතිමය තත්ත්වය. ඔබතුමා නීතිඥයෙක් නොවන නිසායි මා එය කීවේ. CID එකට නීතිපතිගේ අවසරය ඕනෑ නැහැ, විමර්ශනය කරන්න. හැබැයි CID එකට නීති උපදෙස් ඕනෑ නම්, නීතිපතිගෙන් ගන්න පුළුවන්. ඔබතුමා නොදන්නවා වුණාට, දැන් ඔය දේවල් පත්තරවලට ලියන්නේ ඇයි? සමහරු try කරනවා, CID එකයි, නීතිපතියි කොටවන්න. මොකද, මේ දවස්වල හොරු ටික බේරෙන්නේ ඒ ක්‍රමයට. ඒකයි. ඔබතුමා ඒ ගැන දන්නේ නැහැ කියලා මම දන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රියන්ත විජේරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.42]

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයෙන් ඉදිරිපත් වෙච්ච එක කාරණයක් තමයි, ආණ්ඩු පක්ෂයට යම් යම් කාරණා අමතක වනවා කියන එක. කොහොම නමුත් විපක්ෂයේ හැසිරීමෙන් අපට පෙනෙන්නේ ආණ්ඩු පක්ෂයට කෙසේ වෙතත්, විපක්ෂයට නම් යම් යම් කාරණා අමතක වනවා කියලායි. මොකද, මීට ටික වෙලාවකට කලින් අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා වතු කම්කරුවන්ගේ වැටුප සම්බන්ධව විවාදයක් ඉල්ලුවා. මට මතක විධියට ඔය වතු කම්කරුවන්ගේ වැටුප වැඩි කරන්න යෝජනා කළේ අපේ ජනාධිපතිතුමා ගිය 7වෙනි දා ඉදිරිපත් කරපු අය වැය කථාවේදී. ඊට පස්සේ 8වෙනි දා ඉඳලා 14වෙනි දා වෙනකම් ඔය කාරණය ගැන ඇති වෙන්න විවාද කළා. අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමාත් ඒ විවාදයට සහභාගි වෙලා, අනේ වාචාලකමට හෝ වෙනත් ආකාරයකට යම් යම් දේවල් කිව්වා. ඊට පස්සේ වතු කම්කරු ප්‍රජාව පොල් ගැහුවා කියලාත් මට මතකයි. දැන් ආපහු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා මේ ගැන විවාදයක් ඉල්ලන්නේ මොන කාරණයක් නිසාද කියලා මට පැහැදිලි නැහැ. 14වෙනි දා ඡන්දයක් තියලා ජනාධිපතිවරයා ඉදිරිපත් කරපු අය වැය කථාව දෙවන වර කියවීම මේ පාර්ලිමේන්තුවේදී සම්මත කර ගත්තා. එතකොට ආපහු මොන කාරණයකටද මේ විවාදයක් ඉල්ලන්නේ කියලා අපට පැහැදිලි නැහැ. එතුමාට ආපහු අලුත් තර්කයක් මතක් වෙලා විවාදයක් ඉල්ලනවා නම්, එතුමාට තර්ක මතක් වන, මතක් වන වෙලාවට කරුණු ඉදිරිපත් කරන්න අපි සූදානම් නැහැ.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඊළඟ කථාව තිබෙනවා. ඒකෙදි පැහැදිලි කර ගනිමු.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, point of Order එකක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ස්ථාවර නියෝග 91(ඌ) යටතේ අයුතු චෝදනා එල්ල කිරීම පිළිබඳව සඳහන් වනවා.

"වාචාලකම" අරෙහේ මෙහේ කියලා මන්ත්‍රීවරයෙකුට කථා කරනවා. ඒක එක කාරණයක්. ඡන්දය තිබ්බේ වතු කම්කරුවන්ගේ පඩිය ගැන නොවෙයි, මන්ත්‍රීතුමා. මොකක්ද, මේ කථාව? මේවා නිවැරදි කර ගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රියන්ත විජේරත්න මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
අදාළ ස්ථාවර නියෝගය කියලා ඒ කාරණය කියන්න. මගෙන් ප්‍රශ්න අහන්නවත්, මම ඔබතුමාට උත්තර දෙන්නවත් කොහේවත් බැඳිලා නැහැ. ඒක දන්නවා නේ. Point of Order හෝ ස්ථාවර නියෝග අහලා හරි, මම ඔබතුමාට උත්තර දෙන්න බැඳිලා නැහැ. මම ගරු සභාවට උත්තර දෙන්නම්. ඔබතුමාට උත්තර දෙන්න මම බැඳිලා නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නුසුදුසු දෙයක් තිබෙනවා නම් එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කටයුතු කරන්නම්.

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
කිව්වා නේ, දැන් කියලා ඉවරයි නේ, වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* දැන් වාඩි වෙන්න. දැන් මම කථාව කරන්නම්. දැන් මොනවා හරි හේතුවක් මත හිටපු ගමන් මන්ත්‍රීවරුන්ට එක එක තර්ක මතක් වුණාම, ඒ තර්කවලට විවාද කරන්න අපි බැඳිලා නැහැ. ජාතික ජන බලවේගය විධියට අපට අමාරුවක් නැහැ, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට තර්ක මතක් වන, මතක් වන වෙලාවට ඒ සම්බන්ධ කරුණු ඉදිරිපත් කරන්න.

ඊළඟ කාරණය, අපට අමතකද, විපක්ෂයට අමතකද කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි 2026 වර්ෂයට අදාළව තමයි මේ අය වැය ඉදිරිපත් කරන්නේ. අය වැය වාර ගණන ගත්තොත්, මගේ දැනුමේ හැටියට මේ මේ රටේ 80වෙනි අය වැය යෝජනාවලිය, එහෙම නැත්නම් විසර්ජන පනත් කෙටුම්පත තමයි පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන්නේ. 79වෙනි අය වැය යෝජනාවලිය ඉදිරිපත් කළේත් අපි. හැබැයි, 1 සිට 78 දක්වා අය වැය යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ විපක්ෂයෙන්. ඒ අයට අමතකයි, 2023 වර්ෂයේ සැප්තැම්බර් මාසය විතර වෙනකම් මේ රටේ පාලන බලය හෙබවූයේ ඒ අය කියලා.

එතකොට ඒ අවස්ථාව වනකොට එහෙම නැත්නම්, මේ රටේ පළමුවැනි අය වැය යෝජනාවලිය ඉදිරිපත් කරන අවස්ථාව වනකොට අපේ රට කොහොමද තිබුණේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පළමුවැනි අය වැය කථාව කරනකොට දෙවන ලෝක යුද්ධය අවසන් වෙලා, කැඩිච්ච බිඳිච්ච පාලම්, බෝක්කු ඉදිකරන්න, කඩා වැටිච්ච පාසල් ගොඩනැඟිලි ඉදිකරන්න එංගලන්තයටත් ණය දීපු රටක් තමයි ශ්‍රී ලංකාව කියන්නේ. ඒ වනකොට අපේ රටේ තිබුණේ අය වැය හිඟයක් නොවෙයි, අතිරික්තයක්. අපේ රටේ සංචිත තැන්පත් කරලා තිබුණේ එංගලන්තයේ. ඒ, රන් සංචිත විධියට.

ඔන්න ඔහොම රටක තමයි මේ විපක්ෂයේ අය වැය කථා ඉදිරිපත් කරන්න පටන් ගත්තේ. හැබැයි ඔවුන්ගේ 75වැනි, 76වැනි, 77වැනි අය වැය කථා ඉදිරිපත් කරනකොට මේ රට තිබුණේ කොතැනද? අපි දන්නවා, ණය ගෙවාගන්න බැරිව හතර අතේ ණය වෙලා, රටේ මූලික අවශ්‍යතාවත් සපුරාගන්න බැරිව, ඒ සඳහාවත් සල්ලි හොයාගන්න බැරි රටක් බවට ඒ අවසාන අය වැය කථාව ඉදිරිපත් කරනකොටත් විපක්ෂය විසින් මේ රට පත් කරලා තිබුණා කියලා. මිනිස්සු සීමිත සම්පත්වලින් අවශ්‍යතා සපුරාගන්න ගිහිල්ලා, පෝලිම්වල ළතැවෙලා එකිනෙකා රණ්ඩු වෙන්න පටන්ගත්තා. එහෙම තත්ත්වයකට තමයි විපක්ෂයේ පළමුවැනි අය වැය කථාවේ ඉඳලා අවසන් අය වැය කථාව දක්වා අය වැය කථාව කරනකොට අපේ රට පත් කරලා තිබුණේ. හැබැයි, දැන් ඔවුන් මාර කථා කියනවා. මේ දේවල් කරන්න තිබුණා ලු, මේ දේවල් අපි කරන්නේ නැති ලු, තව දේවල් කරන්න තිබෙනවා ලු, ඔහොම නොවෙයි ලු කරන්න ඕනෑ වාගේ ලොකු කතන්දර ගොඩක් දැන් මේ අය කියනවා. හැබැයි ඒ අයට අමතකයි, ඒ අයගේ කාලය තුළ ඒ දේවල් නොකළේ ඇයි කියලා.

එක මන්ත්‍රීවරයෙක් කියනවා, නුවරඑළිය නගරයේ toilet එකක් නැහැ කියලා. මම අහනවා, අවුරුදු 76ක් තිස්සේ මේ රට පාලනය කරපු ඔබට නුවරඑළිය නගරයේ toilet එකක් හදන්න බැරි වුණාද කියලා. තව මන්ත්‍රීවරයෙක් කියනවා, මේ රටේ සිරකරුවන් ප්‍රමාණය වැඩි වෙලා ලු. 10,000ක් විතර රඳවන්න පුළුවන් සිර මැදිරිවල 30,000ක් විතර රඳවාගෙන ඉන්නවා ලු. මේ ප්‍රශ්න පටන් ගන්නකොට මේ රටේ බලයේ හිටියේ කවුද? මේ රටේ මේ ප්‍රශ්නය ඔඩු දුවනකොට කවුද බලයේ හිටියේ? දැන් කෝමා වෙලා වාගේ, නින්දෙන් නැඟිටලා වාගේ අපෙන් අහනවා, මේවා කරන්න තිබුණා, ඇයි මේවා නොකරන්නේ කියලා. ඔබ ඔබෙන්ම ප්‍රශ්න කරගන්න, ඔබට බලය තිබිච්ච කාලයේ ඔබ මොනවාද කළේ කියලා. ඔබට මේ රට හදන්න ඕනෑ තරම් කාලය තිබුණා. හැබැයි අපේ ආණ්ඩුව පත් වෙලා අවුරුද්දක් යනකොට ඔබ කියනවා, මේ රට මෙහෙම හදන්න පුළුවන්, මේ විධියට කරන්න පුළුවන්, ඇයි නොකරන්නේ කියලා. මතක තියාගන්න, අපි ඒක කරමින් ඉන්නේ කියලා. ඒ නිසා තමයි මේ අය වැය විවාදයේදී විපක්ෂයෙන්ම කිව්වේ, මේ රටේ සාර්ව ආර්ථිකය ස්ථාවර කරන්න ආණ්ඩුව සමත් වෙලා තිබෙනවා කියලා. ඒ වාගේම ණය භාණ්ඩාගාරයක් විධියට තිබුණු අපේ රටේ භාණ්ඩාගාරය පිරී ඉතිරී යන තත්ත්වයට පත් කරන්න මේ ආණ්ඩුව සමත් වෙලා තිබෙනවා කියලා විපක්ෂය කියන්නේ ඒ නිසායි. ඒ නිසා කලබල නොවී ඉන්න. අපට මතක නැත්තේ නැහැ. අපට හොඳට මතකයි. අපි මේ ආර්ථිකය ඉලක්කගත දිශාවකට අරගෙන යනවා. අපේ පළමුවැනි අය වැය පසුගිය මාර්තු මාසයේදී ඉදිරිපත් කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුනි.

අපේ දෙවන අය වැය ඒ පළමු අය වැයත් එක්ක ගැටගැහිලා තිබෙනවා. අපේ අය වැය එකින් එක ගැට ගැහෙමින් තමයි ඉස්සරහට යන්නේ. ඒ ගැටගැහීමත් එක්ක මේ රට සුබවාදී දිශාවකට යොමු කරන්න අපට හැකියාව තිබෙනවා. මතක තියාගන්න, අපි නතර වන්නේ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කරපු ආකාරයට පොහොසත් රටක් හදලා, මේ රටේ මිනිස්සුන්ට ජීවත් වන්න පුළුවන් ලස්සන රටක් හදලාය කියන එක. ඒ වෙනුවෙන් අපි කැප වනවා, මහන්සි වනවා කියන එක ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.50]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලසානාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මම නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. එදා ඡන්දය තිබුණේ වතු කම්කරුවන්ගේ වැටුප ගැන නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ නේ. මම බලාගෙන ඉන්නවා විතරයි.

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
මගේ දිහා බලාගෙන "මන්ත්‍රීතුමා" කියලා ඔබතුමා කිව්වේ, මට.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
Point of Order එකක් ගන්න නම් නම කියන්න ඕනෑ. ඒක ස්ථාවර නියෝගවල තිබෙනවා නේ.

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
මගේ දිහා බලාගෙන, මන්ත්‍රීතුමා කියලා ඔබතුමා කිව්වේ, මට.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඒක හරියන්නේ නැහැ. මම නම කිව්වේ නැහැ. ඒ නිසා මේ වැඩේ කරන්න එපා. මම එතුමාගේ නම කිව්වේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම බැලුවේ අර මන්ත්‍රීතුමා දිහා. *[බාධා කිරීමක්]* කරුණාකර මගේ වෙලාව දෙන්න.

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
මගේ දිහා බලාගෙන, මේ ඡන්දය තිබ්බේ කියලා, - *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ වෙලාව ලබා දෙන්න. නැත්නම්, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඒ නරක වැඩේ කරන්න එපා කියලා යෝජනා කරමින්, මම කරුණු කීපයක් කියන්න කැමැතියි. මේවා දකිද්දී මට යම් සිද්ධියක් මතක් වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද නොවැම්බර් 17වැනි දා. 2018 නොවැම්බර් 16 කියන්නේ - ඊයේ ඉරිදා නිසා අපට රැස්වෙන්න බැරිවුණා. - මේ පාර්ලිමේන්තුවේ අඳුරුම දවසක්. කථානායකතුමාට පුටුවේ වාඩි වෙන්න නොදී, මේ පාර්ලිමේන්තුවට අලාභ හානි කරලා, මිරිස් කුඩු ගහලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ගහලා මේ වාගේ මන්ත්‍රීවරු මේක විනාශ කරපු දවසක්. ඒ නිසා *[බාධා කිරීමක්]* අහගන්න, අහගන්න. ඉස්සෙල්ලාම අහගන්න. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, එදා පාර්ලිමේන්තුවේ කළු දවසක්. *[බාධා කිරීමක්]* ඒක නැවත නොවේවා කියලා මතක් කරනවා. මොකද, පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු මිනිස්සු මෙතැන ඉන්නවා. පාර්ලිමේන්තුවට ගිනි තියපු, ඒ සඳහා Facebook pagesවලින් ආරාධනා කරපු මිනිස්සු මේ ඉස්සරහ ඉන්නවා. අද ඒ කළු දවස. මේ ඉතිහාසයේ නැවත එවැනි දෙයක් සිදු නොවේවා කියලා මතක් කරමින් මගේ කථාව පටන් ගන්න කැමැතියි.

ගරු අධිකරණ ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ නොසිටියත්, මේ කාරණාව කිව යුතුයි. අධිකරණ අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් යම් ප්‍රමාණයක් වැඩි වෙද්දී, ප්‍රාග්ධන වියදම් අඩු කරලා තිබෙනවා. අද විතරක් නොවෙයි. ගිය අය වැයේදීත් දැක්වූයේ නඩු විභාග වීමේ වේගය වැඩි කරන්න නම්, නීතියේ පමාව නවත්වන්න නම්, යටිතල පහසුකම් අවශ්‍යයි කියන මතය. හැබැයි, මේ වෙනකොට ප්‍රාග්ධන වියදම් මිලියන පන්සිය ගණනකින් අඩු කරලා තිබෙනවා. එතකොට අපි අහන්න කැමතියි, මේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වෙන්නේ කොහොමද කියලා.

නීතියේ ප්‍රමාදය වෙනත් දෙයක්. අපේ අධිකරණ ඇමතිතුමා පසු ගිය අය වැය විවාදයේදී ඉතාම ලස්සනට කියා තිබෙනවා, මෙහෙම: "Justice delayed is justice denied". Also, we have to keep in mind that justice hurried is justice buried.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මූලික අයිතිවාසිකම් නඩු විශාල ප්‍රමාණයක් පළමුවන අවස්ථාවෙන්ම විසි කර තිබෙන ආකාරය අපි දකිනවා. ඒවා dismiss කර තිබෙනවා. මම ගරු අධිකරණය සම්බන්ධයෙන් එපමණයි කථා කරන්නේ. හැබැයි, නීතියේ ප්‍රමාදය වළක්වා ගන්න කියලා මේ වාගේ පියවර ගැනීම, justice hurried is justice buried. අපි ඒකත් මතක තියාගෙන වැඩ කරන්න අවශ්‍යයි. නඩු ප්‍රමාදය නවත්වන්න ඕනෑ නම් යටිතල පහසුකම්වලට, ප්‍රාග්ධන වියදම්වලට මුදල් යෙදවීම තමයි කළ යුතුව තිබුණේ. හැබැයි ඒක මේ වෙනකොට කරලා නැහැයි කියන එක මම ඉතාම පැහැදිලිව කියන්න කැමතියි. මේ වෙලාවේ වෙන් කරලා තිබෙන මුදල් බලපුවාම, අධිකරණ සංකීර්ණ මෙච්චර හදනවා කියලා කියා තිබෙනවා. මම කියන්නම්, 2025 කියපු ටික. 2025 අය වැයේදී කියා තිබෙනවා, අනුරාධපුර, මාතලේ, යාපනය, පොළොන්නරුව, ගම්පොල, රත්නපුර, වැලිමඩ, වැලිපැන්න ආදී වශයෙන් 13ක් විතර. මෙවරත් ඒකෙන් 7ක්ම තිබෙනවා. පසුගිය වර වෙන් කරපු මිලියන 3,000ක් තිබෙනවා. මෙවර වෙන් කර තිබෙනවා මිලියන 1,260ක්. එතකොට මේ වැඩ කෙරිලා තිබෙන ප්‍රමාණය මේකයි. මේ සම්බන්ධයෙන් අධිකරණ ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී හෝ පිළිතුරු ලබා දෙයි කියලා බලාපොරොත්තු වෙනවා. මේවා තමයි කරන්න අවශ්‍ය වන්නේ. මේකෙන් තමයි නීතියේ පමාව නවත්වන්න හැකියාව තිබෙන්නේ කියලා අපි හිතනවා. ඒ මදිවාට ගිය වර අධිකරණ ඇමතිතුමාගේ කථාවේදී තවත් 9ක් ගැන කිව්වා. මම ඒ ටිකත් කියන්නම්. ඒ තමයි, ඉබ්බාගමුව, ලාහුගල, වත්තේගම, තලවකැලේ, මොරවැව, ජයපුරම්, මුරුක්කන්, පුලියන්කුලම්, චෙට්ටිකුලම්. මේවායේ කටයුතු කෙරුණාද කියලාත් අධිකරණ ඇමතිතුමාගෙන් අහන්න කැමතියි. එතුමාගේ පිළිතුරු කථාවේදී මේවාට පිළිතුරු ලබා දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම මම මේ කාරණයට අවධානය යොමු කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා, professional fees for the legal services of the "X-Press Pearl" maritime disaster සඳහා. මුළු ලංකාවම මේ ගැන දන්නවා. අපගේ මුහුදු තීරයට මහත් ව්‍යසනයක් සිදු වුණා. ගිය අවුරුද්දේත් මිලියන 1,000ක් මේ වෙනුවෙන් වෙන් කර තිබෙනවා. මේ අවුරුද්දේ මිලියන 500යි. මේ වෙනකොට ඒ නඩු කොයි තැනකද තිබෙන්නේ? මෙහෙම මුදල් වියදම් කර කර අපි තවත් රටක් මත යැපෙන්නේ ඇයි කියන ප්‍රශ්නය මම අහනවා. මූලික අයිතිවාසිකම් නඩුවකදී මේ සම්බන්ධයෙන් බොහොම පැහැදිලි තීන්දුවක් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දී තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් බිලියන 1ක් ඒ සිංගප්පූරු සමාගමෙන් ලබා ගන්න කියලා තිබෙනවා. මේ තීන්දුව ලැබෙන තෙක් මේ සමාගම නීතිඥවරයෙක් ඉදිරිපත් කරලා, මේ නඩුවට පෙනී සිටියා.

මේ තීන්දුව ලබා දුන්නාට පස්සේ ඒ නීතිඥවරයාගේ පෙරකලාසියත් අහෝසියි. ඒ සමාගමත් ලංකාවේ නැහැ. හැබැයි, වෙනත් නම්වලින් ඔවුන් මෙහේ ව්‍යාපාර කටයුතු කරනවා. මේ වෙනකොට limitation පිළිබඳ නඩුවක් ලන්ඩන්වල විභාග වෙනවා කියලා අපි දන්නවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. ඒවාට වියදම් කරන්න අවශ්‍යයි. මම ඒක නැහැ කියන්නේ නැහැ. හැබැයි, මේ වෙනකොට මෙතැන තිබෙන්නේ රටවල් දෙකක් අතර තිබෙන සම්බන්ධතාවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙතැන දැන් ඒ සම්බන්ධයෙන් කථා වුණා. Government-to-government discussions අවශ්‍ය තැනක මේක තිබෙන්නේ. ඒක සිංගප්පූරුවේ ධජය දරපු නැවක්. සිංගප්පූරුවේ රජයත් සමඟ අපට තිබෙන සම්බන්ධතාව අනුව ඒ ගැන කථා කරලා "ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට හිස නමන්න, ඒකට එකඟ වෙන්න" කියලා ඉල්ලන එක තමයි මේ අවස්ථාවේ කළ යුතුව තිබෙන්නේ.

දැන් බලන්න, මේ සඳහා මිලියන 1,000ක්, මිලියන 500ක් අපට වැය කරන්න වෙනවා. මේක අපි කවදා වෙනකම් දරන්නද? මේ කථාවේදී පරණ ආණ්ඩුවලට බැණලා නම් උත්තර දෙන්න එපා. එහෙම ප්‍රශ්න වෙලා තිබෙනවා. අපි ඒවා දන්නවා. ඕනෑ නම් අපට ඒවා කියන්නත් පුළුවන්. හැබැයි, අපි අතීතය ගැන නොවෙයි මේ කථා කරන්නේ, ඉදිරිය ගැන. ඔබතුමන්ලා ඉදිරියට හැම දාම මේ වියදම දරාගෙන මේ නඩුවලට මුහුණ දෙනවාද කියලා මම අහන්න කැමතියි. මොකද, ඉතාම පැහැදිලිව අපේ ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දීලා තිබෙනවා. ඒ තීන්දුව වෙනුවෙන් ස්තුතිවන්ත වෙන්නත් මම මෙය අවස්ථාවක් කරගන්නවා. එය ඉතාම ලස්සන තීන්දුවක්. මම නියෝජනය කරන පළාතේ ධීවරයන් විශාල පිරිසක් ඉන්නවා. ඒ ධීවරයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලා තිබෙනවා. මම ඒ කොටස කියවන්න කැමැතියි. එම තීන්දුවේ මෙසේ සඳහන් වෙනවා:

> "…. the harm caused to the marine and coastal environment, and the significant losses suffered by persons who were dependent on fishing and the fishing industry and by other indirect victims."

කරුණාකරලා මේකටත් අවධානය යොමු කරලා සිංගප්පූරු රජය සමඟ කථා කරන්න කියලා මම කියනවා. සිංගප්පූරු රජය සමඟ කථා කරලා මේ වැඩේ කරන්න.

දැන් කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිව කිව්වා, එංගලන්තයට ගිය පොලිස් නිලධාරින් 5 දෙනා සම්බන්ධයෙන්. මම පිළිගන්නම්කෝ ඒක නීතිපතිගෙන් අහන්න ඕනෑ නැහැ කියලා. නීතිපතිතුමා කිව්වා කියලා පත්තරේ තිබෙනවා, මමත් දැක්කා. රජයත් සමඟ කථා කරලා මේක කරගත යුතුයි කියන එක තමයි අපිත් දරන මතය. ඊළඟට මම මේ කාරණයත් කියන්න කැමැතියි. නීතිපතිතුමාගෙන් අහන්න ඕනෑ නැත්නම්, ඒ පොලිස් නිලධාරින් පස්දෙනාට කීයක් වියදම් වුණාද කියලා කරුණාකරලා පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරන්න. මොකද, මිලියන 16ක් සොයන්න මිලියන කීයක් වියදම් වුණාද කියලා අපි දැනගන්නට කැමැතියි. කරනවා නම් කොච්චර වැඩ තිබෙනවාද? මිලියන 16ක් තමයි සොයන්න ඕනෑ. ඒක හරි. මතක තියාගන්න, සමගි ජන බලවේගයේ අපි නඩු පවරලා තමයි ඔබතුමන්ලා ඔය කියවන රට බංකොලොත් කරපු එක ගැන නඩු තීන්දුව ලබා ගත්තෙත්. ඒ නිසා කථා කරද්දී පොඩ්ඩක් සොයා බලා කථා කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අය වැයෙන් අතුරුදහන් වූවන්ගේ පවුල්වලට රුපියල් මිලියන දෙදහස් ගණනක් වෙන් කරලා තිබුණා. ඒ වෙන් කරලා තිබුණේ හානිපූරණය කිරීම සහ වන්දි ලබා දීම වෙනුවෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සොයා බැලුවාම අතුරුදහන් වූවන්ගේ පවුල් අතර ලියාපදිංචි වෙච්ච පවුල් 19,000ක් තිබෙනවා. මේ වෙනකොට ඒ වෙනුවෙන් කීයක් වියදම් කරලා තිබෙනවාද කියලා පිළිතුරු කථාවේදී අපි දැනගන්න කැමැතියි. මොකද, ඒක වියදම් වෙලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවුරුදු ගණනාවක් තිස්සේ තමන්ගේ ළමයා, තමන්ගේ ස්වාමිපුරුෂයා අතුරුදහන් වෙලා ඉන්න පිරිසක්. මම විශේෂයෙන් කියන්න කැමතියි, 1988, 89, 90 කාලවල නැතිවෙච්ච අයගේ, අතුරුදහන් වෙච්ච අයගේ දෙමවුපියන් තවමත් ඉන්නවා. ඔවුන්ට මේ වෙනකොට අවුරුදු 70ක්, 80ක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වාස කරන්න. අවුරුදු 75ක, අවුරුදු 80ක ඒ අම්මලා, තාත්තලා කුලී වැඩ කරනවා. ඒ නිසා මේ අතුරුදහන් වීම සිද්ධ වුණේ කාගෙන්ද කියලා හොය හොයා ඉන්න එපා. පසුගිය අය වැයෙන් පොරොන්දු වුණා නම්, ඒ මුදල් ටික ලබාදෙන්න කියලා විශේෂයෙන් ඉල්ලා සිටිනවා. ඒකට යම් පිළිතුරක් මීට මාසයකට විතර කලිනුත් අධිකරණ ඇමතිතුමා ලබා දුන් බව මම දන්නවා. මීට පෙර වන්දි ලැබිලා තිබෙන අය සොයන්න බැහැ කියලා පිළිතුරක් ලබා දුන්නා. එහෙම නම් පසුගිය අය වැයෙන් රුපියල් මිලියන දෙදහස් ගණනක් වෙන් කළේ මොකටද? ඒකෙන් මිලියන 1,000ක්ම වෙන් කරලා තිබුණේ වන්දි ලබාදීමට. හැබැයි, ඒක සිදු වෙලා නැහැ. වන්දි පැකේජ් එකක් කියලා එකක් ඉදිරියේ දී ලබා දෙන්න නියමිතයි. ඒකට මුවාවෙලා මේකෙන් නතර වෙන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා,

[ගරු නිතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ පැකේජ් එක ලබා දෙද්දී, ඒක ලක්ෂ කීයක් වුණත් අතුරු ගෙවීම වන ලක්ෂ දෙක ලබාදෙන්න. ඒ පැකේජ් එක ලබා දෙන වෙලාවට මේ ලක්ෂ දෙක අඩු කරගන්න. එතකොට වැඩිපුර ගෙවෙන්නේ නැහැ. කරුණාකර මේ ගැන අවධානය යොමු කරන්න. මට මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් ලැබී තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ඉල්ලීමට 100 දෙනෙක් අත්සන් කරලා තිබෙනවා. මේ 100 දෙනා නියෝජනය කරන්නේ කවුද කියලා මම කියන්නම්. Families of the Disappeared, Human Elevation Organization, Katha Organization, Law and Society Trust, Muslim Women's Development Trust and National Peace Council කියන මේ සංවිධාන නියෝජනය කරන අය සිය දෙනෙක් ඉල්ලා සිටිනවා. මම මේ කාරණය මතක් කරනවා. කරුණාකරලා කාගෙන්ද මේක වුණේ කියලා හිතන්න එපා. කාගෙන්ද වුණේ කියලා බලනවාට වඩා මේ අසරණ මිනිසුන්ට පිහිට වෙන්න. ඔබතුමන්ලාගේ පාක්ෂිකයන් විශාල ප්‍රමාණයකුත් ඉන්නවා. කරුණාකරලා ගිහින් බලන්න. 1988-89 ගැන මම කථා කරන්න යන්නේ නැහැ. හැබැයි, පසුගිය අය වැයෙන් පොරොන්දු වූ පරිදි එම කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් ගරු ඇමතිතුමාට මම කියන්න ඕනෑ, හැකි ඉක්මනින් සොයා බලා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම පිළිබඳ වාර්තාවක් නිකුත් කරන්න කියලා. එතැනින් පස්සේ වැඩ කටයුතු පටන් ගන්න. මිනිස්සුන්ට ලබා දුන් පොරොන්දු ඉෂ්ට කරන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සුජීව දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SUJEEWA DISSANAYAKE left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 16ක් තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, හැමෝගෙන්ම වෙලාව අඩු වෙලා තිබෙන්නේ.

[අ.භා. 5.01]

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේත්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදයේදී අදහස් දැක්වීමට මට කාලය ලබා දීම ගැන ඔබතුමාට කෘතවේදී වෙනවා. අද උදේ ඉඳලා විපක්ෂයේ මන්ත්‍රීවරුන් මතු කරපු අදහස් අහගෙන ඉන්නකොට මට හිතුණා, ඉතා හොඳ සුරපුරයක් වාගේ රටක් අපට භාර දීලා, ඒක දැන් විනාශ වෙලා වාගේ තමයි ඒගොල්ලන් කථා කරන්නේ කියලා. කොහොම වුණත්, විනාශ කරලා, හප කරලා, නන්නත්තාර කරලා තිබුණු මේ රටේ ආර්ථිකය, ස්ථාවර කරන්න පසුගිය වසරේ අපට පුළුවන් වුණා; සාර්ව ආර්ථික ස්ථාවරත්වය ඇති කරන්න පුළුවන් වුණා. Exchange rate එක, පොලී අනුපාතය, රාජ්‍ය ආදායම, රජයේ වියදම, අය වැය හිඟය යන සියලු දේවල් කළමනාකරණය කරලා, අපේ රටේ ආර්ථිකය ස්ථාවර තැනකට ගෙන එන්න අපට පුළුවන් වුණා. අන්න ඒ සාර්ව ආර්ථික ස්ථාවරත්වය ළඟා කර ගැනීමේ කටයුත්තේදී, අපට විශාල දායකත්වයක් ලබා දුන්නේ විදේශ රටවල ඉඳලා දුක් මහන්සිවෙලා රැකියාවේ නිතර වෙලා අපේ රටට විදේශ විනිමය එවන අපේ රටේ පුරවැසියන්ය කියන කාරණය මතක් කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයේ දැවැන්ත ව්‍යාපාරිකයාගේ ඉඳලා, පුංචි tuk-tuk එකක වැඩ කරන පුද්ගලයා, සංචාරකයන්ට මඟ පෙන්වන්නා ආදී වශයෙන් ඒ ක්ෂේත්‍රයේ නියැළී සිටින කණ්ඩායම් විසින් තමයි මේ ආර්ථික ස්ථායීකරණය ළඟා කර ගන්න අපට විශාල දායකත්වයක් ලබා දුන්නේ. ඒ පිළිබඳව ඔවුන්ට කෘතවේදී වෙන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි, මේ අවුරුද්දේ අපේ විසිලක්ෂයේ ඉලක්කය සම්පූර්ණ කරන සංචාරකයන් වශයෙන් රුසියාවෙල් සහ ක්ලෙයාර් කියලා ප්‍රංශ යුවළක්, අද උදේ UL 504 ගුවන් යානයෙන් ලංකාවට පැමිණි බව. අද මෙතැනදී දිගින් දිගටම සඳහන් කළා, මෙරටට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව ඔළුගෙඩි ගණනින් වැඩි වෙලා තිබුණාට, ආදායම අඩු වෙලා තිබෙනවා කියලා. මම ඒ පිළිබඳව පැහැදිලි කරන්නම්.

ඊට කලින් මම මේ කාරණය කියන්න කැමැතියි. අද උදේම ඇවිල්ලා මෙතැන ලොකු නාට්‍යයක් පටන්ගන්න ලැස්ති වුණා, අපේ රට ආයෙත් විනාශ වෙන්නයි යන්නේ කියලා. ඒ වාගේම විපක්ෂය පැත්තේ ඉන්න "නයි-රොටි" අයත් උත්සාහයක් දරනවා මම දැක්කා, ජාතිවාදය, එහෙමත් නැත්නම් ආගම්වාදය ආයෙත් අවුස්සලා දේශපාලනය කරන්න. අපි දන්නවා, බුද්ධ ධර්මය තමයි අපේ රටේ ශිෂ්ටාචාරයේ, මේ ඓතිහාසික උරුමයේ පදනම කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ මෛත්‍රිය, කරුණාව පිළිබඳව. ජාතිවාදය අවුස්සලා, වෛරය පතුරලා, බෝම්බ ගහලා ඒ මෛත්‍රිය, කරුණාව විනාශ කර දැමීමේ දේශපාලනික, තුච්ඡ උත්සාහයක් විපක්ෂය දරමින් ඉන්නවා. ඒක නැවත දේශපාලනීකරණය කරන්න, ඒකට උඩ ගෙඩි දෙන්න, මේ කණ්ඩායම අද විවිධ අවස්ථාවල මේ සභාව තුළ උත්සාහ දරමින් සිටියා. මම ඉල්ලීමක් කරන්න කැමැතියි, ඒ පහත් දේශපාලනයේ නිරත වෙන්න එපා කියලා.

අපි ඉතාම හොඳින් මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරලා, විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය ඉතාම හොඳ තැනකට ගෙනෙන්න පසුගිය අවුරුද්දේ සමත් වෙලා තිබෙනවා. 2019න් පස්සේ වාගේ, පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පස්සේ වාගේ

තැනකට ආයෙත් මේ රට ගෙනෙන්න දැන් උත්සාහ කරනවා. 21වැනි දාට සෙනහ සංවිධානය කර ගන්න අවශ්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා, නැවත මේ කර්මාන්තය බිමට සමතලා කරලා, මේ කර්මාන්තයේ යෙදිලා ඉන්න අයගේ සහ රටේ සමස්ත ආර්ථිකය බිමට ඇද දමන උත්සාහයක තමයි විපක්ෂයේ සමහර කණ්ඩායම් දැන් නිරත වෙමින් ඉන්නේ. ඒ පහත් දේශපාලනය නැවත අපේ රටේ ඇති කරන්න එපා. අපි ඒකෙන් ඇති වෙන්න බැට කෑවා; අපේ රටේ පුරවැසියන් බැට කෑවා. එම නිසා මේ අවස්ථාවේදී විපක්ෂයෙන් ඒ ඉල්ලීම කරන්න මම කැමැතියි.

දැන් මන්ත්‍රීවරයෙක් කිව්වා නේ, සංචාරකයන්ගේ පැමිණීම වැඩි වෙනවා, හැබැයි, ඒගොල්ලන්ගේ වියදම් කිරීමේ ප්‍රමාණය අඩුයි කියලා. විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම කියන්න කැමැතියි, ඔයගොල්ලන් මේ ලෝකයත් එක්ක update වෙන්න, මේ ලෝකයේ ජීවත් වෙන්න, මේ ලෝකයේ මොකක්ද වුණේ කියලා හොඳට අධ්‍යයනය කර බලන්න කියලා. 2018දී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයෙක් දිනකට ඩොලර් 181ක වියදමක් දරනවා කියලා අපි ගණනය කර තිබුණා. ඒ වෙලාවේ ඩොලරයක වටිනාකම රුපියල් 180යි. එහෙම බැලුවොත් ඒ අයගේ දවසක වියදම රුපියල් 32,500යි. අපි 10,000ක sample එකක් අරගෙන තවත් අලුත්ම airport survey එකක් කළා. අන්න ඒ survey එකට අනුව ශ්‍රී ලංකාවට එන එක සංචාරකයෙක් දවසකට වියදම් කරන්නේ ඩොලර් 148යි. එහෙම බැලුවොත් අද ඩොලරයක වටිනාකම රුපියල් 300යි. එහෙම calculate කරලා බැලුවොත් සංචාරකයෙක් දවසකට රුපියල් 44,400ක වියදමක් දරනවා. මම මේ කියන්න ලෑස්ති වෙන්නේ මේකයි. අද වන විට ලෝකයේ ආර්ථිකය වෙනස් වෙලා.

අපි මේ කලාපයේ අනෙකුත් රටවල් අරගෙන බලමු. වියට්නාමයට යන සංචාරකයෙකුගේ දෛනික වියදම ඩොලර් 120යි. තායිලන්තයට යන සංචාරකයෙකුගේ දෛනික වියදම ඩොලර් 115යි. මාලදිවයින ගත්තොත් ටිකක් වෙනස් තත්ත්වයක් තිබෙන්නේ. මාලදිවයින කියන්නේ ඉහළ සංචාරක අත්දැකීමක් ලබා දෙන රටක්. එහි තිබෙන්නේ දූපත්. මාලදිවයිනට යන සංචාරකයෙක් දිනකට ඩොලර් 250ක් වාගේ ප්‍රමාණයක් වියදම් කරනවා. අපි කාම්බෝජය ගත්තොත්, එහි සංචාරකයෙකුගේ දෛනික වියදම ඩොලර් 100යි. එතකොට කාම්බෝජයට වඩා, වියට්නාමයට වඩා, මලයාසියාවට වඩා හොඳ රටක් ද අපි භාර ගන්නකොට තිබුණේ? අපේ රට 2022දී බංකොලොත් වීමත් එක්ක අපේ US Dollar exchange rate එකත් එක්ක විශාල වශයෙන් රුපියල අවප්‍රමාණයට ලක් වුණා. අන්න ඒ බලපෑමත් එක්ක තමයි අපේ රටට එන සංචාරකයෙකුගේ දෛනික ඒකපුද්ගල වියදම ඩොලර් 148කට අඩු වෙලා තිබෙන්නේ. එහෙම නැතිව මේක අපේ ආණ්ඩුව හින්දා වෙච්ච සිද්ධියක් නොවෙයි. ඒ අවබෝධය ලබා ගන්න විපක්ෂයට නුවණ පෑදේවා කියා මේ වෙලාවේ ප්‍රාර්ථනා කරන්න කැමැතියි.

විශේෂයෙන්ම සංචාරකයන්ගේ පැමිණීම ගැන මේ සභාවේදී අවස්ථා කිහිපයකදීම කරුණු සඳහන් වුණා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් මේ ගැන උදේම මෙතැන යම් කරුණු වගයක් කියලා යන්න ගියා. අපේ රට, ලෝකයේ තිබෙන රටවල් අතරින් පොඩි දූපතක්. අපේ රටට එන්න තිබෙන්නේ ගේට්ටු දෙකයි. එකක් Port එක; අනෙක Airport එක. මේ දෙවිධියෙන් රට ඇතුළට එන්න බැරි නම්, එන්න තවත් ක්‍රමයක් නැහැ. සංචාරකයන්ගේ පැමිණීම වැඩි කරන්න අවශ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් අපි කළේ නැහැ ලු. දැන් සතියකට ගුවන් යානා ඉල්ලීම්, විශේෂයෙන්ම winter charter flights 30ක්, 40ක් අපට cancel කරන්න වෙලා තිබෙනවා. ඒකට හේතුව, Airport එක expand කර ගන්න බැරි වෙච්ච එක. ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් අද උදේ මේ ගැන සඳහන් කරලා ගියා. ඒගොල්ලන්ගේ ඇමතිවරුන් කප්පම් ඉල්ලපු නිසා තමයි එදා JICA එක ආපහු ගියේ. ඒ ජපන් සමාගම ආයෙත් අපේ රටට එනකොට හිටපු ජනාධිපතිවරයාත් අර කලින් හිටපු ඇමතිවරයා නැවතත් ඒ අමාත්‍යාංශයටම පත් කරපු නිසා JICA එක ආයෙත් ගියා. ඒවාට උදව් කරපු අය තමයි විපක්ෂයේ වාඩිවෙලා දැන් අපට වැදි බණ කියන්නේ.

එළඹෙන වසරේදී අපේ ප්‍රධාන ගුවන් තොටුපොළේ Terminal 2 එකේ expansion project එක අපි ආරම්භ කරනවා. ඒකත් එක්ක තමයි දැනට අපට මේ අභියෝගය එල්ල වෙලා තිබෙන්නේ. ගිය වසරේ අපේ රටට සංචාරකයන් මිලියන 2ක් ආවේ දෙසැම්බර් 26වැනි දා වනකොට. අද නොවැම්බර් 17වන දා. මේ වසර ඇතුළතදී -අද වනකොට- අපේ රටට සංචාරකයන් ලක්ෂ 20ක් ඇවිල්ලා තිබෙනවා. 280,000කට ආසන්න තවත් සංචාරකයන් ප්‍රමාණයක් ඉදිරි මාස දෙක තුළදී අපේ රටට පැමිණෙයි කියලාත් අපි හිතනවා. මොකද මේ, winter season එක. මත්තල airport එකට සතියකට flights 10ක් විතර එනවා. කටුනායක flights 30ක්, 40ක් accommodate කරන්න පුළුවන් වුණා නම්, අපට අනිවාර්යයෙන්ම 3 million tourists target එකට මේ වසරේ යන්න පුළුවන්කම තිබුණා. හැබැයි අවාසනාවකට මේ රටේ අනාගතය දිහා බලලා, ලෝකයේ කර්මාන්තවල දියුණුව බලලා අපට වැඩ කරන්න බැරි වෙලා තිබුණා. මේ නිසා දශක ගණනාවක් තිස්සේ අපේ ගුවන් තොටුපොළවල් පුළුල් කර ගන්න අපට බැරිවෙලා තිබෙනවා. ඒ ව්‍යාපෘතිත් අපි බලයට ආ පසු අපටම තමයි දැන් කරන්න වෙලා තිබෙන්නේ. එවැනි අභියෝගයක් තිබෙන නිසා මිසක්, අපේ ප්‍රවර්ධන කටයුතුවල ප්‍රශ්නයක් නිසා සංචාරකයන්ගේ පැමිණීමේ අඩුවක් වුණා නොවෙයි. අපි ඉලක්ක කළ සංචාරකයන් ප්‍රමාණය අපට සපුරා ගන්න බැරිවෙලා තිබෙන්නේ ශ්‍රී ලංකාව පිළිබඳව සංචාරකයන් තුළ තිබෙන අවබෝධයේ ගැටලුවක් නිසා නොවෙයි.

ඊළඟට, මෙතැනදී tourist harassments ගැන කථා කළා. අපට මතකයි, ඉතිහාසයේ කොහොමද මේවා වුණේ කියලා. එක්තරා කාල වකවානුවකදී ලංකාවට පැමිණි තරුණ සංචාරක යුවළකට මුහුණ පාන්න වූ සිදුවීම අපට මතකයි. එවකට හිටපු පාදඩ දේශපාලනඥයෙක් ඒ විදේශීය තරුණයා මරා දාලා ඒ තරුණිය අපයෝජනය කරලා - දූෂණය කරලා - අපේ රටේ image එක ජාත්‍යන්තර වශයෙන් කළු කළා. එවැනි දේවල්වලටත් දේශපාලනඥයන් වශයෙන් support එක දුන් අය තමයි දැන් අපට ඇවිල්ලා කියන්නේ, මේ ආණ්ඩුව කාලයේ tourist harassments වෙනවා කියලා. යම් සිද්ධියක් ඊයේ පෙරේදා වෙලා තිබෙනවා. ඕනෑම රටක එවැනි සුළු සිදුවීමක් වෙන්න පුළුවන්. එවැනි සිදුවීම්වලට සම්බන්ධ එක්කෙනෙක්, දෙදෙනෙක් වාර්තා වුණා. ඒ අය මේ වනකොට අත්අඩංගුවට පත්වෙලා තිබෙනවා. තිරුක්කෝවිල්වලින් එක්කෙනෙක් අත්අඩංගුවට ගත්තා. අනෙක් කෙනා අත්අඩංගුවට ගන්න පොලීසියෙන් ඔහුගේ නිවසට ගිහිල්ලා රාත්‍රි 12 වෙනකම් හිටියත් ඔහු නිවසට ආවේ නැහැ. නමුත්, ඔහු අද උදේ මහනුවර සංචාරක පොලිස් ඒකකයට ඇවිල්ලා බාරවෙලා තිබෙනවා. ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක වනවා. ඉස්සර එහෙම වුණේ නැහැ. ඉස්සර මේ වාගේ දේවල් කරපු අය ආරක්ෂා කළා. ඒ නිසා අපේ රටේ සංචාරක කර්මාන්තයට අදාළව විශේෂයෙන්ම අපේ රටේ කීර්තිනාමය පවත්වා ගන්න, ඉහළට ගන්න අවශ්‍ය මැදිහත්වීම නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශයෙන් අපි දැන් සහතික කර තිබෙනවා.

ඒ වාගේම නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා සඳහන් කළා, ඒගොල්ලන්ගේ පුංචි ව්‍යාපාරිකයන්ට අපි කරදර කරනවා කියලා. එහෙම නැහැ. මොකක්ද මේ වෙන්නේ? අපේ රටේ සංචාරක කර්මාන්තයේ විතරක් නොවෙයි, ඔබතුමන්ලා දන්නවා ඇති, අපේ රටේ ප්‍රයිවට් බස් ටික යනකොටත් මහ දිගට කප්පම් දීගෙනයි

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

යන්න ඕනෑ. ඒ කප්පම් එකතු කරලා මේගොල්ලන්ට දෙන අය beach එක පුරා වපුරලා ඉන්නවා. මුහුදේ පාවෙලා එන කුඩු අහුලාගෙන විකුණන කණ්ඩායම් මේගොල්ලන් දාලා තිබෙනවා. ඒ නිසා ඉතා අක්‍රමවත් සංවර්ධනයක් අපේ මුහුදු තීරවල සිද්ධවෙලා තිබෙනවා. අන්න ඒක ක්‍රමවත් කරන්න අවශ්‍ය වැඩසටහන් අපි ක්‍රියාත්මක කරලා තිබෙනවා. හැබැයි, ව්‍යාපාරවල නිරත වූ අය ඇතුළු ඒ ස්ථානවලට සම්බන්ධ කිසි කෙනෙකුට අසාධාරණයක් වෙන්නේ නැහැ. පසුගිය දවසක අපි වැලිගම ප්‍රදේශයට ගියා. අපි දැන් අරමුදල් යොදවලා surfing schools කරන operatorsලා වෙනුවෙන් එතැන ඉදිකිරීමක් කරනවා. ඒක හදලා ඒ අයට ලබා දෙනවා. එහෙම නැතුව ඒවායේ බිස්නස් කරන්න අපේ කවුරුවත් යන්නේ නැහැ. අපේ ඇමතිවරු, මන්ත්‍රීවරු කවුරුවත් ඒ තැන්වලට තමන්ගේ ගෝලයෝ දමන්නේ නැහැ.

ඒ වාගේම උතුරු, නැගෙනහිර සංවර්ධනය පිළිබඳවත් සඳහන් වුණා. මට මතකයි, 2025දීත් මේ කථාවම ආවා. මේ ප්‍රදේශයේ විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා 2025දී අපේ අමාත්‍යාංශයේ අරමුදල්වලින් අපි රුපියල් මිලියන 55ක් වෙන් කරලා තිබුණා. මේ අවුරුද්දේ අපි ඒ මුදල රුපියල් මිලියන 131 දක්වා වැඩි කරලා තිබෙනවා. ඊට අමතරව දැවැන්ත ක්‍රීඩාගාර පරිශ්‍රයක් යාපනයේ ස්ථාපිත වෙනවා. මේ වෙනකොට සංචාරක ක්ෂේත්‍රය ඉලක්ක කරගෙන ඒ ප්‍රදේශයේ ආයෝජන කටයුතු කරන්න ආයෝජකයෝ අපිත් එක්ක සාකච්ඡා කරමින් ඉන්නවා. ඩෙල්ෆ් දූපතේ බෝට්ටු සඳහා solar පද්ධති සවි කරන්න සහ ඒවා standardize කරන්න අපි මේ වෙනකොට වැඩ කරමින් ඉන්නවා. විශේෂයෙන්ම මන්නාරම ඇතුළු ප්‍රදේශවල සංවර්ධන කටයුතු සඳහා වැඩ කරනවා. ලෝක බැංකුවේ ඩොලර් මිලියන 100ක ආධාර යටතේ එයින් වැඩි ප්‍රමාණයක් යාපනය දිස්ත්‍රික්කය ඇතුළු Nothern Province එකේ සංචාරක ක්ෂේත්‍රයේ development සඳහා යොදන්න එකඟ වෙලා, සාකච්ඡා කරලා මේ වෙනකොට ඒ කටයුතු කරමින් ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා සඳහන් කළා, Tourism Fund එකෙන් රුපියල් මිලියන 500ක් අරගෙන තිබෙනවා කියලා. අපි ඒ මුදල වෙන් කරලා තිබෙන්නේ පුහුණු කටයුතු සඳහා. විශේෂයෙන් මේ ක්ෂේත්‍රයේ වැඩ කරන්න 2030 වෙනකොට අපට ලක්ෂ 8ක වාගේ පිරිසක් අවශ්‍ය වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. අපි සමෘද්ධි අධිකාරියත් එක්ක සම්බන්ධ වෙලා, "සත්කාරයේ ශ්‍රම සේනා" කියලා වැඩ පිළිවෙළක් ආරම්භ කරලා, දිළිඳු සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල දරුවන් තෝරාගෙන අපේ Tertiary and Vocational Education Commission එකත් එක්ක ඒකාබද්ධ වෙලා, සංචාරක ක්ෂේත්‍රයේ රැකියාවක් දෙන්න අවශ්‍ය පුහුණුව ලබා දෙන්න ඕනෑ කරන මුදලක් විධියට තමයි ඒ මුදල පාවිච්චි කරන්නේ. වතු කම්කරුවාට රුපියල් 200ක් ගෙවන්න එපා කියපු විපක්ෂය, දිළිඳු පවුලක දරුවෙක් රැකියාගත කරන්න අවශ්‍ය පුහුණුව ලබා දෙන්න මුදල් වෙන් කරන එකට විරුද්ධ වීම ගැන අපි පුදුම වෙන්නේ නැහැ. මොකද, ඒගොල්ලන්ට අවශ්‍යයි, වතු දිළිඳුකම වාගේම අපේ ප්‍රජාවේ දිළිඳුකම දිගටම පවත්වාගෙන ගිහිල්ලා, ඒගොල්ලන් කරපු දේශපාලනය දිගටම කරගෙන යන්න. හැබැයි, අපි ඒක ඉවර කරනවා. මේ අය වැයත් එක්ක විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශයට අදාළව දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරලා, සංචාරක ක්ෂේත්‍රය ඉදිරියට මෙහෙයවන්න අපි කටයුතු කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම සඳහන් කළේ පුහුණු කිරීමේ කටයුතු සඳහා පුහුණු ශ්‍රමිකයන් අවශ්‍යයි කියන එකයි. ඔබතුමා පොට වරද්දාගෙන. මට තවම ඒ විධියට වැරදිලා නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

මම ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා, කාලය සීමිත බැවින් මේ මොහොතේ කාලය කළමනාකරණය කිරීම අත්‍යවශ්‍යයි කියලා.

[අ.භා. 5.14]

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට නියමිතව තිබූ කාලය අඩු කරපු නිසා මම ඉතා ඉක්මනින් මේ කාරණා ටික කියන්නම්.

මම ඉන්නේ කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ආසනයේ. අධිකරණ පද්ධතිය ගැන කිව්වොත්, මතුගම ආසනයේ තිබෙන උසාවිය තමයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5ක, පොලීසි 5ක සියලු වැඩ කටයුතු කරන්නේ. ලක්ෂ 3කට ආසන්න ජනතාවකට සේවය සලසන එකම උසාවිය ඒක. ඒ සියලුමදෙනා එතැනදී දඩුවම් විඳිනවා; පැමිණිලි පාර්ශ්වය, විත්ති පාර්ශ්වය, සාක්ෂිකරුවෝ, රජයේ සාක්ෂිකරුවෝ, රජයේ වෛද්‍යවරු කියන ඒ සියලුදෙනාම දඬුවම් විඳිනවා. ඒකට හේතුව තමයි, එතැන සීමිත ඉඩකඩක් තිබීම. ඊට අල්ලපු තැන තිබෙන්නේ rest house එකක්, ඒකට අල්ලපු තැන තිබෙන්නේ ශ්‍රවණාගාරය, ඒකට අල්ලපු තැන තිබෙන්නේ St. Mary's College එක. කිසිම ගැළපීමක් නැහැ. කිසිදු ගැළපීමක් නැති තැනක ඒ උසාවිය ස්ථාපිත කරලා මේ වෙනකොට අවුරුදු ගණනාවක් වෙනවා. ඒක ඔබතුමන්ලාගේ වැරැද්දක් කියලා මම කියන්නේ නැහැ. දැන් ඔබතුමන්ලාට බහුතර

බලයක් දීලා තිබෙනවා. එම නිසා අධිකරණ සේවා කොමිසම හෝ ගරු අධිකරණ ඇමතිතුමා හෝ අපේ පැත්තට ඇවිල්ලා ඒ පිළිබඳව සොයා බලා කරුණාකරලා අපට තව උසාවියක් ස්ථාපිත කරලා දෙන්න.

මහෙස්ත්‍රාත් අධිකරණයේයි, දිසා අධිකරණයේයි දරා ගන්න බැරි තරමේ නඩු සංඛ්‍යාවක් තිබෙනවා. නඩු කඩිනම් කරනවා කිව්වාට, ඒ උසාවියේ තිබෙන නඩු කඩිනම් කරන්න නම් ලැබෙන්නේ නැහැ. එතැනට එන මිනිසුන්ට අවශ්‍ය අවම පහසුකම් ටිකවත් නැහැ. අඩුම ගණනේ ඒ උසාවි පද්ධතිය තුළ පොදු වැසිකිළියක්වත් නැහැ. මට ඒ ගැන කියන්න තිබෙන්නේ එච්චරයි. අධිකරණ සේවා කොමිසමෙන් ඇවිල්ලා ඒවා පරීක්ෂා කර බලන්න. එහෙම පරීක්ෂා කර ඊට පිළියමක් යොදන්න.

කළුතර බන්ධනාගාරය ගත්තොත්, ඒකට වැඩියෙන්ම යන්නේ මතුගම උසාවියෙන්. කළුතර බන්ධනාගාරය පිරී ඉතිරී ගිහින් තිබෙන්නේ. රැඳවියන් 800කට ඉන්න පුළුවන් තැන 2,800ක් පමණ ඉන්නවා. මම මේ ළඟදී බන්ධනාගාරයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් ගියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතැන ගොඩනැඟිලි දෙකක් තිබෙනවා. ඒවා අවදානම් තත්ත්වයක පවතින නිසා සිරකරුවන් ඒවායෙන් අයින් කරලා. ඒවා කඩා වැටෙන්න ඔන්න මෙන්න තිබෙන්නේ. එම ගොඩනැඟිලි කඩාගෙන වැටුණොත් සිරකරුවන් මිය යන්න වුණත් පුළුවන්.

ඊට පසුව මම බැලුවා, නිලධාරීන් ඉන්න quarters ගැන. ඒවාට නිල නිවාස කියන්නත් ලජ්ජයි. මගේ ළඟ ඒවායේ ඡායාරූප තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී එම ඡායාරූප ඇතුළු සියලු ලේඛන **සභාගත*** කරනවා.

ඊට පසුව මම ඒවායේ තිබෙන අඩුපාඩු ගැන සොයා බැලුවා. අඩුපාඩු ගැන බලා මම මුළු බන්ධනාගාරයටම ceiling fans, wall-mounted fans ලබා දුන්නා, බන්ධනාගාර කොමසාරිස් හරහා අවසර ලබාගෙන. අපරාදේ කියන්න බැහැ, එහේ උදය කුමාර කියලා බන්ධනාගාර කොමසාරිස්වරයෙක් ඉන්නවා. එතුමා අවුරුදු 25ට අඩු සිරකරුවන් වෙනම වාට්ටුවකට දමා තිබෙනවා. බලන්නකෝ, කොයි තරම් දේවල් තිබෙනවාද, අපට මේ තුළ හරිගස්සන්න.

බලන්න, බන්ධනාගාර බස් රථයෙන් තමයි පරිවාසගත කර සිටින ළමයි උසාවි අරගෙන යන්නේත්. යම් යම් වැරැදිවලට හසුවන ළමයි ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙන් පරිවාසයට යොමු කරනවා, මොකක් හරි විසඳුමක් දෙනකම්. ඒගොල්ලන් උසාවි අරගෙන යන්නේත්, අර බස් එකේමයි. පාතාලයේ කට්ටියත් එක්ක, කුඩුකාරයෝත් එක්ක අර ළමයි ටිකත් ඒ බස් එකේ අරගෙන යනවා. ඊට පසුව ආයෙත් අරගෙන එන්නේත් ඒ බස් එකේමයි. ඇයි, ළමා ආරක්ෂක අධිකාරියට ඒ සඳහා අවශ්‍ය පහසුකම් දෙන්නේ නැත්තේ? ඇයි, ඒ ළමයි අරගෙන යන්න වාහනයක් දෙන්නේ නැත්තේ? මොකක්ද මේ වෙන්නේ? බන්ධනාගාරය පිරී ඉතිරී ගිහිල්ලා.

ඒ නිසා මේවාට කඩිනම් විසඳුමක් අවශ්‍යයි. මේ වෙලාවේ මට කියන්න තිබෙන්නේ අපි සියලුදෙනා මැදිහත් වෙලා මේ ප්‍රශ්නයට විසඳුම් දෙන්න ඕනෑය කියන එකයි. මේක ව්‍යසනයක්. මේ සිරකරුවන් එළියට එන දවසකට එන්නේ වෛරයෙන්. කුඩු ග්‍රෑම් එකක දෙකක රස පරීක්ෂක වාර්තාව එන්න අවුරුද්දක්, මාස 18ක් පමණ ගත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ මාස 18 තුළ තව කී දෙනෙක් මේකට එකතු වෙනවාද? ඊළඟට, ඇප කොන්දේසි බලන්නකෝ. මේ කරන්නේ අධිකරණය හෑල්ලු කිරීමක් නොවෙයි. ඇප කොන්දේසි දමනවා, ලේ ඥාතීන් කියලා. ලේ ඥාතීන් කිව්වාට පසුව නෝනාට අත්සන් කරන්න බැහැ, සැමියා වෙනුවෙන්. සැමියාට බැහැ, නෝනාට අත්සන් කරන්න. ඒ වාගේ ඇප කොන්දේසි නිසා සැහෙන ප්‍රමාණයක් ඇතුළේ ඉන්නවා, ඇප ගන්න බැරිව. අපි ගියාම ඒ මිනිස්සු අපට ඒ ගැන කියනවා.

මම විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන්ට කියන්න කැමැතියි, ඇවිත් ඒ ගැන බලන්න කියලා. බන්ධනාගාරවලට ගිහිල්ලා බලන්න. ලොකු දානයක් දෙනවාට වඩා පින්කමක් ඒ මිනිස්සුන්ට කරන උදව්ව. වැරදිකාරයන්ට දඬුවම් දුන්නාට කමක් නැහැ. නමුත් මේ සැකකරුවන් වශයෙන් ඉන්න කට්ටියටත් දඬුවම් ලැබී තිබෙන්නේ අවුරුදු ගණනාවක් තිස්සේ. ඒක විය යුතුද? එහෙම වෙන්න බැහැ. වැරදිකරුවා, නිවැරදිකරුවා අධිකරණයෙන් තීන්දු කරනකම්, මේ සියලුදෙනාත් වැරදිකරුවන් බවට පත් වෙලා, මේ තිබෙන ක්‍රමය මත.

වැසිකිළි, කැසිකිළි ආදී කිසිම පහසුකමක් එම බන්ධනාගාරය තුළ නැහැ. ඒ සිරකරුවන් නිදා ගන්නේ අපහසුවෙන් කකුල් දෙක වකුටු කරගෙන. සැමන් මාළු ටින් එකට දැම්මා වාගේ නිදා ගන්නේ. මේවා වෙන්න පුළුවන්ද? අපායේවත් මෙහෙම සිද්ධියක් දැක ගන්න නැතුව ඇති. ඒ නිසා අපි බන්ධනාගාරයට ගිහින් පුළුවන් විධියට ඒ අයට උදවු කරමු. මම තීරණය කර තිබෙනවා, මට පුළුවන් විධියට පෞද්ගලිකව හෝ යම්කිසි පහසුකමක් ලබා දෙන්න. මෙන්න මේවා කරුණාකරලා සොයා බලන්න. අධිකරණ ඇමතිතුමා මෙතැන හිටියා නම් හොඳයි, මේ වෙලාවේ. එතුමා මෙතැන නැති වුණත් නිලධාරි මැදිරිය තුළ අධිකරණ සේවා කොමිසමේ නිලධාරීන් සිටින නිසා මම කියන්න කැමැතියි, මේවා ගැන සොයා බලා කටයුතු කරන්න කියලා.

මට ලැබී තිබෙන කාලය සීමිත නිසා මට ගොඩක් දේවල් කියන්න බැරි වෙනවා. මම හිතුවා, මට විනාඩි 10ක්වත් ලබා දෙයි කියලා.

වයස අවුරුදු 18ට අඩු රැඳවියන් පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. කළුතර බන්ධනාගාරය තුළ වාගේම අධිකරණ භූමිය තුළ තිබෙන අප්‍රසන්නතාවත් නැති කරන්න. කිසි කෙනෙක් මතුගම උසාවියට කැමැත්තෙන් එන්නේ නැහැ, බැණ බැණ යන්නේ. කිසිම පහසුකමක් නැහැ. ඒ නිසා මෙන්න මේවා ගැන අවධානය යොමු කර කටයුතු කරන ලෙස අධිකරණ අමාත්‍යාංශයෙන් මම ඉල්ලා සිටිනවා.

මට මේ වේලාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.19]

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ පිළිබඳව විවාද කරන මේ මොහොතේදී, මුලින්ම මම විදේශ කටයුතු අමාත්‍යාංශය පිළිබවඳ අදහස් කීපයක්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චතුර ගලප්පත්ති මහතා]

ප්‍රකාශ කරන්න කැමැතියි. විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැදගත්ම කාර්යභාරය විය යුත්තේ විදේශ ප්‍රතිපත්තිය ඒකගෙන ඒ ප්‍රතිපත්තිය මත පිහිටා රටක් වශයෙන් දුරදිග බලා කටයුතු කිරීමයි. ඊට ප්‍රධානම හේතුව ඒ ඒ අවස්ථාවලදී පැන නගින බොහොමයක් අන්තර්ජාතික දේශපාලන අර්බුද හා ගැටලුවලදී ශ්‍රී ලංකාවේ හැසිරීම, ශ්‍රී ලංකාවේ චින්තනය, ශ්‍රී ලංකාව රටක් වශයෙන් දක්වන ප්‍රතිචාරය යනාදී සියල්ලම රටට දීර්ඝ කාලීනව, මධ්‍ය කාලීනව හා කෙටි කාලීනව බලපෑමයි. එම නිසා රජයක් මාරු වුණු පමණින්ම හෝ ඇමතිවරයෙක් වෙනස් වුණු පමණින් රටක විදේශ ප්‍රතිපත්තියත් ඊට සමගාමීව මාරුවීම විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වාගේ රටකට කිසිසේත්ම ඔරොත්තු දෙන්නේ නැහැ.

ලෝකයේ වෙන කිසිම රටකත් ඒ වාගේ දෙයක් සිදු වන්නේ නැහැ. ඒකට ප්‍රධානම තාක්ෂණික කාරණාව තමයි ශ්‍රී ලංකාවේ පිහිටීම. ඒ මත රඳිලා තමයි අපේ විදේශ ප්‍රතිපත්තිය ගොඩනැඟෙන්න ඕනෑ. ඒ නිසා මම යෝජනාවක් විධියට මේ කාරණය ඉදිරිපත් කරනවා. විදේශ කටයුතු අමාත්‍යාංශයේ විදේශ ප්‍රතිපත්තිය, රජයක් මාරු වෙනකොට, ඇමතිවරු මාරු වෙනකොට, නිලධාරීන් මාරු වෙනකොට, තානාපතිවරු මාරු වෙනකොට කිසිසේත් වෙනස් නොවී, රටක් වශයෙන් ලංකාවේ අනන්‍යතාව ඒකගෙන, ජාතික අවශ්‍යතා සියල්ල හඳුනාගෙන ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ඒ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යෑම අරමුණු කරගෙන think-tank එකක්, එහෙම නැත්නම් විෂයානුබද්ධ දැනුම තිබෙන කණ්ඩායමක් පත් කර ගැනීම තමයි උචිත වන්නේ. ඒ අය රජයේ නිලධාරීන්ම විය යුතු නැහැ, කීර්තිමත් ඉතිහාසයක් තිබෙන, මේ රටේ පමණක් නොවෙයි, ජාත්‍යන්තර තලයේ විෂයානුබද්ධ දැනුම තිබෙන කණ්ඩායමක් පත් කර ගන්න පුළුවන්. එහෙම පත්කර ගත්තොත් මා විශ්වාස කරනවා, ලංකාව ගෝලීය වශයෙන් පිහිටා ඇති ස්ථානයට සාපේක්ෂව, ඊට අදාළ වන ශක්තිමත් විදේශ ප්‍රතිපත්තියක් අපට සකස් කර ගන්න පුළුවන් වෙයි කියලා. විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා කරන්න පුළුවන් හොඳම ආයෝජනය ඒක විධියටයි මා දකින්නේ.

පසුගිය අවුරුද්දක කාලය පුරාවට අතිගරු ජනාධිපතිතුමා විදේශ සංචාර අටකට සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමිය සංචාර හයකට සම්බන්ධ වෙලා තිබෙනවා. අපේ විදේශ කටයුතු අමාත්‍යතුමාත් අපි දන්නා විධියට ජනාධිපතිතුමා සම්බන්ධ වෙච්ච සියලු විදේශ සංචාරවලට සම්බන්ධ වෙලා තිබෙනවා. අනික, අපි දන්නා විධියට විජිත හේරත් මැතිතුමා ජනාධිපතිතුමාගේ අතිජාත මිත්‍රයකු විධියට, ඉල්ලාගෙන තමයි මේ අමාත්‍යාංශය භාර ගත්තේ. එතුමා කැමැත්තෙන් භාරගත් අමාත්‍යාංශය තුළින් අවුරුද්දක් පුරාවට මේ රටට මොන වාගේ දෙයක්ද දායාද කරලා තිබෙන්නේ? එහෙම නැත්නම් මේ රටට කුමන විදේශ ආයෝජනද ගෙනැල්ලා තිබෙන්නේ? විශේෂයෙන්ම මේ රටට කොච්චර ඩොලර් ප්‍රමාණයක් ගෙනාවාද? එතුමාගේ උදේ කථාවේදී කියලා තිබුණා, ගිවිසුම් 70කට අත්සන් කරලා තිබෙනවා, ආයෝජන සමාගම් 150ක් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා කියලා. නමුත් කාරණාව තිබෙන්නේ මේ කිසි දෙයක් අපට බලාගන්නවත්, මේ රටේ ජනතාවට දැන ගන්නවත් අවස්ථාවක් හිමි කරලා නැති ඒක. ඒ නිසා අපි මේ වාගේ ප්‍රශ්නයක් අහන එක සාධාරණයි. පුළුවන් ඉක්මනින් ඒ ගිවිසුම් අපටත්, රටටත් බලාගන්න අවස්ථාව සලසා දෙන්න කියා ඉල්ලනවා.

විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා සම්බන්ධ වෙච්ච ඒ සංචාරවලදී අපට පෙනෙන විධියට ඒ රටවල ඉන්න ශ්‍රී ලාංකිකයන්ට වාගේම ඩයස්පෝරාවේ ඉන්න ජනතාවට ආමන්ත්‍රණය කරන්න තමයි මූලිකත්වය දුන්නේ; වැඩි අවස්ථාවක් යොදා ගත්තේ. ඒකෙන් අපට වක්‍රව හැඟෙන කාරණාවක් තිබෙනවා. විශේෂයෙන් ඒකේ අරමුණ විධියට මේ රටට දෙයක් ගෙනෙනවාට වඩා, පැලවත්තේ භාණ්ඩාගාරය පොඞ්ඩක් ශක්තිමත් කර ගන්න උත්සාහයක් දරනවා කියලා තමයි අපට හැඟෙන්නේ. අපි විශ්වාස කරනවා, ඉදිරි කාලයේදී අතිගරු ජනාධිපතිතුමාගේ ඒ රාජ්‍ය තාන්ත්‍රික සංචාරවලින් මේ රටට ගෙනෙන්න පුළුවන් උපරිම ප්‍රතිලාභ ගෙන එයි කියලා.

විදේශ රැකියා අමාත්‍යාංශය පිළිබඳවත් යම් අදහසක් ඉදිරිපත් කරන්න ඕනෑ. විදේශ රැකියා අමාත්‍යාංශය හරහා ලංකාවෙන් යන තරුණයන් බලාපොරොත්තු වෙන්නේ ලංකාවට සාපේක්ෂව ඉහළ වැටුප් තලයක තිබෙන රැකියා හොයා ගන්නයි. නමුත් අපි ඒ රටවල් දිහා බැලුවොත් ඒ රටවල පහළම වැටුප් තලවල තිබෙන රැකියාවලට තමයි ලංකාවේ තරුණ-තරුණියන් පොරකාලා යන්නේ. උදාහරණයක් විධියට කම්කරු, කෘෂිකර්ම, ධීවර, ඉවුම් පිහුම්, කාර්මික වැනි පහළ මට්ටමේ රැකියාවලට තමයි අපේ තරුණ-තරුණියන් යන්නේ. නමුත් ඉහළ වැටුප් ලබන්න පුළුවන් රැකියා විශාල ප්‍රමාණයක් විදේශ රටවල වාගේම ලංකාව තුළත් තිබෙනවා.

හැබැයි, පුහුණු ශ්‍රමිකයන් නැති එකයි අපට තිබෙන ගැටලුව. ඒ නිසා මම විශ්වාස කරනවා, පුහුණු ශ්‍රමිකයන් පිරිසක් ඇති කිරීම අපට කරන්න පුළුවන් ලොකුම ආයෝජනයක් කියලා. අනාගතයේ අපේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ වෘත්තීය සුදුසුකම් ලබන්න අවස්ථාව සලසා දීම තුළින් මේකට දිය හැකි හොඳම උත්තරය අපට දෙන්න පුළුවන් කියලා මම හිතනවා. එක පැත්තකින් O/L අසමත් වෙන දරුවන් එහෙම නැත්නම් අධ්‍යාපනය මඟදී අවසාන වන දරුවන් ඉලක්ක කරගෙන අපට පුළුවන් නම් 9 වසරේ සිට වෘත්තීය පුහුණු පාඨමාලා හදාරන්න අවස්ථාව ලබා දෙන්න, එය වඩා ඵලදායි වෙනවා. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා එවැනි අවස්ථාවක් ලැබෙනවා නම්, අපට නිකම්ම නිකම් ශ්‍රමිකයන් යවනවාට වඩා පුහුණු ශ්‍රමිකයන් යැවීමෙන් ප්‍රේෂණ වැඩියෙන් ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා. අනෙක් පැත්තෙන් විරැකියාවට උත්තරයකුත් ලැබෙනවා.

ඒ වාගේම තව කාරණාවක් තිබෙනවා. බන්ධනාගාර විෂයය පිළිබඳවත් අද සාකච්ඡාවට ගැනෙන නිසා මේක කියන්න ඕනෑ. විශේෂයෙන් මත්ද්‍රව්‍යවලට හෝ වෙනත් විවිධ කාරණාවලට අද මැදිහත් වෙන්නේ අධ්‍යාපනය අතින් අඩු මට්ටමක ඉන්න තරුණ පිරිස. ඒ නිසා මම අර කියපු කාරණාවට වැඩි අවධානයක් යොමු කළොත්, ඒ සඳහා වැඩි ආයෝජනයක් කළොත්, මේ කාරණා කිහිපයටම ප්‍රයෝජනවත් වෙයි.

සංචාරක අමාත්‍යාංශය යටතේත් බොහෝ කාරණා කියන්න තිබුණත්, කාලය අඩු නිසා සංචාරක ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මම එක වැදගත් කාරණාවක් පමණක් කියන්න කැමැතියි. සංචාරක ප්‍රදේශයක් වන මාතර දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රධාන ගැටලුවක් තමයි රාත්‍රී කාලයේදී සංචාරකයන්ට විනෝද වෙන්න තිබෙන ස්ථාන අඩු වීම. මොකද, සංචාරකයන් බලන්නේ පැය 24න් වැඩිම කාලයක් විනෝද වෙන්න. නමුත් අපේ ප්‍රදේශය ගත්තොත්, ඔවුන්ට රාත්‍රී කාලයේ විනෝද වෙන්න තිබෙන ස්ථාන හරි අඩුයි. දැනට යම් ව්‍යාපාරික කණ්ඩායමක් විසින් රාත්‍රී කාලයේදී සංවිධානය කරන DJ parties පැවැත්වෙනවා, ස්ථාන කිහිපයක. උදාහරණ විධියට කියනවා නම් අහංගම, වැලිගම, මාතර සහ දික්වැල්ල ප්‍රදේශවල. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, ශබ්ද විකාශන යන්ත්‍ර පරිහරණය පිළිබඳව තිබෙන ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය. මම හිතන්නේ ඇමතිතුමන්ලා මේ සම්බන්ධව දැනුවත්. ඒ නියෝගය අනුව සිකුරාදා සහ සෙනසුරාදා

දිනවල අලුයම 1.00 වෙනකලුත්, ඒ වාගේම ඉරිදා දිනවල රාත්‍රී 12.30 වෙනකලුත් තමයි කාලය දීලා තිබෙන්නේ. ඒක ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක්. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, ඒ නියෝගය අදට කොච්චර දුරට ගැළපෙනවාද, විශේෂයෙන් මේ ක්ෂේත්‍රයේ පැවැත්ම සඳහා කොච්චර දුරට බලපානවාද කියන එක. ඒ නිසා ඒ කාරණාව සම්බන්ධයෙන් අධිකරණයට කරුණු ඉදිරිපත් කරලා යම් සංශෝධනයක් කරන්න පුළුවන් නම් හොඳයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, නියමිත කාලය අවසානයි.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මට පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකට හේතුව මේකයි. ඒ DJ parties හැම තැනම පවත්වන්න බැහැ. සමහරු හිතාගෙන ඉන්නවා, විදේශිකයන් ඉන්නකොට ඒ ඕනෑම තැනක කැමැති විධියකට ශබ්ද විකාශන යන්ත්‍ර පරිහරණය කරන්න පුළුවන් කියලා. නමුත් තෝරා ගත්ත ස්ථානවල, සුදුසු පරිසරයක් තිබෙනවා නම්, විශේෂයෙන්ම ඒ ඩෙසිබල් ගණන පිටතට ප්‍රශ්නයක් නොවෙනවා නම් පමණයි එසේ කරන්න පුළුවන් වෙන්නේ. මොකද, ඒ ශබ්දය නිසා වැඩි වශයෙන් කරදරයට ලක් වෙන්නේ හඬක් නඟන්න බැරි කුඩා, අලුත ඉපදුණු දරුවන් සහ ගර්භිණී කාන්තාවන්. ඔවුන්ට එය විශාල බාධාවක්. ඒ නිසා ඒ කාරණාව ගැනත් බලලා, සුදුසු පරිසරයක් තිබෙන ස්ථානවල ඒ කටයුත්ත කරගෙන යන්න අවස්ථාව සලසා දෙන්න කියලා මම මේ වෙලාවේ සිහිපත් කරනවා. මොකද, මම ඇස් දෙකෙන් දැකලා තිබෙනවා, රාත්‍රී 1.00ට හරියට නීතිය ක්‍රියාත්මක වීම නිසා, විදේශිකයන් Google reviewsවල ඒ ව්‍යාපාරිකයන්ට බැණලා තිබෙනවා. ඒ මඟින් ඒ කර්මාන්තයේ කඩා වැටීමක් සිදු වෙනවා. මොකද, සංචාරකයන්ට රාත්‍රී කාලයේදී වෙන කරන්න දෙයක් නැහැ. ඒ නිසා මම විශ්වාස කරනවා, ඒ සම්බන්ධයෙන් සාධනීය පියවරක් ගනියි කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.28]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமசந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළව මෙම විවාදයට සම්බන්ධ වෙන්න පෙර, මම අපේ දිස්ත්‍රික්කයේ සිද්ධ වෙච්ච, වැළැක්විය හැකිව තිබුණු, ඒ වාගේම සිදු නොවිය යුතුව තිබුණු යම් කාරණාවක් සඳහන් කරන්න කැමැතියි. අපි දන්නවා, පසුගිය දින කිහිපය ගත්තොත් යම්කිසි ආන්දෝලනාත්මක තත්ත්වයක් මතුවෙලා තිබුණා. ප්‍රථමයෙන් ඒ කාරණාවලට අදාළව මගේ කනගාටුව ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම ඒ සියලු කාරණා පිටුපස යම්කිසි දේශපාලන මැදිහත්වීමක් තිබෙන බවත් අපි දන්නවා. ඒ ධර්ම ශාලාව සම්බන්ධ ප්‍රශ්නය ගත්තොත්, එම භූමියේම එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ හිටපු මන්ත්‍රීවරියකගේ ආපන ශාලාවක් තිබුණා. ඒකට අදාළව යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න ගිය වෙලාවේ තමයි ඒ ප්‍රශ්නය ඒ විධියට වර්ධනය වෙලා තිබෙන්නේ. අපි හිතනවා, ඒක ඊට වඩා විධිමත්ව වුණා නම් හොඳයි කියලා. ඒ වාගේම යම්කිසි ආකාරයකට ඒක දේශපාලන වශයෙන් වෙනත් පැත්තකට හරවන්න සංවිධානාත්මකව පිරිසක් මැදිහත් වෙච්ච බවත් අපි දන්නවා. ඒ සඳහා අපට විරුද්ධව විවිධ මඩ, අවලාද එල්ල කරන බවත් අපි දන්නවා. නමුත් ආණ්ඩුවක් විධියට මින් ඉදිරියේදී කරන්න ඕනෑ දේවල් පිළිබඳව සාකච්ඡා කරන්න අපි සූදානම්.

විදේශ කටයුතු, විදේශ රැකියා කියන ක්ෂේත්‍ර දෙකට අදාළ නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට මම කටයුතු කරනවා. ඒ ක්ෂේත්‍ර දෙකම ඉතාම වැදගත් ක්ෂේත්‍ර දෙකක්. අපි බලයට පත් වෙන්න කලින් සිටම අපේ විදේශ ප්‍රතිපත්තියට අදාළව විපක්ෂය යම්කිසි විවේචන එල්ල කරමින් තිබුණා. නමුත් මම ඉතාම සතුටු වෙනවා, අමාත්‍යවරයා ප්‍රමුඛ අපේ කණ්ඩායමේ -අපේ ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිවරුන් වන අප, ඒ වාගේම අපේ ලේකම්තුමිය ඇතුළු සියලුදෙනාගේ- මැදිහත්වීම තුළ අපේ රටේ විදේශ කටයුතු ක්ෂේත්‍රය ඉතාම ඉහළ මට්ටමකට ගෙන එන්න අද වන විට අපට අවස්ථාව ලැබී තිබෙන එක ගැන.

ඒ වාගේම විශේෂයෙන් තවත් කාරණයක් මතු කරන්නට ඕනෑ. අපි ලෝකයේ හැම රටක් එක්කම ඉතාම සුහදශීලිව කටයුතු කරන්න මැදිහත් වෙනවා. මීට කලින් අප අත් හැර ගිය ව්‍යාපෘති සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, වෙනත් විවිධ දේවල් සම්බන්ධයෙන් වෙන්න පුළුවන් ඉතා හොඳ තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා. ඒ අය අප හඹාගෙන එන තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම අපි දූෂණයෙන්, වංචාවෙන්, නාස්තියෙන්, අක්‍රමිකතාවෙන් තොර ඉතා හොඳ සංස්කෘතියක් සහිත පාලනයක් ඉදිරියට ගෙන යනවා. ඒක තමයි අප කළ යුත්තේ. අපි ඒක ඉතාම හොඳ විධියට කරගෙන යනවා. අපේ ගරු විජිත හේරත් ඇමතිතුමා, විදේශ කටයුතු ක්ෂේත්‍රයට අදාළව අඛණ්ඩ පැහැදිලි කිරීමක් කර තිබුණා. ඒ නිසා මම මෙහිදී විදේශ රැකියාවලට අදාළව යම්කිසි පැහැදිලි කිරීමක් කරන්න සූදානමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පුරෝකථනය කරනවා, ඉතිහාසය පුරා අපට වැඩිම විදේශ ප්‍රේෂණ ලැබුණු -විදේශ රැකියා හරහා වැඩිම ප්‍රේෂණ ලැබුණු- අවුරුද්ද මේ අවුරුද්ද කියලා. ඒ කාරණාවත් මම මේ සභාවට ඉතා සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි. එය අප හැමෝම එකතු වෙලා සාමූහිකව අත්පත් කරගත් ජයග්‍රහණයක් විධියට තමයි අපි දකින්නේ. ඒ වාගේම විධිමත් ආකාරයෙන් සුරක්ෂිත සංක්‍රමණයට අදාළවත් අපි මැදිහත් වනවා. විශේෂයෙන්ම GCM Champion රටක් විධියට ශ්‍රී ලංකාව දැන් හඳුන්වා හමාරයි. ඒ නිසා ඒකට අදාළ කාර්යභාරයත් අපි හොඳ විධියට කරගෙන යනවා.

සුරක්ෂිත විදේශ රැකියා ක්ෂේත්‍රයක් ගොඩ නැඟීමට අදාළව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ඉතා වැදගත්, දැවැන්ත කාර්යභාරයක් තිබෙනවා. කෙනෙකු විදේශ රැකියාවකට යන්න කලින් සිට - predeparture සිට - සහ ඇවිල්ලා මේ රට තුළ reintegrate වන එක දක්වා අපට පුළුවන් උපරිම මැදිහත්වීමක් අපි දැන් කරගෙන යනවා. එතැනදී පුහුණු ශ්‍රමිකයන් යවන්න තමයි අප සූදානම් වෙලා ඉන්නේ. ඒ ප්‍රතිශතය ගත්තොත්, සියයට 70 ඉක්මවා ගිහින් තිබෙනවා. අපි ඉතා සුබවාදීව බලාපොරොත්තු වෙනවා, එළැඹෙන අවුරුදු දෙක තුළ මෙය සියයට 80ක්, 85ක් කර ගන්න. එහෙම කරගන්න පුළුවන් නම් ඒක ලොකු ජයග්‍රහණයක්.

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

අපි දන්නවා, පසුගිය කාල වකවානුව තුළ විවිධ දේශපාලන මැදිහත්වීම් මඟින් යම් යම් අක්‍රමිකතා හරහා ගිවිසුම් කිහිපයකට එළඹීම හේතුවෙන් මෙම කාර්යාංශයට බලපෑමක් එල්ල වුණු බව. එවකට හිටපු දේශපාලන අධිකාරිය විසින් එළඹුණු ඒ වාගේ ගිවිසුම් කිහිපයක් තිබෙනවා. විශේෂයෙන් ඊශ්‍රායලයේ රැකියා සම්බන්ධව සමාජයේ යම්කිසි ආන්දෝලනයක් තිබෙනවා. ඒ ගිවිසුම් අරගෙන බැලුවොත්, ඒ ගිවිසුම්වල යම් යම් ප්‍රශ්න, ගැටලු වගයක් තිබෙනවා. එකක් තමයි, ඒ ගිවිසුම් අත්සන් කරන්නට පෙර ශ්‍රී ලංකා රජය පැත්තෙන් ඒවාට අදාළව හරියාකාර සොයා බැලීමක් කර නැහැ කියන එක ඔප්පු වීම; තහවුරු වීම.

සමහර තැන්වලදී අපි බැඳිලා ඉන්නවා, ඒ අදාළ විදේශ ශ්‍රමිකයන් එකතු කරගෙන, ඒ අයට අදාළ පුහුණුව ලබා දීලා, ලොතරැයි ක්‍රමයට යොමු කරන්න. නමුත්, ගිවිසුම්වල කොතැනකවත් සඳහන් වෙලා නැහැ, ලොතරැයි ක්‍රමයට යොමු කරපු සියලුදෙනාට රැකියාව අනිවාර්යයෙන් ලබා දෙන්න ඕනෑ කියලා. ඉතින්, මේ වාගේ ප්‍රශ්න, ගැටලු තිබෙනවා. ඒවාට අදාළ නිරවුල් කිරීම් ආණ්ඩුව විධියට අපි කරගෙන යනවා. ඒ නිසා ඒ දේවල් ඉතා කෙටි කාලයක් තුළ කරගෙන යන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, අප මේ කාර්යය භාරගත් වෙලාවේ විවිධ පැමිණිලි ඇවිත් තිබුණා. විශේෂයෙන්ම විදේශ රැකියාවලට අදාළ වංචා සම්බන්ධ පැමිණිලි රාශියක් අපට ඉදිරිපත් වෙලා තිබුණා. සමහර ලේඛන අරගෙන බැලුවොත්, 10,000කට ආසන්න පැමිණිලි ප්‍රමාණයක් backlog එකක් විධියට තිබුණා. ඒවාට අදාළ විමර්ශන ඉතා කඩිනමින් කරන්න ඕනෑ කියන අරමුණත් එක්ක අපි විශේෂ පොලිස් ඒකකයක් පිහිටුවූවා. මා හිතන්නේ, මේක ඉතා වැදගත්, ඉතා තීරණාත්මක දෙයක්. ඒ පොලිස් විශේෂ ඒකකය හරහා විදේශ රැකියා වංචාවලට අදාළ පැමිණිලි සම්බන්ධ විමර්ශන ඉතා කඩිනමින් කරගෙන යනවා. ඒක ඉතා සතුටුදායක ආරංචියක්. අනෙක් අතට, අපි දැන් මෙම පොලිස් ඒකකය බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේත් ස්ථාපිත කර තිබෙනවා. මෙහිදී සමහර අවස්ථාවලදී සඳහන් වුණා, සමහර අය නීති විරෝධීව, අවිධිමත් විධියට ගිහිල්ලා යම් යම් ජාවාරම්කරුවන්ගේ ගොදුරක් බවට පත් වෙලා තිබෙනවා කියලා. අපි සැලකිය යුතු මැදිහත්වීමක් කරමින් ඒ තත්ත්වය අවම කරමින් තිබෙනවා.

ඒ වාගේම, මෙතැනදී තවත් කාරණයක් මතු කරන්න කැමැතියි. අපේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා විදේශ රැකියාවලට සම්බන්ධ වන පාර්ශ්වවලට ගුවන් ටිකට් පත් ලබා දෙන ක්‍රමයක් තිබුණා. එතැන දැවැන්ත දූෂණ, වංචා සිද්ධ වෙලා තිබෙනවා කියා මේ මොහොත වනකොට විගණන වාර්තාවකින් හෙළිදරව් වෙලා තිබෙනවා.

මම ඒ විගණන වාර්තාව **සභාගත*** කරනවා.

අපි හිතනවා, මෙම විගණන වාර්තාවට අනුව ගත යුතු නීතිමය පියවර ඉදිරියේදී ගන්න පුළුවන් වෙයි කියලා. දැන් වුණත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නඩුවක් තිබෙනවා. මම හිතනවා මෙය එම නඩුවටත් අදාළ ඉතා වැදගත් ලේඛනයක් වෙයි කියලා.

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

අපි දන්නවා, විදේශ ගුවන් ටිකට් පත් කවදාවත් එකම මිලක තිබෙන එකක් නොවන බව. එම මිල අනිවාර්යයෙන්ම fluctuate වෙනවා. එම මිලෙහි යම්කිසි වෙනසක් නිරන්තරයෙන්ම සිදු වනවා. "Amadeus" කියන system එක හරහා තමයි එය සාමාන්‍යයෙන් නිරීක්ෂණය කරන්නේ. නමුත්, එම system එක තිබුණේ නැහැ. විශේෂයෙන්ම ඊශ්‍රායලයට අදාළව ගත්තොත්, 295,000ක් තමයි flat rate එක. ඒ flat rate එකට තමයි හැම දාම ටිකට් පත් නිකුත් කරලා තිබෙන්නේ. අපි සමත් වුණා විශේෂයෙන්ම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අදාළ "ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය" -Sri Lanka Foreign Employment Agency - කියන ආයතනයට IATA licence එක ගන්න. සෘජුව ටිකට් පත් නිකුත් කරන්න අපට දැන් යම්කිසි අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ඒ හරහා අපි ශ්‍රමිකයන්ට අදාළ විවිධ ප්‍රතිලාභ ලබා දෙනවා. ඒ වාගේම විදේශ රැකියාවලට සම්බන්ධ වෙලා ඉන්න අපේ රටේ සියලුදෙනාට ඉදිරියේදී යම්කිසි ආකාරයක package එකක් ලබා දෙන්න පුළුවන්ද කියන එක ගැන යම්කිසි අධ්‍යයනයක් අපි කරගෙන යනවා.

විශ්‍රාම වැටුප් සම්බන්ධ ප්‍රශ්නවලටත් ආණ්ඩුව හැටියට අපි අඛණ්ඩව මැදිහත් වෙනවා. අපි ඉතා කෙටි කාලයක් තුළ ඒ සඳහා නිසි වැඩ පිළිවෙළක් හඳුන්වා දෙනවා. අපේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 40වන සංවත්සරයේදීත් අපි එය නිල වශයෙන් එළි දැක්වූවා. ඒ වාගේම, විදේශ ශ්‍රමිකයන්ගේ ඡන්ද අයිතියට අදාළ කාරණාව ගැන අපි මැතිවරණ කොමිෂන් සභාවත් එක්ක සාකච්ඡා කළා. ඒකට අදාළ කැබිනට් තීරණයකුත් තිබෙනවා. අපි ඒකටත් මැදිහත් වෙමින් ඉන්නවා.

අපි බලාපොරොත්තු වෙනවා ඉදිරියේදී ඉතා විධිමත්, ඉතා හොඳ විධියට අපගේ ශ්‍රමිකයන්ට අවශ්‍ය පුහුණුව, වරප්‍රසාද සහ සියලු අවස්ථා ලබා දෙමින් මේ ක්ෂේත්‍රය තවත් විධිමත් කරමින් ලෝක වෙළෙඳ පොළේ තවත් අවස්ථා අත්පත් කර ගන්න. පෞද්ගලික අංශයත් සම්බන්ධ කරගෙන රජය විධියට අපිත් මැදිහත් වෙමින්, සියලුදෙනාම එක් වෙමින් විදේශ රැකියා ක්ෂේත්‍රය මීට වඩා ගොඩනැඟීමට අප මැදිහත් වෙනවාය කියන කාරණාවත් මම සඳහන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ අවුරුද්දේ අපට Budget savings වගයක් තිබුණා. මිලියන 200ක විතර savings වගයක් තිබුණා. අපි ඒ Budget savings හරහා-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩි 2ක කාලයක් දෙන්න.

අපේ තානාපති කාර්යාලවල තිබෙන කොන්සියුලර් අංශවලට අදාළව භෞතික සම්පත් ලබා දෙන ක්‍රියාවලියකුත් අපි දැන් පටන්ගෙන තිබෙනවා. ඒකට අදාළ tenders ඔක්කෝම අවසන් කරමින් දැන් එම ක්‍රියාවලිය ඉතා වේගයෙන් ඉදිරියට යනවා. විශේෂයෙන්ම අපේ ගොඩක් තානාපති කාර්යාලවල, මහ කොමසාරිස් කාර්යාලවල තිබෙන කොන්සියුලර් අංශවල භෞතික සම්පත් අලුත්වැඩියා වුණේ නැහැ කියලා. ඒ සමහර තැන්වල

printers නැහැ, සමහර තැන්වල photocopy machines නැහැ. ඒවායේ සමහර computers තිබෙනවා අවුරුදු 10ක්, 15ක් විතර පරණ. අපගේ විදේශ කටයුතු ක්ෂේත්‍රය ඉතා හොඳ ආකාරයෙන් දියුණු කිරීමට ඒවා අලුත්වැඩියා කිරීම අත්‍යවශ්‍ය වෙනවා. අපගේ විදේශ තානාපති කාර්යාලවලට අපි අලුතින් වාහන 36ක් ලබා දෙනවා. ඒ වාගේම, අපේ විදේශ රැකියා අංශය නියෝජනය කරන පාර්ශ්වවලටත් තවත් වාහන 8ක් ලබා දෙන්න අපි දැන් කටයුතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය කියලා කථාව අවසාන කරන්නම්. ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විවිධ රටවල - විශේෂයෙන්ම ජපානය, රුමේනියාව වාගේ රටවල- සිටියාට ඒ රටවල කම්කරු අංශය නියෝජනය කරන නිලධාරින් සිටියේ නැහැ. නමුත්, අපි දැන් සමත් වෙලා ඉන්නවා, විශේෂයෙන්ම දේශපාලන පත්වීම් ඉවත් කරමින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ අපේ අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශය නියෝජනය කරන පාර්ශ්වයත් සම්බන්ධ කරමින් කම්කරු අංශයට අදාළ නිලධාරින් ඉතා කඩිනමින්, ඉතා ඉක්මනින් ලබා දෙන්න. විශේෂයෙන්ම රුමේනියාව සහ ජපානය ඇතුළු රටවලටත් අපි කම්කරු නියෝජිතයන් ඉතා කෙටි කාලයක් තුළ යවන්න සූදානම් වෙලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිය පුද කරමින්, කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුරෙයිරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.40]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, போருக்குப் பின்னரான காலத்தில் ஈழத் தமிழர்களுக்குத் துறைகள்தோறும் கிட்டாத ஒரு விடயத்திலான விவாதத்திலே தான் இன்று நாமெல்லாம் கலந்துகொண்டு இருக்கின்றோம். "வென்றவன் பக்கமே வரலாறு சாயும்" என்பதையும் "வெல்பவன் சொல்வதே வரலாறாகும்" என்பதையும் இனவாதம் பழுத்துப்போயுள்ள மாறிவரும் அரசுகளின் செயல்கள் காட்டுகின்றன.

முல்லைத்தீவில் குருந்தூர்மலை, நெடுங்கேணியில் வெடுக்குநாறிமலை, யாழ்ப்பாணத்தில் தையிட்டி, நேற்று திருகோணமலையில் ஸ்ரீ சம்புத்த ஜயந்தி போதிராஜ விகாரை! ஈழத் தமிழர்களின் பூர்வீக இடங்களில் எல்லாம் சட்டம் மௌனிக்க, அரச இயந்திரங்கள் காவல் காக்க, தமிழர்களை அடித்தும் அச்சுறுத்தியும் தடுத்தும் அறத்தைக் கொன்று விகாரைகள் எழும்புகின்றன. பேரினவாத அடக்குமுறைக்குள் தமிழர்களுக்குக் கிட்டாத ஒன்றைப் பற்றிய விவாதத்திலே இன்று கட்டமைக்கப்பட்ட இன அழிப்புக்கு உள்ளாக்கப்படும் மக்களின் சார்பில் உரையாற்றுகின்றேன்.

முள்ளிவாய்க்கால் தமிழ் இனப்படுகொலைக்கு பன்னாட்டு நீதி வேண்டும். 21ஆம் நூற்றாண்டின் மிகப் பெரிய மனிதப் பேரவலமாக முள்ளிவாய்க்கால் தமிழ் இனப் படுகொலைச் செயற்பாட்டைக் காண்கின்றோம். அத்தகைய முள்ளிவாய்க்கால் தமிழினப் படுகொலையுடன் தொடர்புடைய குற்றவாளிகளான அப்போதைய ஆட்சியாளர்களையும் படைத்தரப்பினரையும் பன்னாட்டு நீதி விசாரணைக்கு உட்படுத்துவதற்கும் தமிழ் இனப் படுகொலைக்கான நீதியைப் பெற்றுத் தருவதற்கும் இந்த அரசானது பூரண ஒத்துழைப்பை வழங்க வேண்டுமென இவ்வுயரிய சபையினூடாகக் கேட்டுக் கொள்கின்றேன். மிக மேன்மையாக இதற்கு உதவ வேண்டுமென நீதி அமைச்சரையும் கேட்டுக் கொள்கின்றேன். அத்துடன், சிறைகளில் வாடும் தமிழ் அரசியல் கைதிகள் உடனடியாக விடுவிக்கப்பட வேண்டுமென்ற கோரிக்கை யையும் முன்வைக்கின்றேன்.

கடந்த போர் காலப் பகுதியில் தமது சமூகத்தின் உரிமைகளுக்குக் குரல்கொடுத்ததற்காக பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின்கீழ் தமிழ் மக்கள் பலரும் கைது செய்யப்பட்டு சிறையில் அடைக்கப்பட்டனர். அவ்வாறு சிறைவைக்கப்பட்ட பலர் விடுவிக்கப்பட்டு இருந்தாலும், தற்போதும் 10 தமிழ் அரசியல் கைதிகள் பயங்கரவாதத் தடுப்புச் சட்டத்தின்கீழ் 15-30 ஆண்டுகளாகச் சிறையில் வாடுகின்றனர். அந்த வகையில், மகசின் சிறைச்சாலையில் 6 தமிழ் அரசியல் கைதிகள் தடுத்துவைக்கப்பட்டுள்ளனர். கதிர்காமத்தம்பி சிவகுமார், விக்கினேஸ்வரநாதன் பார்த்தீபன் ஆகியோர் 30 வருடங்களாகவும், சண்முகலிங்கம் சூரியகுமார், சச்சிதானந்தம் ஆனந்தசுதாகர் ஆகியோர் 17 வருடங்களாகவும், செல்வராஜா கிருபாகரன், தம்பையா பிரகாஷ் ஆகியோர் 16 வருடங்களாகவும் சிறைகளில் தடுத்து தவைக்கப்பட்டுள்ளனர்.

அதேபோல், மஹர சிறைச்சாலையில் தமிழ் அரசியல் கைதிகள் இருவர் தடுத்து வைக்கப்பட்டுள்ளனர். ஜோன்சன் கொலின் வலன்ரினோ என்பவர் 17 வருடங்களாகவும், தங்கவேலு நிமலன் 16 வருடங்களாகவும் தடுத்து வைக்கப் பட்டுள்ளனர். இதேவேளை, வெலிக்கடைச் சிறைச்சாலையில் கிருஸ்ணசாமி இராமச்சந்திரன் என்பவர் 22 வருடங்களாக தமிழ் அரசியல் கைதியாகத் தடுத்து வைக்கப்பட்டுள்ளதுடன், தும்பறை சிறைச்சாலையில் ஏ.எச். உமர் கத்தாப் என்ற அரசியல் கைதி 16 ஆண்டுகளாக சிறை வைக்கப்பட்டுள்ளார்.

சிறைகளில் தமது இனிமையான இளமைக் காலத்தைத் தொலைத்துவிட்டு, எஞ்சியுள்ள தமது வாழ்க்கைக் காலத்தையும் சிறைக் கம்பிகளுக்குப் பின்னாலேயே தொலைத்து விடுவோமோ என்ற ஏக்கத்துடன், தமது விடுதலைக்காக இவர்கள் காத்திருக்கின்றனர். இவர்கள் அனைவருமே சாதாரண குடும்பங்களைச் சேர்ந்தவர்கள். அந்தக் குடும்பங்களுக்கு வருமானத்தை ஈட்டிக்கொடுக்க வேண்டிய இவர்கள் சிறையில் இருக்கும் நிலையில், இவர்களின் குடும்பங்கள் வறுமையில் வாடுகின்றன. தற்போது இந்த நாட்டிலுள்ள பொருளாதார நெருக்கடியும் அதிகரித்த வாழ்க்கைச் செலவும் இந்தக் குடும்பங்களை மேலும் சிக்கலுக்குள் உள்ளாக்குவதாக அமைந்துள்ளது.

அத்தோடு, கடந்த 10 ஆண்டுகளில் மட்டும் 11 தமிழ் அரசியல் கைதிகள் இறந்துள்ள துயரச் சம்பவங்களும் இடம்பெற்றுள்ளன. தற்போது, சிறைகளிலுள்ள கைதிகளை விடுவிப்பதற்கு நடவடிக்கை எடுக்காவிட்டால், அத்தகையை அவலங்கள் அரங்கேறும் வாய்ப்புகளும் உள்ளன. அரசியல் கைதிகளின் விடுதலை என்பது அவர்களின் துன்பங்களை மாத்திரமல்ல, அவர்களின் குடும்பங்களின் துன்பங்களையும் தணிக்கும். அத்தோடு, அரசின் ஒருமைப்பாட்டுக்கான முயற்சியாகவும் நல்லிணக்க செயற்பாட்டுக்கான சமிக்ஞையாகவும் தமிழ் மக்களாலும் நோக்கப்படும். எனவே,

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

தடுத்து வைக்கப்பட்டுள்ள 10 அரசியல் கைதிகளையும் நல்லெண்ண அடிப்படையில் தாமதமின்றி விடுதலை செய்யுமாறு இந்த உயரிய சபையைக் கோருகின்றேன்.

இதேவேளை, கடந்த 14 ஆண்டுகளுக்கும் மேலாக தமிழ் அரசியல் கைதியாக தடுப்புக் காவல் மற்றும் கடுங்காவல் சிறைத் தண்டனையை அனுபவித்து, பின்னர் விடுதலை செய்யப்பட்டிருந்த திருமதி செல்வக்குமார் சத்தியலீலா என்பவருக்கு 2023ஆம் ஆண்டு மேன்முறையீட்டு நீதிமன்றினால் மரண தண்டனை விதிக்கப்பட்டுள்ளது. இந்தத் தீர்ப்பை மறு ஆய்வுக்கு உட்படுத்துமாறு அவர் உச்ச நீதிமன்றத்தை நாடியுள்ளார். எனவே, விடுதலை செய்யப்பட்டு, தற்போது மரண தண்டனை விதிக்கப்பட்டுள்ள சத்தியலீலாவுக்கு மனிதாபிமான அடிப்படையில் பொது மன்னிப்பு வழங்குமாறு கோருகின்றேன்.

அடுத்து, வலிந்து காணாமல் ஆக்கப்பட்டவர்களுக்கு நீதி வேண்டும். வடக்கு, கிழக்கில் கடந்த போர்க் காலப் பகுதியில் படையினராலும், படையினருடன் சேர்ந்து இயங்கிய துணை ஆயுதக் குழுக்களாலும் பல்லாயிரக்கணக்கான அப்பாவித் தமிழ் மக்கள் கடத்தப்பட்டு வலிந்து காணாமல் ஆக்கப்பட்டனர். அதேவேளை, இறுதிக்கட்டப் போரின்போது வட்டுவாகல் மற்றும் வவுனியா ஓமந்தை சோதனைச்சாவடி ஆகிய பகுதிகளில் இராணுவத்தினரிடம் உறவினர்களால் கையளிக் கப்பட்டவர்களும் வலிந்து காணாமல் ஆக்கப்பட்டனர். இந்த நிலையில், வலிந்து காணாமல் ஆக்கப்பட்டவர்களுக்கான நீதியைக் கோரி அவர்களது உறவினர்கள் வடக்கு, கிழக்கில் மூவாயிரம் நாட்களைக் கடந்தும் தொடர் போராட்டத்தில் ஈடுபட்டு வருகின்றனர்.

கணவன்மார் காணாமல் ஆக்கப்பட்டுள்ள நிலையில், மனைவியர்கள் குங்குமத்தையும் தாலியையும் அணிவதா, அணியாமல் விடுவதா? எனத் திணறுகின்றனர். தந்தை வருவாரா, வரமாட்டாரா? எனப் பிள்ளைகள் கேட்கும் கேள்விகளுக்கு என்ன பதிலளிப்பது எனத் தெரியாமல் தாய்மார் திண்டாடுகின்றனர். இவ்வாறாக அவர்கள் ஒன்றரைத் தசாப்த காலத்துக்கும் மேலாக மெல்லவும் முடியாமல் விழுங்கவும் முடியாத ஓர் அவல வாழ்வைத் தாங்கி வாழ்கின்றனர். அதேவேளை, வலிந்து காணாமல் ஆக்கப்பட்ட தமது பிள்ளைகளைத் தேடி தொடர் போராட்டத்தில் ஈடுபட்டிருந்த பல நூற்றுக்கணக்கான பெற்றோர் வயது முதிர்வாலும், நோய்வாய்ப்பட்டும் உயிரிழந்துள்ளனர். நீங்கள் எப்போது இவர்களுக்கான நீதியை வழங்கப் போகின்றீர்கள்? இவ்வாறு அனைவரும் மரணித்த பின்புதான் நீதியை வழங்கப் போகின்றீர்களா? அவ்வாறெனில், அது நீதியாகுமா? காலம் கடந்த நீதி மறுக்கப்பட்ட நீதிக்குச் சமன் என்பதைக் கருத்திற்கொண்டு, வலிந்து காணாமல் ஆக்கப்பட்டோரின் உறவுகளின் கோரிக்கைக்கு அமைவாக, பன்னாட்டு நீதி விசாரணை ஊடாக அவர்களுக்கான நீதியைப் பெற்றுக் கொடுப்பதற்குரிய நடவடிக்கைகளை உடனடியாக மேற்கொள்ளுமாறு இவ்வுயரிய சபையினரைக் கோரிக் கொண்டு, நீதி அமைச்சர் அவர்களிடமும் இந்தக் கோரிக்கைகளை முன்வைத்து விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.49]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා මතුගම අධිකරණ සංකීර්ණයේ පවතින ඉතා කනගාටුදායක තත්ත්වය සඳහන් කළා. ඒක සම්පූර්ණයෙන්ම සත්‍යයක්. ඒක සම්පූර්ණයෙන්ම අවධානය යොමු නොවුණු අධිකරණ සංකීර්ණයක්. අපරාධ සහ සිවිල් යන වර්ග දෙකෙන්ම අතිවිශාල නඩු ප්‍රමාණයක් තිබෙන අධිකරණයක්. ඇත්ත වශයෙන්ම ඒ තිබෙන ස්ථානය අධිකරණයකට ගැළපෙන්නේ නැහැ. රථ වාහන නතර කිරීමටත්, එම ස්ථානය වැඩි දියුණු කිරීමටත් අපහසුයි. ඒ නිසා විකල්ප ස්ථානයක් අවශ්‍යයි. විකල්ප ස්ථාන තිබෙනවා. රජයට අයිති ඉඩම් තිබෙනවා. එවැනි විකල්ප ස්ථානයක මතුගම මහේස්ත්‍රාත් අධිකරණය සහ දිසා අධිකරණය ස්ථාපනය කිරීම ඉතා වැදගත් දෙයක්, ප්‍රමුඛතාව දිය යුතු දෙයක්. ඒ කාරණයට මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ කාරණය මතු කිරීම ගැන ජගත් විතාන මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, විනිශ්චයකාරවරුන්ගේ උසස්වීම් පිළිබඳව අද ලොකු සංවාදයක්, විවාදයක් ඇති වුණා. දිසා අධිකරණයේ විනිශ්චයකාර ධුර දරපු විනිශ්චයකාරවරුන් 35දෙනෙකු පමණ අතරින් ජ්‍යෙෂ්ඨත්වය නොතකා මහාධිකරණ විනිශ්චයකාර පත්වීම් දීම ගැන ලොකු සංවාදයක් ඇති වුණා. දැන් මෙතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද? ජ්‍යෙෂ්ඨත්වය විතරක්ම සැලකීම සුදුසුයි කියලා මම හිතන්නේ නැහැ. හැබැයි ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳව සලකන පැරණි සම්ප්‍රදායෙන් එළියට යනවා නම්, මහාධිකරණ විනිශ්චයකාර ධුරයකට තෝරා ගැනීම හෝ පොදුවේ විනිශ්චයකාර වෘත්තියේ උසස්වීම් ලබා ගැනීමේ ක්‍රියාවලිය තුළ සලකා බලන, ලකුණු දෙන ක්‍රියාපටිපාටිය මොකක්ද කියලා විනිශ්චයකාරවරු දැනගන්නට ඕනෑ. එහිදී අධිකරණ සේවා කොමිෂන් සභාවේ හුදු ඇස් පෙනුමට හෝ අගවිනිසුරුතුමාගේ මතය හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජික විනිශ්චයකාරවරුන්ගේ පෞද්ගලික මතය හෝ නොව, යම් ක්‍රමයක් තිබිය යුතුයි, විනිවිදභාවයක් තිබිය යුතුයි. ඒ විනිවිදභාවය නැතිකම නිසා තමයි මේ ප්‍රශ්නය මතු වුණේ. එක් විනිශ්චයකාරවරයකුගේ, දෙන්නෙකුගේ නොවෙයිනේ. විනිශ්චයකාරවරුන් විශාල පිරිසකගේ ජ්‍යෙෂ්ඨත්වය නොතකා පත් කිරීම් කළා. ඒ නිසා බරපතළ අසහනයක් ඇති වෙලා තිබෙනවා. අසහනයක් නැහැයි කියලා කියන්න බැහැ. ගරු ජනාධිපතිතුමාත් මේකට මැදිහත් වෙනවා. මොකද, අවසානයේ මහාධිකරණ විනිශ්චයකාර ධුර සඳහා පත් කරන්නේ ජනාධිපතිතුමා, නිර්දේශ කරන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව. ඒ නිසා ඊළඟ පත් කිරීම් සිදු කිරීමේදී ඒ ක්‍රියාදාමය විනිවිදභාවයෙන් යුතුව, ක්‍රමවත්ව සිදු විය යුතුයි කියා මා ඉල්ලා සිටිනවා. සරලව කිව්වොත්, ඒ සඳහා ලකුණු දෙන්නේ කොහොමද කියලා දැන ගන්න ඕනෑ, මොකක්ද ඒ ක්‍රමය කියලා දැනගන්න ඕනෑ. ඒක නොදැන සිටීම තමයි මෙතැන මතු වෙලා තිබෙන ප්‍රශ්නය.

ගරු අධිකරණ ඇමතිතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණය තුළ විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු මෑත කාලයේ දිගින් දිගටම ඉදිරියට ගෙන යෑමට අවසර නොදී, තොග ගණනට ප්‍රතික්ෂේප වෙනවා. ඒක සාමාන්‍ය තත්ත්වයක් නොවෙයි. මූලික අයිතිවාසිකම්වලින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙනවා. මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට පමණයි. මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය භාවිත කරන ශ්‍රේෂ්ඨාධිකරණය තමයි පුරවැසියන්ගේ අවසාන බලාපොරොත්තුව. මේ නඩු තොග ගණනින් ප්‍රතික්ෂේපවීම සාමාන්‍ය නැහැ, ඒක විශේෂ දෙයක්.

ඒ වාගේම තව දෙයක් නිරීක්ෂණය වෙනවා. මේ මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු විභාග කරන්නේ, leave to proceed දෙනවාද කියලා විභාග කරන්නේ බොහෝවිට එකම විනිශ්චය මණ්ඩලයක්. සමහර ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් ඒ විනිශ්චය මණ්ඩලවලට පත් කරන්නේ නැති බවක් පෙනෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේක විශ්ලේෂණය කරලා බලන්න කියලා. "මම අධිකරණ ඇමති, මට කරන්න දෙයක් නැහැ, ඒක සම්පූර්ණයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලයක්" කියලා අහක බලාගෙන ඉන්න පුළුවන්කමක් ආණ්ඩුවකට නැහැ. මේ පාර්ලිමේන්තුව තුළ අපි ඒ ගැන කරුණු දැක්වූවාම අපි කියන කරුණු සත්‍යද, එහෙම දිගින් දිගටම මූලික අයිතිවාසිකම් නඩු නිශ්ප්‍රභ කිරීමේ ප්‍රවණතාවක් තිබෙනවාද, සමහර විනිශ්චයකාරවරුන් මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය පිළිබඳ තීරණ ගන්න විනිශ්චය මණ්ඩපවලට ඇතුළත් නොවෙනවාද, එහි අමුත්තක් තිබෙනවාද, නැද්ද කියලා සොයා බැලීමේ වගකීම ඔබතුමාට තිබෙනවා, මේ ආණ්ඩුවට තිබෙනවා ගරු ඇමතිතුමනි.

ඊළඟ කාරණය තමයි, මේ රටේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මතු වෙලා තිබෙන තත්ත්වය.රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 30,000කට වැඩි සාම්පල එක්රැස් වෙලා
(19th start) තිබෙනවා. රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යම් සාම්පලයක් යොමු කළාම, ඒ සාම්පලය පරීක්ෂා කර මහෙස්ත්‍රාත් අධිකරණයට වාර්තා කිරීමට ගතවන කාලය මාස 3ක්, මාස 4ක් දක්වා අඩු වෙලා තිබුණා. දැන් ඒ කාලය වැඩි වෙලා තිබෙනවා. ඒකට හේතුව අත් අඩංගුවට ගැනීම් වැඩි නිසා වෙන්න පුළුවන්, මත්ද්‍රව්‍ය උවදුර පොදුවේ පැතිරී තිබෙන නිසා වෙන්න පුළුවන්, වෙනත් වර්ගවල අපරාධ, ගිනි අවි පිළිබඳ අපරාධ වැඩිවෙලා තිබෙන නිසා වෙන්න පුළුවන්. ඒ හේතුව මොකක් වුණත් ඕනෑම මොහොතක සාම්පල 30,000ක් විතර රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ තිබෙනවා කියලා අපට පාර්ලිමේන්තුවෙන් දීපු සංඛ්‍යාලේඛනවල තිබෙනවා.

මේ තත්ත්වයට සරිලන පරිදි රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ධාරිතාව වැඩි කිරීම, පහසුකම් ලබා දීම, සේවක සංඛ්‍යාව වැඩි කිරීම, නවීන තාක්ෂණය හඳුන්වා දීම අත්‍යවශ්‍යයි. ඒ වාගේම, එහි කළමනාකරණ ක්‍රමයත් ඉතා වැදගත්. ඒ කළමනාකරණ ක්‍රමය ශක්තිමත් කිරීම තුළින් ඉතාම ඉක්මනින් ඒ සාම්පල් පරීක්ෂාව සහ ඒවායේ වාර්තා මහෙස්ත්‍රාත් අධිකරණ වෙත යොමු වීම තහවුරු කිරීම අවශ්‍යයි, ගරු අධිකරණ ඇමතිතුමනි. මේක සරල ප්‍රශ්නයක් නොවෙයි. සමහර වෙලාවට කිසිම වරදක් නොකරපු අය, අසාධාරණ විදියට චෝදනාවලට ලක් වෙච්ච අය ඉන්නවා. මොකද, සමහර වෙලාවට වෙනත් වැරදි හෝ වෙනත් ප්‍රශ්න වෙනුවෙන් යොමු වෙච්ච අයට දඬුවමක් විදියට දීර්ඝ කාලයක් රඳවා තබන්න පොලිස් නිලධාරීන් සෑහෙන අවස්ථාවලදී කිසිම සාධාරණ හේතුවක් නැතිව, -54 වගන්තිය යටතේ මත්ද්‍රව්‍යවලට අත් අඩංගුවට අරගෙන- අවුරුද්දකට අඩු කාලයක් රඳවාගන්නා අවස්ථා අනන්ත ප්‍රමාණයක් අපි වෘත්තීය අතරතුර දැක තිබෙනවා. අපට ඒ පිළිබඳව අත්දැකීම් තිබෙනවා. මේ තත්ත්වය වළක්වා ගැනීම සඳහා රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි කරන්න ඔබතුමාට වගකීමක් තිබෙනවා. ඒක ඔබතුමා යටතේ තිබෙන දෙපාර්තමේන්තුවක්.

ඒ විතරක් නොවෙයි. මම ඔබතුමාට පසුගිය අය වැයේදීත් කියපු, පෞද්ගලිකවත් දින කිහිපයක් කියපු කාරණයක් තිබෙනවා. මේ වන විට කොළඹ දිසා අධිකරණයේ සමාගම් විසින් පවරන මුදල් නඩු දහස් ගණනක් ගොඩ ගැසී තිබෙනවා. එසේ ගොඩ ගැසුණේ කිසිදු සාධාරණ පදනමක් නොමැතිව හිතුවක්කාර විදියට සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9(අ) වගන්තිය සංශෝධනය කර පැමිණිලිකරු හෝ විත්තිකරු සිටින ඕනෑම තැනක නඩු දමන්න අවස්ථාව දීපු නිසායි. මුදල් නඩු විතරක් නොවෙයි, ඕනෑම නඩුවක්. ඉඩම් නඩුවලටත් මේ කාරණය අදාළයි. කළුතර තිබෙන ඉඩම්වලට ත්‍රිකුණාමලයේ නඩු දමනවා. හිතාගන්න පුළුවන්ද? සමහර අය පීඩාවට පත් කරන්න එහෙම කරනවා. නමුත්, වැඩිපුරම මේ ප්‍රශ්නය මතුවෙලා තිබෙන්නේ මුදල් නඩුවලටයි. දැන් කොළඹ දිසා අධිකරණයේ නඩු ගොඩ ගැහිලා තිබෙනවා. ඔබතුමා මට කිව්වා, මේ සම්බන්ධ සංශෝධන පනත් කෙටුම්පත සූදානම් කියලා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, අඩුම ගණනේ ලබන අවුරුද්දේ ප්‍රථම, ප්‍රමුඛ පනත හැටියට මේ සංශෝධනය ගෙනැල්ලා කලින් තිබුණු තත්ත්වයට පත් කරන්න කියලායි. අද වෙනකොට ප්‍රාදේශීය දිසා අධිකරණවල මුදල් නඩු නැහැ. කොළඹ දිසා අධිකරණයේ දහස් ගණන් නඩු ගොඩ ගැහිලා, record room එකේ ඉඩ නැහැ. මෙහි පසුබිම ඔබතුමා හොඳින්ම දන්නවා. ශ්‍රී ලංකා නීතිඥ සංගමය මේ ගැන ඔබතුමාට කරුණු කිව්වා, පානදුර නීතිඥ සංගමය ඔබතුමාට කරුණු කිව්වා. මේක මුළු රටේම තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9(අ) වගන්තිය සංශෝධනය කිරීම සඳහා වන ඉතාම සුළු, නමුත් වැදගත් පනත් කෙටුම්පත ලබන අවුරුද්දේ ප්‍රමුඛ පනත් කෙටුම්පතක් හැටියට ඔබතුමා අරගෙන එයි කියලා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන ඇතැම් ප්‍රතිපාදන, ඇතැම් නීති කෙටුම්පත්, ඇතැම් පොරොන්දු ක්‍රියාත්මක නොවීම පිළිබඳව අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම සඳහා වන වැදගත්ම දෙයක් තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන එක. පසුගිය ජනාධිපතිවරණයේදී තමුන්නාන්සේලාගේ ජනාධිපති අපේක්ෂක වන අනුර කුමාර දිසානායක මැතිතුමාත්, සජිත් ප්‍රේමදාස මැතිතුමාත්, දෙදෙනාම කියා සිටියා, "අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අරගෙන එනවා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන, පාර්ලිමේන්තු ක්‍රමය ස්ථාපනය කරන අලුත් ආණ්ඩු ක්‍රමයක් අරගෙන එනවා" කියලා. ගරු ඇමතිතුමනි, මම මේ පාර්ලිමේන්තුවේ මේ ප්‍රශ්නය මතු කරන 10වැනි දවස, අද. රටට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අරගෙන එනවාය කියන පොරොන්දුව ඉෂ්ට කරන්නේ කවදාද කියලා කල් තැබීමේ යෝජනාවකුත් මම අරගෙන ආවා. අවස්ථා කිහිපයකදී ඒ ගැන ප්‍රශ්න කළා. ජනාධිපතිතුමා ගොඩක් දේවල් ගැන කතා කළත්, මේ ගැන කථා කරන්නේ නැහැ. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒම සඳහා ඔබතුමන්ලාගේ රජයේ වැඩ පිළිවෙළ කුමක්ද? ඒ පිළිබඳ මාර්ග සිතියම කුමක්ද? එසේ නොමැති නම් ඒ පොරොන්දුව අතහැර දමා තිබෙනවාද? මොකද, විශාල වාර ගණනක් සංශෝධනය වෙච්ච, විකෘති වෙච්ච මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් එක්ක අපි බලාපොරොත්තු වන දේශපාලන වෙනස මේ රටේ ඇති කරන්න පුළුවන්කමක් නැහැ.

ඔබතුමන්ලා හිතනවා නම් නිශ්ශබ්දව සිටීමෙන් ජනතාවට මේක මගහැරෙයි කියලා, මේ රටේ ජනතාව ගැන එච්චරටම අවතක්සේරු කරන්න එපා. ගරු ලාල් කාන්ත ඇමතිතුමා නම් ඒ ගැන උනන්දුයි කියලා මට එතුමාගේ මුහුණෙන් පෙනෙනවා. මම ඒ ගැන කියනකොට එතුමාගේ මුහුණ මලක් වාගේ ලස්සන වුණා. ඒ කියන්නේ ඔබතුමාගේ හිතේ තිබෙනවා, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඕනෑ, විධායක ජනාධිපති ක්‍රමය හොඳ නැහැ, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ස්ථාපිත කරන්න ඕනෑ කියලා. ඒකට ඔබතුමාත් එකඟයි, මමත් එකඟයි, අපේ පක්ෂ දෙකම එකඟයි. ආණ්ඩු පක්ෂයයි, ප්‍රධාන විපක්ෂයයි දෙකම එකඟයි. නමුත් ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, අද වෙනකන් එය කෙටුම්පත් කිරීමේ ක්‍රියාදාමයවත් පටන් අරගෙන නැහැ. මෙවර අය වැයෙන් ඒ පිළිබඳ විශේෂඥ සහාය ලබා ගැනීමට මුදල් වෙන් කිරීමකුත් නැහැ. අද වෙච්ච දේ ඔබතුමා දැක්කා නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමේ ප්‍රශ්නය ජාතික වශයෙන් වැදගත්ම ප්‍රශ්නයක්. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ තිබෙන වැදගත්ම පොරොන්දුවක්. අනුර කුමාර දිසානායක මහත්තයාගේ වැදගත්ම පොරොන්දුවක්. ජනතාවගේ බලාපොරොත්තුවක්. ඒ නිසා මම

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

බලාපොරොත්තු වනවා, මේ රටේ අනාගතය උදෙසා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමේ ක්‍රියාදාමය ඉක්මනින් ආරම්භ කරලා, ඉක්මනින් ඒ පනත් කෙටුම්පත සම්මත කර ගනීවි කියලා. එය ජන මත විචාරණයට යන අවස්ථාවේදීත්, පාර්ලිමේන්තුවේදීත් සමගි ජන බලවේගය හැටියට අපේ පූර්ණ සහයෝගය ලබා දෙන බවත් මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.00]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනය තුළ නැඟුණු පදනම් සහිත ප්‍රශ්න කිහිපයකට පමණක් පිළිතුරු දෙන්න මා අපේක්ෂා කරනවා. මූලිකවම අද මා ප්‍රධාන තේමාවක් දැක්කා. එකක් තමයි, ත්‍රිකුණාමලයේ සිද්ධිය. අනෙක් එක තමයි, අග්‍ර විනිශ්චයකාරතුමාගේ තීන්දු-තීරණ සම්බන්ධයෙන්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීන්දු-තීරණ සම්බන්ධයෙන් පොදුවේ සැකයක් ජනිත කිරීමට අසාධාරණ ලෙස පහර දීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉස්සෙල්ලාම මේ කාරණය පැහැදිලි කරන්න ඕනෑ. සාමාන්‍යයෙන් ආණ්ඩුවක් දොස් අහන්නේ අධිකරණයට අත පොවන්න යනවා කියලායි. අපි අධිකරණයේ ස්වාධීනත්වයට ගරු කරනවා. අපි අධිකරණයට අත පොවන්න යන්නේ නැහැ. මා හිතන්නේ මේ ගරු සභාවේ ඉන්න සියලු නීතිඥ මන්ත්‍රීවරු අනිවාර්යයෙන් දන්නවා, අධිකරණ සේවා කොමිෂන් සභාව කියන්නේ ස්වාධීන ආයතනයක් කියන එක. ඒ ආයතනයට බලපෑම් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවත් වරදක් බව කවුරුත් දන්නවා. ඒ වාගේම විනිශ්චයකාරවරු ඉවත් කර තිබෙන්නේ ප්‍රීති පද්මන් සූරසේන අග්‍ර විනිශ්චයකාරතුමා පමණක් නොවෙයි. මීට පෙරත් ඒ දේ සිදු වෙලා තිබෙනවා. ඒ ඉවත් කරන ලද සෑම විනිශ්චයකාරවරයෙකුටම, වැඩ තහනම් කරන ලද සෑම විනිශ්චයකාරවරයෙකුටම කරුණු දක්වන්න අවස්ථාවක් දීලා යුක්ති සහගත *audi alteram partem* ක්‍රමය අනුව දෙපාර්ශ්වයටම කන් දීලා ගත්ත තීන්දු-තීරණ තිබෙන්නේ.

ඒකට වෙන කවුරුන් හෝ මොනවා හෝ කියලා සැකයක් උපද්දවන්න හදනවා නම්, ඊට එකම හේතුව විය හැක්කේ ඒ වැරදි කරන ලද මහෙස්ත්‍රාත්වරු මේ මන්ත්‍රීවරුන්ට දීපු වැරදි තොරතුරු විය යුතුයි. උදාහරණයක් වශයෙන් වැල්ලවායේ මහෙස්ත්‍රාත් කෙනෙක් ගැන ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා කථා කළා. රත්තරන් කිලෝ හයකට මොකක්ද වුණේ කියලා හොයා ගන්න බැරි නිසා විමර්ශනයක් කරලා වෙච්ච වැඩක් ඒක. ඒ වාගේම property නඩුවක් සම්බන්ධව ගත්ත තීන්දුවක්. මට ඒ විසිදෙනා ගැනම එකින් එක කියන්න පුළුවන් විධියට වාර්තා තිබෙනවා. මොකද, අපි ඒ වාර්තා කැඳවා තිබෙන නිසා. නමුත්, ඒවා මෙතැන කියලා මම කාටවත් හිරිහැරයක් කරන්නේ නැහැ. මම එක දෙයක් කියන්නම්. අධිකරණ සේවා කොමිෂන් සභාවත්, ගරු අග්‍ර විනිශ්චයකාරතුමාත් ඒ දේ නිවැරදිව, සාධාරණව, යුක්ති සහගතව කරලා තිබෙනවා. මේ complain කරලා තිබෙන කවුරුන් හෝ වෙච්චා ඒගොල්ලන්ට කිසිම බාධාවක් නැහැ, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට අභියෝග කරලා උසාවියක නඩුවක් පවත්වාගෙන යන්න. නමුත් ඒ එක්කෙනෙක්වත් උසාවියකට ගියේ නැහැ. ඒ එක්කෙනෙක්වත් උසාවියකට යන්නේ නැතිව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් යොදා ගනිමින් මඩ ගහනවා, අවලාද කරනවා, ස්වාධීන ආයතනයක් වූ අධිකරණ සේවා කොමිෂන් සභාවට. පුදුම වැඩේ කියන්නේ ඇප පිට එළියේ ඉන්න විත්තිකරුවන්, සැකකරුවන් තමයි මෙලෙස අධිකරණයට පහර ගහන්නේ. මේ අය පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කරමින් තමයි ඒ දේ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න තිබෙන අනෙක් කරුණ මෙයයි. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා, photocopy machines පිළිබඳ ප්‍රශ්නය. ඔව්, ඒක රට පුරාම තිබෙන අධිකරණවල තිබුණු ප්‍රශ්නයක්. මේ වනකොට circular එකක් ගහලා තිබෙනවා, procurement procedures යටතේ එහෙමම ඒ machines hire කර ගන්න. මොකද, ඒ photocopy machine එකට ගෙවන ගණනෙන් අයිතිකාරයා ඒ hire එක cover කර ගන්නවා. ඒ වාගේම ඒ machine එක කැඩුණාමත් ඔහු ඒක replace කරනවා. දැන් ඒ අවසරය දීලා තිබෙනවා. මම හිතන්නේ මහාධිකරණවල විනිශ්චයකාරවරුත් ඒක ක්‍රියාවට නඟාවි. හැබැයි අවශ්‍ය ලිපිද්‍රව්‍ය -කොළ- තවමත් යවන්නේ අධිකරණ අමාත්‍යාංශයෙන්මයි. මම ඒ දේ කරන්න හේතු වුණේත් දාන දාන machines කැඩෙන තරමට අපට මේ වැඩේ කරන්න බැරි නිසා. අම්පාරේ අධිකරණවල හෝ වෙනත් දුර පළාත්වල අධිකරණවල වැඩ කරගෙන යන්නත් අර ක්‍රමය හොඳයි. එම නිසා දැන් ඒ දේ අපි කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා, තවත් පැති දෙකක අධිකරණ පිහිටුවන්න කියලා. *[බාධා කිරීමක්]* ඔව්, ඒ තැන් දෙකේ ගැටලුවක් මතු වනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඒ ගැන අනිවාර්යයෙන් බලන්න, ගරු ඇමතිතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඔව්, අනිවාර්යයෙන් බලන්නම්. නමුත්, අධිකරණ පිහිටුවීමේ තීන්දුව ගන්න ඕනෑ අධිකරණ සේවා කොමිෂන් සභාව. නීතිඥ සංගම්වල අවශ්‍යතාව ගැන මටත් ලියන්න, එතකොට මටත් එය අධිකරණ සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්. නැත්නම් කෙළින්ම ඒ අයට පුළුවන්, JSC එකටම ලියන්න. එතැනින් තීන්දු කළොත් ඒ ප්‍රදේශයට අධිකරණයක් අවශ්‍යයි කියලා, ඒ අවශ්‍ය පහසුකම් දෙන්න කටයුතු කරන්න අපේ අමාත්‍යාංශය බැඳිලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මානව හිමිකම් නඩු සම්බන්ධ තවත් ප්‍රහාරයක් එල්ල වනවා. මොකද, මානව හිමිකම් නඩු තොග පිටින් - wholesale - විසි කරනවා. මේ ගැන මන්ත්‍රීවරුන් දෙතුන් දෙනෙක් කිව්වා. මානව හිමිකම් නඩුවකදී ඉස්සෙල්ලාම කරුණු තහවුරු කරන්න ඕනෑ. පදනමක් සහිත නඩුවක් තිබුණොත් විතරයි ඒක leave to proceed දෙන්නේ. ඒක හැම නීතිඥවරයාම දන්නවා. පදනම් විරහිත නඩුවලට ඉඩ දෙන්නේ නැහැ කියලා, ඒකට අධිකරණයට දෙහි කපන එක සුදුසු නැහැ කියලායි මම කියන්නේ.

ඒ වාගේම මම තවත් කරුණක් පැහැදිලි කරන්න ඕනෑ. යම් ප්‍රමාණයකට අපට පිළිගන්න වනවා, අපේ ප්‍රාග්ධන වියදම්වල අඩුවීම. මේකට බලපෑ හේතු කාරණා කිහිපයක් තිබෙනවා.

අපි නොවැම්බර් සිට මාර්තු 21වැනි දා වෙනකම් කටයුතු කරගෙන ආවේ අතුරු අය වැයකින්. එහිදී අපි කිසිම දෙයක් මුළු වර්ෂයටම plan කරන්නේ නැහැ. ඊට පස්සේ අපි ඉදිරිපත් කළ Budget එක මාර්තු 21වැනි දා සම්මත වුණාට පස්සේ එන්නේ අප්‍රේල් මාසය. ඒ කියන්නේ, නිවාඩු මාසය. මැයි, ජූනි, ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් 30 දක්වා කියන මාස 5 ප්‍රගතිය තමයි ඔබතුමන්ලාගේ වාර්තාවල තිබෙන්නේ. ඒ මාස 5ක ප්‍රගතිය මිස, අවුරුද්දක ප්‍රගතිය නොවෙයි. ඒ මාස 5ට ප්‍රාග්ධන වියදම් හැටියට අධිකරණ අමාත්‍යාංශයෙන් දරලා තිබෙන්නේ සියයට 22යි. මම ඒක පිළිගන්නවා. ඒකට කාරණා කිහිපයක් බලපෑවා. එකක් තමයි, කාර්ය මණ්ඩල හිඟය. ඒ වාගේම Procurement Guidelines. කලින් ආණ්ඩු වංචා දූෂණ හැම එකක්ම කළේ Procurement Guidelines හැම එකක්ම මඟ හැරලා ගිහිල්ලා. අපි එහෙම කරන්නේ නැහැ. අපි නිසි ක්‍රමයට අනුව කටයුතු කරනවා. හැබැයි, නිසි ක්‍රමයට අනුව කටයුතු කරනකොට යම්කිසි පමාවක් වෙලා තිබෙනවා. මට පැහැදිලිවම කියන්න පුළුවන්, මේ දෙසැම්බර් 31වැනි දා වනකොට අපට ඒ සියලු දේවල් කරලා ප්‍රාග්ධන වියදම සියයට 70ක, 75ක ප්‍රමාණයට ගෙනයන්න හැකියාව ලැබෙයි කියලා. මොකද, ඒ බිල්පත්වල ගෙවීම් කටයුතු දැන් කරමින් පවතිනවා. අපි මේ කියන එකේ ඇත්ත නැත්ත ලබන වසරේ බලන්න පුළුවන්.

පසුගිය අවුරුද්දේ මම කිව්වා, අධිකරණවල පුරප්පාඩු 6,021ක් තිබුණා කියලා. මේ වනකොට දෙදහස් ගණනක් බඳවාගෙන තිබෙනවා. ඉදිරියේදී මේ කටයුතු වේගවත්ව කරගෙන යන්න පුළුවන්. නඩුකාරවරුන් පනස් දෙනෙකු පත් කරලා තිබෙනවා. මතක තබාගන්න, 2022න් පස්සේ කිසිම ගොඩනැඟිල්ලක් අලුතින් හදලා තිබුණේ නැහැ. ඒ කටයුතු නවත්වා තිබුණා, economic crisis එකෙන් පස්සේ. ඒ වාගේම recruitment freeze කරලා තිබුණේ. අපි ඒවා 2024දී පටන් ගන්නකොට, නැවතිච්ච රටක් ක්‍රියාත්මක කරන්න යනකොට මිලෙහි විචලන සිදු වනවා. පරණ ගණන්වලට කොන්ත්‍රාත්කරුවන් වැඩ කරන්නේ නැහැ. එතකොට ඒවා නැවත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරලා ඒ මිල විචලනය සඳහා approval ගන්න ඕනෑ; සල්ලි වෙන් කරගන්න ඕනෑ. මේ සියලු කාරණා සිද්ධ කරනකොට යම් පමාවක් ඇති වෙලා තිබෙනවා. නමුත් ඒක පමාවක් නොවෙයි. අපි ඒක සලකන්නේ අත්‍යවශ්‍ය කාලයක් හැටියට.

පූගොඩ අලුත් අධිකරණයේ වැඩ කටයුතු දෙසැම්බර් මාසයේ තමයි අවසන් කරන්න තිබුණේ. නමුත් ඒක කරන්න වෙන්නේ මාර්තු මාසයේදී. ඒකට හේතුව, State Engineering Corporation එක සමඟ තිබුණු ගැටලු. දැන් ඒක නිවැරදි කරලා තිබෙනවා. ඒ වාගේම මාතලේ සහ කන්තලේ උසාවි පිහිටුවන්න අවශ්‍ය වැඩ කටයුතු ටිකත් අපි කරගෙන යනවා. මනම්පිටිය, වාලච්චේනයි, පුත්තලම, වාකරෙයි සහ නිකවැරටිය ප්‍රදේශවල නව අධිකරණ විවෘත කරන්න අවශ්‍ය කටයුතු සූදානම් කරලා තිබෙනවා. අපි මේ වසරේදී ඒවා විවෘත කරන්න බලාපොරොත්තු වනවා. පුත්තලම අධිකරණය මේ වන විට විවෘත කර තිබෙනවා.

තවත් හේතුවක් තිබෙනවා, මුදල් ඉතුරු වෙන්න. ඒ තමයි අපි බලාපොරොත්තු වෙච්ච level එකට price escalations සිදු නොවීම. ඒ නිසාත් යම් මුදල් ප්‍රමාණයක් ඉතිරි වෙලා තිබෙනවා.

අනෙක් ගැටලුව මෙයයි. උසාවි වෙනත් තැන් වාගේ නොවෙයි. ඒවා repair කරන්න ඕනෑ, හදන්න ඕනෑ, උසාවියක් ක්‍රියාත්මක වෙද්දීමයි. ඒවායේ වැඩ කරන අය සද්ද ඇහෙනවාට කැමැතිත් නැහැ. ඒ නිසා ඒ කටයුතු රාත්‍රි කාලයේත් කරන්න සිදු වනවා.

එක්ස්ප්‍රස් පර්ල් නඩුව සම්බන්ධයෙන් වන වියදම් ගැනත් අද කිව්වා. අපේ රජය බලයට එන්න කලින් තමයි මේ නඩුව වෙනුවෙන් කොන්ත්‍රාත් අත්සන් කරලා නීතිඥයන් අරගෙන තිබෙන්නේ. අපි සිංගප්පූරුවේත්, එංගලන්තයේත් එක්ස්ප්‍රස් පර්ල් නඩුව සම්බන්ධයෙන් කටයුතු කරගෙන යනවා. කැබිනට් මණ්ඩලයේ එකඟතාව පරිදි අපි ඒකට අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කරගෙන, ඒ මුදල් ගෙවීම සිදු කරනවා. මොකද, සිංගප්පූරුවේ සහ එංගලන්තයේ කරගෙන යන නඩු කටයුතු අඩාළ වුණොත් අපට ලබා ගන්න තිබෙන වන්දියත් ගන්න බැරි වනවා. ඒ සම්බන්ධ සම්පූර්ණ වියදම් වාර්තාවක් මම පාර්ලිමේන්තුවට නුදුරේදීම ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා. *[බාධා කිරීමක්]* වෙලාව නැහැනේ මන්ත්‍රීතුමා, විනාඩි දෙකයිනේ තිබෙන්නේ. අපි පස්සේ කථා කරමු. මගේ කථාව ඉක්මනට ඉවර කරන්න ඕනෑ.

ඒ වාගේම Government Analyst's Department එකේ reportsවල යම් පමාවක් තිබෙනවා. මම ඒක නැහැයි කියන්නේ නැහැ. ඒකට හේතුව, එහි කාර්ය මණ්ඩලය විශාල වශයෙන් අඩුවීම. මේ වනකොට අපි 16දෙනෙක් අලුතින් බඳවාගන්න කටයුතු කරනවා. ඒ වාගේම තව 25දෙනෙක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නවා. එතකොට එහි තිබෙන පමාව මඟ හරවා ගැනීමට අපට හැකියාව ලැබෙනවා.

ළමයින් උසාවියට ගෙන ඒමේදී වැඩිහිටියන් සමඟ එකට ගෙන ඒම අවුරුදු 10ක්, 15ක්, 20ක් තිස්සේ සිදුවනවා. ඒක විසඳන ක්‍රමය අපි නුවරින් පටන් ගත්තා. නුවර අධිකරණයේ ළමයින්ට සාක්ෂි දෙන්න වෙනමම කාමරයක් හදලා තිබෙනවා. ඒ වාගේම Civil Procedure Code එකට ගෙනාපු සංශෝධනය හරහා ළමයින්ට online ක්‍රමයට සාක්ෂි දෙන්නත් පුළුවන්. එතකොට මේ ප්‍රශ්නය බොහෝදුරට විසඳෙයි කියලා අපි බලාපොරොත්තු වනවා.

අජිත් පෙරේරා මන්ත්‍රීතුමනි, කළුතර අධිකරණයේ ගොඩක් දිරාපත් වුණු බිල්ඩින් දෙකක් තිබෙනවා. ඒවා ඉක්මනින් අලුත්වැඩියා කරන්න අවශ්‍ය පියවර ගන්නවා කියන එකත් මම ඔබතුමාට කියන්න ඕනෑ.

ඒ වාගේම මම කිව්වා, Civil Procedure Code එකේ Section (9) ගැන. මම අජිත් පෙරේරා මන්ත්‍රීතුමාට අවස්ථා කිහිපයකදීම ඒ ගැන පැහැදිලි කළා. මම ඒ වගන්තිය සම්පූර්ණයෙන්ම සංශෝධනය කරන්න කියපු සභා වාර්තාව කැඳෙව්වා. ඒක කියවලා බලනකොට Section (9) සංශෝධනය කරන්න කියලා එහි සඳහන් වෙලා තිබුණේත් නැහැ. නමුත් ඔබතුමාත් දන්නවා, ඒක කළේ කවුද කියලා. මම මේ පාර්ලිමේන්තුවේ මුක්තිය පාවිච්චි කරලා කාටවත් මඩ ගහන්නේ නැහැ. නමුත් ඔබතුමාත් දන්නවා, කවුද ඒක කළේ, මොන හේතුවකටද ඒක කළේ කියලා. නමුත් මම ඒක වෙනස් කරන්න කමිටුවක් පත් කරනවා. අනිවාර්යයෙන්ම මම ඒක එන අවුරුද්දේ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු ඇමතිතුමනි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි විපක්ෂය ගෙනාපු සාධනීය විවේචනවලට අනිවාර්යයෙන්ම කන් දීලා ඉදිරියේ දී එතුමන්ලා සමඟ සම්බන්ධ වෙමින් අධිකරණයේ කටයුතු ඉතා ප්‍රශස්ත මට්ටමින් කර ගෙන යන්න අවශ්‍ය දේ කරනවා. මා ගෞරවයෙන් එක ඉල්ලීමයි කරන්නේ. ස්වාධීන අධිකරණයට බලපෑම් කරන්න එපා. නොවැම්බර් 21වැනි දාට පෙරහුරුවක් ඕනෑ නම් වෙන කොහේ හරි කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.09]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම මේ කාරණය මතක් කරන්න ඕනෑ. ඉතාම වැදගත්, රටට විදේශ විනිමය වැඩියෙන්ම ගෙනෙන විදේශ කටයුතු අමාත්‍යාංශයේ ඇමතිතුමා උදේ කිව්වා, පෞද්ගලික අංශයෙන් තමයි මේ සියලු කාර්යයන් ඉෂ්ට කරන්නේ කියලා. ඒක හරි. එක පැත්තකින් අපට දැන් විදේශ රැකියාවලින් ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක් ලැබෙනවා. ඒ වාගේම සංචාරක ව්‍යාපාරයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක් හෝ ඊට වැඩි ගණනක් ලැබෙනවා. එතකොට මේ අමාත්‍යාංශයේ නියාමනය එහෙම නැත්නම් අධීක්ෂණය යටතේ අපේ රටට ඇමෙරිකානු ඩොලර් බිලියන 10කට වඩා ආදායමක් එන අංශ දෙකක් තිබෙනවා. අද මෙතැන කථා කරපු නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනාම කිව්වා, "අපි එනකොට මේවා ඔක්කෝම විනාශ වෙලා තිබුණා" කියලා. සමහර කැබිනට් ඇමතිවරු කිව්වා, "අපි ආණ්ඩුව භාර ගන්නකොට තෙල් පෝලිම් තිබුණා" කියලා. එතුමන්ලා පෝලිම් ගණනාවක් ගැන කථා කළා. හැබැයි, මේ සංඛ්‍යාලේඛන බැලුවාම අපට එහෙම දෙයක් පෙනෙන්නේ නැහැ. නමුත් ඒක නොවෙයි ඇත්ත. තමුන්නාන්සේලා මේ රජය භාර ගත්තේ 2024 අවුරුද්දේ අග.

අපට වැඩියෙන්ම ඩොලර් එන විදේශ රැකියා සහ සංචාරක කියන ක්ෂේත්‍ර දෙක අපි ගනිමු. අපි සංචාරක ක්ෂේත්‍රය ගත්තොත්, එහි ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ගරු විජිත හේරත් ඇමතිතුමනි, ඔබතුමා අත්දැකීම් තිබෙන ඇමතිවරයෙක්. එම නිසා මේ ක්ෂේත්‍ර දෙක අපට වැදගත්. අපේ රට බංකොලොත් වුණේ, මේ ක්ෂේත්‍ර දෙකේ ප්‍රශ්න ඇති වුණේ ඒ වෙලාවේ ඇති වුණු කොරෝනා වසංගතය නිසායි. එම නිසා ලෝකයේම සංචාරක ව්‍යාපාරය ඇනහිටියා. ඒ හේතුවෙන් ඒ අවුරුදු එකහමාර, දෙක තුළ අපට ඇමෙරිකානු ඩොලර් මිලියන 4,000කට ආසන්න මුදල් ප්‍රමාණයක් නැති වුණා. ඒ වාගේම ඒ වෙලාවේ විදේශ රැකියා ක්ෂේත්‍රයෙනුත් ඉතාම අඩු ආදායමක් තමයි අපට ලැබුණේ. ඒ නිසා තමයි ක්ෂණිකව ඒ තත්ත්වය ඇති වුණේ. එහෙම නම් මේ ක්ෂේත්‍ර ඉතාම වැදගත්. අත්දැකීම් තිබෙන ඇමතිවරයකු හැටියට ඔබතුමාට, - නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනාම කථා කරන දේවල් බැලුවාම සහ ක්‍රියා කරන ආකාරය බැලුවාම - මේ දෙදෙනාගෙන් ලොකු හයියක් හම්බ වෙනවා කියලා මම හිතන්නේ නැහැ. මොකද, එතුමන්ලාට අත්දැකීම් නැති නිසා මේ ගැන ඉගෙන ගෙන මේවා ක්‍රියාත්මක කරන්න සහයෝගය දෙන්න ඕනෑ. එතුමන්ලා දෙදෙනාම දැන් උද්ධච්චකමින් වැඩ කරනවා කියලා තමයි මට නම් ඒ කථා තුළින් පෙනෙන්නේ. ඒක තමයි ඇත්ත. එහෙම කරලා මේ කටයුතු කරන්න බැහැ. ඒක මතක තබා ගන්න.

විදේශ රැකියා ක්ෂේත්‍රය ගත්තොත්, 2023දී අපට ආදායම හැටියට ඩොලර් මිලියන 5,969ක් ඇවිල්ලා තිබෙනවා. 2024දී ඩොලර් මිලියන 6,575ක් ඇවිල්ලා තිබෙනවා. මේකට හේතුව තමයි ඊට ඉස්සෙල්ලා වසරේ විදේශගත වුණු කණ්ඩායම සහ විදේශගත වෙලා ඉන්න කණ්ඩායම. ගොඩක් වෙලාවට විදේශගත වෙන්නේ අවුරුදු දෙකක ගිවිසුමකට. පසුගිය අවුරුද්දේ සහ ඊට ඉස්සෙල්ලා අවුරුද්දේ විදේශ රැකියාවලට ගිය අයගේ ප්‍රතිඵල තමයි අද වනකොට එන්නේ.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිතුමා කියනවා, අපි මේ අවුරුද්දේ විදේශ රැකියා සඳහා ලක්ෂ තුනහමාරක් විදේශගත කරන්න ඕනෑ කියලා. ඒ target එකට යන්න පුළුවන්ද? මෙන්න මේවායි බලන්න ඕනෑ. මම කියනවා, දෙසැම්බර් මාසය වනකොට ඒ target එකට යන්න බැහැ කියලා. ඒ target එකට යන්න අවශ්‍ය වැඩ පිළිවෙළ තමුන්නාන්සේලා අමාත්‍යාංශය තුළින් ක්‍රියාත්මක කරලා නැහැ. ඒකයි අපි කියන්නේ. මම දැක්කා, නියෝජ්‍ය ඇමතිතුමා ඇවිල්ලා ටිකට් වගයක ගණන් කියනවා. ඒක මෙතැන කියලා වැඩක් නැහැ. ඒක අධිකරණයට කියන්න. ඒවා කිය-කියා ඉඳලා වැඩක් නැහැ. තමන්ට තිබෙන වගකීම ඉෂ්ට කරන්න. අපට ණය ගෙවන්න තිබෙන්නේ ඩොලර් ගණන්වලින්. ඒකට උදවු වන ප්‍රධානම අංශයක් තමයි, විදේශ රැකියා අංශය.

එහෙම නම්, විදේශ රැකියා ක්ෂේත්‍රය ගොඩගන්න එක වැදගත්. ඇමතිතුමනි, ඔබතුමා කාර්ය බහුල ඇති. මොකද, ඔබතුමා යටතේ අමාත්‍යාංශ ගණනාවක් තිබෙනවා. නමුත්, මේ වෙනකම්ම මේ විදේශ රැකියා ක්ෂේත්‍රයට කවුද මුල් වෙලා ඉන්නේ? මේ ක්ෂේත්‍රය ගත්තොත්, අපේ රටේ ශ්‍රමිකයන් පිටරට යවන්නේ ඒජන්තවරු හරහා. එතකොට ඒ අය සහ විදේශ රැකියාවලට යන අපේ රටේ සහෝදර ජනතාව අමාත්‍යාංශයෙන්, එහෙම නැත්නම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් නියාමනය කරන්න ඕනෑ. ඒක හැර වෙන සහයෝගයක් ලැබෙන්නේ නැහැ. පෞද්ගලිකව රට යන කණ්ඩායමයි, ඒජන්තවරුයි එකතු වෙලා තමයි සම්පූර්ණයෙන්ම මේ කටයුතු කරන්නේ. එතකොට ඒකට අපි සහාය දෙන්න ඕනෑ.

එක පැත්තකින් විදේශ රැකියාවල නියුතු වෙලා ඉන්න අය වෙනුවෙන් විශ්‍රාම වැටුපක් ලබා දීමේ වැඩ පිළිවෙළක් හදනවා කියලා මේ අය වැයේදීත් කියනවා අපි දැක්කා. අපි ඒ අය වෙනුවෙන් යහ පාලන රජය කාලයේ මේ වෙනුවෙන් වැඩ පිළිවෙළක් ආරම්භ කළා. නමුත්, තවම ඒක ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා. ඒ ගැන අපි හැමෝම ලජ්ජා වෙන්න ඕනෑ. විශේෂයෙන්ම විදේශ රැකියාවල නියුතු වෙලා ඉන්න අය එවන ඩොලර්වලින් තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ආවාට පස්සේ වාහන ගෙන්නුවේ. ඒ අනුව බිලියන ගණනාවක වාහන ගෙනාවා. කොහෙන්ද මේ සල්ලි? මේවා විදේශ රැකියා කරන අපේ රටේ අහිංසක ජනතාව එවන ඩොලර්. අපි දැන් පාවිච්චි කරන මේ දුරකථනයක් පවා අපට ගන්න අවස්ථාව ලැබිලා තිබෙන්නේ ඒ අය නිසායි. මොකද, වෙන ක්‍රමයක් අපට නැහැ, ඩොලර් ලැබෙන්න. 2022දී අපේ රට බංකොලොත් වෙලා හිටපු වෙලාවේ, අපේ රටේ ඩොලර් හිඟ වෙච්ච නිසා අපට ඉන්ධන නැවකට ගෙවා ගන්න සල්ලි තිබුණේ නැහැ. විදේශ විනිමය උපයන්න දායක වන නිසා මේ අමාත්‍යාංශය ඉතා වැදගත් අමාත්‍යාංශයක්. ඒ නිසා විදේශ රැකියාවල නියුතු වෙලා ඉන්න අයට ඒ සහන ලබා දෙන එක අපේ යුතුකමක්. මේ ක්ෂේත්‍රය ඉහළට ගන්න නම් ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම අවශ්‍යයි, ඇමතිතුමනි.

නමුත් මේ වෙනකම් මට ලැබිච්ච තොරතුරු අනුව තවම ඒ වෙනුවෙන් නිසි වැඩ පිළිවෙළක් හඳුන්වා දීලා නැහැ. ඔබතුමන්ලා ඊයේ - පෙරේදා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ස්ථාපිත කර වසර 40ක් පිරීම නිමිත්තෙන් අරලියගහ මන්දිරයේ උත්සවයක් පැවැත්වුවා. ඒ උත්සවයේදී ඔබතුමන්ලා කථා පැවැත්වුවා. නමුත් අර ඒජන්තවරු, එහෙම නැත්නම් විදේශ රැකියා ක්ෂේත්‍රයේ කටයුතු කරන ඒ අය ඇගැයීමකට ලක් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ නිසියාකාරයෙන් සිදු වෙලා තිබුණේ නැහැ. ඒක පැහැදිලිව මම කියන්න ඕනෑ. විදේශ රැකියා ඒජන්තවරු එක්ක කථා කරලා බලන්න. මේ වෙනකම් ඒ අයට ඔබතුමන්ලා එක්ක සාකච්ඡාවක් දීලා නැහැ, මේ ක්ෂේත්‍රය ඉස්සරහට අරගෙන යන්නේ කොහොමද කියලා සොයා බලන්න. නියෝජ්‍ය ඇමතිතුමන්ලාට මේ කටයුතු භාර දීලා මේ වැදගත් ක්ෂේත්‍රය මෙතැනින් එහාට ගන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. අත්දැකීම් තිබෙන පුද්ගලයකු හැටියට ඔබතුමා ඒකට අත ගහලා ක්‍රියාත්මක කළ යුතු වෙනවා. නැත්නම් ප්‍රශ්න ගණනාවක් ඉස්සරහට ඇති වෙයි. එතකොට ඒ බලාපොරොත්තු වෙන targetsවලට, ඒ තැනට යන්න අපට අවස්ථාව ලැබෙන්නේ නැහැ.

ඒ වාගේම විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, සංචාරකයන් ලංකාවට එන එක ගැන අපි කවුරුත් සතුටු වෙන බව. ඇත්තටම අපි ඒ ගැන සතුටු වෙන්න ඕනෑ. නමුත්, අපේ රටට මේ වනවිට එන සංචාරකයන් ප්‍රමාණය 2018 අවුරුද්දත් එක්ක සන්සන්දනය කරලා බලන්න ඕනෑ. මොකද, 2018 අවුරුද්දේ තමයි අපේ රටට වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් ආවේ. 2018 අවුරුද්දේ සංචාරකයන් මිලියන 2.5ක් - ලක්ෂ 25ක් - අපේ රටට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම 2018 අවුරුද්දේ සංචාරකයන් පැමිණීම තුළින් අපට ඩොලර් බිලියන 5.6ක ආදායමක් ලැබිලා තිබෙනවා. නමුත්, 2019 අවුරුද්දේ පාස්කු ඉරුදින ප්‍රහාරයත් එක්ක -ඒ බෝම්බ පිපිරීමත් එක්ක- මේ ආදායම යම් ප්‍රමාණයකට අඩු වුණා. හැබැයි, ඒත් අපට ඩොලර් බිලියන 4.6ක් ආදායම වශයෙන් ලැබුණා. අපේ රට බංකොලොත් වීමෙන් පසු, 2023 අවුරුද්දේ සිට මේ ආදායම ආපසු වැඩි වෙන්න පටන් ගත්තා. ඒ අනුව අපට ආදායම වශයෙන් ඩොලර් බිලියන 2ක් ලැබුණා. 2024දී අපට ඩොලර් බිලියන 3.2ක් ආදායම වශයෙන් ලැබුණා. මේ වෙනකොට සංචාරකයන්ගේ පැමිණීම ගත්තොත්, මම කලින් කිව්ව 2018 අවුරුද්දේ අපේ රටට ආපු සීමාවටම ඇවිල්ලා තිබෙනවා. මේ අවුරුද්දේ තව මාසයක, එකහමාරක කාලයක් ඉතුරු වෙලා තිබෙනවා. ඒ කාලය තුළ ඊට වඩා සංචාරකයන් අපේ රටට එන්නත් පුළුවන්. ඒ අනුව, සංචාරකයන් මිලියන 2.6ක් හෝ මිලියන 2.7ක් හෝ අපේ රටට ඒවි. හැබැයි, ආදායම බලන්න. ආදායම ඩොලර් බිලියන 3.2යි. අපට 2018දී ආදායම වශයෙන් ලැබුණු ඩොලර් බිලියන 5 වෙනුවට, ඒ ප්‍රමාණයටම සංචාරකයන් ඇවිල්ලාත් දැන් ලැබෙන්නේ ඩොලර් බිලියන තුනයි ගණනක්. ඒ අනුව ඩොලර් බිලියන 2ක් අපට අහිමි වෙලා තිබෙනවා. එහෙම නම් මේ එන්නේ කොයි වාගේ අයද? ඒ ගැන අපි බලන්න ඕනෑ. සංචාරකයන්ගේ ප්‍රමාණය වැඩි වුණාට කමක් නැහැ. නමුත් සංචාරකයන්ගේ ප්‍රමාණය වැඩි වෙනවාත් එක්කම ඒ අයට පහසුකම් ලැබෙන්න ඕනෑ. සංචාරකයන් අපේ රටට පැමිණීම තුළින් ලැබෙන ආදායම අපට ඉතා වැදගත් වෙනවා. එම නිසා ඒ සඳහා අවශ්‍ය සහයෝගය ඒ ක්ෂේත්‍රවලට ලබා දෙන්න ඕනෑ.

විදේශ රැකියා ක්ෂේත්‍රය ගත්තාම, අනිවාර්යයෙන්ම අපි පැති දෙකක් බලන්න වෙනවා. එකක් තමයි, විදේශ රැකියාවට යන පුද්ගලයා. මොකද, විදේශ රැකියාවකට යන පුද්ගලයා අවුරුදු ගණනාවක් විශාල කාර්යභාරයක් අපේ රට වෙනුවෙන් කරනවා. ඔබතුමන්ලා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ස්ථාපිත කර වසර 40ක් පිරීම නිමිත්තෙන් වූ 40වන සංවත්සරය පැවැත්වූවා. මේ පිරිස් අවුරුදු 40ක්ම අපේ රටේ සිටින අනික් පිරිස ජීවත් කරවන්න ඔවුන්ගේ ශ්‍රමය යොදවලා අපේ රටට ඩොලර් එවලා තිබෙනවා. නමුත් අපි ඒ අය ගැන බලන විධිය හරිද? තමුන්නාන්සේලා බලයට ගෙනෙන්න ලොකු සහායක් මේ ක්ෂේත්‍රයේ නිරත වෙලා සිටින අය ලබා දීලා තිබෙනවා. විදේශ රැකියාවල නියුතු අයගේ පවුල්වල හැම කෙනාම වාගේ ඔබතුමන්ලාට ඡන්දය දීලා තිබෙනවා. එහෙම නම් අපේ යුතුකමක් විධියට අපි ඒ අය ගැන බලන්න ඕනෑ. ඒ අයගේ ජීවන තත්ත්වය මොකක්ද? විදේශ රැකියාවලට ගියාම පවුල්වල ගැටලු ගණනාවක් ඇති වෙනවා. එම නිසා ඒ ගැටලු නැති කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න ඕනෑ වාගේම, ඒ සඳහා වැඩ පිළිවෙළක් අපි හදන්න ඕනෑ. විදෙස්ගත ශ්‍රමිකයන්ට විශ්‍රාම වැටුප් ලබා දීමේ වැඩ පිළිවෙළ ගැන අපි කථාවට පමණක් කියලා වැඩක් නැහැ. අපි අනිවාර්යයෙන්ම ඒ අයට විශ්‍රාම වැටුප් ලබා දීමේ වැඩ පිළිවෙළක් හදලා දෙන්න ඕනෑ. ඒ යෝජනාව 2015දී යහ පාලනයෙනුත් ගෙනාවා. නමුත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා අපි යුතුකමක් හැටියට ඒක ඉෂ්ට කරන්න ඕනෑ.

ඒ වාගේම අපි අලුතින් දෙයක් කරන්න ඕනෑ. තමුන්නාන්සේලා බලයට ආවාට පස්සේත් තිබුණු දේම තමයි ඉස්සරහට යන්නේ. නමුත් තවත් රටවල් ගණනාවක් තිබෙනවා, අපට රැකියා අවස්ථා ලබා දෙන්න පුළුවන්. Skills අනුව අපේ රටේ තරුණ තරුණියන්ට ඒ අවස්ථාව ලබා දෙන්න හැකියාව තිබෙනවා. ඒ ගැන සාකච්ඡා කරලා, අලුතින් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑ. එහෙම නැතුව අපි පරණ දේවල් ඇතුළු නොයෙකුත් දේවල් ගැන විතරක් අපේ කාලය යෙදෙව්වොත් අපට බැරි වෙනවා මේ ක්ෂේත්‍රයේ ඉස්සරහට යන්න. ඒක අපට ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙනවා.

ඒ වාගේම තමයි, සංචාරක ව්‍යාපාරය. සංචාරක ව්‍යාපාරයේත් ගැටලු ගණනාවක් තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රයට මඟපෙන්වන්නන් වාගේම වාහන පහසුකම් විශාල වශයෙන් අවශ්‍යයි. අපි ඒවා සඳහා සහයෝගය ලබා දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මට තව පොඩි කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සංචාරක ව්‍යාපාරයේදී සංචාරකයන්ගේ ගමන් පහසුව සඳහා යම් සහන වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මීට කලින් ඒ පහසුව ලබා දීලා තිබුණා. සංචාරකයන් සඳහා වාහන ගෙන්වනකොට, ඒ ව්‍යාපාරයේ යෙදිලා ඉන්න අයට යම් යම් සහන ලබා දීලා තිබුණා. ඒ තත්ත්වය යළි ඇති කරන්න ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම අපි ඇමතිතුමාට මතක් කරනවා, -ඔබතුමා හොඳ පළපුරුද්දක් තිබෙන ඇමතිවරයෙක්- මේ ක්ෂේත්‍ර දෙක ගැන විශේෂ අවධානයක් යොමු කරන්න කියලා. ඒ දෙක ගැන අවධානය යොමු කළේ නැත්නම් අපේ රටට එන ඩොලර් ප්‍රමාණයට අනිවාර්යයෙන් ප්‍රශ්න ගණනාවක් ඇති වෙනවා. මේ අවුරුද්දේ විදේශගත වෙන ප්‍රමාණයත් එක්ක තමයි ඊළඟ අවුරුද්දට එන ඩොලර් ප්‍රමාණය සංසන්දනය වෙන්නේ. ඒක පෙනනවා කොවිඩ් කාලයේ ඇති වූ තත්ත්වයත් එක්ක. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඔබතුමන්ලාට මතක් කරනවා. විශේෂයෙන්ම අපි විදේශ ශ්‍රමිකයා වෙනුවෙන් වැඩ පිළිවෙළක් හදලා ඒ අයට යම් සහන සලසන, එහෙම නැත්නම් ඒ අයගේ ජීවිත ඉහළට ගන්න වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න ඕනෑය කියලා මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

Order, please! ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair and THE HON. SPEAKER took the Chair.*

[අ.භා. 6.22]

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු සභාපතිතුමනි, අද උදේ සිට මේ දක්වා අදහස්, යෝජනා, විවේචන ඉදිරිපත් කරපු සියලු මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. මම කෙටියෙන් පිළිතුරු කිහිපයක් දෙන්න කැමැතියි. ඉතාලියේ වාගේම බොහෝ විදේශ රටවල ඉන්න ශ්‍රී ලාංකිකයන්ට පාස්පෝට් ලබා දීමේදී, නීත්‍යනුකූලව ඉන්න අයට තමයි පාස්පෝට් ලබා දෙන්නේ. නීතිවිරෝධීව ඉන්න අයට ඒ අදාළ තානාපති කාර්යාල හරහා පාස්පෝට් ලබා දෙන්න ක්‍රමයක් නැහැ. විශේෂයෙන්ම ඉතාලියේ ඒ ගැන තිබෙන ප්‍රශ්නය ඉදිරිපත් කළා, උදේ පාන්දරම. ඒකට මම කියන්න කැමැතියි, ඒ අවශ්‍ය කරන නීතිමය පසුබිම යටතේ ලබා දිය හැකි පාස්පෝට් අදාළ තානාපති කාර්යාලවලින් ලබා දෙනවා කියලා.

ඊශ්‍රායලයට යැවීමේ ක්‍රමයේ ප්‍රමාදයක් නැහැ. මේ අවුරුද්ද තුළත් අපි 6,511දෙනෙක් අලුතින් යවලා තිබෙනවා, ක්ෂේත්‍ර ගණනාවකට. මීට කලින් හිටපු ඇමතිවරයා 10,000ක් කෘෂිකර්ම ක්ෂේත්‍රයට යවලා තිබුණා. දේශපාලන හිතවත්කම් මත යවලා අන්තිමට ඊශ්‍රායලයෙන් ලොකු චෝදනාවක් ආවා, ඒ යවන අයට වැඩ කරන්න බැහැ, හැකියාව නැහැ, මහන්සි වෙන්න බැහැ, එහෙම අය නම් එවන්න එපා කියලා. ඒ නිසා ඒ 10,000 කෝටාව ඇත්තටම දිගට ගෙනියන්න බැරිවුණා. එතැනින් 8,000ක්ම අයින් වුණා. අපි ඒ 8,000 වෙනත් වෙනත් ක්ෂේත්‍රවලට යොමු කරලා යැව්වා. හැබැයි ඒ කෘෂිකර්මාන්තයට නොවෙයි. කෘෂි කර්මාන්තයට ගෙන්වන එකත් නතර කරන තත්ත්වයටම පත් වුණා, එදා වෙච්ච ඒ දේශපාලන මැදිහත්වීම් නිසා. අද විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අපි කිසි කෙනෙක් දේශපාලන වශයෙන් මේ කටයුතුවලට මැදිහත් වෙන්නේ නැහැ. ඒජන්සිකරුවන්ට පෞද්ගලිකව කෝටා ලබා දෙන ක්‍රමයක් නැහැ. ඉස්සර නම් එහෙම තමයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 40වැනි සංවත්සරය අපි සැමරුවා. එක ඒජන්සිකරුවෙකුටවත් අපි බරපැන දරන්න දුන්නේ නැහැ. හැබැයි කලින් එහෙම නොවෙයි. ඇමතිවරු එක එක අයගෙන් තමයි ඒවාට සල්ලි එකතු කළේ. ඒවා නැහැ දැන්. ඒ නිසා ඉතා පැහැදිලිව මම කියන්න කැමැතියි, අපි විනිවිදභාවයෙන් යුතුව, දේශපාලන මැදිහත්වීමකින් තොරව උපරිමයෙන් මේ කටයුතු පවත්වාගෙන යනවා කියලා. අපි ක්‍රමය හදලා තිබෙනවා. ඒ ක්‍රමය ශක්තිමත් වීම තුළ තවත් මේ කටයුතු ඉස්සරහට ගෙනියන්න පුළුවන් කියන විශ්වාසය තිබෙනවා.

මට කියන්න සන්තෝෂයි, මේ අවුරුද්දේ අපේ සංචාරකයන්ගේ පැමිණීම ගත්තොත්, අද මේ විවාදය දවසේ මිලියන දෙක සනිටුහන් කරන සංචාරකයන් දෙදෙනාම ලංකාවට ආවා. ඒ අනුව, අපට ඉදිරි මාස එකහමාර තුළ අනිවාර්යයෙන්ම මිලියන 2.4ක ඉලක්කයට යන්න පුළුවන්. අපි අනිවාර්යයෙන්ම එතැනට එනවා. ඒ කියන්නේ, ලංකාවේ ඉතිහාසයේ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් ලංකාවට ආපු අවුරුද්ද මේ 2025 අවුරුද්ද වෙනවා.

ඒ වාගේම තමයි විදේශ ප්‍රේෂණ. විදේශ ප්‍රේෂණ වැඩියෙන්ම ඇවිල්ලා තිබුණේ, 2016දී. ඒ, ඩොලර් බිලියන 7.2ක්. නමුත් මේ වෙනකොටම අපි ඩොලර් බිලියන 6.5ක් ලබාගෙන තිබෙනවා. සාමාන්‍යයෙන් මාසයකට ඩොලර් මිලියන 650ක් විතර එනවා. මේ අවුරුද්ද අවසාන වෙනකොට බිලියන 7.5 ඉක්මවනවා. ඒ කියන්නේ, ලංකා ඉතිහාසයේ වැඩිම විදේශ ප්‍රේෂණ ප්‍රමාණය ලැබූ අවුරුද්ද බවට මේ අවුරුද්ද පත් වෙනවා. වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණි අවුරුද්ද වාගේම විදේශ ප්‍රේෂණ වැඩියෙන්ම ලබා ගත්ත අවුරුද්ද බවට මේ අවුරුද්ද වාර්තාගත වෙනවා. ඒ ගැන රටක් විධියට අපට සන්තෝෂයි.

සංචාරකයන්ගේ පැමිණීම ගිය අවුරුද්දට සාපේක්ෂව සියයට 20කින් වැඩි වෙලා තිබෙනවා. නමුත් ආදායම ගත්තොත් ඩොලර් බිලියන 2.5ක් විතර තමයි වෙන්නේ. ඒකට හේතුවක් තිබෙනවා. අද ඩොලර් එක රුපියල් 300ක්, 306ක් විතර වෙනවා. ඔය කලින් කියන ආදායම ආපු කාලයේ ඩොලර් එක රුපියල් 103යි, 108යි. රුපියල් 108 වුණාම ඒකෙන් තිබෙන මිලදී ගැනීමේ හැකියාවයි, රුපියල් 300 වුණාම ඒකෙන් තිබෙන මිලදී ගැනීමේ හැකියාවයි අතර වෙනසක් එනවා. ඒ කියන්නේ, එක ඩොලරයකින් රුපියල් 306ක් එනවා නම්, එතැනින් වැඩි ප්‍රමාණයක් මිලදී ගන්න පුළුවන්. එතකොට ඩොලර් ප්‍රමාණය අඩු වෙනවා. ඒකේ යම් වෙනසක් තිබෙනවා. ඒක තමයි මම කෙටියෙන් කිව්වේ.

ඊළඟට, අපි free visa ලබා දීම සම්බන්ධයෙන් තීන්දුව අරගෙන තිබෙනවා. ඒකේ නීතිමය ගැටලුවක් තිබෙනවා, පසුගිය කාලයේ වෙච්ච සිදුවීම් එක්ක. VFS නඩුව එක්ක ඒක ගැට ගැහිලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස්වේ.

***ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.***
*தன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දිනට නියමිත කටයුතු නිමා කර ගැනීම සඳහා අවශ්‍ය කාලය ලබා දීමට ගරු සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී -***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பட்டது. -*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee. -*
*[THE HON. SPEAKER in the Chair.]*

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධයෙන් නීතිපතිතුමාගේ clarification එක ආවාට පසුව අපි free visa එක ක්‍රියාත්මක කරනවා. කොහොමටත්, මේ දවස්වල season එක. මේ season එකේදී ඒක නැති වුණාට ප්‍රශ්නයක් නැහැ. ඊට පස්සේ off-season එකේදී ඒක පටන් ගත්තාම ප්‍රමාණවත්. අනිවාර්යයෙන් ඒක අපි පටන් ගන්නවා. E-gates අපි දැනට සවි කර තිබෙනවා. නමුත් e-

gates ක්‍රියාත්මක කරන්න බැහැ. දැනට තිබෙන පනත අනුව නීතිය ප්‍රමාණවත් නැහැ. දැනට නව පනතක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර තිබෙනවා. ඒ පනතේ වගන්ති අපි සංශෝධනය කර තිබෙනවා. එය මේ පාර්ලිමේන්තුවේ සම්මත වුණාට පසුව e-gates ක්‍රියාත්මක කරන්න පුළුවන්. E-gates අපි ගෙනැල්ලා තිබුණාට ක්‍රියාත්මක කරන්නේ නැතුව airport එකේ තිබෙන හේතුව ඒකයි.

සංචාරක කර්මාන්තය දියුණු කරන්න නම් airport එක තවත් පුළුල් වෙන්න ඕනෑ. අපි දැනටමත් ඒක ආරම්භ කර තිබෙනවා. ජපානයේ JICA ආධාර යටතේ ඒ කටයුත්ත දැන් සිදු වෙනවා. ලබන අවුරුද්දේ අප්‍රේල් මාසය වෙනකොට ඒ කටයුතු අනිවාර්යයෙන් ආරම්භ කරනවා. මේ evaluation එක යනවා, technical evaluation, financial evaluation වශයෙන්. ඒක ඉවර වෙනවා, පෙබරවාරි මුල වෙනකොට. ඊට පසු අප්‍රේල් වෙනකොට ගුවන්තොටුපොළ පුළුල් කිරීම ආරම්භ කරනවා. සංචාරකයන්ගේ පහසුව සඳහා අපි පෞද්ගලික අංශයේ දායකත්වය යටතේ - ඇත්තටම ගත්තොත්, පෞද්ගලික අංශයේ කිහිපදෙනෙක් ඒකාබද්ධ වෙලා- මිලියන 35ක මුදලක් වියදම් කරලා තාවකාලික terminals කිහිපයක් දාලා තිබෙනවා, මේ season එකට. ඒකෙන් යම් ප්‍රමාණයකින් තදබදය අඩු කරගන්න අපි බලාපොරොත්තු වෙනවා. කොහොමටත් ස්ථිර උත්තරයක් සඳහා ගුවන්තොටුපොළ පුළුල් කිරීමේ ව්‍යාපෘතිය අපි ක්‍රියාත්මක කරනවා.

ඒ වාගේම උතුර සහ නැඟෙනහිර දෙපළාතේම ව්‍යාපෘති ගණනාවක්ම ක්‍රියාත්මක වෙනවා. පලාලි ගුවන්තොටුපොළ දියුණු කිරීම වාගේම, KKS එකේ වැඩත් අපි ආරම්භ කරනවා. ඒ ව්‍යාපෘතිය පිළිබඳව අපි දැන් යෝජනා සම්මත කරලා සාකච්ඡා කරමින් යනවා. ඉන්දියාවත් එක්ක ඒකාබද්ධව අපි KKS සංවර්ධනය කරනවා. අදත් කැබිනට් පත්‍රිකාවක් සම්මත වුණා, ලෝක බැංකු ආධාර යටතේ ඒ කටයුතු කරන්න. විශේෂයෙන්ම "Lonely Planet" website එක නම් කර තිබෙනවා, යාපනය tourist destination එකක් විධියට. අපි අදත් ඩොලර් මිලියන ගණනක් වෙන් කළා, උතුරේ මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම එරාවූර්වල, කාත්තන්කුඩිවල ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා. මට ඒවා ගැන කියන්න වෙලාව මදි කියන්න. සංචාරක අමාත්‍යාංශය විසින් නැඟෙනහිර පළාතටත් ව්‍යාපෘති ගණනාවක්ම ක්‍රියාත්මක කරනවා. උතුරු පළාතටත් ක්‍රියාත්මක වෙනවා, ව්‍යාපෘති ගණනාවක්ම.

ඒ වාගේම, යාල ජීප් රථ පිළිබඳ ප්‍රශ්නයක් මතු කළා. මම කියන්න කැමැතියි, දැනට ජීප් රථ 500ක් යොදවා තිබෙන බව. තවත් 175ක් යොදවන්න කියා ඉල්ලීමක් කර තිබෙනවා. වනජීවී එකෙන් කියනවා, "ඒ ධාරිතාව වැඩි කරන්න බැහැ, ඒක සතුන්ට කරදරයක්" කියලා. ඒක තමයි ප්‍රශ්නය. ඒ නිසා දැනට ජීප් රථ යොදවන අයගේ ප්‍රමාණය අඩු කරලා තමයි අලුත් අයට අවස්ථාව දෙන්න වෙන්නේ. ඒක පොඩි එකඟතාවකින් කරන්න ඕනෑ දෙයක්. මොකද, දැනට අර කට්ටිය register වෙලා ඉන්නේ. ඒක ඇත්ත. දැනට ඉන්න අයට ජීප් රථ 50, 60 තිබෙනවා. ඒ රියැදුරන් තමයි අලුත් ජීප් රථ අරගෙන තිබෙන්නේ. ඒ නිසා ඒ අය අතරින්ම එකඟතාවක් අරගෙන තමයි ඒක කරන්න ඕනෑ. කොහොම වුණත් ඒ ප්‍රශ්නය මම දන්නවා. වනජීවී එකෙන් තමයි ඒකට මැදිහත්වීම කළ යුතු වන්නේ. ඒකට අවශ්‍ය පියවර ගන්න ඉදිරියේදී අපි සූදානම්.

කටාර්වලට ප්‍රහාරය එල්ල කරපු වෙලාවේ විදේශ අමාත්‍යාංශයෙන් ඉතාම පැහැදිලිව නිවේදනයක් නිකුත් කළා. ඒ සිද්ධිය ඇති වුණේ සැප්තැම්බර් 09වැනි දා. අපි 10වැනිදා ම එය හෙළා දැකලා නිවේදනයක් නිකුත් කළා. ඒ විතරක් නොවෙයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් වෙච්ච ඒ Resolution එකට අපි සම සභාපතිත්වය දැරුවා. ඒ ප්‍රහාරය හෙළා දකින යෝජනාවට ලංකාව සම සභාපතිත්වය දරලා ඒ යෝජනාවට සහයෝගය දැක්වුවා.

ඒ විතරක් නොවෙයි. ගරු ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන සමුළුවේදී පලස්තීන ජනතාවගේ-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sorry to distutb you, Hon. Minister. Sir, Standing Order No. 92.(1)(a) states, I quote:

> "shall enter Parliament or Committee with decorum and in an orderly manner;"

මා හිතන්නේ ඇමතිතුමාට ඇඳුමේ button එක දමන්න බැරි වෙලා. Mediaවල යනවා, button එක - බොත්තම - දමලා නැහැ කියලා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
That is not a point of Order.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Sorry, මන්ත්‍රීතුමා. Okay, that is right.

පලස්තීන ජනතාවගේ විමුක්තිය පිළිබඳව අපි එදා ඉඳලා ඉන්න ස්ථාවරයක් තිබෙනවා. පලස්තීනය වෙනම රටක් විධියට අපි 1988දීත් පිළිගත්තා. අපි එදාත් මේ රටවල් දෙකේ විසඳුම් පිළිබඳව අපේ එකඟතාව පළ කර තිබෙනවා. ඒ ස්ථාවරයේ කිසිදු වෙනසක් නැහැ. විපක්ෂයේ ඉන්න කොට අපේ ස්ථාවරයේත්, ආණ්ඩුවේ ඉන්න කොට අපේ ස්ථාවරයේත් වෙනසක් නැහැ, එකම තමයි. අපි ඒ වෙනුවෙන් අද මැදිහත් වන්නේත් ඒ ආකාරයෙන්මයි. අපි එක්සත් ජාතීන්ගේ සංවිධානයේදී අදාළ කරන මැදිහත් වීමත්, ජාත්‍යන්තර සමුළුවලදී අදාළ කරන මැදිහත්වීමත් -දෙකම- ඒ ආකාරයෙන්ම සිදු කර තිබෙනවා.

ඒ වාගේම, දැනට තිබෙන වෙළෙඳ ගිවිසුම්, එනම් SAFTA ගිවිසුම, සිංගප්පූරුව සහ තායිලන්තය එක්ක අත්සන් කරලා තිබෙන ගිවිසුම ආදි සියලු වෙළෙඳ ගිවිසුම් පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා වෙනම කැබිනට් මණ්ඩල අනුකමිටුවක් පත් කර තිබෙනවා. අපි ඒ අනුකමිටුවෙන් ඒවායේ වාසි අවාසි ගැන සහ ඒවා යාවත්කාලීන කිරීම පිළිබඳව සොයා බලනවා. මොකද, ඒ ගිවිසුම් අත්සන් කරලා දැන් කාලයක් ගත වෙනවා. ඒවා අදට ගැළපෙනවාද නැද්ද, ඒවායෙන් අපේ රටට ලැබෙන වාසි අවාසි මොනවාද කියන එක පිළිබඳව සමාලෝචනය කරන්නයි අපි වෙනම කමිටුවක් පත් කරලා තිබෙන්නේ. ඒ හරහා අවශ්‍ය තීන්දු තීරණ ඉදිරියේදී අපි ගන්නවා.

[ගරු විජිත හේරත් මහතා]

විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ විවිධ යෝජනා, අදහස් ගොඩක් මතු වුණා. මම ඒ ගැනත් කියන්න කැමැතියි. ඒවා බොහොම සාධනීයයි. ඒවා ක්‍රියාත්මක කරන්න යම් කාලයක් ගතවෙනවා. සංචාරක ක්ෂේත්‍රය කියන්නේ තනි අමාත්‍යාංශයක් විසින් විතරක් නඟා සිටුවිය හැකි එකක් නොවෙයි. ඒක අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන ගණනාවක් ඒකාබද්ධව සංවර්ධනය කළ යුතු එකක්. ඒ සියලු අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරමින් සංචාරක ක්ෂේත්‍රය නඟා සිටුවන්න අවශ්‍ය පදනම -අඩිතාලම- අපි දැන් යොදා තිබෙනවා. ඒ පදනම මත අපට ඉලක්කයක් තිබෙනවා, අපේ රටට වැඩිම විදේශ විනිමය ලබාගන්න පුළුවන් ක්ෂේත්‍රයක් විධියට සංචාරක කර්මාන්තය දියුණු කරන්න. සංචාරක කර්මාන්තය දියුණු වෙනවා කියන්නේ, අපේ රට තුළ රැකියා අවස්ථා පළල් වෙනවා, නව රැකියා අවස්ථා බිහි වෙනවා කියන එකයි. ඒකත් එක්ක ආර්ථිකය ඉදිරියට යනවා.

විදේශ රැකියා ක්ෂේත්‍රය ගත්තොත්, විදේශ රැකියාවලින් අප ලබා ගන්නා ප්‍රේෂණ වැඩි කර ගැනීම අපේ ඉලක්කයක්. හැබැයි, විදේශ රැකියාවලට යවන ප්‍රමාණය වැඩි කරන එක ඉලක්කයක් වෙන්න ඕනෑ නැහැ. මොකද, රටක් විධියට ගත්තොත්, රටේ ආර්ථිකය ශක්තිමත් නම්, රැකියා අවස්ථා පළල් වනවා නම්, අපේ නිෂ්පාදන ආර්ථිකය තවත් ශක්තිමත් වෙනවා නම්, අපේ රටින් බැහැර වෙන්න නොවෙයි, අපේ රට තුළ රැඳී ඉන්න තමයි ජනතාව පෙලඹෙන්න ඕනෑ.

එතකොට අපි යන ප්‍රමාණය ඉලක්කම්වලින් වැඩියි, වැඩියි කියන එක හාස්කමක් වෙන්නේ නැහැ. අපි ඇත්තටම කටයුතු කරන්න ඕනෑ, අපේ රට තුළ ඉන්න පුළුවන් තත්ත්වයකට අපේ ආර්ථිකය ශක්තිමත් කරන්න; නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරන්න. ඒ දැක්මේ ඉඳලා තමයි අපි මේ සඳහා මැදිහත් වෙන්නේ. දැනට තිබෙන යථාර්ථය තමයි, අපේ රටේ වැඩිම විදේශ විනිමය ප්‍රමාණයක් උපයන්නේ විදේශ ප්‍රේෂණ හරහා. මැද පෙරදිගින් තමයි වැඩිම ආදායම එන්නේ. ඒකෙනුත් වැඩිම ආදායම එන්නේ කුවේට්වලින්. ඊළඟට, එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන්, සවුදි අරාබියෙන්, කටාර්වලින්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
හොඳයි, ගරු සභාපතිතුමනි.

ඒ පදනමේ ඉඳලා තමයි අපි මැදිහත් වෙන්නේ. කොහොම වුණත් අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, අපේ විදේශ ප්‍රතිපත්තිය ඉතා පැහැදිලි බව. ඒ ප්‍රතිපත්තිය, අපේ රට ලෝකය තුළ අභිමානවත් රටක් බවට පත් කිරීම ඉලක්ක කර ගත්ත විදේශ ප්‍රතිපත්තියක් සහ ලෝකයත් එක්ක අත්වැල් බැඳ ගත්ත විදේශ ප්‍රතිපත්තියක්. ඒ තුළ ඉඳගෙන අපි කටයුතු කරනවා. ඒ කර්තව්‍යයේදී අද දවස පුරා මේ විවාදයට සහභාගි වෙච්ච ඔබතුමන්ලාටත්, ලේකම් මණ්ඩලය ඇතුළු සියලුදෙනාටත් විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු නිලධාරි මණ්ඩලයේ සියලුදෙනාට, මේ කරන ලද කැප කිරීමටත්, සාමූහික උත්සාහයටත් අවසාන වශයෙන් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, ශීර්ෂ අංක 112 කාරක සභාව එකඟ ද?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, we would like to call for a Division on Head 112, under which comes the United Nations and Human Rights Division, due to the domestic approach that the Government is taking on the accountability issue.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීවරුන්ට දැන් ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

ශීර්ෂ අංක 112 සංශෝධන රහිතව සම්මත කිරීමට පක්ෂ නම් කොළ පාට බොත්තමත්, විරුද්ධ නම් රතු පාට බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටිනවා නම් කහ පාට බොත්තමත් භාවිත කර ගරු මන්ත්‍රීවරුන්ට ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කරගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

මගේ වම් අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කවුරුවත් නැති බවයි පෙනෙන්නේ. ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***

*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*

*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 87; විරුද්ධව 07; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***

*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 87 எதிராக 07; விலகியிருந்தோர் 0.*

*According to Electronic Voting, Parliament divided: Ayes 87; Noes 07; Abstain 0.*

| | |
|---|---|
| G 002. Sunil Handunnetti | Yes |
| G 003. K.D. Lal Kantha | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayathissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekar | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 012. Chrishantha Abeysena | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 015. Dammika Patabendi | Yes |
| G 016. Saroja Savithri Paulraj | Yes |
| G 017. Ananda Wijepala | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Kumara Jayakody | Yes |
| G 021. Rizvie Salih | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 023. Upali Pannilage | Yes |
| G 024. Susil Ranasinghe | Yes |
| G 026. Nihal Abeysinghe | Yes |
| G 029. Gamagedara Dissanayake | Yes |
| G 030. R.M. Jayawardhana | Yes |
| G 031. Sunil Watagala | Yes |
| G 033. Mahinda Jayasinghe | Yes |
| G 034. Chathuranga Abeysinghe | Yes |
| G 036. Upali Samarasingha | Yes |
| G 037. T.B. Sarath | Yes |
| G 039. Prasanna Gunasena | Yes |
| G 040. Anton Jayakody | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 043. Ruwan Ranasinghe | Yes |
| G 044. Muneer Mulaffer | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 054. Kaushalya Ariyarathne | Yes |
| G 058. Nishantha Jayaweera | Yes |
| G 059. Ashoka Ranwala | Yes |
| G 060. Lakshman Nipuna Arachchi | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Najith Indika | Yes |
| G 063. Lakmali Hemachandra | Yes |
| G 064. Samanmali Gunasingha | Yes |
| G 066. Manjula Suraweera Arachchi | Yes |
| G 067. K. Ilankumaran | Yes |
| G 070. Sagarika Athauda | Yes |
| G 075. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 077. Krishnan Kalaichelvi | Yes |
| G 086. Nilusha Lakmali Gamage | Yes |
| G 087. Ajantha Gammeddage | Yes |
| G 088. Ajith Gihan | Yes |
| G 091. Ruwanthilaka Jayakody | Yes |
| G 092. Thushari Jayasingha | Yes |
| G 093. T.K. Jayasundara | Yes |
| G 095. Rajeevan Jeyachandramoorthy | Yes |
| G 096. Sellaththamby Thilaganathan | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Anushka Thilakarathne | Yes |
| G 099. Chandana Thennakoon | Yes |
| G 100. Thanura Dissanayake | Yes |
| G 101. Dharmapriya Dissanayake | Yes |
| G 102. Sujeewa Dissanayake | Yes |
| G 105. Sena Nanayakkara | Yes |
| G 107. Nimal Palihena | Yes |
| G 115. Sudath Balagalla | Yes |
| G 116. Sri Bavanandarajah | Yes |
| O 015. G.G. Ponnambalam | No |
| O 016. Ramanathan Archchuna | No |
| O 020. Shanakiyan Rajaputhran Rasamanickam | No |
| O 040. Gnanamuththu Srineshan | No |
| O 059. Kathiravelu Shanmugam Kugathasan | No |
| O 060. Thurairasa Ravikaran | No |
| O 065. E. M. Basnayaka | Yes |
| O 067. S. Sandaruwan Madarasinghe | Yes |
| O 068. Prageeth Madhuranga | Yes |
| O 070. Ruwan Mapalagama | Yes |
| O 072. Riyas Farook | Yes |
| O 080. Pathmanathan Sathiyalingam | No |
| O 084. Manjula Sugath Rathnayaka | Yes |
| O 085. A.M.M.M. Rathwaththe | Yes |
| O 090. Kanchana Welipitiya | Yes |
| O 094. Ruwan Wijeweera | Yes |
| O 095. Darmapriya Wijesinghe | Yes |
| O 096. Hiruni Wijesinghe | Yes |
| O 098. Fasmin Sharif | Yes |
| O 104. Kitnan Selvaraj | Yes |
| O 110. Bhagya Sri Herath | Yes |
| O 111. Muhammad Faizal | Yes |
| O 112. Ashoka Gunasena | Yes |
| O 113. Nandana Pathmakumara | Yes |
| O 114. Sunil Biyanwila | Yes |

*Electronic Voting Results:*

**Participants:**

| | |
|---|---|
| Present | 94 |

**Votes:**

| | |
|---|---|
| Yes | 87 |
| No | 07 |
| Abstain | 0 |

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව ශීර්ෂ අංක 112 සංශෝධන රහිතව සම්මත කිරීමට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 87යි; විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 07යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

ඒ අනුව, ශීර්ෂ අංක 112 සංශෝධන රහිතව වැඩි ඡන්ද 80කින් සම්මත වූ බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

"112 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු.1,326,685,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

112 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.59,500,000

"112 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.59,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

112 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.19,673,315,000

"112 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.19,673,315,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

112 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු.1,940,500,000

"112 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.1,940,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

112 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී

“தலைப்பு 112, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 1,326,685,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 112, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 59,500,000

“தலைப்பு 112, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 59,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 112, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 19,673,315,000

“தலைப்பு 112, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 19,673,315,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 112, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 1,940,500,000

“தலைப்பு 112, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 1,940,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 112, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 1,326,685,000, for Head 112, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 112, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 59,500,000

Question, "That the sum of Rs. 59,500,000, for Head 112, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 112, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 19,673,315,000

Question, "That the sum of Rs. 19,673,315,000, for Head 112, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 112, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 1,940,500,000

Question, "That the sum of Rs. 1,940,500,000, for Head 112, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 112, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

## අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சு
MINISTRY OF JUSTICE AND NATIONAL INTEGRATION

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 43,000,000,000 |
| මූලධන | රු. 15,500,000,000 |

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"15 වන පිටුවේ, 12 සහ 13 පේළි ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

| | |
|---|---|
| 'පුනරාවර්තන | රු. 42,120,410,000 |
| මූලධන | රු. 17,157,000,000' " |

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 42,120,410,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 17,157,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" மீண்டுவருஞ் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 42,120,410,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 17,157,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the decreased sum of Rs. 42,120,410,000 for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 17,157,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

**110 වන ශීර්ෂය.- අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා**

**01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන -**
**පුනරාවර්තන වියදම,`` රු.5,380,300,000;**
**මූලධන වියදම, රු.6,024,000,000**

தலைப்பு 110. - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -
மீண்டுவருஞ் செலவு, ரூபாய்5,380,300,000;
மூலதனச் செலவு, ரூபாய்6,024,000,000

HEAD 110. - MINISTER OF JUSTICE AND NATIONAL INTEGRATION
Programme 01. - Operational Activities -
Recurrent Expenditure, Rs. 5,380,300,000;
Capital Expenditure, Rs. 6,024,000,000

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 110 වන වැය ශීර්ෂයේ 01 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා:

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"15 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 01
මෙහෙයුම් වැඩසටහන රු. 4,500,710,000 රු. 5,681,000,000' "

[ගරු හර්ෂණ නානායක්කාර මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ, 2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුශංගිකව වැය ශීර්ෂ අංක 110 - අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා යටතේ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය සඳහා වෙන්කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන රු. 879,590,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 343,000,000ක් වැය ශීර්ෂ අංක 189 - මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා යටතට මාරු කිරීමයි.)

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ශීර්ෂ අංක 110 සංශෝධන සහිතව කාරක සභාව එකඟද?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, we would like to call for a Division on Head 110, under which come the Office on Missing Persons and the Office for Reparations, because military personnel had been appointed to the Office for Reparations and also because we - the victim community - have rejected both those institutions.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
We call for a Division on the whole Ministry, Sir.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීවරුන්ට දැන් ඡන්දය ප්‍රකාශ කළ හැකියි. ශීර්ෂ අංක 110 සංශෝධන සහිතව සම්මත කිරීමට පක්ෂ නම් කොළ පාට බොත්තමත්, විරුද්ධ නම් රතු පාට බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටිනවා නම් කහ පාට බොත්තමත් භාවිත කර ගරු මන්ත්‍රීවරුන්ට ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කරගන්න. මගේ දකුණු අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.මගේ වම් අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම්දෙන්න. කවුරුවත් නැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***

*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*

*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 87; විරුද්ධව 7; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***

*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 87; எதிராக 7; விலகியிருந்தோர் 0.*

*According to Electronic Voting, Parliament divided: Ayes 87; Noes 7; Abstain 0.*

| | |
|---|---|
| G 002. Sunil Handunnetti | Yes |
| G 003. K.D. Lal Kantha | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayathissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekar | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 012. Chrishantha Abeysena | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 015. Dammika Patabendi | Yes |
| G 016. Saroja Savithri Paulraj | Yes |
| G 017. Ananda Wijepala | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Kumara Jayakody | Yes |
| G 021. Rizvie Salih | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 023. Upali Pannilage | Yes |
| G 024. Susil Ranasinghe | Yes |
| G 026. Nihal Abeysinghe | Yes |
| G 029. Gamagedara Dissanayake | Yes |
| G 030. R.M. Jayawardhana | Yes |
| G 031. Sunil Watagala | Yes |
| G 033. Mahinda Jayasinghe | Yes |
| G 034. Chathuranga Abeysinghe | Yes |
| G 036. Upali Samarasingha | Yes |
| G 037. T.B. Sarath | Yes |
| G 039. Prasanna Gunasena | Yes |
| G 040. Anton Jayakody | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 043. Ruwan Ranasinghe | Yes |
| G 044. Muneer Mulaffer | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 054. Kaushalya Ariyarathne | Yes |
| G 058. Nishantha Jayaweera | Yes |
| G 059. Ashoka Ranwala | Yes |
| G 060. Lakshman Nipuna Arachchi | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Najith Indika | Yes |
| G 063. Lakmali Hemachandra | Yes |
| G 064. Samanmali Gunasingha | Yes |
| G 066. Manjula Suraweera Arachchi | Yes |
| G 067. K. Ilankumaran | Yes |
| G 070. Sagarika Athauda | Yes |
| G 075. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 077. Krishnan Kalaichelvi | Yes |
| G 086. Nilusha Lakmali Gamage | Yes |
| G 087. Ajantha Gammeddage | Yes |
| G 088. Ajith Gihan | Yes |
| G 091. Ruwanthilaka Jayakody | Yes |
| G 092. Thushari Jayasingha | Yes |
| G 093. T.K. Jayasundara | Yes |
| G 095. Rajeevan Jeyachandramoorthy | Yes |
| G 096. Sellaththamby Thilaganathan | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Anushka Thilakarathne | Yes |
| G 099. Chandana Thennakoon | Yes |
| G 100. Thanura Dissanayake | Yes |
| G 101. Dharmapriya Dissanayake | Yes |
| G 102. Sujeewa Dissanayake | Yes |
| G 105. Sena Nanayakkara | Yes |
| G 107. Nimal Palihena | Yes |
| G 115. Sudath Balagalla | Yes |
| G 116. Sri Bavanandarajah | Yes |
| O 015. G.G. Ponnambalam | No |
| O 016. Ramanathan Archchuna | No |
| O 020. Shanakiyan Rajaputhran Rasamanickam | No |
| O 040. Gnanamuththu Srineshan | No |

| | |
|---|---|
| O 059. Kathiravelu Shanmugam Kugathasan | No |
| O 060. Thurairasa Ravikaran | No |
| O 065. E. M. Basnayaka | Yes |
| O 067. S. Sandaruwan Madarasinghe | Yes |
| O 068. Prageeth Madhuranga | Yes |
| O 070. Ruwan Mapalagama | Yes |
| O 072. Riyas Farook | Yes |
| O 080. Pathmanathan Sathiyalingam | No |
| O 084. Manjula Sugath Rathnayaka | Yes |
| O 085. A.M.M.M. Rathwaththe | Yes |
| O 090. Kanchana Welipitiya | Yes |
| O 094. Ruwan Wijeweera | Yes |
| O 095. Darmapriya Wijesinghe | Yes |
| O 096. Hiruni Wijesinghe | Yes |
| O 098. Fasmin Sharif | Yes |
| O 104. Kitnan Selvaraj | Yes |
| O 110. Bhagya Sri Herath | Yes |
| O 111. Muhammad Faizal | Yes |
| O 112. Ashoka Gunasena | Yes |
| O 113. Nandana Pathmakumara | Yes |
| O 114. Sunil Biyanwila | Yes |

*Electronic Voting Results:*

**Participants:**

| | |
|---|---|
| Present | 94 |

**Votes:**

| | |
|---|---|
| Yes | 87 |
| No | 7 |
| Abstain | 0 |

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
විද්‍යුත් ඡන්ද විමසීම අනුව ශීර්ෂ අංක 110 සංශෝධන සහිතව සම්මත කිරීමට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 87යි; විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 07යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

ඒ අනුව, ශීර්ෂ අංක 110 සංශෝධන සහිතව වැඩි ඡන්ද 80කින් සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

"110 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 4,500,710,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

110 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"110 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 5,681,000,000 දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

110 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 110, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 4,500,710,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 110, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 110, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 5,681,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 110, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the decreased sum of Rs. 4,500,710,000, for Head 110, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 110, Programme 01, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 5,681,000,000, for Head 110, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 110, Programme 01, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

**228 වන ශීර්ෂය.- අධිකරණ පරිපාලනය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 13,601,200,000

"228 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 13,601,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

228 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 4,980,000,000

"228 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 4,980,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

228 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**229 වන ශීර්ෂය.- නීතිපති දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 2,569,000,000

"229 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,569,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

229 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 79,000,000

"229 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 79,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

229 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**230 වන ශීර්ෂය.- නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 234,200,000

"230 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 234,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

230 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 38,200,000

"230 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 38,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

230 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**231 වන ශීර්ෂය.- ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 94,200,000

"231 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 94,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

231 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 3,800,000

"231 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 3,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

231 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 228.- நீதிமன்ற நிருவாகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 13,601,200,000

"தலைப்பு 228, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 13,601,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 228, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 4,980,000,000

"தலைப்பு 228, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 4,980,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 228, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 229.- சட்டமா அதிபர் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 2,569,000,000

"தலைப்பு 229, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 2,569,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 229, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 79,000,000

"தலைப்பு 229, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 79,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 229, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 230.- சட்ட வரைஞர் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 234,200,000

"தலைப்பு 230, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 234,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 230, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 38,200,000

"தலைப்பு 230, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 38,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 230, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 231.- கடன் நிவாரண சபை திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 94,200,000

"தலைப்பு 231, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 94,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 231, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 3,800,000

"தலைப்பு 231, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 3,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 231, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 228. - COURTS ADMINISTRATION

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 13,601,200,000

Question, "That the sum of Rs. 13,601,200,000, for Head 228, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 228, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 4,980,000,000

Question, "That the sum of Rs. 4,980,000,000, for Head 228, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 228, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 229.- ATTORNEY-GENERAL'S DEPARTMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 2,569,000,000

Question, "That the sum of Rs. 2,569,000,000, for Head 229, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 229, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 79,000,000

Question, "That the sum of Rs. 79,000,000, for Head 229, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 229, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 230.- LEGAL DRAFTSMAN'S DEPARTMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 234,200,000

Question, "That the sum of Rs. 234,200,000, for Head 230, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 230, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 38,200,000

Question, "That the sum of Rs. 38,200,000, for Head 230, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 230, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 231.- DEPARTMENT OF DEBT CONCILIATION BOARD

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 94,200,000

Question, "That the sum of Rs. 94,200,000, for Head 231, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 231, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 3,800,000

Question, "That the sum of Rs. 3,800,000, for Head 231, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 231, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**232 වන ශීර්ෂය.- බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 18,760,800,000; මූලධන වියදම, රු. 3,627,000,000

**தலைப்பு 232.- சிறைச்சாலைகள் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 18,760,800,000; மூலதனச் செலவு, ரூபாய் 3,627,000,000

Head 232. - DEPARTMENT OF PRISONS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 18,760,800,000; Capital Expenditure, Rs. 3,627,000,000

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 232 වන වැය ශීර්ෂය සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

කාරක සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"16 වන පිටුවේ 6 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතු ය:

වැඩසටහන 01 මෙහෙයුම් වැඩසටහන

රු. 18,760,800,000 රු. 5,627,000,000' "

[ගරු හර්ෂණ නානායක්කාර මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ අයවැය යෝජනා අංක 47 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින්, වැය ශීර්ෂ අංක 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා රු. 2,000,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"232 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 18,760,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

232 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"232 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 5,627,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

232 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 232, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 18,760,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 232, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 232, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 5,627,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 232, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 18,760,800,000, for Head 232, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 232, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 5,627,000,000, for Head 232, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 232, Programme 01, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

### 233 වන ශීර්ෂය.- රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 873,000,000

"233 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 873,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

233 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 626,000,000

"233 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 626,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

233 වන වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 234 වන ශීර්ෂය.- ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.454,300,000

"234 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.454,300,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

234 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.34,500,000

"234 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.34,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

234 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 235 වන ශීර්ෂය.- ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,රු.30,800,000

" 235 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.30,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

235 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.3,700,000

"235 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.3,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

235 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 236 වන ශීර්ෂය.- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.216,100,000

"236 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.216,100,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

236 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.15,500,000

"236 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.15,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

236 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**326 වන ශීර්ෂය.- ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.786,100,000

"326 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.786,100,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

326 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.68,300,000

"326 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.68,300,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

326 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 233.- அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 873,000,000

“தலைப்பு 233, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபாய் 873,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 233, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 626,000,000

“தலைப்பு 233, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 626,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 233, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 234.- உயர் நீதிமன்ற பதிவாளர் அலுவலகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 454,300,000

“தலைப்பு 234, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபாய் 454,300,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 234, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 34,500,000

“தலைப்பு 234, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 34,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 234, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 235.- இலங்கை சட்ட ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 30,800,000

“தலைப்பு 235, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபாய் 30,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 235, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 3,700,000

“தலைப்பு 235, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 3,700,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 235, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 236.- அரச கரும மொழிகள் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 216,100,000

“தலைப்பு 236, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபாய் 216,100,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 236, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 15,500,000

“தலைப்பு 236, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 15,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 236, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 326.- சமுதாய அடிப்படை சீர்திருத்த திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 786,100,000

“தலைப்பு 326, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபாய் 786,100,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 326, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 68,300,000

“தலைப்பு 326, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 68,300,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 326, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 233.- DEPARTMENT OF GOVERNMENT ANALYST

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 873,000,000

Question, "That the sum of Rs. 873,000,000, for Head 233, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 233, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 626,000,000

Question, "That the sum of Rs. 626,000,000, for Head 233, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 233, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 234.- OFFICE OF THE REGISTRAR OF THE SUPREME COURT

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 454,300,000

Question, "That the sum of Rs. 454,300,000, for Head 234, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 234, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 34,500,000

Question, "That the sum of Rs. 34,500,000, for Head 234, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 234, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule

HEAD 235.- LAW COMMISSION OF SRI LANKA

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 30,800,000

Question, "That the sum of Rs. 30,800,000, for Head 235, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 235, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 3,700,000

Question, "That the sum of Rs. 3,700,000, for Head 235, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 235, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 236.- DEPARTMENT OF OFFICIAL LANGUAGES

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 216,100,000

Question, "That the sum of Rs. 216,100,000, for Head 236, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 236, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 15,500,000

Question, "That the sum of Rs. 15,500,000, for Head 236, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 236, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 326.- DEPARTMENT OF COMMUNITY BASED CORRECTIONS

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 786,100,000

Question, "That the sum of Rs. 786,100,000, for Head 326, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 326, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 68,300,000

Question, "That the sum of Rs. 68,300,000, for Head 326, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 326, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයි ද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය" යි ද මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ.භා. 6.57ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.***

***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 නොවැම්බර් 18වන අඟහරුවාදා.***

*பி.ப. 6.57 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 நவம்பர் 18, செவ்வாய்க்கிழமை.*

*At 6.57 p.m., the Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Tuesday, 18th November, 2025.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශීර්ෂ අංක 110 සහ 232 සංශෝධන සහිතව ද, ශීර්ෂ අංක 112, 228 සිට 231 දක්වා ද, ශීර්ෂ අංක 233, 234, 235, 236 සහ 326 සංශෝධන රහිතව ද කාරක සභාවේදී සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය: වාර්ෂික වාර්තාව (2022)
## இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகம்: ஆண்டறிக்கை (2022)
## SRI LANKA BUREAU OF FOREIGN EMPLOYMENT: ANNUAL REPORT (2022)

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතේ 19 වගන්තිය යටතේ 2024.07.23 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.08.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය: වාර්ෂික වාර්තාව (2022)
## இலங்கை நீதிபதிகள் நிறுவகம்: ஆண்டறிக்கை (2022)
## SRI LANKA JUDGES' INSTITUTE: ANNUAL REPORT (2022)

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ 10(8) වගන්තිය යටතේ 2023.12.01 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.05.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය: වාර්ෂික වාර්තාව (2023)
## இலங்கை நீதிபதிகள் நிறுவகம்: ஆண்டறிக்கை (2023)
## SRI LANKA JUDGES' INSTITUTE: ANNUAL REPORT (2023)

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ 10(8) වගන්තිය යටතේ 2025.03.05 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.05.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 6.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.59ට, 2025 නොවැම්බර් 13වන දින සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 18වන අඟහරුවාදා පූ.භා. 9.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தைஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.59 மணிக்கு, பாராளுமன்றம் அதனது 2025 நவம்பர் 13ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 18, செவ்வாய்க்கிழமை மு.ப. 9.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 6.30 p.m., THE HON.SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.59 p.m. until 9.00 a.m. on Tuesday, 18th November, 2025, pursuant to the Resolution of Parliament of 13th November, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.